මිනිසුන්, ලාභය

සහ ලෝකය

වාර්ෂික වාර්තාව - 2019



නාගරික සංවර්ධන
අධිකාරිය

නාගරික සංවර්ධන , ජල සැපයුම් හා
නිවාස පහසුකම් අමාත්‍යාංශය

වාර්ෂික වාර්තාව - 2019

නාගරික සංවර්ධන අධිකාරිය



+94112875916
+94112875920

+94112873637

09, 07 සහ 06 මහල්,
“සෙත්සිරිපාය ” බත්තරමුල්ල

විගණකාධිපති
306/72, පොල්දූව පාර, බත්තරමුල්ල

ලංකා බැංකුව
නො. 01
ලංකා බැංකු චතුරශ්‍රය, කොළඹ 1

ලේකම්, කළමනාකරණ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල් ,
නාගරික සංවර්ධන අධිකාරිය

dg@uda.lk
www.uda.gov.lk

පටුන

හැදින්වීම	**01 - 02**
1.1 වාර්තාව පිළිබඳ හැඳින්වීම	01
1.2 සභාපතිතුමාගේ විශ්ලේෂණය	02
අප ගැන	**05 - 33**
2.1නාගරික සංවර්ධන අධිකාරියේ විශේෂ සංදිස්ථාන	05
2.2 දැක්ම I මෙහෙයුම| වැඩ වර්ණාවලිය	06
2.3 රාජකාරි සහ කාර්යයන්	විශ්ලේෂණය	07 - 08
2.4නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රකාෂිත බල ප්‍රදේශ	09
2.5 කළමනාකරණ මණ්ඩලය	ප්‍රධාන පුද්ගලයින්	10 - 13
2.6ආයතනික සංයුතිය I කළමනාකරණ ව්‍යුහය	14
2.7 UDA හි ත්‍රිත්ව පහළ රේඛා ප්‍රවේශය(Triple Bottom line approach)	15 - 19
2.8නාගරික සංවර්ධන අධිකාරියෙහි අංශ	20 - 30
2.9 අනුබද්ධ සහ ආශ්‍රිත සමාගම්	31 - 33
වසරේ විශේෂ අවස්ථා	**41-137**
3.1 පලාත් කාර්යාල ක්‍රියාකාරිත්වය	41 - 71
3.2 ප්‍රධාන කාර්යාලයේ අනෙකුත් අංශ වල ක්‍රියාකාරිත්වය	75 - 82
3.3 සැලසුම් කිරීම /ව්‍යාපෘති/ බලාත්මක කිරීම් /උපදේශන විශේෂතා	85 - 133
3.4 සමාජ වැඩ සහ වෙනත් ජයග්‍රහණ	137
මූල්‍ය තොරතුරු සහ ආයතනික පාලනය	**141-196**
4.1 2019 වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය	141-142
4.2 මූල්‍ය ප්‍රකාශණය 2019	143-189
4.3 වසර 10 තුල සාරාංශ වාර්තාව (මුල්‍ය තත්වයේ ප්‍රකාශය, විසඨීරණ ආදායම් ප්‍රකාශය මූල්‍යමය මුදල් ප්‍රවාහ ප්‍රකාශය)	190 - 194
4.4 ආයතනික පාලනය	195 - 196
විගණන කමිටු වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන	**199-223**
5.1 විගණන කමිටුවේ කාර්යභාරය	199
5.2 විගනණ කමිටු සාමාරිකයින්	199
5.3 2019 විගණන කමිටු රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ සහභාගීත්වය	199
5.4 2019 වර්ෂය සඳහා විසනන කමිටුවේ කාර්යය භාරය	200
5.5.2019 දෙසැම්බර් 31 දිනෙන් අසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන	201 - 223
විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිවරයාගේ අදහස්	**227 - 269**

---------- මෙම පිටුව හිතාමතාම හිස්ව තබා ඇත ----------

හැදින්වීම

1.1 වාර්තාව පිළිබඳ හැඳින්වීම

1.2සභාපතිතුමාගේ පණිවිඩය



---------- මෙම පිටුව හිතාමතාම හිස්ව තබා ඇත ----------

1.1 වාර්තාව පිළිබඳ හැඳින්වීම

තිරසාර සංවර්ධනයක් කරා ගමන් කරනු ලබන රටක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය (නා.සං.අ), ජාතියේ ආර්ථික හා සමාජීය සංවර්ධනය සාක්ෂාත් කරගැනීම සඳහා මහ පෙන්වන ප්‍රධාන ආයතනයක් ලෙස ක්‍රියා කරයි. තිරසාර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා ගෙන ඇති පියවර නාගරික සංවර්ධන අධිකාරියේ සමස්ථ කාර්ය සාධනය ලෙස මෙහි නිරූපනය කර ඇති අතර එමගින් 2019 වර්ෂය සඳහා අධිකාරියේ කාර්ය සාධනය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබාදෙනු ඇත. තවද සංවර්ධන සැලසුම්, සංවර්ධන ව්‍යාපෘති, නිවාස සහ අනෙකුත් ව්‍යාපෘති කාර්යය සාධනයන් සකස් කර ක්‍රියාත්මක කරමින් උපායමාර්ගික මැදිහත්වීම් සමග ජාතික සංවර්ධනය සාක්ෂාත් කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ අංශ, පළාත් කාර්යාලවල සහ දිස්ත්‍රික් කාර්යාලය විසින් සපයන ලද සමස්ථ දායකත්වය මෙම වර්තාවෙන් නියෝජනය වේ.

අධිකාරියේ දැක්ම හා මෙහෙවර, කාලෝචිත හා වැදගත් තීරණ හරහා නාගරික සංවර්ධන අධිකාරියට නිවැරදි ලෙස මහ පෙන්වූ කළමණාකරන මණ්ඩලය, සභාපතිවරයාගේ අධීක්ෂණය සමග, 2019 පුරාවටම මෙම අධිකාරිය සුවිශේෂී අධිකාරියක් බවට පත් කල අධිකාරියේ සුදුසුකම් ලත් සහ පළපුරුදු කාර්ය මණ්ඩල සාමාජිකයින් පිළිබඳවද මෙම වාර්තාවේ අන්තර්ගත වේ.

නාගරික ප්‍රදේශවල භෞතික ආර්ථික සාමාජීය සහ පාරිසරික බලවේග සංයෝජනය කරනු ලබන ඒකාබද්ධ සැලසුම්කරණය තුලින් මහජනතාවට ලැබෙන ප්‍රතිලාභ සහ සේවාවන්ද කෙටියෙන් වාර්තාවේ දැක්වේ. නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ සහ පළාත් කාර්යාල මගින් සිදු කර ඇති රටේ සැලකිය යුතු ජාතික හා ප්‍රාදේශීය සංවර්ධන ව්‍යාපෘති පිළිබඳවද වාර්තාව අවධාරණය කර ඇත. ඊට අමතරව පළාත් සහ දිස්ත්‍රික් කාර්යාල මගින් ප්‍රාදේශීය වශයෙන් සිදු කරන සංවර්ධන ව්‍යාපෘති මෙන්ම ඒ ඒ පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල හෝ කොට්ඨාස මගින් සිදු කරනු ලබන සමාජ සුභසාධන කටයුතු සහිත විශේෂ ව්‍යාපෘති ද වාර්තාවේ සඳහන් වේ.

තවද නාගරික සංවර්ධන අධිකාරියේ වත්කම් සහ අයකරගැනීම් පිළිබඳව එනම් ඉඩම් සහ අනෙකුත් ඉදිකල වත්කම් ඇතුළු අධිකාරිය සතු දේපල පිළිබඳ විස්තර කෙරෙන විශේෂ අංශයක් යටතේ මෙම වාර්තාවේ දක්වා ඇත.ආයතනික පාලන සංරචකය සහ නාගරික සංවර්ධන අධිකාරියෙහි ත්‍රිත්ව පහල - රේඛා සංකල්පය ද රටෙහි සමාජ ආර්ථික සහ පාරිසරික සංවර්ධනය යටතේ නාගරික සංවර්ධන අධිකාරියෙහි බහුවිධ භූමිකාවද ඉස්මතු කර ඇත.

වාර්ෂික වාර්තාවේ එක් ප්‍රධාන අංගයන් වන අධිකාරියේ සමස්ථ ආදායම සහ වියදම් ඇතුළු මූල්‍ය ප්‍රකාශයන්ද සවිස්තරාත්මකව දක්වා ඇත. අවසාන වශයෙන් විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් සභාපතිතුමාගේ කෙටි අදහස් සමූහයක් සමඟ අධිකාරිය පිළිබඳ විගණකාධිපති වාර්තාව මෙම වාර්ෂික වාර්තාවට ඇතුලත් කර ඇත. සාරාංශයක් ලෙස 2019 වර්ෂය සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ කාර්ය සාධනය වාර්තාවේ අඩංගු වන අතර එමගින් රටේ තිරසාර සංවර්ධනය සඳහා සැලසුම් සහගත තිරසාර සහ සුහුරු නාගරිකත්වය සාක්ෂාත් කර ගැනීමට මග පෙන්වයි.

1.2 සභාපතිතුමාගේ විශ්ලේෂණය

තිරසාර, සුරක්ෂිත සහ මිත්‍රශීලී නාගරීකරණය තුලින් රට ආර්ථික හා සමාජීය වශයෙන් දියුණු කරනු වස් නාගරික සංවර්ධන අධිකාරිය සුවිශේෂ කාර්යයක් ඉටු කරනු ලබයි. මනා කළමනාකරණයකින් යුත් නාගරික පරිසයක්, සියලු ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සෘජුවම සහ වක්‍රව දායක වන අතර සියලු ආර්ථික අංශවල සංවර්ධනයන්ට දායක වේ.

2019 වර්ෂය නාගරික සංවර්ධන අධිකාරියට සුවිශේෂ වසරක් විය. සැලසුම් ආයතනයක් ලෙස නාගරික සංවර්ධන අධිකාරිය ලෝක දේපල හා ආයෝජන ප්‍රදර්ශනයේදී වසරේ සැලසුම්කරු ලෙස සම්මානයට ද පාත්‍ර විය. එමෙන්ම වසර තුල සංවර්ධන සැලසුම් 29 ක් සකස් කර ගැසට් මගින් ප්‍රකාශයට පත් කරන ලදී. ඊට අමතරව 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 21 වැනි වගන්තිය යටතේ සැලසුම් සහ සංවර්ධන රෙගුලාසි සකස් කිරීමට ආරම්භ කරන ලදී.

නාගරික අඩු ආදායම්ලාභීන්ගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා කොළඹ නගරයේ පැල්පත් වාසීන් සඳහා නිවාස ඒකක 4,740 කට අධික ප්‍රමාණයක් ඉදිකරදීමට අපට හැකිවී ඇති බව අපි ආඩම්භරයෙන් ප්‍රකාශ කර සිටින්නෙමු. කොට්ටාව, මාකුඹුර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයෙහි ගුවන් පාලම්, බස්රථ ගාල්, ප්‍රවේශ මාර්ග, ජලාපවහන වැඩිදියුණු කිරීම් සහ බෙරේ වැව රේඛීය උද්‍යාන සංවර්ධනය, ඇතුළුව 2019 දී නාගරික සංවර්ධන අධිකාරිය විසින් හසුරුවන ලද ප්‍රධාන ව්‍යාපෘති කිහිපයකි. එසේම 2019 වසර සඳහා රුපියල් මිලියන 4, 914 ක් වටිනා ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇති අතර, ඒවා රටේ සංවර්ධනයට ඔවුන්ගේ පිරිවැයට වඩා කිහිප ගුණයකින් විශාල දායකත්වයක් සපයයි.

ආයතනයක් වශයෙන් නාගරික සංවර්ධන අධිකාරිය 2019 වර්ෂය සඳහා රුපියල් මිලියන 1,089 ක ලාභයක් උපයා ඇති අතර, එය පෙර වසර වලට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කර ඇත.

නාගරික සංවර්ධන අධිකාරියේ අදාල සියලුම අංශවලට සහ එහි අදාල ආයතන වලට ඔවුන්ගේ කාර්යයන් අවබෝධකර ගැනීමට සහ 2019 වසරේ ඔවුන්ගේ කාර්යභාරය පිළිබඳ පසු විපරම් කිරීමට වාර්ෂික වාර්තාව යොමු කරන ලෙස මම ඉල්ලා සිටිමි.

මෙම වාර්තාවේ සඳහන් කර ඇති සියළුම කාර්යයන් සහ ජයග්‍රහන එක් පුද්ගලයකුගේ හෝ කිහිප දෙනෙකුගේ කාර්යභාරය පමණක් නොව සමස්ථ කාර්ය මණ්ඩලය විසින් කරන ලද කැපවීම් නිසා ලබාගත් බව මම ඉස්මතු කිරීමට කැමැත්තෙමි. ඒ සඳහා දායකවූ සියලුම කාර්ය මණ්ඩලයට මාගේ හෘදයාංගම ස්තුතිය ප්‍රකාශ කිරීමටද මෙය අවස්ථාවක් කර ගනිමි.

සභාපති,

නාගරික සංවර්ධන අධිකාරිය.



අප ගැන

2.1නාගරික සංවර්ධන අධිකාරියේ විශේෂ සංදිස්ථාන

2.2 දැක්ම I මෙහෙයුම| වැඩ වර්ණාවලිය

2.4 රාජකාරි සහ කාර්යයන් | විශ්ලේෂණය

2.5නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රකාෂිත බල ප්‍රදේශ

2.6 කළමනාකරණ මණ්ඩලය | ප්‍රධාන පුද්ගලයින්

2.7ආයතනික සංයුතිය I කළමනාකරණ ව්‍යුහය

2.8 UDA හි ත්‍රිත්ව පහළ රේඛා ප්‍රවේශය(Triple Bottom line approach)

2.9නාගරික සංවර්ධන අධිකාරියෙහි අංශ

2.10 අනුබද්ධ සහ ආශ්‍රිත සමාගම්

----------මෙම පිටුව හිතාමතාම හිස්ව තබා ඇත----------

2.1 නාගරික සංවර්ධන අධිකාරියේ විශේෂ සංධිස්ථාන

1978

නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවීම

1978

මහ කොළඹ සංවර්ධන සැලැස්ම සකස් කිරීම (UNDP සහය ඇතුව)

1985

කොළඹ නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා ලංකාවේ ප්‍රථම සංවර්ධන සැලැස්ම ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම

1986

ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ සංවර්ධනය සඳහා කලාපිකරණ හා ගොඩනැගිලි රෙගුලාසි හඳුන්වාදීම සහ ක්‍රියාත්මක කිරීම

1998

නාගරික සංවර්ධන අධිකාරි ඉතිහාසයේ දේශීය වෘත්තිකයින් විසින් පළමු වරට කොළඹ මහා නාගරික කලාපිකරණ ව්‍යුහාත්මක සැලැස්ම සකස් කිරීම

1999

කොළඹ නගර සංවර්ධ සැලැස්ම සංවර්ධනය කිරීම (1985 සැලැස්ම සඳහා සංශෝධනය)

2004

සිංගප්පූරු උපදේශකයින් සහ ආයෝජන මණ්ඩලය සමග බස්නාහිර පලාත් මෙගාපොලිස් ව්‍යුහාත්මක සැලැස්ම සකස් කිරීම

2009

කොළඹ නාගරික කේන්ද්‍රයෙන් ඔබ්බෙහි පිහිටි ප්‍රදේශ සඳහා සැලසුම් සහ ගොඩනැගිලි රෙගුලාසි ඇතුලත් සංවර්ධන සැලසුම් සකස් කිරීම

2010

“ආසියාවේ ආශ්චර්යය” සංවර්ධනය කිරීමේ පුරෝගාමීන් වීම

2016

බස්නාහිර කලාපිකරණ මෙගා පොලිස් ප්‍රධාන සැලැස්ම 2030 සකස් කිරීම හා මෙගා පොලිස් සංවර්ධනයේ ප්‍රමුඛයා වීම

2017

ප්‍රකාශිත නාගරික සංවර්ධන ප්‍රදේශ වල සංවර්ධනය නියාමනය සඳහා බලතල අභිනියෝජනය

2018

කොළඹ වාණිජ අගනුවර සැලැස්ම හා කෝට්ටේ අගනගර සැලැස්ම අතුළු ප්‍රධාන නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් 29 ක් සකස් කිරීම

2019

ජාත්‍යන්තරව තරග කරමින් “වසරේ සැලසුම්කරු” සම්මානය දිනා ගැනීම

2.2 දැක්ම

සැලසුම් සහගත, තිරසාර සහ සුහුරු නාගරිකරණයක් කරා



මෙහෙවර

ප්‍රකාශිත නගර ප්‍රදේශ වල ආර්ථික, සාමාජීය, පාරිසරික හා භෞතික සංවර්ධනය සඳහා ඒකාබද්ධ සැලසුම් කරණය සහ ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය

වැඩ වර්ණාවලිය



2.3 රාජකාරී /කර්යයන් / විශ්ලේෂණය

ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරණ පනත යටතේ 1978 සැප්තැම්බර් මස 06 වන දින පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් වන නාගරික සංවර්ධන අධිකාරියට අදාල විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශයක ආර්ථික, සාමාජීය, පාරිසරික හා භෞතික සංවර්ධනය සඳහා ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කිරීමේ කාර්ය පැවරී ඇත.

පනතට අනුකූලව, අධිකාරිය පුළුල් විෂය පථයක් තුල පහත සඳහන් රාජකාරී සහ කාර්යයන් ඉඩු කරනු ලබයි.

- ප්‍රකාශිත සංවර්ධන ප්‍රදේශ තුල ඒකාබද්ධ සැලසුම්කරණය සහ භෞතික සංවර්ධනය සිදු කිරීම සහ සංවර්ධන ක්‍රියාකාරකම් සහ සේවා සම්බන්ධ වැඩ සටහන් සම්බන්ධීකරණය සහ ක්‍රියාත්මක කිරීම
- අත්හැර දමා ඇති සංවර්ධන ව්‍යාපෘති නිම කිරීම
- ප්‍රාග්ධන ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් සකස් කරීම සහ ක්‍රියාත්මක කිරීම
- නාගරික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- පාරිසරික ප්‍රමිතින් සකස් කිරීම සහ පාරිසරික වැඩිදියුණු කිරීම් සඳහා යෝජනා ක්‍රම සකස් කිරීම
- නාගරික ප්‍රදේශ සංවර්ධනයට අදාලව ගොඩනැගිලි ඉංජිනේරු සහ උපදේශන සේවා සිදු කිරීම
- සංවර්ධන සැලසුම් අනුව ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- අනුමත සංවර්ධන ව්‍යාපෘති නිම කිරීම
- රටේ නාගරික සංවර්ධනය සඳහා නිශ්චල හෝ චංචල දේපල අත්පත් කරගැනීම සහ බැහැර කිරීම
- ප්‍රකාෂිත නාගරික ප්‍රදේශ වල නිවාස වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති සකස් කිරීම ක්‍රියාත්මක කිරීම සහ පහසුකම් රහිත ජනාවාස ඉවත් කිරීම සහ එලෙස ලබාගන්නා ලද ඉඩම් සංවර්ධනය කිරීම
- රාජ්‍ය ආයතන සහ රජය නියොජනය කරන ආයතන සඳහා සංවර්ධන සැලසුම් යෝජනා සහ ව්‍යෘපෘති සකස් කිරීම, සම්බන්ධීකරණය, ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය කිරීම
- අනෙකුත් රාජ්‍ය ආයතන වල අවශ්‍යතා සඳහා තාක්ෂණික සැලසුම් සේවා සැපයීම

විශ්ලේෂණය

තිරසාර සංවර්ධන ඉලක්ක සුරක්ෂිත කරමින් ජාතික නාගරික සංවර්ධන ප්‍රමුඛ නියෝජිතායතන ලෙස නාගරික සංවර්ධන අධිකාරිය සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසහටන් රැසක් ක්‍රියාත්මක කර ඇත. ජාතික මට්ටමේ සහ ප්‍රාදේශීය මට්ටමේ මෙම ව්‍යාපෘති අතර නිවාස වැඩසටහන්, වාණිජ සංවර්ධන ව්‍යාපෘති, ප්‍රජා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති, විනෝදාත්මක ව්‍යාපෘති, පරිසර සංරක්ෂණ ව්‍යාපෘති හඳුනාගත හැකිය.

2019 වර්ෂයේ දී නිවාස ඒකක 2,000 කට වැඩි ප්‍රමාණයක් ලබාදීමෙන් කොළඹ නගරයෙහි අඩු ආදායම් ලාභී ප්‍රජාවගේ ජීවන තත්වය නංවාලීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිකාරිය තවත් පියවරක් ගෙන ඇත. මෙම තේමාව යටතේ කොළඹ නගරයේ සැපවත් ජීවනෝපායක් ලබාදීම සඳහා මාලිගාවත්ත ලක්විරු සෙවන නිවාස සංකීර්ණයේ ඒකක 380 ක් ද දෙමටගොඩ සියපත් සෙවන නිවාස ඒකක 266 ක් සහ හේනමුල්ල ප්‍රදේශයේ හෙලමුතු සංකීර්ණයේ නිවාස 1,076 ක්ද රන්මුතු නිවාස සංකීර්ණයෙන් නිවාස ඒකක 576 ක් ද වශයෙන් ලබාදී ඇත.

ශ්‍රී ලංකාවේ පොදු ප්‍රවාහනය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සමගාමීව නව තලයකට ලගා වෙමින් ඒකී ප්‍රථම බහු මාදිලි ප්‍රවාහන මධ්‍යස්ථානය ලෙස අධිකාරියේ අධීක්ෂණය යටතේ මාකුඹුර බහුමාදිලි ප්‍රවාහන මධ්‍යස්ථානය සංවර්ධන කර 2019 වර්ෂයේදී මහජනතාව සඳහා විවෘත කරන ලදී.

"සුඛිත පුරවර සංවර්ධන වැඩසටහන" යටතේ බස් නැවතුම් පොලවල්, දුම්රිය ස්ථාන සහ පොදු/ සති පොල ව්‍යාපෘති සංවර්ධනය කිරීම සිදු කර මහජනතාවට ආර්ථික හා සමාජයීය ප්‍රතිලාභ ලබාගැනීම සඳහා විවෘත කර ඇත. තවද නාගරික සංවර්ධන අධිකාරිය විසින් දමිල දරුවන් සඳහා රක්වාන ලමා නිවාසය ඉදිකිරීම වැනි විශේෂ ව්‍යාපෘති කිහිපයක් යටතේ සමාජයේ විශේෂ කණ්ඩායම් වලට පහසුකම් සැලසීමට කටයුතු කර ඇත. මීට අමතරව මීරිගම, දොම්පේ, වලස්මුල්ල, මිනුවන්ගොඩ, වැලිමඩ, බිබිල සහ මොනරාගල වැනි ප්‍රදේශ වල වාණිජ සංකීර්ණ සහ වෙළඳපල සංවර්ධන ව්‍යාපෘති මෙන්ම බහුකාර්යය ගොඩනැගිලි සංකීර්ණ සංවර්ධන ව්‍යාපෘති ද මෙම වසරේදී ඉදිකර ජනතා අයිතියට පත් කෙරුණි.

2019 වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරිය නාගරික ප්‍රදේශ වල ස්වභාවික පරිසරය සංරක්ෂණය කරමින් නගරවාසීන්ට ක්‍රියාශීලී සහ ක්‍රියාශීලී නොවන විනෝදාස්වාද අවකාශයන් නිර්මාණය කිරීම සඳහා මාතර, රිවර් සයිඩ් තානායම නුවරඑළිය ග්‍රෙගරි වැව සහ අවට සංවර්ධනය ඇඹිලිපිටිය කාවන්තිස්ස වැව සහ අවට සංවර්ධනය, හෝමාගම නාගරික උද්‍යාන සංවර්ධනය සහ දීප ව්‍යාප්ත හරිත උද්‍යාන ව්‍යාපෘතියට සමගාමීව ක්‍රීඩාපිටි සංවර්ධන ව්‍යාපෘති සිදු කරන ලදී.

අධිකාරියේ සේවකයන්ගේ කාර්යය සාධනය ඇගයීම සඳහා වර්ෂය තුල ප්‍රධාන කාර්ය සාධන දර්ශකය (KPI) සැලකිල්ලට ගනිමින් සේවකයින් දිරිමත් කිරීම සඳහා අධිකාරියේ සේවකයින් සඳහා රැකියා උසස්වීම් ගණනාවක් ලබාදෙන ලදී. තවද, ඵළදායිතාව සහ සේවකයින්ගේ රැකියා තෘප්තිය ඉහල නැංවීම අරමුණින් සිදුවන අධිකාරියේ වාර්ෂික සුබසාධන කටයුතු එම වර්ෂයේදීත් ලබාදෙන ලදී. අධිකාරියේ සේවකයින් සඳහා ණය පහසුකම්, උත්සව අත්තිකාරම්, ප්‍රසාද දීමනා සහ වෛද්‍ය දීමනා වැනි වාර්ෂික සුබසාධන කටයුතු මෙන්ම අධිකාරියට බස් රථයක් මිලදී ගැනීමට ලීසිං පහසුකම් සහ කාර්යාල පරිශ්‍රයේ ඇති දිවා සුරැකුම් මධ්‍යස්ථානයෙහි අමතර කොටසක් ඉදිකිරීම සඳහා 2019 වසරේ ඉඩප්‍රස්ථා ලබාදෙන ලදී.

2.4 නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රකාශිත බල ප්‍රදේශ



2.5 කළමනාකරණ මණ්ඩලය

ආචාර්ය ජගත් මුණසිංහ - සභාපති
සභාපති නා.සං.අ.
අධ්‍යක්ෂ ජනරාල්, ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව,

PhD National -University of Singapore,
Msc. (Tow. & Cont.Pl) - UOM,
Msc. (Archi) – UOM, Bsc. (Built Environment) - UOM, AIASL, MITPSL





එස්.එස්.පී. රත්නායක මහතා - ලේකම්,
අධ්‍යක්ෂ ජනරාල් (නා.සං.අ.)

BSc.Eng (Hons), CEng, MIE(SL),
PG Diploma(H&T)

චන්දන රණසිංහ මහතා
සාමාජික
ක්‍රියාකාරී අධ්‍යක්ෂ නා.සං.අ.
MBA - University of Jayawardenapura
Bsc. Eng - University of Moratuwa





මාධව වෛද්‍යරත්න මහතා සාමාජික
අතිරේක ලේකම් ,
මහ නගර හා බස්නාහිර පළාත් සංවරවර්ධන අමාත්‍යාංශය

MBA, MSc. - (IT), M.A.
Bsc. (Chemistry) Special

පී. සනත් පනවැන්නගේ මහතා සාමාජික
අධ්‍යක්ෂ ජනරාල් -
ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය
Msc. - University of Jayawardenapura , MBA. - University of Jayewardenepura, Ceng., MIET





ඒ.ජී.එම්.එම්.විමලසුරිය මහතා සාමාජික
අධ්‍යක්ෂ -
කාලගුණ විද්‍යා දෙපාරත්මේන්තුව, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය - මොරටුව විශ්ව විද්‍යාලය

BSc. (Hon), Dip. in Meteorology & Climatology

අයි.එස්.පලන්සූරිය මහතා සාමාජික
සභාපති, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය -
BA - University of Peradeniya , Small and Medium Scale Industrial H. Dip - University of Philippines, Public Relation Training Dip-IBM





විද්‍යා දිල්රුක් අමරපාල මහතා සාමාජික
උපදේශක - බලශක්ති, ආයෝජන ප්‍රවර්ධන
ව්‍යාපෘති කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීම
MBA, Member of AMT, Member of IEEE

එච්.ටී.කේ.පද්මසාරි මහතා
ලේකම් - පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
MPAd - University of SJ
BA. - University of Peradeniya



ඒ.ටී.එල්.පී. සමරසිංහ මහත සාමාජික
අතිරේක ලේකම් - ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය



Member of Institute of Engineering and Technology - UK, Chartered Engineer, MBA in Electronic Governance UOM, Bachelor in Management -

බී.බී.අයි.ඒ.පෙරේරා මහත්මිය
සාමාජික
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) - විදුලි හා බල ශක්ති අමාත්‍යාංශය

Msc. Agriculture (Sp in food Sc. &Tech)-University of Peradeniya, BSc. Agriculture(Sp) - University of Peradeniya.





එච්.හේවගේ මහතා
සාමාජික
අතිරේක ලේකම් - (පරිපාලන සහ මුදල්) අධ්‍යාපන අමාත්‍යාංශය

BSc. (Public Ad.) Special, M.A. (Economics), Member of AAT (SL), Licentiate Certificate of the ICASL

ඩබ්.ඩී.ඒ. සුනිල් පෙරේරා මහතා
සාමාජික
මූල්‍ය උපදේශක - ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව
Post Graduate Diploma in Business and Financial Administration, Bsc. (Mgt) Sp. University of Sri Jayawardenapura, Fellow of ICASL, Fellow of CIMA,Fellow of AAT





එච්.එච්.කස්තුරිආරච්චි මහතා
සාමාජික
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ව්‍යවසාය දෙපාරත්මේන්තුව

B.Com (Special) Hons, LLB, MAAT

ඉංජිනේරු ඩබ්.බී. පලුගස්වැව මහතා
සාමාජික
අතිරේක ලේකම් - නාගරික සංවර්ධන

BSc. (Civil Engineering), CEng, MIE (SL), MSc. (Ground water Hydrology)





ඊ.ඒ.ආර්.රේණුකා මහත්මිය
සාමාජික
අතිරේක ලේකම්(ඉඩම් අමාත්‍යාංශය

B.Sc (Special) Degree (botany), Msc. (Sociology)

කේ.ඩී,චිත්‍රපාල මහතා
සාමාජික
අතිරේක ලේකම් - කර්මාන්ත හා වාණිජ කටයුතු

B.Com (Special) Hons, Master of Commerce, PG Diploma in local Government Finance, Chartered public finance accountant,





එස්. මහේෂ්වරන් මහතා
සාමාජික
අධ්‍යක්ෂ ව්‍යාපෘති – ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

BSc. Engineering, MIE (SL), PG Diploma in Construction Project Management, Dip in Public Procurement & Construction management, Class I officer in SL Engineering Service.

ඩී.චමන්ද සිල්වා මහතා
සාමාජික
සභාපති – වෝඩර්ස් එජ්

BSc. Engineering (Electrical & Electronic)





එච්.ඩබ්..කරුණාරත්න මහතා
සාමාජික

ලේකම්, ඉඩම් අමාත්‍යාංශය

B.Com (Special) Hons, LLB, MAAT



කේ.ප්‍රදීප යෝගවන්ද්‍ර මහතා
සාමාජික
සහකාර ලේකම් – සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය.
B.Sc Hons Attorney at Law, Master of International Studies

ප්‍රධාන පුද්ගලයින්

	තනතුර	නම
1	සභාපති	ආචාර්ය ජගත් නන්දන මුණසිංහ මහතා (11.12.2019 දක්වා)
		වරලත් ගෘහ නිර්මාණ ශිල්පී හර්ෂාන් ද සිල්වා
2	අධ්‍යක්ෂ ජනරාල්	එස්.එස්.පී.රත්නායක මහතා(18.11.2019 දක්වා)
		එන්.පී.කේ.රණවීර මහතා
3	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	කේ.ඒ.ඩී, චන්ද්‍රදාස මහතා (11.03.2019 දක්වා)
		ඩී.එම්.බී.රණතුංග මහතා
4	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මුදල්)	ඩබ්.වී.ඡායා තිලිනි මහත්මිය
5	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ව්‍යාපෘති)	එම්.සී.විතානච්චි මහතා
6	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(සැලසුම්)	ඩී.එම්.පී.රණතුංග මහතා(03.06.2019 දක්වා)
		එම්.පී.රණතුංග මහතා
7	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(උපදේශන) කොන්ත්‍රාත්	චම්පිකාද සිල්වා මහත්මිය
8	අධ්‍යක්ෂ (බලාත්මක)	එම්.පී.රණතුංග මහතා (23.06.2019 දක්වා)
	වැ.බ. අධ්‍යක්ෂ (බලාත්මක)	එම්.එච්.වී.රත්නකුමාර් මහතා(08.09.2019 දක්වා)
	අධ්‍යක්ෂ (කොළඹ මහ නාගරික ප්‍රදේශය)	එච්.ජේ.සී.රණවීර මහතා(09.12.2019 දක්වා)
	අධ්‍යක්ෂ (කොළඹ මහ නාගරික ප්‍රදේශය)	එම්.එම්.එල්.පී. විජයරත්න මහතා
9	අධ්‍යක්ෂ (ඉඩම් සංවර්ධන හා කළමනාකරණ)	කේ.එල්.ඩබ්.පෙරේරා මහතා (29.10.2019 දක්වා)
	වැ.බ. (ඉඩම් සංවර්ධන හා කළමනාකරණ)	එස්.එන්.දිසානායක මහතා(23.12.2019 දක්වා)
		එච්.ඒ. දයානන්ද මහතා
10	අධ්‍යක්ෂ(භූගෝලිය තොරතුරු පද්ධති)	ජේ.පී.එස්.සෝමසේකර මහත්මිය
11	අධ්‍යක්ෂ(සංවර්ධන සැලසුම්)	එම්.එම්.එල්.පී. විජයරත්න මහතා (03.03.2019 දක්වා)
		එච්.ජේ.සී.රණවීර මහතා
	අධ්‍යක්ෂ(උපායමාර්ගික සැලසුම්)	ආර්.එල්.පී.පී. නවරත්න මහත්මිය (18.12.2019 දක්වා)
		ඒ.ටී.පී. ද අල්විස් මහත්මිය
12	වැ.බ.අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ හා පරිපාලන)	කේ.එම්.පී.ජී.ඩී.කේ.කැකුලන්දර මහත්මිය (11.06.2019 දක්වා)
13	අධ්‍යක්ෂ (අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය)	ඊ.ඒ.සී. ප්‍රියශාන්ත මහතා
14	අධ්‍යක්ෂ (නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය)	බ්‍රිගේන්ඩියර් එස්.ඒ.ආර්. සමරසිංහ මහතා
15	අධ්‍යක්ෂ (ඉංජිනේරු සේවා)	එල්.ඒ.ඩී.ජේ. සිසිර කුමාර මහතා
16	වැ.බ. අධ්‍යක්ෂ (වත්කම් කළමනාකරණ හා අයකර ගැනීම්)	ආර්.ඩී.එන්.රණසිංහ මහතා (18.12.2019 දක්වා)
	අධ්‍යක්ෂ (වත්කම් කළමනාකරණ හා අයකර ගැනීම්)	කේ.එච්.එම්.ඩබ්.කේ. අබේරත්න මහතා
17	අධ්‍යක්ෂ(පරිසර හා භූ දර්ශන)	සී.කේ.කලුපහන මහත්මිය
18	අධ්‍යක්ෂ (සැලසුම්, ව්‍යාපෘති කළමනාකරණය සහ උපදේශනය)	එල්.එන්.එන්.ඒ. සමරසිංහ මහතා (16.01.2019 දක්වා)
19	අධ්‍යක්ෂ (නීති)	ටී.ලියනාරච්චි මහත්මිය
20	අධ්‍යක්ෂ (මුදල්)	එච්.ආර්.එස්.සී. ගුණතිලක මහතා
21	අධ්‍යක්ෂ (වයඹ පලාත)	ඩබ්.ජේ.සෙනවිරත්න මහතා (28.02.2019 දක්වා)
		එන්.ඒ.එස්.එන්. නිස්සංක මහතා (18.12.2019 දක්වා)
		ඊ.එම්.එස්.බී. ඒකනායක මහතා
22	අධ්‍යක්ෂ (සබරගමුව පලාත)	ඩී.එම්.එස්.එම්. දිසානායක මහතා
23	අධ්‍යක්ෂ (දකුණු පලාත)	කේ.එච්.එම්.ඩබ්.කේ. අබේරත්න මහතා (19.12.2019 දක්වා)

		එච්.ජේ. සී. රණවීර මහතා
24	අධ්‍යක්ෂ (ඌව පලාත)	එච්.එම්.ඒ. ආර්. මැදවල මහතා (18.12.2019 දක්වා)
		ඩී.එම්.එස්. එම්. දිසානායක මහතා
25	අධ්‍යක්ෂ (සංවර්ධන සැලසුම් - උතුර හා නැගෙනිහර පලාත)	වයි.ඒ.සී.කේ. ගුණතිලක මහතා (10.03.2019 දක්වා)
26	අධ්‍යක්ෂ (උතුරු මැද පලාත)	එල්.ජේ. ලියනගේ මහතා
27	අධ්‍යක්ෂ (නැගෙනහිර පළාත)	ඊ.එම්.එස්.බී. ඒකනායක මහතා (07.03.2019 දක්වා)
		එම්.එම්.එල්.පී. විජරත්න මහතා (15.12.2019 දක්වා)
		එල්.ජේ. ලියනගේ මහතා
28	අධ්‍යක්ෂ(බස්නාහිර පළාත)	එච්.ජේ.සී. රණවීර මහතා (05.03.2019 දක්වා)
		වයි.ඒ.ජී.කේ. ගුණතිලක මහතා
29	අධ්‍යක්ෂ(මධ්‍යම පළාත)	එන්.ඒ.එස්.එන්. නිස්සන්ක මහතා (07.03.2019 දක්වා)
		කේ. එම්.එස්.බී. ඒකනායක මහතා (18.12.2019 දක්වා)
		එන්.ඒ.එස්.එන්. නිස්සන්ක මහතා
30	අධ්‍යක්ෂ(උතුරු පලාත)	එන්.පී.කේ.රණවීර මහතා
31	ප්‍රධානී (ව්‍යාපාර ප්‍රවර්ධන)	ආර්. එම්. ධනංජය සිරිවර්ධන මහතා
32	ප්‍රධාන අභ්‍යන්තර විගණක	එන්.පී.දිසානායක මහතා
33	අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමනාකරණ)	ජී.එන්. ප්‍රේමවර්ධන මහතා
34	අධ්‍යක්ෂ (උපදේශන - ගෘහ නිර්මාණ ශිල්පී)	ජී.එන්. ප්‍රේමවර්ධන මහතා
35	නියෝජ්‍ය අධ්‍යක්ෂ (බලාත්මක විගණන හා පසුවිපරම්)	ඒ.ටී,පී. අල්විස් මහත්මිය (03.09.2019 දක්වා)
	නියෝජ්‍ය අධ්‍යක්ෂ (බලාත්මක විගණන හා පසුවිපරම්)	එම්.එච්.වී.රත්නකුමාර් මහතා
36	අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන)	ඒ.ටී,පී. අල්විස් මහත්මිය (16.12.2019 දක්වා)
		ආර්.එල්.පී.පී. නවරත්න මහත්මිය
37	ඒකක ප්‍රධානී(සැලසුම් තොරතුර පද්ධති)	එම්.එම්.අනුර ප්‍රසන්න මහතා (03.09.2019 දක්වා)
38	අධ්‍යක්ෂ(දේපල කළමනාකරණ)	එම්.එම්.අනුර ප්‍රසන්න මහතා
39	නි.අධ්‍යක්ෂ / ඒකක ප්‍රධානී (උපදේශක – (උතුරුමැද පළාත)	බී.එල්.කේ. ඉන්දිකා බාලසූරිය මිය (12.06.2019 දක්වා)
40	අධ්‍යක්ෂ(ව්‍යාපෘති කළමනාකරණ-උතුරු කලාපය)	බී.එල්.කේ. ඉන්දිකා බාලසූරිය මිය
41	නි.අධ්‍යක්ෂ / ඒකක ප්‍රධානී (ගොඩනගිල අයදුම්පත් නිකුත් කිරීමේ ඒකකය)	ඩබ්.ඒ.රූපා රංජනී මිය
42	නි.අධ්‍යක්ෂ ./ ඒකක ප්‍රධානී (උපදේශක – දකුණු පළාත් කාර්යාලය	ලාව්‍යා වීරසූරිය මිය
43	අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමනාකරණ- දකුණු කලාපය)	ලාවන්‍යා වීරසූරිය මිය
44	නි. අධ්‍යක්ෂ./ ඒකක ප්‍රධානී (උපදේශක – බස්නාහිර පලාත)	ඩබ්.ටී. නිලකරත්න මහත්මිය
45	අධ්‍යක්ෂ (ව්‍යාපෘති කළමනාකරණ- බටහිර කලාපය)	ඩබ්.ටී.නිලකරත්න මහත්මිය
46	අධ්‍යක්ෂ (පහසුකම් කළමනාකරණ අංශය)	එච්.ජී.සරත්චන්‍ද්‍ර මහතා
47	අධ්‍යක්ෂ (ප්‍රගති සමාලෝචන)	පී.ඩී,කේ.පතිරණ මහතා
48	අධ්‍යක්ෂ (ගෘහ නිර්මාණ ශිල්පී)	එඑස්.පී.කේ. කපුගම ආරච්චි මහතා

2.6 සංයුතිය I කළමනාකරණ ව්‍යුහය

අධිකාරියේ කළමනාකරණ ව්‍යුහය



- *2019 අධිකාරියේ කළමනාකරණ ව්‍යුහය 2019 වසරේ අනුමත සේවක සංඛ්‍යාව*

මානව සම්පත් ව්‍යුහය



- මානව සම්පත් ව්‍යුහය ස්ථිර සේවක තනතුරු මත පදනම් වේ

2.7 නා.සං.අ. හි ත්‍රිත්ව - පහල රේඛා ප්‍රවේශය

නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලබන සියලුම සංවර්ධන කටයුතු ජාතියේ සමස්ථ පුරවැසියන් ඉලක්කර කර ගනිමින් සිදුකරනු ලබන බව සඳහන් කිරීම ඉතා වැදගත් වේ. පනත මගින් ලබා දී ඇති පුළුල් විෂය පථය හේතුවෙන් ශ්‍රී ලංකාවේ අනෙකුත් රාජ්‍ය ව්‍යවස්ථාවන් හා සසඳන විට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ජාතිය වෙත සිය යුතුකම් කිසිදු හේදයකින් තොරව ඉටු කරනු ලබයි. මෙම පුළුල් විෂය පථය නිසා නා.සං.අ. විසින් විවිධ මට්ටම් වලින් තිරසාර සංවර්ධන ඉලක්ක සපුරාලයි.

ත්‍රිත්ව - පහල -රේඛා (TBL) යනු සමාජ, පාරිසරික සහ මූල්‍ය යන කොටස් තුනකින් සමන්විත ගිණුම්කරණ රාමුවකි. සමහර ආයතන වැඩි ව්‍යාපාරික වටිනාකමක් ඇති කිරීම සඳහා පුළුල් දෘෂ්ඨිකෝණයකින් ඔවුන්ගේ කාර්යය සාධනය ඇගයීමට මෙම (TBL) රාමුව අනුගමනය කර ඇත.

TBL සංකල්පය පැහැදිලිව විස්තර කර ඇති පරිදි සෑම වසරකම නා.සං.අ. විසින් මෙම මිනිසුන් ලාභ සහ ලෝකය යන ක්ෂේත්‍ර තුනම වෙනුවෙන් කටයුතු කරන ලදී. විෂය භාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරන ලද ප්‍රදේශ වල ඒකාබද්ධ සැලසුම්කරණය සහ ආර්ථික සමාජ, භෞතික සහ පාරිසරික සංවර්ධනය ක්‍රියාත්මක කිරීම සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 1978 අංක 41 දරණ පාර්ලිමේන්තු පනත මගින් නා.සං.අ. පිහිටුවන ලදී. නීතිය විසින්ම පැහැදිලි කර ඇති පරිදි ජාතික තිරසාර සංවර්ධනයක් සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය සියලුම ක්ෂේත්‍ර කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කිරීම අරමුණ වී ඇත. නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඔවුන්ගේ ආයතනික සැලසුම් සහ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් වල නියමිත ඉලක්ක සපුරා ගැනීම සඳහා අනෙකුත් පාර්ශවකරුවන් සමග කැපවී ක්‍රියාකරනු ලබයි. මෑත අතීතයේ සිදු කරන ලද සමස්ථ ක්‍රියාකාකම් විශ්ලේෂණය කිරීමේදී අදාල සියලුම තිරසාර සංවර්ධන ඉලක්ක (SDGS) සෘජුව හෝ වක්‍රව



නාගරික සංවර්ධන අධිකාරිය විසින් සපයා ඇති බව සඳහන් කිරීම නිවැරදි වේ.

ඒ අනුව අධිකාරිය විසින් වරින් වර සම්මත කර ගන්නා ලද රජයේ ප්‍රතිපත්ති ලේඛන වලට සහ (TBL) මූල ධර්මයට අනුව අනුගත වෙමින් සමාජ ආර්ථික, යහපැවැත්ම නංවාලීම සඳහා මිනිසුන්, ලාභය, ලෝකය වැඩිදියුණු කිරීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබාදෙන අතරම මානව, මූල්‍ය හා භෞතික සම්පත් පදනමකින් සමන්විත තිරසාර රාජ්‍ය ව්‍යවසායකයෙක් ලෙස කැපී පෙනෙයි.

2019 වර්ෂයේදී ද TBL සංකල්පයෙහි ඉහත සඳහන් ක්ෂේත්‍ර 03 ප්‍රමාණවත් ලෙස අවධානය යොමු කර ඇත. සැලසුම්, ව්‍යාපෘති සහ බලාත්මක කිරීමේ කෂේත්‍ර සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ එක් එක් අංශයේ සහ කාර්යාලවල දායකත්වය සැලකිල්ලට ගනිමින් 2019 වර්ෂය සඳහා මේ සම්බන්ධයෙන් දායකවී ඇති ආකාරය වෙන වෙනම විශ්ලේෂණය කර ඇත. ඊට අමතරව නගර අලංකරණය, නගර සංවර්ධන සැලසුම් සහ නිමකරන ලද සැලසුම් කටයුතු, දේපල වෙලදාම් ආදිය ඇතුළුව වර්ෂය තුල නිම කරන ලද ව්‍යාපෘති සියල්ල සමග "වසරේ විශේෂ අවස්ථා" යටතේ වාර්ෂික වාර්තාවට ඇතුලත් කර ඇත. තවද සමාජයේ දිලිදු පිරිසට පහසුකම් සැලසීමේ අරමුණින් සහ සමාජයේ නාගරික නිවාස අවශ්‍යතා සපුරාලීම සඳහා මධ්‍යම අදායායම්ලාභි නිවාස ව්‍යාපෘති වැනි නිවාස ව්‍යාපාති ක්‍රියාත්මක කරන ලදී. 2019 වර්ෂයේදී පරිසරයට කාබන්ඩයෝක්සයිඩ් විමෝචනය අවම කිරීම සඳහා පරිසර හිතකාමී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම කෙරෙහිද විශේෂ අවධානයක් යොමු කරන ලදී.

රාජ්‍ය අංශයේ ප්‍රමුඛතම ව්‍යවස්ථාපිත හා වාණිජ ආයතනයක් ලෙස නා.සං.අ. රජය වෙනුවෙන් විශාල සංවර්ධන ව්‍යාපෘති නිම කරමින් ඉමහත් දායකත්වයක් ලබා දී ඇති අතර ජනතාවට (මහජනතාවට) සාධාරණ ලෙස සේවය කිරීමට සහ ලෝකය (පරිසරයට) හානියක් නොවන පරිදි සියලුම කාර්ය සාධනය සඳහා TBL සංකල්පය යොදා ගනිමින් අධිකාරියට සැලකිය යුතු ලාභයක් උපයාගෙන ඇත.

2019 වසර තුල සාර්ථක වූ ක්ෂේත්‍ර 03 පහත සාරාංශගත කර ඇත.

(a) මිනිසුන්

නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්තව්‍යට අනුව, රටේ වාණිජ සහ පරිපාලන අගනුවර ඇතුළු ප්‍රකාශිත නාගරික සංවර්ධන ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් 29 ක් සකස් කර ගැසට් කරන ලදී. මෙම සැලසුම් සෑම ප්‍රදේශයකම සමාජ, ආර්ථික, භෞතික සහ පාරිසරික අංශ එක හා සමානව සලකා සකස් කර ඇත.

නගර සංවර්ධන වැඩසටහන් වලට සමගාමීව, බස් නැවතුම් ක්‍රීඩා පිටි, පොදු උද්‍යාන, ඇවිදීමේ මංතිරු, වෙළඳ පොල සංවර්ධනය සහ පරිපාලන සංකීර්ණ ගොඩනැගීම ඇතුළුව රට පුරා සෑම ප්‍රදේශකම සාමාජීය සහ යටිතල පහසුකම් සංවර්ධනය කර ඇති අතර එමගින් පුරවැසියන්ගේ ජීවන තත්ත්වය නංවාලනු ලැබේ. කොළඹ නගරයේ සහ තදාසන්න ප්‍රදේශවල අඩුපාඩුකම් ජනවාස වල ජීවන රටාව නංවාලීමේ අරමුණින් රජය වෙනුවෙන් නාගරික පුනර්ජීවන වැඩසටහන 2011 වර්ෂයේදී නා.සං.අ. විසින් දියත් කර ඇත.

- ප්‍රකාශිත බල ප්‍රදේතුල සියලුම සැලසුම් කිරීම් බලාත්මක කිරීම මර්ගෝපදේශ සැලසුම් සහ ව්‍යාපෘති සැලසුම් ක්‍රියාකාරකම් සිදුකිරීම සඳහා පළාත් කාර්යාල 10 ක් දිස්ත්‍රික් කාර්යාල 12 ක් උප කාර්යාල 2 ක් ඇති අතර එමගින් අපගේ ගනුදෙනුකරුවන්ට කාර්යක්ෂම සේවාවක් සැපයීමට බලාපොරොත්තු වේ.

- නාගරික සංවර්ධන ප්‍රදේශ වල නියමිත කාලරාමු තුල සතුටුදායක මට්ටමින් ගනුදෙනු කරුවන්ගේ අවශ්‍යතාවය සපුරාලීම සඳහා බොහෝ විධිමත් හා අවිධිමත් වේදිකා හරහා (Platform)

සම්බන්ධවීම

- පැමිණිලි/දුක්ගැනවිලි ඇතුළු පාර්හෝගික ප්‍රතිපෝෂණ සෑම අවස්ථාවකදීම විධිමත් සහ අවිධිමත් මාර්ග හරහා පිලිගනු ලබන අතර, එවා ලුහුබැඳීම විශ්ලේෂණය සහ පවත්නා පදනමක් මත ඒවා ජයගැනීම

- මහජනතාවට මෙන්ම පරිසයට බලපාන සැලසුම් සහගත ප්‍රතිඵලවලින් යම් අපගමනයක් වේ නම් නිවාරදි කිරීමට පියවර ගන්නා අතරම හදුනාගත් අභිප්‍රායන් සාක්ෂාත් කරගැනීමටත් සාධාරණ තීරණ ගැනීමටත් නා.සං.අ. අධිෂ්ඨානකර ඇත.

- යාවත්කාලීන කරන ලද මූලධර්ම, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සහ සැලකිය යුතු අංශවල වගකිවයුතු නිලධාරින් පැහැදිලිව හදුන්වාදී වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කර ඇති අතර, ඒමගින් සාමාන්‍ය ජනතාව අතර විශ්වාසය සහ හොද ප්‍රතිරූපයක් ගොඩනගා ගත හැකිවේ.

- අධිකාරියට සහ සාමාන්‍ය ජනතාවට ප්‍රතිලාභ අත්වන්නා වූ අතහැර දමා ඇති සංවර්ධන ව්‍යාපෘති නිම කිරීම

- කුඩා, මධ්‍යම සහ විශාල ව්‍යාපෘති හරහා විවිධ රැකියා අවස්ථා ලබාදීම වෘත්තීය විශේෂඥයන් පමණක් නොව ස්වයං රැකියා ඇතුළු කුඩා පරිමාණ ඇතුළු අනෙකුත් රැකියා කාණ්ඩ වලටද ප්‍රතිලාභ ලැබේ.

- අභ්‍යන්තර විගණන පාලනයන් හරහා නීතිරීති සහ මාර්ගෝපදේශ වලට අනුකූලවීම මැනවින් ඇගයීමට ලත් කෙරෙන බැවින් නාගරික සංවර්ධන අධිකාරියේ ක්‍රියාකාකම් කෙරෙහි මහජන විශ්වාසය වැඩිදියුණු වනු ඇත

2019 වර්ෂය තුල නා.සං.අ. විසින් "මිනිසුන්" සංරචකය සඳහා ලබාදුන් දායකත්වය පහත ව්‍යාපෘති මගින් පෙන්නුම් කරනු ලබයි.

1. නාඋල නාගරික චත්‍රරශ්‍රය සහ ප්‍රජා ශාලාව
2. පිළියන්දල බස් නැවතුම්පොල සංවර්ධනය
3. පිටකෝට්ටේ රජමහා විහාරය සංවර්ධනය
4. මාලිගාත්තේ නිවාස ඒක 768 ක් කොළඹගේ මාවතෙහි නිවාස ඒකක 615 ක් සංවර්ධනය

(b) ලෝකය

ඉතාමත් ප්‍රමුඛ හා අත්‍යාවශ්‍ය ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් 29 ක් සකස් කරමින් එකී ප්‍රදේශ වල දියුණුව අපේක්ෂා කරන ලදී. එම සැලසුම් අතර කොළඹ වාණිජ නගර සංවර්ධන සැලැස්ම (2019-2030) හා අගනගර සංවර්ධන සැලැස්ම (2019-2030) වේ.

- මහජනතාවගේ යටිතල පහසුකම් සහ විවේක අවශ්‍යතා සපුරාලමින් පරිසරය ආරක්ෂා කිරීම නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම සඳහා සීමිත සම්පත් තුල කුඩා පරිමාණ ව්‍යාපෘති සිට ඉතා උස ගොඩනැගිලි දක්වා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- හරිත ගොඩනැගිලි සංකල්පය ක්‍රියාත්මක කිරීම
- පාර්ලිමේන්තු පිටිය, බේරේ වැව වැනි ප්‍රදේශ වල හරිත පරිසරය නඩත්තු කිරීම
- වසර පුරා භූ දර්ශන ක්‍රියාකාරකම් හරහා රුක් රෝපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම උදා : බේරේ වැව, නුවරඑළිය ආදී
- මිනිසා විසින් සාදන ලද අපද්‍රව්‍ය පාලනය කිරීම සහ ඒවට විසඳුම් ලබාදීමට සම්බන්ධවීම උදා : මීතොටමුල්ල කුණු කන්ද නැවත සංවර්ධන ව්‍යාපෘති
- ව්‍යාපෘති සමාජයට හෝ පරිසරයට හානියක් නොවන බව තහවුරු කිරීම සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර අදාල වෙනත් ව්‍යවස්ථාපිත ආයතන වලින් අදාල නිෂ්කාශණ / සහතික ලබාගැනීම

2019 වර්ෂය තුල "ලෝකය" යන සංරචකය සඳහා නා.සං.අ. විසින් ලබාදුන් දායකත්වය පහත ව්‍යාපෘති මගින් පෙන්නුම් කෙරේ.

1. බොරලැස්ගමුව වැව අවට ප්‍රදේශය සංවර්ධනය
2. බත්තරමුල්ල, ජපන් මිත්‍රත්ව පාරේ භූ ද රශන වැඩිදියුණු කිරීම
3. කැලිඩෝ වෙරල උද්‍යානය සංවර්ධනය

(c) ලාභය

පනතේ අරමුණු පරිදි නාගරික සංවර්ධන අධිකාරිය මහා භාණ්ඩාගාරයට බරක් නොවී පොදු ව්‍යවසායකයෙක් ලෙස එහි වියදම් සියවා ගනිමින් පවත්වාගෙන යාමස දහා සාධාරණ ලාභගයක් උපයා ගනු ලබයි. කුලිය, බදුකුලිය, ආයෝජන සහ අනෙකුත් ආදායම් (ගොඩනැගිලි සැලසුම් අනුමත කිරීම්, ඉඩම් අනුබෙදුම් සැලසුම් අනුමත කිරීම්, මූලික සැලසුම් නිශ්කාෂණ ලබාදීම, භාවිතය වෙනස් කිරීම) ආදීය අධිකාරියේ ප්‍රධාන ආදායම් මාර්ගය වේ. වර්ෂය සඳහා පවරා ඇති කාර්යය සපුරාලීම සඳහා එහි සියලු මැදිහත්වීම සලකා බැලීමෙන් පසු ලාභ ගණනය කරනු ලබයි.

- අධිකාරියේ ආදායම් මර්ග වැඩිදියුණු කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ ප්‍රකාශ නොකළ නාගරික ප්‍රදේශ, ප්‍රකාශිත ප්‍රදේශ ලෙස නම්කර අනාගත ආයෝජකයින් හරහා සංවර්ධනය කිරීම

- ආයතනික අභිප්‍රාය ප්‍රකාශය (SCI) සමග ක්ෂේත්‍රයේ අනෙකුත් රාජ්‍ය ව්‍යවසායන් හා තරග කිරීමට සහ වසරේ ලාභය සපුරාලීම සඳහා පුහුණු වැඩටසහන් කිහිපයක් බුද්ධි කලම්බන ආදිය පවත්වනු ලැබේ.

- අධිකාරියේ ලාභය උපරිම කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ දේපල සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා ව්‍යාපාර ආකෘති සකස් කිරීම
- නා.සං.අ සතු ඉඩම් සඳහා යෝජනා සකස් කිරීම සඳහ සුදුසු ආයෝජන මොඩියුල (PPP) හරහා තෙවන පාරිසරික පාරිසරයක් සමග විභවතා සහිත ව්‍යපෘති ආරම්භ කිරීම

- විවේක ව්‍යාපෘති සහ අනුබද්ධිත ආයතන හරහා මහජනයා හා නා.සං.අ සඳහා උපරිම ලාභයක් දෙනු ලබයි

වගකිවයුතු රාජ්‍ය ව්‍යවසායයෙකු ලෙස වසර තුල උපයාගත් සැලකිය යුතු ලාභය ආදාම් ප්‍රකාශය පහත පරිදි වේ.

	රු. මිලියන
<u>ආදායම්</u>	
කුලී පදනම් මත හා බදු පදනම් මත	2,581
ආයෝජන ආදායම	1,918
වෙනත් අදායම්	536
මුළු ආදායම	5,035
<u>අඩු</u>	
මුළු වියදම	(3,975)
වසරේ ලාභය	1060

2.8 නාගරික සංවර්ධන අධිකාරියේ අංශ

සභාපතිවරයා යටතේ පවතින අංශ

අභ්‍යන්තර විගණන අංශය

නාගරික සංවර්ධන අධිකාරියේ ක්‍රියාකාරකම්, මෙහෙයුම් මූල්‍ය පද්ධති සහ පාලන ක්‍රියාවලින් පිළිබඳ ස්වාධීන සහ පරමාර්ථ සමාලෝචන සහ තක්සේරු කිරීම් සඳහා අභ්‍යන්තර විගණන අංශය වගකීම දරයි. විගණන දෙපාර්තමේන්තුව එහි කාලීන සමාලෝචන වලින් සොයාගැනීම් ඉහල කළමනාකාරිත්වයට සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ විගණන කමිටුව වෙත ලබාදෙනු ලබයි. අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන කාර්යයන් වන්නේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටිවලට අනුකූලවීම නිර්ණය කිරීම, අභ්‍යන්තර පාලනවල ගුණාත්මකභාවය තක්සේරු කිරීම, අවදානම් කළමනාකරණයේ ගුණාත්මකභාවය තක්සේරු කිරීම සහ නීතිරීති සහ මාර්ගෝපදේශ වලට අනුකූල වීම ඇගයීමයි.

අධ්‍යක්ෂ ජනරාල් යටතේ පවතින අංශ

මධ්‍යම ආදායම් නිවාස අංශය

නිවාස අංශය ප්‍රධාන කාර්යය භාරය වන්නේ මධ්‍යම ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමයි. සුදුසු මධ්‍යම ආදායම්ලාභී නිවාස ව්‍යාපෘති සැකසීම සහ එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම වැනි කාර්යයන් මෙම අංශය විසින් ඉටු කරනු ලබයි. මෙම ව්‍යාපෘති වාණිජ පරමාර්ථයෙන් සිදු කරනු ලබයි.

නාගරික පුනර්ජීවන ව්‍යාපෘති අංශය

නාගරික අඩුපහසුකම් ලාභී ජනාවාස පදිංචිකරුවන් සඳහා නව නිවාස ඉදිකිරීම සහ නාගරික මධ්‍යස්ථාන වල ඌණ උපයෝගීතා ඉඩම් සංවර්ධන කටයුතු සඳහා නිදහස් කිරීම සඳහා නාගරික පුනර්ජීවන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ වගකීම වේ. නා.පු.ව්‍යා. අංශය විසින් නැවත ස්ථානගත කිරීමේ වැඩසටහන් සඳහා පහසුකම් සපයන අතර නැවත ස්ථානගත කිරීමේ නිවාස ව්‍යාපෘති ආරම්භයේ සිට පසු ක්‍රියාත්මක කිරීමේ අදියර දක්වා කළමනාකරණය කරනු ලබයි

තොරතුරු තාක්ෂණ පද්ධති අංශය

දෘඩාංක සහ මෘදුකාංග, ජාලකරණ සහ කළමණාකරන පද්ධති ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම ඇතුළුව මෙම අංශයේ තොරතුරු තාක්ෂණ පද්ධති කළමණාකරනයද හසුරවනු ලබයි. තවද මෙම අංශය නා.සං.අ. හි නිල වෙබ් අඩවිය සහ අනෙකුත් සමාජ මාධ්‍ය වේදිකාවල කළමනාකරණය සඳහා ද වගකීම් දරනු ලබයි

නීති අංශය

නාගරික සංවර්ධන අධිකාරියේ නෛතික අංශය ආයතනයට නීති උපදෙස් සහ මගපෙන්වීම අධිකරණයේ නඩු පැවරීම සහ ආරක්ෂා කිරීම සහනඩු කළමනාකරණය කිරීඹ සිදු කරයි. තවද ආයතනයේ නෛතික අයිතිවාසිකම් වල උපරිම ආරක්ෂාව මෙන්ම ආයතනයේ නීතිමය වගකීම් නිසි ලෙස ඉටු කිරීම සහතික කරන අතරම නීතිමය ලියකියවිලි කෙටුම්පත් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා දායක වේ.

ආයතනික උපායමාර්ගික අංශය

ආයතනික උපායමාර්ග අංශය ආයතනික මෙහෙයුම් සඳහා වගකිව යුතු අය සමීක්ෂණය කරමින් අභියෝග සහ අරමුණු පිලිබඳ තොරතුරු රැස් කරනු ලබයි. එය පුද්ගල උපායමාර්ගික අරමුණ සමස්ථ ප්‍රවේශයක් බවට ඒකාබද්ධ කරන අතර, ඊට අදාල අංශ මගින් ප්‍රතිපොෂණය ද ලබාගනු ලබයි. අංශ ප්‍රධානීන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු සම්පාදනය කර අවසාන උපායමාර්ගික සැලැස්ම සකස් කර සංස්කරණය කරනු ලබයි. ඊට අමතරව, ආයතනික සැලැස්ම හරහා ප්‍රධාන කාර්ය සාධන දර්ශකයේ (KPI) ප්‍රගති අධීක්ෂණය ස්ථාපිත කරන ලදී

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) යටතේ පවතින අංශ

නාගරික සංවර්ධන අධිකාරියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(සැලසුම්) විසින් සැලසුම් සහ බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම් සෘජුව අධීක්ෂණය හා මෙහෙයවනු ලැබේ. නි.අ.ජ.(සැලසුම්) ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන අංශ 04 ක් සහ පළාත් කාර්යාල ඇත.

කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය

කොළඹ මහ නාගරික ප්‍රදේශ අංශය විසින් මීට පෙර හැදින්වූයේ බලාත්මක අංශය ලෙසිනි. එය 2019 දී එහි නව නාමයෙන් ස්ථාපිත කරන ලද අතර එය කොළඹ මෙට්‍රෝ

කලාපයේ තෝරාගත් පළාත් පාලන ප්‍රදේශ වල සංවර්ධනය කළමනාකරණය කිරීමේ වගකීම දරණ ප්‍රධාන අංශය වේ. කොා.ම.නා.ප්‍ර අංශය තෝරාගත් පළාත් පාලන ප්‍රදේශ වල අදාල සැලසුම් සකස් කිරීම බලාත්මක කිරීම සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කරනු ලබයි

උපායමාර්ගික සැලසුම් අංශය

සංවර්ධන සැලසුම් සකස් කිරීම සම්බන්ධයෙන් අධිකාරිය විසින් අනුගමනය කරනු ලබන පොදු මාර්ගෝපදේශ හා ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කිරීම සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීඹ උපායමාර්ගික සැලසුම් අංශයේ කාර්යභාරය වේ. අදාල පළාත් කාර්යාල මගින් සකස් කරන ලද සංවර්ධන සැලසුම් ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සඳහා උපායමාර්ගික සැලසුම් අංශය අඛණ්ඩ ප්‍රගති රැස්වීම් පවත්වනු ලබයි. තවද, උපායමාර්ගික සැලසුම් අංශය විසින් සංවර්ධන සැලසුම් සකස් කිරීමේ කටයුතු සඳහා පහසුකම් සැලසීම සඳහා සැලසුම් ක්‍රියාවලියේ අවශ්‍ය අවදින්හි දී අදාල වැඩමුළුද සංවිධානය කරයි. සැලසුම් සැකසීමේ ක්‍රියාවලියේ විවිධ අවධින්හි දී අදාල පළාත් කාර්යාල මගින් සිදු කරනු ලබන පාර්ශවකරුවන්ගේ රැස්වීම් සඳහා උපායමාර්ගික සැලසුම් අංශයද සහභාගී වී පහසුකම් සපයනු ලබයි.

මීට අමරතව සකස් කරන ලද සංවර්ධන සැලසුම් ගැසට් නිවේදන මගින් ප්‍රකාශයට පත් කිරීමට උපායමාර්ගික සැලසුම් අංශය පහසුකම් සපයයි. 1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරියේ විධිවිධාන අනුව නාගරික සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශ කිරීමටද අදාල කටයුතු සම්බන්ධීකරණය කිරීමේ වගකීමද උපායමාර්ගික සැලසුම් අංශය සතුවේ. එය නාගරික සංවර්ධන අධිකාරයේ ප්‍රධාන සැලසුම් කමිටුවට සත්කාරකත්වය සැපයීමේ වගකීමද දරණ ප්‍රධාන අංශය වේ.

පර්යේෂණ සහ සංවර්ධන අංශය (R & D)

නා.සං.අ. හි සැලසුම්, බලාත්මක කිරීම සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සඳහා නව්‍ය මෙවලම් සහ තාක්ෂණයන් ගවේෂණය කිරීම පර්යේෂණ සහ සංවර්ධන අංශයේ කාර්යභාරය වේ. පර්යේෂණ සහ සංවර්ධන අංශය විශේෂයෙන් අවධානය යොමු කරනුයේ නවීන සැලසුම් න්‍යායන්, මෙවලම්, ආකෘති සහ තාක්ෂණයන් පර්යේෂණ හරහා හඳුන්වා දීම සහ සැලසුම් අභ්‍යාස තුළ සැබෑ අවස්ථාවන්හිදී ඒවායේ අදාළත්වය පරීක්ෂා කිරීම කෙරෙහි ය. නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද සැලසුම් ක්‍රියාවලිය සහ සංවර්ධන සැලසුම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම මෙහි අරමුණයි.

තවද, පර්යේෂණ සහ සංවර්ධන අංශය අවශ්‍ය පර්යේෂණ සහ නව්‍ය තාක්ෂණය පදනම් කරගත් වර්ධනයන් සමඟ බලාත්මක කිරීමේ යාන්ත්‍රණයන්හි වැඩිදියුණු කිරීම් සඳහා පහසුකම් සපයයි. නාගරික සංවර්ධන අධිකාරියේ අදාළ අංශ සමඟ සහයෝගයෙන්

තෝරාගත් අවස්ථා සඳහා ව්‍යාපෘති සැලසුම් කිරීම, සැලසුම් කිරීම සහ සකස් කිරීම පර්යේෂණ සහ සංවර්ධන අංශය භාර ගනී.

මීට අමතරව, UDA හි වෘත්තීය කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා සංවර්ධන සහ පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම සඳහා R&D අංශය වගකීම දරයි. එසේම, විද්වතුන්, වෘත්තිකයන්, උනන්දුවක් දක්වන කණ්ඩායම් සහ දේශීය හා ජාත්‍යන්තර සංවිධාන සමඟ සහයෝගීතාවයන් ආරම්භ කිරීම පර්යේෂණ සහ සංවර්ධන අංශයේ කාර්යභාරය වේ.

භූගෝලීය තොරතුරු පද්ධති අංශය (GIS)

භූගෝලීය තොරතුරු පද්ධති පිළිබඳ විශේෂිත වූ මෙම අංශය නා.සං.අ. හි ප්‍රධාන සැලසුම් ආධාරක අංශයකි

එහි ප්‍රධාන කාර්ය භාරයක් වන්නේ නාගරික සංවර්ධන අධිකාරිය තුළ වැඩ සැලසුම් කිරීම සඳහා අවශ්‍ය දත්ත රැස් කිරීම, සකස් කිරීම, සැකසීම සහ බෙදා හැරීම සිදු කිරීමයි. විශේෂයෙන්, ඔවුන් නා.සං.අ. හි භූ-අවකාශීය දත්ත ගබඩාව කළමනාකරණය කරන අතර අවශ්‍ය තාක්ෂණික සහාය සමඟ අදාළ පළාත් කාර්යාලවලට සහාය වේ. මීට අමතරව, භූ.තො.ප. අංශය විශාල ප්‍රමාණයේ සිතියම් සැකසීමට පහසුකම් සපයයි. තොග මුද්‍රණය හසුරුවන නා.සං.අ. හි මුද්‍රණ ඒකකයද මෙම අංශය යටතේ ක්‍රියාත්මක වේ.

පළාත් කාර්යාල

නා.සං.අ හි පළාත් කාර්යාල ශ්‍රී ලංකාවේ පළාත් නවයේම පිහිටුවා ඇත. සෑම පළාත් කාර්යාලයක්ම අදාළ පළාත් අධ්‍යක්ෂවරයා විසින් මෙහෙයවනු ලබන අතර ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය තුළ පළාත් අධ්‍යක්ෂවරුන් නව දෙනෙකු සිටී. මීට අමතරව, පළාත් රාජකාරී පහසුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා සමහර පළාත් කාර්යාල යටතේ ස්ථාපිත දිස්ත්‍රික් කාර්යාල 12ක් ඇත.

තම පළාත් තුළ ප්‍රකාශිත නාගරික සංවර්ධන ප්‍රදේශ තුළ සමස්ත සංවර්ධන කටයුතු සඳහා පළාත් කාර්යාල වගකිව යුතුය. මෙම පළාත් කාර්යාල මෙම ප්‍රකාශිත ප්‍රදේශ තුළ සියලුම සැලසුම්, බලාත්මක සහ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සිදු කරයි. තවද, විශේෂ ව්‍යාපෘති සහ සැලසුම් අරමුණු සඳහා උප කාර්යාල කිහිපයක් පිහිටුවා ඇති අතර ඒවා අදාළ පළාත් අධ්‍යක්ෂවරුන් යටතේ ක්‍රියාත්මක වේ.

නාගරික සංවර්ධන අධිකාරියේ පළාත් කාර්යාල හා උප කාර්යාල



අපි ක්‍රියාකාරීව සිටිනුයේ



Ⓟ පළාත් කාර්යාල

Ⓓ දිස්ත්‍රික් කාර්යාලය

Ⓢ උප කාර්යාල

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්(ව්‍යාපෘති කළමනාකරණ) යටතේ පවතින අංශ

ව්‍යාපෘති කළමනාකරණ අංශය

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (ව්‍යාපෘති කළමනාකරණ) යටතේ ව්‍යාපෘති කලමණාකරණ බස්නාහිර කලාපය **(RI)** ව්‍යාපෘති කළමනාකරණ දකුණු කලාපය **(RII)** සහ ව්‍යාපෘති කළමනාකරණ උතුරු කලාපය **(RIII)** යන අංශ 03 ක් ඇත. ඊට අමතරව නි.අ.ජ (ව්‍යාපෘති කළමනාකරණ) යටතේ ප්‍රගති අධීක්ෂණ සහ ප්‍රසම්පාදන ඒකකය ක්‍රියාත්මක වේ.

දිවයින පුරා සකස් කරන ලද සංවර්ධන සැලසුම් මගින් හඳුනාගත් භාණ්ඩාගාර අරමුදල් ලබා ගන්නා ව්‍යාපෘති නි.අ.ජ (ව්‍යා.ක.) යටතේ ඉහත අංශ තුන මගින් සිදු කරනු ලැබේ. ඊට අමතරව, නා.සං.අ. හි ස්වකීය අරමුදල් සහ සේවාලාභී අරමුදල් සහිත ව්‍යාපෘති යටතේ හඳුනාගෙන ඇති බොහෝ ව්‍යාපෘතිද නි.අ.ජ.(ව්‍යා.ක.) යටතේ ඇති අංශ තුන විසින් සිදු කරනු ලැබේ. දිවයින පුරා ඇති ව්‍යාපෘති එම අංශ 03 ට පහත පරිදි පවරා ඇත.

බස්නාහිර කලාපීය ව්‍යාපෘති කළමනාකරණ අංශය (RI)

බස්නාහිර පළාතේ භාණ්ඩාගාර අරමුදල් ප්‍රතිපාදන යටතේ සියලුම ව්‍යාපෘති මෙම අංශය විසින් භාර ගනු ලබයි. ඊට අමතරව, නාගරික සංවර්ධන අධිකාරිය විසින් ම අරමුදල් සපයන ව්‍යාපෘති සහ බස්නාහිර පළාතේ තෝරාගත් උපදේශන ව්‍යාපෘති කිහිපයක් ද මෙම අංශය මගින් සිදු කරනු ලබයි

දකුණු කලාපීය ව්‍යාපෘති කළමනාකරණ අංශය (RII)

මෙම අංශය දකුණු නැගෙනහිර සබරගමුව නහ ඌව පලාත්වල භාණ්ඩගාර අරමුදල් ප්‍රතිපාදන යටතේ ඇති සියලුම ව්‍යාපෘති භාර ගනු ලබයි. ඊට අමතරව නා.සං.අ. විසින්ම අරමුදල් සපයන ව්‍යාපෘති සහ තෝරාගත් පළාත් පාලන උපදේශන ව්‍යපෘතිද මෙම අංශය මගිනි ඉහත පළාත් 04 තුල සිදුකරනු ලැබේ.

උතුරු කලාපයේ ව්‍යාපෘති කළමනාකරණ අංශය (RIII)

උතුරු, වයඹ මධ්‍යම සහ උතුරු මැද පළාත්වල භාණ්ඩාගාර අරමුදල් ප්‍රතිපාදන යටතේ සියලුම ව්‍යාපෘති මෙම අංශය භාරගනු ලබයි. ඊට අමතරව නාගරික සංවර්ධන අධිකාරිය විසින් ම අරමුදල් සපයන ව්‍යාපෘති සහ තෝරාගත් පළාත් පාලන ආයතන උපදේශන ව්‍යාපෘති ද මෙම අංශය මගින් ඉහත පළාත් 04 තුල සිදු කරනු ලබයි.

ඉංජිනේරු සේවා අංශය

නාගරික සංවර්ධන අධිකාරි පරිශ්‍රයේ සහ සෙත්සිරිපාය 1 අදියර ගොඩනැගිල්ලේ ඉංජිනේරු සේවා අවශ්‍යතා අලුත්වැඩියාව, පානීය ජලය, විදුලිය, වායු සමීකරණ සහ ගිනි ආරක්ෂණ නඩත්තු හා සේවා අවශ්‍යතා සඳහා සහභාගීවීම මෙම අංශයේ වගකීම වේ. ඊට අමතරව කුඩා හා මධ්‍යම පරිමාණ සංවර්ධන ව්‍යාපෘති සඳහා සිවිල් හා ව්‍යුහාත්මක ඉංජිනේරු සේවා සිදු කරනු ලැබුයේද මෙම අංශය විසිනි. නිවාස ව්‍යාපෘති, දිස්ත්‍රික් හාඋප කාර්යාල, වෙළඳ සංකීර්ණ, භූ දර්ශන ප්‍රදේශ සහ උද්‍යාන ආශ්‍රිත නඩතුත් කටයුතු සිදු කරනු ලබයි

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (උපදේශන) යටතේ පවතින අංශ

ව්‍යාපෘති උපදේශක ඉංජිනේරු අංශය

පහත සඳහන් පිදි ව්‍යාපෘති උපදේශන ඉංජිනේරු අංශය යටතේ අංශ 02 ක් ක්‍රියාත්මක වේ. නා.සං.අ. හි උපදේශන අංශයේ කාර්යභාරය වන්නේ නා.සං.අ. ව්‍යාපෘති සඳහා අභ්‍යන්තරව සහ වෙනත් රාජ්‍ය ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සඳහා බාහිරව ව්‍යාපෘති උපදේශන සේවා සැපයීමයි.

ඉංජිනේරු උපදේශන අංශය

ව්‍යුහාත්මක සැලසුම්, විස්තර ඇඳීම්, සමාලෝචන, ධාරිතා තක්සේරු කිරීම්, ස්ථාන පරීක්ෂා කිරීම්, ලේඛන අනුමත කිරීම් සහ පූර්ව ටෙන්ඩර් පිළිබඳ ඉංජිනේරු ඇස්තමේනුත පිරිවැය

උපදෙස්කොන්ත්‍රාත්තු විචලනය පරීක්ෂා කිරීම, සහ නා.සං.අ. විසින් අභ්‍යන්තරව සහ බාහිරව වෙනත් රජයේ ආයතන ක්‍රියාත්මක කරන ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාදීමේ වගකිව යුතු අංශය මෙය වේ.

සැලසුම් ව්‍යාපෘති කළමනාකරණය සහ උපදේශනය (DPM සහ C)

නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලබන විශේෂ ව්‍යාපෘතිවල වාස්තු විද්‍යාත්මක උපදේශන ලබාදීඹ ප්‍රධාන වශයෙන් සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘති දිවයින පුරා ක්‍රියාත්මක වන අතර, ප්‍රධාන වශයෙන් ජාතික වැදගත් කමක් ඇති ව්‍යාපෘති සම්බන්ධීකරණය සඳහා ඉංජිනේරු උපදේශකවරුන්, ව්‍යුහාත්මක සහ කාර්මික ඉංජිනේරුවරුන් ඇදී ව්‍යාපෘති ප්‍රවීනකයන්ගේ දැනුම අවශ්‍ය වේ.

පරිසර සහ භූ දර්ශන අංශය

නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද පාරිසරික හා භූ දර්ශන සංවර්ධන ව්‍යාපෘති නිර්මාණය කිරීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා වගකිව යුතු අංශය මෙය වේ. මීට අමතරව, බාහිර පාර්ශවයන් විසින් ක්‍රියාත්මක කරනු ලබන පරිසරය සහ භූ දර්ශන සැලසුම් ආශ්‍රිත ව්‍යාපෘති සම්බන්ධ උපදේශන සේවාද මෙම අංශය මගින් සපයයි. මීට අමතරව, සැලසුම් සහ ගොඩනැගිලි නියාමනය සඳහා හරිත ගොඩනැගිලි සංකල්පය ක්‍රියාත්මක කිරීම ද පරිසර හා භූ දර්ශන අංශය මගින් සිදු කරනු ලබයි.

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (දේපල සහ ඉඩම් කළමනාකරණය) යටතේ පවතින අංශ

ඉඩම් සංවර්ධන සහ කළමනාකරණ අංශය

ඉඩම් සංවර්ධන සහ කළමනාකරණ අංශයේ කාර්යභාරය වන්නේ ප්‍රකාශිත නාගරික සංවර්ධන ප්‍රදේශ තුළ පිහිටි හඳුනාගත් ඉඩම් අත්පත් කර ගැනීම, පවරාදීම සහ මිලදී ගැනීම, යෝජිත සංවර්ධන ව්‍යාපෘති සහ හඳුනාගත් ව්‍යාපෘති සඳහා එම ඉඩම් අන්සතු කිරීම සහ සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් බලපෑමට ලක් වූ පාර්ශ්වයන් නැවත පදිංචි කිරීමේ පහසුකම් සැපයීමයි.

ව්‍යාපාර ප්‍රවර්ධන අංශය

නාගරික සංවර්ධන අධිකාරියේ දේපල හා සංවර්ධන ව්‍යාපෘති සඳහා ව්‍යාපාර ආකෘති සකස් කර අධිකාරියේ ලාභය උපරිම කිරීම.

දේපල හා වත්කම් කළමනාකරණ අංශය

දේපල සහ වත්කම් කළමනාකරණ අංශයේ කාර්යභාරය වනුයේ UDA සතු ඉඩම් සඳහා ව්‍යාපෘති යෝජනා සකස් කිරීම සහ සුදුසු ආයෝජන ආකෘති හරහා තෙවන පාර්ශවයන් සමඟ සංවර්ධන විභවත පවතින ව්‍යාපෘති හා සම්බන්ධ වීමයි

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (මුදල් සහ පරිපාලන) යටතේ පවතින අංශ

මුදල් අංශය

අධිකාරියේ මූල්‍ය කටයුතුවල කාර්යක්ෂමතාව සහ ඵලදායී කළමනාකරණය පිළිබඳ වගකීම මෙම අංශය සතු වේ. ඉහත සඳහන් කාර්යය ඉටු කිරීම සඳහා, මූල්‍ය අංශය අධිකාරියේ වාර්ෂික/මාසික ගිණුම් සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම, UDA වාර්ෂික අයවැය සකස් කිරීම සහ සංශෝධනය කිරීම, නව ව්‍යාපෘති/ව්‍යාපාර සඳහා මූල්‍ය සැලසුම්කරණය, ව්‍යාපෘති ඇගයීම, බාහිර අරමුදල් මූලාශ්‍ර සැකසීම සහ ආයෝජන කළඹ ඵලදායී කළමනාකරණයවැනි බොහෝ කාර්යයන් සිදු කරයි.

මානව සම්පත් කළමනාකරණ සහ පරිපාලන අංශය

අධිකාරියේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා නව බඳවා ගැනීම්, පුහුණුව, උසස්වීම් සහ අනෙකුත් සියලුම මානව සම්පත් කළමනාකරණ කටයුතු සඳහා මෙම අංශය වගකිම දරයි. තවද අධිකාරියේ සාමාන්‍ය පරිපාලනය සහ ප්‍රවාහන පහසුකම් කළමනාකරණය කරමින් සේවකයන්ගේ කාර්යක්ෂමතාවය අගයමින් අධිකාරියේ මානව සම්පත්වල විනය පවත්වාගෙන යාම ද අංශය මගින් සිදු කෙරේ.

වත්කම් හා දේපල කළමණාකරන අංශය

අධිකාරියේ දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා නව බඳවා ගැනීම්, පුහුණුව, උසස්වීම් සහ අනෙකුත් සියලුම මානව සම්පත් කළමනාකරණ කටයුතු සඳහා මෙම අංශය වගකිම දරයි. තවද අධිකාරියේ සාමාන්‍ය පරිපාලනය සහ ප්‍රවාහන පහසුකම් කළමනාකරණය කරමින් සේවකයන්ගේ කාර්යක්ෂමතාවය අගයමින් අධිකාරියේ මානව සම්පත්වල විනය පවත්වාගෙන යාම ද අංශය මගින් සිදු කෙරේ.

2.9 අපගේ අනුබද්ධ සමාගම්

නාගරික ආයෝජන සහ සංවර්ධන පුද්ගලික සමාගම (UNIDEP)

මෙම සමාගම 2006 අගෝස්තු මාසයේදී නාගරික සංවර්ධන අධිකාරියේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් ලෙස ආරම්භ කරන ලදී. ආයතනය පිහිටුවීමේ පරමාර්ථය වන්නේ අධිකාරිය විසින් සෘජුව හාර ගනු ලබන නාගරික ප්‍රදේශවල ඕනෑම ආකාරයක සංවර්ධන ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීම, ගොඩනැගීම සහ ක්‍රියාත්මක කිරීමයි. මේ වන විට කාර්ය මණ්ඩල සාමාජිකයින් 11 දෙනෙකු සමඟින් UNIDEP ආයතනය අමාත්‍යාංශ, රජයේ දෙපාර්තමේන්තු සහ සංවිධාන කිහිපයකට පහසුකම් සපයන සෙත්සිරිපාය II අදියර ගොඩනැගිල්ල සහ ඒ අවට ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය පිළිබඳ වගකීම් දරනු ලබයි.

මෙම ගොඩනැගිල්ල මහල් 13 කින් (බිම් මහල +12 මහල්) සමන්විත වන අතර දළ වශයෙන් වර්ග අඩි 368,084 ක වපසරියකින් යුක්ත වේ. UNIDEP නාගරික සංවර්ධන අධිකාරියට පූර්ණ අනුබද්ධිත ආයතනයක් ලෙස ස්ථාපිත කර ඇති අතර ස්වාධීන අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් කළමනාකරණය කරනු ලබන ස්වාධීන ආයතනයක් ලෙස මෙහෙයුම් සිදු කරනු ලබයි. එමෙන්ම ආර්ථිකමය, කාර්යක්ෂම හා ඵලදායී ලෙස දේපල කළමනාකරණය කිරීම සඳහා පත් කරන ලද කැපවූ කාර්ය මණ්ඩලයක් ද වේ.

වෝටර්ස් එජ් පුද්ගලික සමාගම (වෝටර්ස් එජ් හෝටලය)

වෝටර්ස් එජ් ලිමිටඩ් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවක ප්‍රතිඵලයක් ලෙස UDA වෙත පැවරී ඇති අතර දේපල කළමනාකරණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා අධිකාරියේ පූර්ණ අනුබද්ධිත ආයතනයක් ලෙස 2009 පෙබරවාරි මාසයේදී සංස්ථාගත කරන ලදී. වර්තමානයේ වෝටර්ස් එජ් හි හෝටලයක් සහ ආපන ශාලාවක් සහ විවේකය සහ විනෝදාස්වාද කටයුතු සඳහා තවත් පහසුකම් කිහිපයක් ස්ථාපිත කර ඇත. එය රාජ්‍ය හා පෞද්ගලික ව්‍යවසායන් සමඟ සහයෝගයෙන් සිය ක්‍රියාකාරකම් පුළුල් කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටියි.





සීමාසහිත ලංකා රෙස්ට් හවුස්

ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් 2006 ජුනි මාසයේදී යූඩීඒ රෙස්ට් හවුස් ලිමිටඩ් නමින් ආරම්භ කරන ලද අතර දැනට පවතින නම 2010 නොවැම්බර් මස කළමනාකාරීත්ව මණ්ඩල තීරණයක් මගින් ලබා දෙන ලදී. සමාගමේ ප්‍රධාන අරමුණ වනුයේ විශේෂයෙන්ම රාජකාරියේ යෙදී සිටින රජයේ සේවකයන්ට නිවාඩු දිනවලද දැරිය හැකි මිලකටමෙන්ම ආරක්ෂිත, සුවපහසු සහ ගෞරවනීය විවේකයක් සහ නවාතැන් සැපයීමයි.

එම අරමුණ ඉටුකිරීමේදී ලංකා රෙස්ට් හවුස් සමාගම දිවයින පුරා උපාය මාර්ගික ස්ථානවල ඉදිකර ඇති තානායම් 31ක් පරිපාලනය කරයි. ඉහත කී තානායම් අතර, තානායම් 29 ක් ටෙන්ඩර් මගින් තෝරාගෙන ඇති තුන්වන පාර්ශ්වයන් විසින් කළමනාකරණය කරනු ලැබේ. ඉතිරි නිවාස 02; මහියංගන සහ වලිගම තානායම් සෘජුවම කළමනාකරණය කරනු ලබන්නේ සමාගම විසිනි.ඇති තුන්වන පාර්ශ්වයන් විසින් කළමනාකරණය කරනු ලැබේ. ඉතිරි නිවාස 02; මහියංගන සහ වලිගම තානායම් සෘජුවම කළමනාකරණය කරනු ලබන්නේ සමාගම විසිනි.











අපගේ ආශ්‍රිත සමාගම්

ඕෂන් වීව් ඩිවලෝප්මන්ට් පුද්. සමාගම



අංක 94/340/006 දරන කැබිනට් පත්‍රිකාවට ප්‍රතිචාර වශයෙන් 1994.02.17 දිනැති කැබිනට් තීරණයට අනුව, එම සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලදී. සමාගමේ කොටස් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ නාගරික සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව හිමි වේ. නාගරික සංවර්ධන අධිකාරියේ කොටස් සංයුතිය සමාගමේ 43.39% කි.

ඔනලී හොල්ඩින්ස් පුද්. සමාගම

On'ally Holdings PLC

ඔනලී හොල්ඩින්ස් පුද්. සමාගම මූලික වශයෙන් ශ්‍රී ලංකාවේ දේපල සංවර්ධන/නිශ්චල දේපල සංවර්ධන ව්‍යාපාරයේ නිරත වේ. වාණිජ ඒකක වලින් සමන්විත ආයෝජන දේපල කුලියට ගැනීම සඳහා සමාගම සම්බන්ධ වේ. සමාගම 1982 දී ආරම්භ කරන ලද අතර එය ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටා ඇත. නාගරික සංවර්ධන අධිකාරියේ කොටස් සංයුතිය සමාගමේ 47.617% කි.

---------මෙම පිටුව හිතාමතාම හිස්ව තබා ඇත-------

වසරේ විශේෂ අවස්ථා



---------මෙම පිටුව හිතාමතාම හිස්ව තබා ඇත-------

නාගරික සංවර්ධන අධිකාරිය

2019 වර්ෂයේ සාරාංශය

1,670 +

සේවකයින්

15,000 +

බලාත්මක කිරීම්

36

දේශීය පුහුණු

17

විදේශ පුහුණු
වැඩසටහන්

නිකුත් කල

6,850 +

සංවර්ධන බලපත්‍ර

නිකුත් කල

6,250 +

මූලික සැලසුම් නිරාකරණ අනුමැතින්

නිකුත් කල

520 +

අනුකූලතා සහතික

4,740+

නාගරික පුනර්ජනන
නිවාස ඒකක

29

ගැසට් කළ සංවර්ධන
සැලසුම්

4,937 මිලියන

වටිනා ව්‍යාපෘති-2019



Source: Finance Division of UDA

මුළු අදායම (R)
මිලියන **5051**

මුළු වියදම (C)
මිලියන **3965**

ලාබය (P)
මිලියන **1086**

---------- මෙම පිටුව හිනාමනාම හිස්ව තබා ඇත----------



වසරේ විශේෂ අවස්ථා

3.1 පලාත් කාර්යාල ක්‍රියාකාරිත්වය

3.1.1ප්‍රධාන කාර්යාලයේ අනෙකුත් අංශ වල ක්‍රියාකාරිත්වය

3.1.2 සැලසුම් කිරීම

3.1.3ව්‍යාපෘති

3.1.3 උපදේශන විශේෂතා

3.1.4 බලාත්මක කිරීම්

3.1.5 සමාජ වැඩ සහ වෙනත් ජයග්‍රහණ

----------මෙම පිටුව හිතාමතාම හිස්ව තබා ඇත----------

3.1 පළාත් කාර්යාල කාර්ය සාධන විශේෂ අවස්ථා - 2019

බස්නාහිර පළාත් කාර්යාල

- බස්නාහිර පළාත් අංශය සහ කොා.ම. නා. අ. /බලාත්මක කිරීමේ අංශය
- ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය
- කළුතර දිස්ත්‍රික් කාර්යාලය

"ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ වාණිජ හදවතේ ප්‍රධාන සංවර්ධන ප්‍රවර්ධන සහ නියාමන ආයතනය. දිස්ත්‍රික්ක තුනක් කාර්යාල තුනකින් සමන්විත වේ. කොළඹ දිස්ත්‍රික්කයේ නම් කොට්ඨාශ දෙකක්; බස්නාහිර පළාත් අංශය සහ බලාත්මක කිරීමේ/CMR අංශය ප්‍රධාන නියාමන ආයතන දෙක ලෙස ක්‍රියා කරන අතර ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය සහ කළුතර දිස්ත්‍රික් කාර්යාලය බස්නාහිර පළාතේ අනෙකුත් දිස්ත්‍රික් කාර්යාල ලෙස ක්‍රියා කරයි. තවද, ප්‍රධාන කාර්යාලයේ බස්නාහිර පළාත් අංශය බස්නාහිර පළාතේ පළාත් කාර්යාලය වේ"



2019 විශේෂ අවස්ථා

කොළඹ

බස්නාහිර පළාත් අංශය

9 වන මහල ,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල
+94 11 2863101



ප්‍රධාන කාර්යයන්

අවකාශීය සැලසුම් සකස් කිරීම

බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම්

ව්‍යාපෘති සැලසුම් හා ක්‍රියාත්මක කිරීම්

මානව සම්පත් කළමනාකරණය



සැලසුම්

10.3 %

සංවර්ධ සැලුසම් දායකත්වය

බලාත්මක කිරීම්

8.2 %

සියළුම වාර්ගයේ සම්පූර්ණ කරන ලද ගොනු

ව්‍යාපෘති

2019 ආරම්භ කරන ලද

මිලියන **74.5**

වටිනා ව්‍යාපෘති

අවසන් කල ව්‍යාපෘති ගණන : **12**

මානව සම්පත්

කළමනාකරණ මට්ටම	එකතුව
ජ්‍යෙෂ්ඨ	1
මධ්‍යම	17
කණිෂ්ඨ	2
කළ.ස.(තාක්ෂණික)	1
කළ.තා.නොවන	11
ප්‍රාථමික	15

2019 විශේෂ අවස්ථා

කොළඹ
බලාත්මක අංශය
කොා. ම. නා. ප්‍ර. අංශය



ප්‍රධාන කාර්යයන්

බලාත්මක කිරීමේ ක්‍රියාකාරකම්

අවකාශීය සැලසුම් සකස් කිරීම

සැලසුම් උප කමිටු

රථවාහන බලපෑම තක්සේරුව

පාරිසරික බලපෑම් තක්සේරුව

සැලසුම්

0 %

සංවර්ධ සැලුසම් දායකත්වය

බලාත්මක කිරීම්

17.2 %

සියළුම වාර්ගයේ සම්පූර්ණ කරන ලද ගොනු

2019

රෙගුලාසි

50%

යාවත්කාලීන කරන ලද පොදු රෙගුලාසි

FAR ගණනය කිරීමට නව ක්‍රමයක් හඳුන්වා දීම

මානව සම්පත්

කළමනාකරණ මට්ටම	එකතුව
ජ්‍යෙෂ්ඨ	1
මධ්‍යම	4
කණිෂ්ඨ	14
කළ.ස.(තාක්ෂණික)	1
කළ. ස.(තා. නොවන)	16
ප්‍රාථමික	20

2019 විශේෂ අවස්ථා

ගම්පහ

බස්නාහිර පළාත

නො.6
මේරි බිසෝ මාවත
ගම්පහ
+94 33 2221934



ප්‍රධාන කාර්යයන්

අවකාශීය සැලසුම් සකස් කිරීම

බලාත්මක ක්‍රියාකාරකම්

ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම

සැලසුම්

10.3 %

සංවර්ධන සැලසුම් දායකත්වය

බලාත්මක කිරීම්

15.9 %

සියලුම වර්ගයේ සැලසුම් කරන ලද ගොනු

2019

ව්‍යාපෘති

2019 ආරම්භ කරන ලද

මිලියන **76.8**

වටිනා ව්‍යාපෘති

අවසන් කල ව්‍යාපෘති ගණන : **05**

මානව සම්පත්

කළමනාකරණ මට්ටම	එකතුව
ජ්‍යෙෂ්ඨ	1
මධ්‍යම	11
කණිෂ්ඨ	8
කළ.ස.(තාක්ෂණික)	4
කළ. ස.(තා. නොවන)	7
ප්‍රාථමික	7

2019 විශේෂ අවස්ථා

කළුතර දිස්ත්‍රික් කාර්යාලය

බස්නාහිර පළාත

326/2,
ගාලු පාර
කළුතර දකුණ .
+94 34 2223595



ප්‍රධාන කාර්යයන්

අවකාශීය සැලසුම් සකස් කිරීම

බලාත්මක කිරීම්

ව්‍යාපෘති සැලසුම් හා ක්‍රියාත්මක කිරීම්



2019 ආරම්භ කරන ලද

මිලියන **32.36**

වටිනා ව්‍යාපෘති

අවසන් කල ව්‍යාපෘති ගණන : **06**

කළමනාකරණ මට්ටම	එකතුව
ජ්‍යෙෂ්ඨ	1
මධ්‍යම	10
කණිෂ්ඨ	5
කළ.ස.(තාක්ෂණික)	1
කළ. ස.(තා. නොවන)	11
ප්‍රාථමික	3

මධ්‍යම පළාත

මධ්‍යම පළාත් කාර්යාල

- **මහනුවර පළාත් කාර්යාලය**
- නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය
- මාතලේ දිස්ත්‍රික් කාර්යාලය

“මධ්‍යම කඳුකරයේ ප්‍රධාන සංවර්ධන ප්‍රවර්ධන සහ නියාමන ආයතනය ලෙස නාගරික සංවර්ධන අධිකාරියේ මධ්‍යම පළාත් කාර්යාලය හැඳින්වේ. මධ්‍යම ම පළාතේ කාර්යාල තුනක් ඇති අතර ඉන් පළාත් කාර්යාලය ලෙස ක්‍රිය කරනුයේ මහනුවර කාර්යාලයයි. ඊට අමතරව නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය සහ මාතලේ දිස්ත්‍රිත් කාර්යාලය මධ්‍යම පළාතේ දිස්ත්‍රික්කය කාර්යාල ලෙස පිහිටා ඇත”



2019 විශේෂ අවස්ථා

මහනුවර පළාත් කාර්යාලය

මධ්‍යම පළාත

කොා. 18,
කැප්පෙටිපොල
මාවත, මහනුවර
+94 81 2223898



ප්‍රධාන කාර්යයන්

අවකාශීය සැලසුම් සකස් කිරීම

බලාත්මක කිරීම්

ව්‍යාපති සැලසුම් හා ක්‍රියාත්මක කිරීම්

ඉඩම් කළමනාකරණ

නීති ක්‍රියාකාරකම්

මානව සම්පත් කලමණාකරණ



සැලසුම්

3.4 %

සංවර්ධන සැලසුම් දායකත්වය

බලාත්මක කිරීම්

5.1 %

සියලුම ආකාරයේ සම්පූර්ණ කරන ලද ගොනු

ව්‍යාපෘති

2019 ආරම්භ කරන ලද

මිලියන **32.29**

වටිනා ව්‍යාපෘති

ආරම්භ කරන ලද ව්‍යාපෘති : **04**
අවසන් කල ව්‍යාපෘති ගණන : **06**
2018 ආරම්භ කරන ලද ව්‍යාපෘති :13

මානව සම්පත්

කළමනාකරණ මට්ටම	එකතුව
ජ්‍යෙෂ්ඨ	1
මධ්‍යම	21
කණිෂ්ඨ	4
කළ.ස.(තාක්ෂණික)	9
කළ.ස.(තා.නොවන)	21
ප්‍රාථමික	5

2019 විශේෂ අවස්ථා

නුවරඑළිය දිස්ත්‍රික් කාර්යාලය

මධ්‍යම පලාත

2 වන මහල ක්වීන් එලිසබත් වෙළඳ සංකීර්ණය ,
නුවරඑළිය .
+94 52 2223664



ප්‍රධාන කාර්යයන්

අවකාශීය සැලසුම් සකස් කිරීම

බලාත්මක ක්‍රියාකාරකම්

ව්‍යාපෘති සැලසුම හා ක්‍රියාත්මක කිරීම්

ඉඩම් කළමනාකරණය

මානව සම්පත් කළමනාකරණය



සැලසුම්

3.4 % සැලසුම්

සංවර්ධන සැලුසම් දායකත්වය

බලාත්මක කිරීම්

0.8 %

සියලුම වර්ගයේ සම්පූර්ණ කරන ලද ගොනු

ව්‍යාපෘති

2019 ආරම්භ කරන ලද

මිලියන **306**

වටිනා ව්‍යාපෘති

මානව සම්පත්

කළමනාකරණ මට්ටම	එකතුව
ජ්‍යෙෂ්ඨ	1
මධ්‍යම	3
කණිෂ්ඨ	2
කළ.ස.(තාක්ෂණික)	1
කළ. ස.(තා. නොවන)	12
ප්‍රාථමික	8

2019 විශේෂ අවස්ථා

මාතලේ දිස්ත්‍රික් කාර්යාලය

මධ්‍යම පලාත

3 වන මහල,
පරිපාලන සංකීර්ණය ,
ගම් උදාභූමිය ,
දඹුල්ල
+94 66 2283422

ප්‍රධාන ක්‍රියකාරකම්



අවකාශීය සැලසුම් සකස් කිරීම

බලාත්මක කිරීම්

ව්‍යාපෘති සැලසුම් හා ක්‍රියාත්මක කිරීම්

මානව සම්පත් කළමනාකරණය



සැලසුම්

0 %

සංවර්ධන සැලසුම් දායකත්වය

බලාත්මක කිරීම්

2.0 %

සියලුම වර්ගයේ සම්පූර්ණ කරන ලද ගොනු

ව්‍යාපෘති

2019 ආරම්භ කරන ලද

මිලියන **32**

වටිනා ව්‍යාපෘති

අවසන් කල ව්‍යාපෘති ගණන : **02**

මානව සම්පත්

කළමනාකරණ මට්ටම	එකතුව
ජ්‍යෙෂ්ඨ	1
මධ්‍යම	3
කණිෂ්ඨ	2
කළ.ස.(තාක්ෂණික)	1
විස්තරය – මාළු වෙළෙන්දන්ට නිසි අලෙවියක් නොමැති අතර පාරිභෝගිකයින්ට ද මාළු මිලදී ගැනීමට නිසි තැනක් නොමැති වී ඇත. එබැවින් ඉහත අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලද අතර ගොඩකවෙල ප්‍රාදේශීය සභාව, නගරය පිරිසිදු කිරීම සහ නගර අලංකරණය අඛණ්ඩව පවත්වාගෙන යමින් සිටී.

72. ඇඹිලිපිටිය කාවන්තිස්ස වැව ආශ්‍රිත නාගරික උද්‍යාන සංවර්ධනය - III අදියර



ස්ථානය – ඇඹිලිපිටිය

ආරම්භක දිනය – 02.05.2018

අවසන් දිනය – 31.03.2019

පිරිවැය – රු මිලියන .88.65

අරමුදල් මූලාශ්‍ර – තුරු වදුල රු මිලියන 1,000

ව්‍යාපෘති හවුල්කරුවන් – CECB

විස්තරය – නගර මධ්‍ය සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාකාරී ව්‍යාපෘතියක් ලෙස කාවන්තිස්ස වැව නාගරික උද්‍යාන සංවර්ධන ව්‍යාපෘතිය හඳුනාගෙන ඇති අතර කාවන්තිස්ස වැව සහ ඇළ පුළුල් කිරීම, ඉඩම් වැඩිදියුණු කිරීමේ කටයුතු, ඇවිදීමේ මංතීරු සංවර්ධනය, රුක් සිටුවීම, ව්‍යායාම් ශාලාවේ අයිතම සැපයීම සහ සවිකිරීම ඊට ඇතුළත් වේ.

73. ඇඹිලිපිටිය කාවන්තිස්ස වැව ආශ්‍රිත නාගරික උද්‍යාන සංවර්ධනය - IV අදියර



ස්ථානය – ඇඹිලිපිටිය

ආරම්භක දිනය – 31.10.2018

අවසන් දිනය – 15.08.2019

පිරිවැය – රු. මිලියන .30.02

අරමුදල් මූලාශ්‍ර – (තුරු වදුල) - රු. මිලියන . 1,000

ව්‍යාපෘති හවුල් කරවුන් – CECB

විස්තරය – අදියරට වැසිකිලි කුට්ටියක් ඉදිකිරීම, කුඩා කඩ කාමර 5ක් (කියෝස්ක්) සහ ඇළ ඉවුර වැඩිදියුණු කිරීම, ඉඩම් වැඩිදියුණු කිරීමේ කටයුතු, ඇවිදීමේ මංතීරු සංවර්ධනය, ගස් සිටුවීම, ව්‍යායාම් ශාලාවේ අයිතම සැපයීම සහ ස්ථාපනය කිරීම ඇතුළත් විය.

74. රුවන්වැල්ලේ යෝජිත හරිත උද්‍යානය බහුකාර්ය ගොඩනැගිල්ල



ස්ථානය – රුවන්වැල්ල, අඟුරුවැල්ල

ආරම්භක දිනය – 01.01.2019

අවසන් දිනය – 30.08.2019

පිරිවැය – රු මිලියන .12.21

අරමුදල් මූලාශ්‍ර – (තුරු වදුල) - රු මිලියන . 1,000

ව්‍යාපෘති හවුල්කරුවන් – ආසිරි බිල්ඩින් කන්ස්ට්‍රක්ෂන්ස්

විස්තරය – මෙගා පොලිස් සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතේ හඳුනාගෙන ඇති අතර, භූ දර්ශන සංවර්ධන ව්‍යාපෘතියට තට්ටු බහුකාර්ය ගොඩනැගිලි දෙකක් (GF - යෝග්‍යතා කාමරය සහිත කියවීම් කාමරය, UF- විවෘත රැස්වීම් ශාලාව) සහ ළමා ක්‍රීඩා පිටියක් ඇතුළත් වේ.

2019

ව්‍යාපෘති කළමනාකරණය හා ක්‍රියාත්මක කිරීම

වයඹ පලාත

75. හෙට්ටිපොළ මහජන පොළ සංවර්ධනය





ස්ථානය – හෙට්ටිපොල නගරය

ආරම්භක දිනය – අප්‍රේල 1 2018

අවසන් දිනය – ජූලි 2019

පිරිවැය – රු.මිලියන .155

අරමුදල් මූලාශ්‍ර – භාණ්ඩාගර අරමුදල්

ව්‍යාපෘති හවුල්කුවන් – හෙට්ටිපොල ප්‍රාදේශීය සභාව

විස්තරය – . ප්‍රමාණවත් වාහන නැවැත්වීමේ පහසුකම් සහිතව හොඳින් සැලසුම් කළ පොළ ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කරන ලදී. පොළ සහ අවට තදබදය අවම කිරීම සඳහා ප්‍රදේශයේ වීදි වෙළෙන්දන් ද පොළට මාරු කරනු ලැබේ.

76. කුරුණෑගල වැව අවට භූමි අලංකරණ ව්‍යාපෘතිය - II අදියර





ස්ථානය – කුරුණෑකල වැව අවට

පිරිවැය – රු. මිලියන 195

අරමුදල් මූලාශ්‍රය – භාණ්ඩාගාර

ව්‍යාපෘති හවුල්කරුවන් කුරුණෑගල මහ නගර සභාව

ආරම්භක දිනය – මාර්තු 2016

අවසන් දිනය – පෙබරවාරි 2019

විස්තරය – දෙස් විදෙස් සංචාරකයින් ආකර්ශනය කර ගත හැකි විනෝදාත්මක යටිතල පහසුකම් සහිත ප්‍රදර්ශන මධ්‍යස්ථාන සහ ඇවිදීමේ මං තීරු වැනි පහසුකම් සහිතව වැව අවට ප්‍රදේශය සංවර්ධනය කර ඇත.

77. බහුකාර්ය ගොඩනැගිලි සංකීර්ණය සහ මහව සතිපොළ සංවර්ධනය





ස්ථානය – මහව නගර මධ්‍යය

පිරිවැය – රු. මිලියන 103

අරමුදල් මූලාශ්‍ර – භාණ්ඩාගාර

ව්‍යාපෘති හවුල්කරුවන් – මහව ප්‍රාදේශීය සභාව

ආරම්භක දිනය – අප්‍රේල් 2018

අවසන් . මහව නගර මධ්‍යයේ රථවාහන ප්‍රශ්නය සහ වාහන නැවැත්වීමේ පහසුකම් නොමැතිකමට පිළියම් යෙදීම සඳහා මෙම සංවර්ධනය සිදු කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් තම පාරිභෝගිකයින්ට පහසු ප්‍රවේශයක්, ප්‍රසන්න වෙළඳපල අත්දැකීමක් සහ පාරිභෝගිකයින්ගේ අපේක්ෂාවන් වැඩිදියුණු වීම හේතුවෙන් විකුණුම්කරුවන්ට ආර්ථික වර්ධනයක් ලබා දෙනු ඇත.

78. බහුකාර්ය ගොඩනැගිලි සංකීර්ණය සහ ආණමඩුව සතිපොළ සංවර්ධනය



ස්ථානය – ආනමඩුව නගර මධ්‍යය

පිරිවැය – රු. මිලියන 130

අරමුදල් මූලාශ්‍ර – භාණ්ඩාගාර

ව්‍යාපෘති හවුල්කරුවන් – ආනමඩුව ප්‍රාදේශීය සභාව

ආරම්භක දිනය – මාර්තු 2018

දිනය – පෙබරවාරි 2019

විස්තරය – නගර මධ්‍යයේ රථවාහන ප්‍රශ්නය සහ වාහන නැවැත්වීමේ පහසුකම් නොමැතිකමට පිළියම් යෙදීම සඳහා මෙම සංවර්ධනය සිදු කර ඇත. මෙම ව්‍යාපෘතිය මගින් තම පාරිභෝගිකයින්ට පහසු ප්‍රවේශයක්, ප්‍රසන්න වෙළඳපල අත්දැකීමක් සහ පාරිභෝගිකයින්ගේ අපේක්ෂාවන් වැඩිදියුණු වීම හේතුවෙන් විකුණුම්කරුවන්ට ආර්ථික වර්ධනයක් ලබා දෙනු ඇත.

79. කුලියාපිටිය හරිත උද්‍යානය බහුකාර්ය ගොඩනැගිල්ල



ස්ථානය – සුභූතිපුර කුලියාපිටිය

පිරිවැය – රු. මිලියන 12.1

අරමුදල් මූලාශ්‍ර – මුදල් අමාත්‍යාංශ

ව්‍යාපෘති හවුල්කරුවන් – කුලියාපිටිය නගර සභාව

ආරම්භක දිනය – පෙබරවරි 2019

අවසන් දිනය – දෙසැම්බර් 2019

විස්තරය – ව්‍යාපෘතිය මගින් ප්‍රජා ක්‍රියාකාරකම් සහ විනෝදාස්වාද පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා බහුකාර්ය ශාලාවක්, ශාරීරික යෝග්‍යතා කාමරයක්, කියවීම් කාමරයක් සහ ඇවිදීමේ මංතීරු සහිත භූ දර්ශන සහිත ප්‍රදේශයක් සහ ළමා ක්‍රීඩා පිටියක් ලබා දී ඇත.

80. මාවතගම හරිත උද්‍යානය බහුකාර්ය ගොඩනැගිල්ල



ස්ථානය – මාවතගම

පිරිවාය – රු. මිලියන 12.1

අරමුදල් මූලාශ්‍ර – මුදල් අමාත්‍යාංශ

ව්‍යාපෘති හවුල් කරවුන් – මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

ආරම්භක දිනය – පෙබරවාරි 2019

අවසන් දිනය – දෙසැම්බර් 2019

විස්තරය – . ව්‍යාපෘතිය මගින් ප්‍රජා ක්‍රියාකාරකම් සහ විනෝදාස්වාද පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා බහුකාර්ය ශාලාවක්, ශාරීරික යෝග්‍යතා කාමරයක්, කියවීම් කාමරයක් සහ ඇවිදීමේ මංතීරු සහිත භූ දර්ශන සහිත ප්‍රදේශයක් සහ ළමා ක්‍රීඩා පිටියක් ලබා දී ඇත.

81. පන්නල හරිත උද්‍යානය බහුකාර්ය ගොඩනැගිල්ල



ස්ථානය –බදබද්ද වත්ත , පන්නල

පිරිවැය – රු.මිලියන 12.1

අරමුදල් මූලාශ්‍ර – මුදල් අමාත්‍යාංශය

ව්‍යාපෘති හවුල්කරුවන් – පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

ආරම්භක දිනය – ජුනි 2019

අවසන් දිනය – දෙසැම්බර් r 2019

විස්තරය – ව්‍යාපෘතිය මගින් ප්‍රජා ක්‍රියාකාරකම් සහ විනෝදාස්වාද පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා බහුකාර්ය ශාලාවක්, ශාරීරික යෝග්‍යතා කාමරයක්, කියවීම් කාමරයක් සහ ඇවිදීමේ මංතීරු සහිත භූ දර්ශන සහිත ප්‍රදේශයක් සහ ළමා ක්‍රීඩා පිටියක් ලබා දී ඇත.

82. පුත්තලම හරිත උද්‍යානය බහුකාර්ය ගොඩනැගිල්ල



ස්ථානය – නින්දෙනිය, පුත්තලම

පිරිවැය – රු. මිලියන 12.1

අරමුදල් මූලාශ්‍ර – මුදල් අමාත්‍යාංශය

ව්‍යාපෘති හවුල්කරුවන් – පුත්තලම නගර සභාව

ආරම්භක දිනය – ජනවාරි 2019

අවසන් දිනය – ඔක්තෝම්බර් r 2019

විස්තරය – ව්‍යාපෘතිය මගින් ප්‍රජා ක්‍රියාකාරකම් සහ විනෝදාස්වාද පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා බහුකාර්ය ශාලාවක්, ශාරීරික යෝග්‍යතා කාමරයක්, කියවීම් කාමරයක් සහ ඇවිදීමේ මංතීරු සහිත භූ දර්ශන සහිත ප්‍රදේශයක් සහ ළමා ක්‍රීඩා පිටියක් ලබා දී ඇත.

2019

ව්‍යාපෘති කළමනාකරණය හා ක්‍රියාත්මක කිරීම

උතුරු පලාත

83. මුලතිව් බස් නැවතුම්පොළ සංවර්ධනය



ව්‍යාපෘති ස්ථානය – මුලතිව් හනදියේ සිට මීටර් 100 දුරින්

ව්‍යාපෘතියේ මුළු පිරිවැය – රු. මිලියන 26

අරමුදල් මූලාශ්‍ර – භාණ්ඩාගාර

සේවාදායකයා/ පාර්ශව කරුවන් – මරිතිමේ පත්තු ප්‍රාදේශීය සභාව

ව්‍යාපෘතියේ ආරම්භක දිනය – 11.10.2017

ව්‍යාපෘතියේ අවසන දිනය – අගෝස්තු 2019

විස්තරය - වත්මන් ප්‍රවාහන ප්‍රවාහය අවට ප්‍රදේශයට ව්‍යාප්ත කිරීමෙන් ප්‍රාදේශීය සහ ජාතික සම්බන්ධතා ඇති කිරීම

84. මුලතිව් හි පහසුකම් මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම



ව්‍යාපෘති ස්ථානය – මුලතිව් හනදියේ සිට මීටර් 100 දුරින්

ව්‍යාපෘතියේ මුළු පිරිවැය – රු. මිලියන 60

අරමුදල් මූලාශ්‍ර – භාණ්ඩාගාර

සේවාදායකයා/ පාර්ශවකරුවන් – මරිතනෙපත්තු ප්‍රාදේශීය සභාව

ව්‍යාපෘතියේ ආරම්භක දිනය – 11.10.2017

ව්‍යාපෘතියේ අවසන් දිනය – අගෝස්තු 2019

විස්තරය – ප්‍රදේශය තුළ ආකර්ශනීය ව්‍යාපාරික පරිසරයක් සැපයීම

85. යාපනයේ මුනීස්වරන් පාර පදික මාර්ගය සංවර්ධනය



ව්‍යාපෘති ස්ථානය – යාපනය නගරය

ව්‍යාපෘතියේ මුළු පිරිවැය – රු. මිලියන 33

අරමුදල් මූලාශ්‍ර – භාණ්ඩාගාර

සේවාදායකයා/ පාර්ශව කරුවන් – යාපනය මහ නගර සභාව

ව්‍යාපෘතියේ ආරම්භක දිනය – 24.08.2018

ව්‍යාපෘතියේ අවසන් දිනය – 24.11.2019

විස්තරය –මගීන්ට සහ නගරවාසීන්ට වඩා හොඳ ඇවිදීමේ පහසුකමක් ඇති කිරීම, මුනේශ්වරන් මාර්ගය හරහා CTB සහ පෞද්ගලික බස් නැවතුම්පොළ සම්බන්ධ කිරීම, හරිත පරිසරයක් සහිත ආරක්ෂිත පරිසර හිතකාමී පදික මාර්ගයක් නිර්මාණය කිරීම, පදිකයින් සහ වෙනත් වාහන අතර ගැටලු අවම කිරීම.

----------මෙම පිටුව හිතාමතාම හිස්ව තබා ඇත----------



වසරේ විශේෂ අවස්ථා

3.1 පලාත් කාර්යාල ක්‍රියාකාරිත්වය

3.1.1ප්‍රධාන කාර්යාලයේ අනෙකුත් අංශ වල ක්‍රියාකාරිත්වය

3.1.2 සැලසුම් කිරීම

3.1.3ව්‍යාපෘති

3.1.3 උපදේශන විශේෂතා

3.1.4 බලාත්මක කිරීම

3.1.5 සමාජ වැඩ සහ වෙනත් ජයග්‍රහණ

----------මෙම පිටුව හිතාමතාම හිස්ව තබා ඇත----------

3.1.3 උපදේශන විශේෂ අවස්ථා 2019

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (උපදේශන) යටතේ සැලසුම්, ව්‍යාපෘති කළමනාකරණ සහ උපදේශන අංශය ස්ථාපිත කර ඇති අතර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලද විශේෂ ව්‍යාපෘති ලෙස ප්‍රධාන වශයෙන් වාස්තු විද්‍යාත්මක උපදේශන ව්‍යාපෘතිවල නිරත වේ. ජාතික වශයෙන් වැදගත් වන මෙම ව්‍යාපෘති දිවයින පුරා ක්‍රියාත්මක වන අතර ඉංජිනේරු උපදේශකවරුන්, ව්‍යුහාත්මක සහ MEP වැනි අනෙකුත් වෘත්තීය ප්‍රවීණයන් සමඟ සම්බන්ධීකරණයෙන් වැඩ කටයුතු කරගෙන යනු ලබයි.

වෘත්තියෙන් වරලත් ගෘහ නිර්මාණ ශිල්පියෙකු වන අධ්‍යක්ෂ (DPM&C) යටතේ, වෘත්තීය සුදුසුකම් ලත් වරලත් ගෘහ නිර්මාණ ශිල්පීන් ද වන නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් 03ක් ද කටයුතු කරනු ලබයි.

ඉහත අය හැරුණු විට ගෘහ නිර්මාණ ශිල්පීන් 05 දෙනෙකු සිටින අතර ඉන් 03 දෙනෙකු වරලත් ගෘහ නිර්මාණ ශිල්පීන් වේ.

සහායක කාර්ය මණ්ඩලය එක් ජ්‍යෙෂ්ඨ තාක්ෂණික නිලධාරියෙකු, එක් පුහුණු නිලධාරියෙකු, ප්‍රමාණ සමීක්ෂකයෙකු, ලිපිකරුවෙකු, ලේකම්වරයෙකු, කාර්යාල සහයකයෙකු සහ කොට්ඨාශයට අනුයුක්ත රියදුරන්

සැලසුම්, ව්‍යාපෘති කළමනාකරණය සහ උපදේශන අංශය
2019 විශේෂ අවස්ථා

සෙත්සිරිපාය පරිශ්‍රයේ යෝජිත උස් කාර්යාල සංකීර්ණය (සෙත්සිරිපාය අදියර-III)

ස්ථානය : බත්තරමුල්ල(සෙත්සිරිපාය පරිශ්‍රය)

වියදම : ගොඩකිරීමේ වැඩ - 924.5මිලියන (VAT සමග)

අරමුදල් මූලාශ්‍ර : නා.සං.අ.

ව්‍යාපෘති හවුල්කරුවන්: CECB

ආරම්භක දිනය : 12.02.2018

අවසන් දිනය : 15.01.2019 (තවමත් සම්පූර්ණ කර නොමැති අතර ප්‍රගතියක් ලබයි



විස්තරය

කාර්යාල අවකාශය සඳහා දිනෙන් දින ඉහළ යන ඉල්ලුම සැලකිල්ලට ගනිමින්, අවශ්‍ය සියලු පහසුකම් සහිත රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය කාර්යාල අවකාශය සඳහා අවශ්‍ය විසඳුම් පිරිවැය ඵලදායී ලෙස ලබාදීම සඳහා සෙත්සිරිපාය අදියර III ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු ආරම්භ කර ඇත



බොරලැස්ගමුව වැව අවට ප්‍රදේශයේ සංවර්ධන අදියර 1 සහ 2

ස්ථානය : බොරලැස්ගමුව වැව අද්දර

වියදම : රු. මි. 68.4, 66.3

අරමුදල් මූලාශ්‍ර : භාණ්ඩාගාර

ආරම්භක දිනය : 24.01.2019

අවසන් : 02.07. 2019



විස්තරය : ජලාපවහන පහසුකම් වැඩිදියුණු කරමින් සහ වැව අවට අනවසර ඉදිකිරීම් පාලනය කරමින් සාමාන්‍ය ජනතාවගේ මානසික හා ශාරීරික සෞඛ්‍ය නංවාලීම සඳහා වැව වටා ධාවන පථයක් ඇතුළු ලයිනර් උද්‍යානයක් ලබා දීම.





ඉදිකිරීමට යෝජිත නාවින්න බස් නැවතුම්පල

ස්ථානය: නාවින්න

වියදම : රු.මි. 89.19

අරමුදල් මූලාශ්‍ර : භාණ්ඩාගාර

ආරම්භක දිනය : 20.04.2018

අවසන් දිනය : 04.11.2019

විස්තරය : නාවින්න නගර මධ්‍යයට බස් නැවතුම්පළක් බස්රථ අංගන 12කින් යුත් බස් නැවතුම්පොළක් ලබාදීම



කොට්ටාවෙහි යෝජිත බස් නැවතුම්පළ ඉදිකිරීම

ස්ථානය: කොට්ටාව

වියදම : රු. මි..61.06

අරමුදල් මූලාශ්‍ර : භාණ්ඩාගාර

ආරම්භක දිනය : 03.09.2018

අවසන් දිනය : 18.11.2020

විස්තරය : කොට්ටාව නගර මධ්‍යයට බස් නැවතුම්පොළක් ලබා දීම සඳහා බස්රථ අංගන 05 කින් සමන්විතය



----------මෙම පිටුව හිතාමතාම හිස්ව තබා ඇත----------



වසරේ විශේෂ අවස්ථා

3.1 පලාත් කාර්යාල ක්‍රියාකාරිත්වය

3.1.1ප්‍රධාන කාර්යාලයේ අනෙකුත් අංශ වල ක්‍රියාකාරිත්වය

3.1.2 සැලසුම් කිරීම

3.1.3ව්‍යාපෘති

3.1.3 උපදේශන විශේෂතා

3.1.4 බලාත්මක කිරීම්

3.1.5 සමාජ වැඩ සහ වෙනත් ජයග්‍රහණ

----------මෙම පිටුව හිතාමතාම හිස්ව තබා ඇත----------

3.1.4 බලාත්මක කිරීමේ විශේෂ අවස්ථා - 2019 (පෙරසැරි කරන ලද සියලුම අයදුම්පත්)



උප කාර්යාල	එකතුව	ගොඩනැගිල්ල අයදුම්පත	මූලික සැලසුම් නිර්ණය අනුමැතිය	ඉඩම් අනුමැතිය අයදුම්පත්	අනුකූලතා සහතික	වෙනත් අයදුම්පත්	සියයට ගණන
මහනුවර	775	129	463	115	28	39	5.1%
නුවරඑළිය	123	26	61	27	4	3	0.8%
මාතලේ	307	47	133	105	6	16	2.0%
බලාත්මක කිරීමේ අංශය	2587	857	630	958	109	33	17.2%
කොළඹ	1235	79	252	821	65	18	8.2%
ගම්පහ	2404	218	570	1398	-	218	15.9%
කළුතර	839	139	510	119	31	40	5.6%
ගාල්ල	1048	362	277	363	16	30	6.9%
මාතර	295	74	131	73	11	6	2.0%
හම්බන්තොට	513	126	198	17	12	160	3.4%
අනුරාධපුර	987	71	628	108	71	109	6.5%
පොළොන්නරුව	118	15	49	54	-	-	0.8%
යාපනය	1314	135	897	160	80	42	8.7%
බදුල්ල	203	10	138	48	5	7	1.3%
මොණරාගල	253	8	205	18	-	15	1.7%
කෑගල්ල	450	102	279	25	23	21	3.0%
රත්නපුර	260	54	50	63	13	80	1.7%
පුත්තලම	301	56	124	38	19	64	2.0%
කුරුණෑගල	461	77	231	75	19	59	3.1%
ත්‍රිකුණාමලය	213	37	144	22	5	5	1.4%
මඩකලපුව	220	24	131	57	3	5	1.4%
කල්මුණෙ	32	3	22	6	1	0	0.2%
අම්පාර	146	14	128	0	1	3	1.0%



242

මුළු පොකුරු ගණන

242

34 මහ නගර සභා

75 නගර සභා

133 ප්‍රාදේශීය සභා

15084

සකසන ලද සම්පූර්ණ ගොනු ගණන

---------- මෙම පිටුව හිතාමතාම හිස්ව තබා ඇත----------



වසරේ විශේෂ අවස්ථා

3.1 පලාත් කාර්යාල ක්‍රියාකාරිත්වය

3.1.1ප්‍රධාන කාර්යාලයේ අනෙකුත් අංශ වල ක්‍රියාකාරිත්වය

3.1.2 සැලසුම් කිරීම

3.1.3ව්‍යාපෘති

3.1.3 උපදේශන විශේෂතා

3.1.4 බලාත්මක කිරීම්

3.1.5 සමාජ වැඩ සහ වෙනත් ජයග්‍රහණ

---------- මෙම පිටුව හිතාමතාම හිස්ව තබා ඇත----------

3.1.5 සමාජ වැඩ සහ වෙනත් ජයග්‍රහණ

රුක් රෝපණ වැඩසටහන - මාතර දිස්ත්‍රික් කාර්යාලය







2019 නොවැම්බර් 28 දින මාතලේ දිස්ත්‍රික් කාර්යාලය මගින් පවත් වූ ලේ දන්දීමේ කඳවර





ජාතික සේවා මලල ක්‍රීඩා උළෙල - මීටර් 400,800 (දෙවන ස්ථානය)
එන්.ඩී.සී. වීරවර්ධන









UDA-NCP කාර්යාලයේ සුභසාධක සංගමය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන දන්සැල වැඩසටහන ඇසළ පුර පසළොස්වක පොහොය දින අනුරාධපුරයේදී පැවැත්විණි





2019.10.31 වෛද්‍ය කඳවුර- පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය

----------මෙම පිටුව හිතාමතාම හිස්ව තබා ඇත ----------



මූල්‍ය තොරතුරු සහ ආයතනික පාලනය

4.1 2019 වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය

4.2 මූල්‍ය ප්‍රකාශණය 2019

4.3 වසර 10 තුල සාරාංශ වාර්තාව (මූල්‍ය තත්වයේ ප්‍රකාශය, විසර්ණ ආදායම් ප්‍රකාශය මූල්‍යමය මුදල් ප්‍රවාහ ප්‍රකාශය)

4.4 ආයතනික පාලනය

---------- මෙම පිටුව හිතාමතාම හිස්ව තබා ඇත----------

4.1 2019 වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධනය

- **ලාභදායිත්වය කළමනාකරණය**

  අධිකාරිය, රාජ්‍ය ආයතනයක් ලෙස ආයතනික හා සමාජ සංවර්ධන ව්‍යාපෘතිවල නියැලෙමින්, පෙර වසරට අදාළව සමාලෝචනය කරන වර්ෂය තුළ 40.30%ක ශුද්ධ ලාභ වර්ධනයක් වාර්තා කර ඇත. අඩු ආදායම්ලාභී නිවාස ව්‍යාපෘතිය අධිකාරිය විසින් සිදුකරනු ලබන ප්‍රමුඛතම සමාජ ව්‍යාපෘතියක් ලෙස සැලකිය හැකිය.

- **ලාභාංශ ලැබීම**

.

අනුබද්ධිත සමාගම්, අනුබද්ධ සමාගම් සහ අනෙකුත් සමාගම්වල කරන ලද ආයෝජන සඳහා සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් උපයාගත් ලාභාංශ ආදායම ආයෝජන ප්‍රතිශතයක් ලෙස පහත පරිදි වේ

සමාගමේ නම	ආයෝජනය කළ මුදල (රු. මිලියන)	කොටස් තබා ගැනීම %	ලැබුණු ලාභාංශ (රු. මිලියන)	ආයෝජන ප්‍රතිලාභ%
PLC හෝල්ඩින්ස්	40	47%	24	60%
සිලෝන් ඉලෙක්ට්‍රසිටි ප්‍රයිවට් ලිමිටඩ්	9	0.8%	8	89%

2019 දී පරිපාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම්වල කාර්ය සාධනය

අනුබද්ධ සමාගම්

(විස්තර)	නාගරික ආයෝජන සහ සංවර්ධන සමාගම (පුද්ගලික) සමාගම (රු. මිලියන)	සීමාසහිත ලංකා රෙස්ට් හවුස් (රු. මිලියන)	වෝටර්ස් එජ් පුද්ගලික ලිමිටඩ් (රු. මිලියන)
ආදායම	682	31	928
වියදම	(364)	(22)	(794)
ලාභය/ (අලාභය	**318**	**9**	**134**

ආශ්‍රිත සමාගම්

විස්තර	PLC හෝල්ඩින්ස් (රු. මිලියන) 2020.03.31	ඕෂන්වීව් ඩිවලොප්මන්ඩ් කම්පැණි ලිමිටඩ් (රු. මිලියන)
ආදායම	313	149
වියදම	(137)	(143)
ලාභය/ අලාභය	176	6

වෙනත් ආයෝජන

විස්තර	ලංකා ඉලෙක්ට්‍රසිටි ප්‍රයිවට් ලිමිටඩ් (රු. මිලියන)	කලම්බු ලැන්ඩ් ඇන් ඩිවලොප්මන්ඩ් කම්පැණි (රු. මිලියන)
ආදායම	37,809	720
වියදම	(35,972)	(356)
ලාභය / අලාභය	**1,837**	**364**

ප්‍රාග්ධන වත්කම් කළමනාකරණය)

සමාලෝචිත වර්ෂයේදී, ජංගම නොවන වත්කම් මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස 84% කි.

ණය කළමනාකරණය

අධිකාරියේ වෙලඳ ණය ගැනි ශේෂය සමාලෝචිත වර්ෂයේ ජංගම වත්කම්වල 9% ප්‍රතිශතයක් වේ. මෙම ණයගැනි ශේෂයතුල රාජ්‍ය ආයතන කිහිපයකින් දිගුකාලයක සිට ලැබිය යුතු ශේෂයන් කිහිපයක් ද ඇතුළත් වන අතර, ඒ සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව එම ණයගැනි ශේෂයන් සඳහා 100% හානිකරන ණය වෙන් කිරීමක් කර ඇත.

අනෙකුත් ණය ගැනියන්ගෙන් ලැබිය යුතු ශේෂයන් නියමිත පරිදි අයකර ගැනීමට අධිකාරිය නිසි විධිවිධාන සලසා ඇත. නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන ආදායම් මාර්ගය වනුයේ විවිධ ආයෝජන ව්‍යාපාර සඳහා දීර්ඝ කාලීන හා කෙටි කාලීන පදනම්න් අධිකාරියට අයිති ඉඩම් සහ ගොඩනැගිලි විවිධ ආයෝජනයන්ට ලබා දීමෙන් ලැබෙන කුලී ආදායමයි. මීට අමතරව, අධිකාරිය විසින් සපයනු ලබන විවිධ වෘත්තීය සේවාවලින් සැලකිය යුතු ආදායමක් උපයා ඇත. තවද, අධිකාරිය විසින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවලට අදාළ ගෙවීම් සහ සමස්ත කාර්ය මණ්ඩලය සඳහා වැටුප් ගෙවීම සහ අනෙකුත් ව්‍යවස්ථාපිත ගෙවීම් සිදු කරනු ලබන්නේ අධිකාරිය විසින් උත්පාදනය කරන ලද අරමුදල් මගිනි.

ඒ අනුව, 2019 වර්ෂයේ මුල්ය ප්‍රකාශන පිළිබඳ මූල්‍ය තත්ව විශ්ලේෂණය පහත දැක්වේ.

නාගරික සංවර්ධන අධිකාරිය
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශය

		සමූහය		අධිකාරිය	
		2019	2018 පුනප්‍රකාශය	2019	2018 පුනප්‍රකාශය
		රු.	රු.	රු.	රු.
	සටහන				
ආදායම්	2	**4,561,896,132**	**4,632,158,661**	**2,581,600,819**	**2,711,294,186**
සෘජු වියදම්		**(435,138,688)**	**(413,165,496)**		
දළ ලාභය		**4,126,757,444**	**4,218,993,165**	**2,581,600,819**	**2,711,294,186**
ආයෝජන ආදායම	3	**1,919,252,584**	**1,981,800,053**	**1,917,648,276**	**1,973,152,443**
වෙනත් ආදායම්	4	**573,214,520**	**234,854,895**	**536,485,216**	**112,473,520**
රාජ්‍ය ප්‍රදාන		**15,717,001**	**15,717,001**	**15,717,001**	**15,717,001**
පරිපාලන වියදම්	5	**(4,564,922,534)**	**(4,550,392,742)**	**(3,736,053,913)**	**(3,654,283,051)**
විකිණීමේ හා අලෙවි වියදම්		**(56,738,253)**	**(62,752,214)**	-	-
වෙනත් වියදම්	6	**(119,870,124)**	**(196,695,109)**	**(106,894,745)**	**(182,379,017)**
මෙහෙයුම් කටයුතු වලින් ලද ප්‍රතිඵල		**1,893,410,638**	**1,641,525,049**	**1,208,502,653**	**975,975,080**
මූල්‍ය පිරිවැය	7	**(222,069,465)**	**(277,738,252)**	**(878,256)**	**(28,543,426)**
හිමිකම් ගිණුම්ගත පදනම අනුව ආයෝජනවල ලාභ කොටස		**(23,084,592)**	**160,800,185**	-	-
බදු පෙර ලාභය		**1,648,256,580**	**1,524,586,982**	**1,207,624,397**	**947,431,654**
ආදායම් බදු වියදම	8	**(146,575,041)**	**(206,051,472)**	**(121,242,863)**	**(178,231,666)**
වර්ෂය සඳහා ලාභය / (අලාභය)		**1,501,681,539**	**1,318,535,510**	**1,086,381,534**	**769,199,989**
වෙනත් විස්තීරණ ආදායම්					
ආයුගණනක ලාභය / (අලාභය)		**(24,144,192)**	**(13,930,650)**	**(25,925,217)**	**(13,930,650)**
පශ්චාත් සේවක ප්‍රතිලාභ වගකීම් නැවතගණ		**(249,344)**	-	-	-
වර්ෂය සඳහා විස්තීරණ ආදායම්		**(24,393,536)**	**(13,930,650)**	**(25,925,217)**	**(13,930,650)**
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම්		**1,477,288,003**	**1,304,604,860**	**1,060,456,317**	**755,269,339**

නාගරික සංවර්ධන අධිකාරිය
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සමූහය** **අධිකාරිය**
ඒකාබද්ධ ශේෂ පත්‍රය

		31/12/2019	31/12/2018	31/12/2019	31/12/2018
			පුනප්‍රකාශය		පුනප්‍රකාශය
වත්කම්	**සටහන**	**රු.**	**රු.**	**රු.**	**රු.**
ජංගම නොවන වත්කම්					
යන්ත්‍ර සූත්‍ර පිරියත හා උපකරණ	9	5,320,273,192	5,104,224,489	2,912,452,758	2,096,607,591
අස්පෘශ්‍ය වත්කම්		6,782,452	-	-	-
ආයෝජන	10	98,640,318,074	93,789,710,553	96,706,779,657	91,781,147,666
පරිපාලිත වෙළඳ සමාගම් ආයෝජන	11	-	-	545,000,080	781,017,080
ආශ්‍රිත සමාගම් ආයෝජන	12	917,720,147	964,454,735	132,000,000	132,000,000
වෙනත් ආයෝජන	13	45,812,341	45,812,341	45,809,841	45,809,841
නාගරික ආයෝජන හා සංවර්ධන පුද් සමාගමෙන් ලැ	14	-	-	2,341,145,064	2,713,263,836
වෝටර්ස් එජ් සමාගමෙන් ලැබිය යුතු දෑ	15	-	-	4,349,552,293	-
පලාන් පාලන ආයතන වලින් අයවිය යුතු ණය-යූඩීඑස්පී		25,804,122	7,075,902	25,804,122	7,075,902
වෙළඳ නොග	16	37,082,465,842	29,196,101,463	37,082,465,842	29,196,101,463
ප්‍රාග්ධන නොනිමි වැඩ		22,256,775,705	28,979,199,437	21,934,612,903	28,817,400,987
මුළු ජංගම නොවන වත්කම්		**164,295,951,874**	**158,086,578,920**	**166,075,622,560**	**155,570,424,368**
ජංගම වත්කම්					
නොගය		40,123,499	44,046,699	13,764,438	13,511,392
ණය ගැනියෝ	17	3,032,729,942	2,606,290,900	2,651,741,531	2,417,743,810
සේවක ණයගැනියෝ	17. b	229,865,191	228,184,722	227,432,584	228,184,722
කලින් ගෙවූ සේවක පිරිවැය		54,310,535	59,018,115	54,310,535	59,018,115
තැන්පතු, කලින් ගෙවීම් හා අත්තිකාරම්	18	5,754,793,964	13,948,486,378	5,735,144,241	13,909,235,755
ස්ථාවර තැන්පතු	19	20,503,087,077	14,291,081,988	20,214,127,309	13,953,904,186
කෙටිකාලීන ආයෝජන	20	1,751,050,353	2,325,435,288	1,715,000,000	2,294,384,935
මුදල් හා මුදල් වලට සමානදෑ	21	76,897,135	85,766,473	28,789,974	40,957,867
මුළු ජංගම වත්කම්		**31,442,857,695**	**33,588,310,563**	**30,640,310,612**	**32,916,940,782**
මුළු වත්කම්		**195,738,809,569**	**191,674,889,483**	**196,715,933,172**	**188,487,365,151**
ස්කන්ධය හා වගකීම්					
ස්කන්ධය					
අනුදත් ප්‍රාග්ධනය	22	100,000,000	100,000,000	100,000,000	100,000,000
		100,000,000	100,000,000	100,000,000	100,000,000
ප්‍රාග්ධන සංචිත	23	-	8,462,785	-	8,462,785
අයභාර සංචිත	24	79,085,028,761	78,407,267,085	75,636,837,782	75,380,978,700
මුළු ස්කන්ධය		**79,185,028,761**	**78,515,729,870**	**75,736,837,782**	**75,489,441,485**
වගකීම්					
ජංගම නොවන වගකීම්					
ණය ගැනුම් සම්බන්ධ පොළිය	25	9,782,806,551	10,046,806,551	9,782,806,551	10,046,806,551
ශුද්ධ රාජ්‍ය දායකය	26	922,649,889	938,366,890	922,649,889	938,366,890
නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය සඳහා රාජ්‍ය දායකත	27	20,664,181,880	13,095,631,587	20,664,181,880	13,095,631,587
නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘති ණය	28	-	92,873,842	-	92,873,842
විලම්බිත බදු කුළී ගිණුම	29	38,912,380,329	38,483,338,756	43,499,440,189	38,751,288,756
ඉඩම් සඳහා උපචිත වන්දි		14,818,445,514	12,783,762,185	14,818,445,514	12,783,762,185
සංවර්ධන ව්‍යාපෘති සඳහා අත් මුදල් ලැබීම්		130,075,395	129,867,641	130,075,395	129,867,641
ගෙවිය යුතු පාරිතෝෂික දීමනා	30	367,757,425	322,071,836	328,256,724	287,431,149
කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු දෑ	31	1,358,016,849	1,555,905,835	1,358,016,849	1,555,905,835
මුළු ජංගම නොවන වගකීම්		**86,956,313,830**	**77,448,625,122**	**91,503,872,989**	**77,681,934,435**
ජංගම වගකීම්					
ණය ගැනුම් සම්බන්ධ පොළිය	25.1	264,000,000	264,000,000	264,000,000	264,000,000
වියදම් හා අනෙකුත් ණය හිමියෝ	32	17,438,220,954	21,938,583,674	17,560,294,595	21,801,894,229
විලම්බිත බදු	33	143,583,360	335,839,547	60,120,654	277,438,589
තැන්පතු හා අත්තිකාරම්	34	11,701,912,631	13,061,152,447	11,589,439,095	12,971,026,028
බැංකු අයිරාව	35	49,750,033	110,958,824	1,368,058	1,630,384
මුළු ජංගම වගකීම්		**29,597,466,978**	**35,710,534,492**	**29,475,222,402**	**35,315,989,230**
මුළු ස්කන්ධය හා වගකීම්		**195,738,809,569**	**191,674,889,483**	**196,715,933,172**	**188,487,365,151**

පිටු අංක 07 සිට 45 දක්වා පෙන්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වල අනුකූල වූ කොටස් වේ.මෙම මූල්‍ය ප්‍රකාශන 2019 දෙසැම්බර් මස 31 දිනට අධිකාරියේ සභ්‍යත්ව හා සාධාරණ තත්වය හා වර්ෂය අවසාන අතිරික්තය පිළිබිඹු කරන බව මා විසින් මෙයින් සහතික කරන ලදී

ඩබ්. වී. ජායා නිළිණි
නි.අ.ජනරාල් (මුදල්)

මෙම මූල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් කළමණාකරන මණ්ඩලය වගකීමට බැඳෙන අතර එම ප්‍රකාශන කළමණාකරන මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කර ඇත.

හර්ෂාන් ද සිල්වා
සභාපති
දිනය

කේ.වී.සී දිල්රුක්ෂි
කළ.මණ්ඩල සාමාජික
දිනය

නාගරික සංවර්ධන අධිකාරිය
ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය

ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය (අධිකාරිය සඳහා)

	අනුදත් ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිත	අයභාර සංචිත	සමුච්චිත ලාභය/ (අලාභය)	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.
2018 ජනවාරි 01 දිනට ශේෂය	100,000,000	8,462,785	55,000,000	74,701,349,221	74,864,812,006
ලාභාලාභ ගිණුමට එකතු කල රාජ්‍ය ප්‍රදාන					-
පෙර වර්ෂයේ ගැළපීම් - හිඟ සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් ගෙවීම					
පෙර වර්ෂයේ ගැළපීම් - ඉඩම් විකිණීමේ ලාභය					
පෙර වර්ෂයේ ගැළපීම් - ඉඩම් බැහැර කිරීමෙන් ලද අනෙකුත් ආදායම් හඳුනා ගැනීම					
නාගරික පුනරජ්ජන ව්‍යාපෘතිය සඳහා රජය ප්‍රදාන					-
ගිණුම වර්ෂය සඳහා ආදායමට වැඩි වියදම				769,199,994	769,199,994
අයභාර සංචිත ප්‍රත්‍යාවර්තනය			(55,000,000)	55,000,000	-
පෙර වර්ෂයේ ගැළපීම (වලමිඤ්ත බදු කුළු ගිණුම හා ආයෝජන දේපළ ගිණුම සැසඳීම)				(130,639,863)	(130,639,863)
මුළු වෙනත් විස්තීරණ ආදායම				(13,930,650)	(13,930,650)
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**100,000,000**	**8,462,785**	**-**	**75,380,978,701**	**75,489,441,484**
2019 ජනවාරි 01 දිනට ශේෂය	100,000,000	8,462,785	-	75,380,978,701	75,489,441,484
ලාභාලාභ ගිණුමට එකතු කල රාජ්‍ය ප්‍රදාන					-
ගිණුම් වර්ෂය සඳහා ආදායමට වැඩි වියදම				1,086,381,534	1,086,381,534
අයභාර සංචිත ප්‍රතිවර්තනය		(8,462,785)		8,462,785	-
පෙර වර්ෂයේ ගැළපීම්				62,440,198	62,440,198
පෙර වර්ෂයේ ගැළපීම්(සටහන 01)				(430,654,666)	(430,654,666)
පෙර වර්ෂයේ ගැළපීම්(සටහන 02)				(443,078,239)	(443,078,239)
පෙර වර්ෂයේ ගැළපීම්(ආයුගණනක අලාභ හඳුනාගැනීම)				(1,767,313)	(1,767,313)
මුළු වෙනත් විස්තීරණ ආදායම්				(25,925,217)	(25,925,217)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**100,000,000**	**-**	**-**	**75,636,837,782**	**75,736,837,779**

සටහන 01

සීමාසහිත වෝටර්ස් එජ් සමාගම පිහිටුවා ඇති ඉඩම වසර 99කට බදු දීමට නාගරික සංවර්ධක අධිකාරිය වෝටර්ස් එජ් ලිමිටඩ් සමඟ ගිවිසුමකට එළැඹ ඇත. මීට පෙර මෙම ඉඩම ආයෝජන දේපලක් ලෙස හඳුනාගෙන ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වෙත සංක්‍රමණය වීමේදී සාධාරණ වටිනාකම් ලාභය රඳවාගත් අතිරික්තය සඳහා හඳුනා ගන්නා ලදී. එසේම වෝටර්ස් එජ් පරිශ්‍රය සමාගමට පවරා ඇති අතර වටිනාකම ආයෝජනය ලෙස හඳුනාගෙන ඇත. ඉහත බදු ගිවිසුම හේතුවෙන් ආයෝජන දේපල ලෙස කලින් හඳුනාගැනීම සහ සමාගමෙහි ආයෝජනය ලෙස හඳුනා නොගෙන ඇත.

සටහන 02

URPCC ව්‍යාපෘති යටතේ ඉදිකරන ලද නිවාස ඒකක 1413ක් බැහැර කර ඇතැම් ව්‍යාපෘති, අමාත්‍යාංශ සහ රාජ්‍ය ආයතන වෙත පවරා දී ඇත. එම බැහැර කිරීම්වලින් නිවාස 192ක් 2018 වර්ෂයේදී ගිණුම්ගත කර ඇති අතර ශේෂය සමාලෝචිත වර්ෂයේදී ගලපා ඇත. නිවාස 1221 ක මුළු විකුණුම් රු. 3,683,000,000 සහ එහි පිරිවැය රු.4,382,278,343 විය. ඒ අනුව අලාභය රුපියල් 443,078,239 කි.

ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය (සමූහය සඳහා)

	අනුදත් ප්‍රාග්ධනය	ප්‍රාග්ධන සංචිත	අයභාර සංචිත	රඳවාගත් අතිරික්තය	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.
2018 ජනවාරි 01 දිනට ශේෂය	100,000,000	8,462,785	55,000,000	77,178,302,090	77,341,764,875
ලාභාලාභ ගිණුමට එකතු කල රාජ්‍ය ප්‍රදාන					-
අයභාර සංචිත ප්‍රතිවර්තනය			(55,000,000)	55,000,000	-
පෙර වර්ෂයේ ගැළපීම් (විලම්බිත බදු කුළී ගිණුම හා ආයෝජිත දේපළ ගිණුම සැසඳීම)				(130,639,863)	(130,639,863)
ගිණුම් වර්ෂය සඳහා ආදායමට වැඩි වියදම				1,318,535,510	1,318,535,510
මුළු වෙනත් විස්තීරණ ආදායම්				(13,930,650)	(13,930,650)
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**100,000,000**	**8,462,785**	**-**	**78,407,267,087**	**78,515,729,871**
2019 ජනවාරි 01 දිනට ශේෂය	100,000,000	8,462,785	-	78,407,267,087	78,515,729,871
පෙර වර්ෂ ගැලපුම් (අඩුවෙන් ගිණුම්ගත වූ විලම්බිත බදු - UNIDEP)					-
ලාභාලාභ ගිණුමට එකතු කල රාජ්‍ය ප්‍රදාන					-
අයභාර සංචිත ප්‍රතිවර්තනය		(8,462,785)		8,462,785	-
පෙර වර්ෂ ගැලපුම්				62,440,198	62,440,198
පෙර වර්ෂ ගැලපුම් **(සටහන 01)**				(430,654,666)	(430,654,666)
පෙර වර්ෂ ගැලපුම් **(සටහන 02)**				(443,078,239)	(443,078,239)
පෙර වර්ෂ ගැලපුම් (ලංකා රෙස්ට් හවුස් සමාගමේ වැඩියෙන් ගිණුම් ගත වී ඇති ලාභය හඳුනා ගැනීම)				(1,683,290)	(1,683,290)
පෙර වසර ගැලපීම් (ගිණුම් ගතනොවූ පාරිතෝෂික ප්‍රතිලාභ වගකීම් සහ වෝටර්ස් එජ් ලිමිටඩ් හි වැඩියෙන් ගිණුම් ගත වී ඇති ආදායම් බදු වියදම් හඳුනාගැනීම)				6,754,198	6,754,198
පෙර වර්ෂයේ ගැළපීම්(ආයුගණක අලාභ හඳුනාගැනීම)				(1,767,313)	(1,767,313)
0				1,501,681,539	1,501,681,539
මුළු වෙනත් විස්තීරණ ආදායම්				(24,393,536)	(24,393,536)
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**100,000,000**	**-**	**-**	**79,085,028,761**	**79,185,028,761**

සටහන 01

සීමාසහිත වෝටර්ස් එජ් සමාගම පිහිටුවා ඇති ඉඩම වසර 99කට බදු දීමට නාගරික සංවර්ධක අධිකාරිය වෝටර්ස් එජ් ලිමිටඩ් සමඟ ගිවිසුමකට එළැඹ ඇත. මීට පෙර මෙම ඉඩම ආයෝජන දේපලක් ලෙස හඳුනාගෙන ඇති අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලින් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වෙත සංක්‍රමණය වීමේදී සාධාරණ වටිනාකම් ලාභය රඳවාගත් අතිරික්තය සඳහා හඳුනා ගන්නා ලදී. එසේම වෝටර්ස් එජ් පරිශ්‍රය සමාගමට පවරා ඇති අතර වටිනාකම ආයෝජනය ලෙස හඳුනාගෙන ඇත. ඉහත බදු ගිවිසුම හේතුවෙන් ආයෝජන දේපල ලෙස කලින් හඳුනාගැනීම සහ සමාගමෙහි ආයෝජනය ලෙස හඳුනා නොගෙන ඇත.

සටහන 02

ව්‍යාපෘති යටතේ ඉදිකරන ලද විවිධ නිවාස ව්‍යාපෘතිවල නිවාස ඒකක 1413ක් බැහැර කර සමහර ව්‍යාපෘති අමාත්‍යාංශ සහ ආයතන වෙත භාර දී ඇත. එම නිවාස 192න් 2018 වර්ෂයේදී ගිණුම්ගත කර ඇති අතර ඉතිරිය සමාලෝචිත වර්ෂයේදී ගලපා ඇත. නිවාස 1221 ක මුළු විකුණුම් රු. 3,683,000,000 සහ එහි පිරිවැය රු.4,382,278,343 විය.

නාගරික සංවර්ධන අධිකාරිය
මුදල් ප්‍රවාහ ප්‍රකාශය (අධිකාරිය සඳහා)
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		31/12/2019 රු.		31/12/2018 රු.	
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද ලැබීම්					
බද්දට පෙර ශුද්ධ ලාභය / (අලාභය)			1,207,624,397	-	947,431,659
එකතු කලා : බොල් ණය සඳහා වෙන් කිරීම්		12,851,352		11,288,852	
ක්ෂය වෙන්කිරීම්		397,255,633		394,571,683	
පාරිතොෂික සඳහා වෙන් කිරීම්		49,956,651		40,261,739	
කලින් ගෙවූ සේවක පිරිවැය		25,135,868	485,199,504	26,737,310	472,859,583
			1,692,823,901		1,420,291,243
අඩුකලා : කුලිය		1,147,775,152		922,486,428	
බදු කුළී		618,419,146		779,860,784	
රාජ්‍ය ප්‍රදාන ලියා හැරීම් සඳහා වෙන් කිරීම්		15,717,001		15,717,001	
ලභාංශ ලැබීම්		31,440,618		29,562,540	
ඉඩම් හා ගොඩනැගිලි විකිණීමෙන් ලද ආදායම		-		(30,729,424)	
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය		19,986,172		-	
URPC නිවාස විකිණීමෙන් ලද ලාභය		-		46,841,693	
මධ්‍ය ආදායම් නිවාස විකිණීමෙන් ලද ලාභය		459,989,308		-	
පොළී ආදායම		1,886,207,657	4,179,535,054	1,943,589,903	3,707,328,925
කාරක ප්‍රාග්ධන වෙනස් වීම් වලට පෙර මෙහෙයුම් ලාභය/ (අලාභය)			(2,486,711,154)		(2,287,037,682)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීම්					
වෙළඳ හා වෙනත් ණය හිමියන්ගේ වැඩිවීම / (අඩුවීම)		(3,091,082,216)		5,438,076,056	
පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇති ණය -UDSP((වැඩිවීම) / අඩු		(18,728,220)			
UDSPණය -(වැඩිවීම) / අඩුවීම		(92,873,842)			
ණය ගැතියන්ගේ (වැඩිවීම) / අඩුවීම		(158,796,713)		(662,497,653)	
සේවක ණයගැතියන්ගේ (වැඩිවීම) / අඩුවීම		5,459,718		(11,377,727)	
තොගය හා තැන්පතු වල (වැඩිවීම) / අඩුවීම		8,173,838,467		(9,594,820,294)	
අත්තිකාරම් හා තැන්පතු වල (වැඩිවීම) / අඩුවීම		327,988,067		3,007,308,276	
කොන්ත්‍රාත්තුව මත ගෙවිය යුතු (වැඩිවීම / අඩුවීම)-(URPC)		(197,888,986)		(252,156,653)	
			4,947,916,275		(2,075,467,995)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ලැබීම්/ (ගලායාම්)					
කුලී ආදායම		1,097,603,128		846,861,385	
ආදායම් බදු/ආර්.සේවා ගාස්තු/රඳවාගැනීමේ බදු ගෙවීම්		(398,765,287)		(299,771,147)	
බදු වාරික වලින් මුදල් ලැබීම්		5,315,595,172		2,691,782,319	
බදු වාරික වලින් මුදල් ලැබීම්- වෝටර්ස් එජ් සමාගම		(4,349,552,293)			
පාරිතෝෂික මුදල් ගෙවීම්		(35,290,630)		(25,860,069)	
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ලැබීම්			1,629,590,091		3,213,012,488
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද මුදල් ලැබීම්/ ගලා යැම්					
ලාභාංශ ලැබීම්		31,440,618		29,830,517	
පොළිය ලැබීම්		1,874,166,859		1,896,339,932	
ස්ථාවර වත්කම් මිලදී ගැනීම්/ඉවත් කිරීම්		(99,491,134)		(144,110,873)	
අක් මුදල් ලැබීම්		207,754		2,051,020	
ඉඩම් සහ ගොඩනැගිලි වල වැඩිවීම් / අඩුවීම්		(4,945,392,520)		(1,207,545,535)	
ප්‍රාග්ධන නොනිමි වැඩ (වැඩිවීම) / අඩුවීම		(2,335,113,375)		1,245,544,106	
වෙළඳ තොග වල (වැඩිවීම) / අඩුවීම		(1,500,331,501)		(9,869,236,926)	
ඉඩම් අත්පත් කර ගැනීම මත ගෙවූ වන්දි		(853,596,804)		(1,641,028,352)	
අයකරගැනීම්/(ගෙවීම්)පරිපාලිත සමාගම්		372,118,773		217,312,856	
ස්ථාවර තැන්පතු වල ආයෝජනය		(6,260,223,123)		6,610,684,484	
කෙටි කාලීන ආයෝජන		579,384,935		(1,009,981,779)	
ඉඩම් විකිණීමෙන් ලද ලාභය		-		7,181,444	
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය		19,986,172		-	
URPCC ගෙවල් විකිණීමෙන් ලද ලාභය		-		713,000,000	
මධ්‍ය ආදායම්ගෙවල් විකිණීමෙන් ලද ලාභය		1,709,575,000		-	
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ලැබීම් / (ගලායාම්)			(11,407,268,345)		(3,149,959,106)
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය					
ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ණය නැවත ගෙවීම්		(264,000,000)		(264,000,000)	
බැංකු ණය ලැබීම PB		-		1,750,000,000	
කෙටි කාලීන බැංකුණය ලැබීම-BOC		-		(1,750,000,000)	
නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය සඳහා රජයේ ප්‍රදාන		7,568,550,293		4,595,631,587	
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ලැබීම් / (ගලායාම්)			7,304,550,293		4,331,631,587
මුදල් හා මුදල් වලට සමාන දැ වල ශුද්ධ වැඩිවීම			(11,922,841)		32,179,291
වර්ෂය ආරම්භයේ මුදල් හා බැංකු ශේෂ	**B**		38,473,280		6,293,990
වර්ෂය අවසානයේ මුදල් හා බැංකු ශේෂ	**A**		26,550,438		38,473,280
වර්ෂය අවසානයේ මුදල් හා බැංකු ශේෂ			**A**		**A**
බැංකු අයිරා			(1,368,058)		(1,630,384)
වාසිදායක බැංකු ශේෂය			27,203,077		39,814,059
සුළු මුදල් හා අතැති මුදල්			715,419		289,604
			26,550,438		38,473,280

නාගරික සංවර්ධන අධිකාරිය
මුදල් ප්‍රවාහ ප්‍රකාශය (සමූහය සඳහා)
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

		31.12.2019 රු.		31.12.2018 රු.	
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද ලැබීම්					
බදු පෙර ශුද්ධ අලාභය			1,648,256,580		1,524,586,982
එකතු කලා : බොල් ණය සඳහා වෙන් කිරීම්		16,448,481		12,821,974	
ක්ෂය වෙන්කිරීම්		570,334,153		571,092,693	
පාරිතෝෂික සඳහා වෙන් කිරීම්		57,859,822		46,900,976	
කලින් ගෙවූ සාමාජික පිරිවැය		25,135,868	669,778,324	26,737,310	657,552,952
			2,318,034,904		2,182,139,934
අඩුකලා : කුලිය		1,565,340,912		1,346,077,088	
බදු කුළී		618,419,146		779,860,784	
රාජ්‍ය ප්‍රදාන ලියා හැරීම් සඳහා වෙන් කිරීම්		15,717,001		15,717,001	
ලභාංශ ලැබීම්		7,790,622		4,479,210	
ආශ්‍රිත සමාගම් වල ආයෝජන කොටස		(23,084,592)		160,800,185	
ඉඩම් හා ගොඩනැගිලි විකිණීමෙන් ලද ආදායම		-		(30,729,424)	
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ආදායම		19,986,172		-	
URPCC නිවාස විකිණීමෙන් ලද ආදායම		-		46,841,693	
මධ්‍ය ආදායම් නිවාස විකිණීමෙන් ලද ආදායම		459,989,308			
පොළී ආදායම		1,911,461,962	4,575,620,532	1,977,320,843	4,300,367,380
කාරක ප්‍රාග්ධන වෙනස් වීම් වලට පෙර මෙහෙයුම් ලාභය/ (අලාභය)			(2,257,585,628)		(2,118,227,446)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීම්					
වෙළඳ හා වෙනත් ණය හිමියන්ගේ වැඩිවීම / (අඩුවීම)		(3,112,525,512)		5,354,316,172	
ණය ගැනියන්ගේ (වැඩිවීම) / අඩුවීම		(355,653,028)		(567,741,580)	
පළාත් පාලන ආයතන වෙත ලබා දී ඇති ණය -UDSP((වැඩිවීම) / අඩුවීම		(18,728,220)		-	
UDSPණය -(වැඩිවීම) / අඩුවීම		(92,873,842)		-	
සේවක ණයගැනියන්ගේ (වැඩිවීම) / අඩුවීම		3,027,111		(11,377,727)	
තොගය හා තැන්පතු වල (වැඩිවීම) / අඩුවීම		8,197,615,614		(9,563,642,588)	
අත්තිකාරම් හා තැන්පතු වල (වැඩිවීම) / අඩුවීම		350,335,184		2,931,069,988	
කොන්ත්‍රාත්තුව මත ගෙවිය යුතු (වැඩිවීම / අඩුවීම)-(URPC)		(197,888,986)		(252,156,654)	
			4,773,308,321		(2,109,532,388)
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ලැබීම්/ (ගලායාම්)					
කුලී ආදායම		1,555,343,092		1,181,344,346	
ආදායම් බදු/ආර්.සේවා ගාස්තු/රඳවාගැනීමේ බදු ගෙවීම්		(404,909,785)		(309,044,974)	
බදු වාරික වලින් මුදල් ලැබීම්		966,042,880		2,691,782,319	
පාරිතෝෂික මුදල් ගෙවීම්		(34,349,700)		(28,515,219)	
මෙහෙයුම් ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ලැබීම්			2,082,126,487		3,535,566,472
ආයෝජන ක්‍රියාකාරකම් තුළින් ලද මුදල් ලැබීම්/ ගලා යැම්					
ලාභාංශ ලැබීම්		7,458,845		4,147,433	
පොළිය ලැබීම්		1,893,956,400		1,958,614,168	
ස්ථාවර වත්කම් මිලදී ගැනීම්/ඉවත් කිරීම්		(148,115,744)		(294,836,068)	
අක් මුදල් ලැබීම්		207,753		2,051,020	
අස්පෘශ්‍ය වත්කම් වැඩිවීම් / අඩුවීම්		(6,782,452)		-	
ඉඩම් සහ ගොඩනැගිලි වල වැඩිවීම් / අඩුවීම්		(4,839,048,731)		(1,461,288,477)	
ප්‍රාග්ධන නොනිමි වැඩ වල (වැඩි වීම) / අඩු වීම		(2,495,477,727)		1,283,513,804	
වෙළඳ තොග වල (වැඩිවීම) / අඩුවීම		(1,500,331,501)		(9,869,236,926)	
ඉඩම් අත්පත් කර ගැනීම් සඳහා වන්දි ගෙවීම		(853,596,804)		(1,641,028,352)	
ස්ථාවර තැන්පතු වල ආයෝජන		(6,212,005,089)		6,568,125,424	
කෙටි කාලීන ආයෝජන		574,367,661		(905,366,890)	
ඉඩම් විකිණීමෙන් ලද ලාභය		-		7,181,444	
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය		19,986,172			
URPCC ගෙවල් විකිණීමෙන් ලද ලාභය		-		713,000,000	
මධ්‍ය ආදායම්ගෙවල් විකිණීමෙන් ලද ලාභය		1,709,575,000			
ආයෝජන ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ලැබීම් / (ගලායාම්)			(11,849,806,216)		(3,635,123,419)
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද මුදල් ප්‍රවාහය					
ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ණය නැවත ගෙවීම්		(264,000,000)		(264,000,000)	
බැංකු ණය ලැබීම PB		-		1,750,000,000	
කෙටි කාලීන බැංකුණය ලැබීම-BOC		-		(1,750,000,000)	
නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය සඳහා රජයේ ප්‍රදාන		7,568,550,293		4,595,631,587	
මූල්‍ය ක්‍රියාකාරකම් තුලින් ලද ශුද්ධ මුදල් ලැබීම් / (ගලායාම්)			7,304,550,293		4,331,631,587
මුදල් හා මුදල් වලට සමාන දැ වල ශුද්ධ වැඩිවීම			52,593,257		4,314,806
වර්ෂය ආරම්භයේ මුදල් හා බැංකු ශේෂ	**B**		(26,317,634)	B	(30,632,439)
වර්ෂය අවසානයේ මුදල් හා බැංකු ශේෂ	**A**		26,275,623	A	(26,317,634)
වර්ෂය අවසානයේ මුදල් හා බැංකු ශේෂ			**A**		**A**
බැංකු අයිරා			(49,750,033)		(110,958,824)
වාසිදායක බැංකු ශේෂය			71,665,907		77,089,960
සුළු මුදල් හා අතැති මුදල්			4,359,750		7,551,230
			26,275,623		(26,317,634)

නාගරික සංවර්ධන අධිකාරිය
2019.12.31දිනෙන් අවසන් වර්ෂය සඳහා
වාර්ෂික ඒකාබද්ධ ගිණුම් සටහන්

1. ආයතනික සහ සමූහයේ තොරතුරු

1.1. ආයතනික තොරතුරු

1.1.1 වාර්තාකරණ ඒකකය

නාගරික සංවර්ධන අධිකාරිය ,ජාතික රාජ්‍ය සභාවේ 1978අංක 41 දරන පනත යටතේ 06/09/1978 දින ස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත ආයතනයකි. අධිකාරියේ ප්‍රධාන කාර්යාලය බත්තරමුල්ල, සෙත්සිරිපායෙහි 06 වන මහලෙහි පිහිටා ඇත. සමූහයේ 2018 දෙසැම්බර් මස 31දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අධිකාරියේ හා එහි පරිපාලිත සමාගම් වලින් සැදුම්ලත්ව ඇත.

1.1.2 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල "අධිකාරිය", නාගරික සංවර්ධන අධිකාරිය මව් සමාගම ලෙස සඳහන් කරන අතර "සමූහය" එහි ඒකාබද්ධ කර ඇති සමාගම් ඇතුළත් වේ.

1.1.3 මූල්‍ය ප්‍රකාශනවල අනුමැතිය සහ වගකීම

2007 අංක 07 දරන සමාගම් පනතේ සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (SLFRSs) & (LKASs) හි විධිවිධාන අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. මේ අනුව, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2021 අප්‍රේල් 22 වැනි දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කිරීමට අවසර දෙන ලදී.

1.1.4 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් ස්වභාවය

නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකාව තුල නාගරික සැලසුම් සැකසීමේ හා ක්‍රමික නාගරික සංවර්ධනයන් හි නිරත වූ බහුවිධ ආයතනයකි.

අනුකූලතා ප්‍රකාශණය

විස්තීරණ ආදායම් ප්‍රකාශය, මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, අධිකාරියේ සහ සමූහයේ ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශය සහ අධිකාරියේ සහ සමූහයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සටහන් සමඟ " මූල්‍ය ප්‍රකාශන" ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (CA ශ්‍රී ලංකා) විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLFRS/ LKAS) අනුව සහ 2007 අංක 7 දරන සමාගම් පනතට අනුකූලව සකස් කර ඇත.

1.1.1 සමූහයේ තොරතුරු

1.2.1. අනුබද්ධ සහ ආශ්‍රිත සමාගම්

සීමාසහිත වෝටර්ස් එජ් ලිමිටඩ්, ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් සහ නාගරික ආයෝජන සහ සංවර්ධන සමාගම (පුද්ගලික) යන පූර්ණ හිමිකාරී අනුබද්ධ සමාගම් 03 ක් නාගරික සංවර්ධන අධිකාරියේ පාලනය යටතේ පවතී.

තවද, නාගරික සංවර්ධන අධිකාරිය ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම, සහ ඔනාලි හෝල්ඩින්ස් පීඑල්සී කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරන අතර ඒවා නාගරික සංවර්ධන අධිකාරියේ ආශ්‍රිත සමාගම් වේ. සමාලෝචිත මූල්‍ය වර්ෂය තුළ අධිකාරියේ සහ සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවයේ සැලකිය යුතු වෙනසක් සිදු නොවීය.

1.1.1 අනුබද්ධ සමාගම් සහ ආශ්‍රිතයන්ගේ ක්‍රියාකාරිත්වයේ ස්වභාවය

සමාගමේ නම	වර්ගය	අරමුණ සහ ප්‍රධාන ක්‍රියාකාරකම්
සීමාසහිත වෝටර්ස් එජ් ලිමිටඩ්	සම්පූර්ණයෙන්ම අයිති අනුබද්ධිත ආයතනයකි 100%	වෝටර්ස් එජ් ලිමිටඩ් 2009 දී සීමිත වගකීම් සමාගමක් ලෙස සංස්ථාගත කරන ලද අතර එහි ව්‍යාපාරයේ ස්වභාවය ආපනශාලා සහ භෝජන සංග්‍රහ පහසුකම් සහ මෙහෙයුම් කටයුතු කළමනාකරණය යි.
ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ්	සම්පූර්ණයෙන්ම අයිති අනුබද්ධිත ආයතනයකි 100%	තානායම්, සංචාරක බංගලා, උද්‍යාන සහ අනෙකුත් විනෝදාස්වාද පහසුකම් කළමනාකරණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පාලනය කිරීම සඳහා සීමාසහිත ලංකා රෙස්ට් හවුස් ආයතනය සංස්ථාපිත විය.
නාගරික ආයෝජන සහ සංවර්ධන සමාගම (පුද්ගලික)	සම්පූර්ණයෙන්ම අයිති අනුබද්ධිත ආයතනයකි 100%	සීමාසහිත නාගරික ආයෝජන සහ සංවර්ධන සමාගම (පුද්ගලික) යනු ඕනෑම ප්‍රදේශයක ඕනෑම ආකාරයක සංවර්ධන ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීම, ගොඩනැගීම සහ ක්‍රියාත්මක කිරීමයි. සමාගමේ ආයෝජන දේපල වන්නේ සෙත්සිරිපාය II අදියර ගොඩනැගිල්ලයි.
ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම	අනුබද්ධ 43.39%	ඕෂන් වීව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම ගුණාත්මක තනි නිවාස ලබා දීමෙන් දේපල සංවර්ධන අංශයේ ප්‍රමුඛස්ථානයක් ලබා ගැනීම අරමුණයි. සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම්

		වනුයේ, සාප්පු සහ මහල් නිවාස කුලියට දීම සහ විකිණීම සඳහා දේපල සංවර්ධනය කිරීමයි.
ඔනාලි හෝල්ඩින්ස් පීඑල්සී	අනුබද්ධ 44.80%	ඔනාලි හෝල්ඩින්ස් පීඑල්සී දේපල සංවර්ධන සහ දේපල ව්‍යාපාරයේ නියැලී සිටී. සමාගම ක්‍රියාත්මක වන්නේ ආයෝජන දේපල අංශය කුලියට දීමෙනි. සමාගමේ ආයෝජන දේපල වන්නේ කොළඹ 04 හි පිහිටි යුනිටි ප්ලාසා ගොඩනැගිල්ලයි.

අනුබද්ධ සමාගම්වල සහ ආශ්‍රිත සමාගම්වල ආයෝජන පිළිබඳ අදාළ තොරතුරු 10 සහ 11 සටහන්වල අනාවරණය කර ඇත.

1.2. සකස් කිරීමේ පදනම සහ අනෙකුත් සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.2.1 මිනුම් පදනම

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුළ පහත සඳහන් පරිදි ද්‍රව්‍යාත්මක අයිතම හැර අනිකුත් ගණුදෙනු ඓතිහාසික පිරිවැය මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

- ආයෝජන දේපල තක්සේරු කිරීම.
- හදුනාගන්නා ලද හිමිකම් ප්‍රතිලාභ සඳහා වගකීම හදුනාගන්නා ලද හිමිකම් ප්‍රතිලාභවල වර්තමාන වටිනාකමට, හදුනානොගන්නා ලද ආයුගණන ලාභය එකතුකිරීම, හදුනානොගන්නා ලද අතීත සේවා පිරිවැය හා හදුනානොගන්නා ලද ආයුගණන අලාභ අඩුකිරීම තුළින් හදුනාගෙන ඇත.

.

1.3.2. ගණුදෙනු ක්‍රියාකාරී සහ ප්‍රකාශ්රිත මූල්‍ය වර්ගය

සමුහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය සමූහයේ ක්‍රියාකාරී මුදල් ඒකකය ලෙස පිළිගෙන ඇත. සියලුම මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත.

1.3.3 ඇස්තමේන්තු හා මතයන් භාවිතය

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා ප්‍රමිත වලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ අවශ්‍යතාවය වනුයේ, වත්කම්, වගකීම්,ආදායම් හා වියදම්වල වාර්තාගත

ප්‍රතිඵල සම්බන්ධව හා භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳව කළමණාකරණයට තීරණ ගැනීම, ඇස්තමේන්තු කිරීම හා උපකල්පන ඉදිරිපත් කිරීම වේ. ඇස්තමේන්තු අගයන් සත්‍ය ප්‍රතිඵල තුලින් වෙනස් විය හැක.

වත්කම් හා වගකීම්වල ධාරණ අගය පිළිබඳව විනිශ්චයන් කිරීමේදී ඇස්තමේන්තු හා සම්බන්ධිත උපකල්පය ඓතිහාසික අත්දැකීම් හා අනෙකුත් සාධක මත පදනම් වන අතර ඒවා වෙනත් මූලාශ්‍ර වලින් පැහැදිලිව පෙන්නුම් නොකෙරේ.

ඇස්තමේන්තු හා පහතින් දිවෙන උපකල්පනයන් පවත්නා පදනමක් මත නිරීක්ෂණය කරනු ඇත. අදාළ කාලපරිච්ඡේදය තුල ඇස්තමේන්තු වලට සංශෝධනයන් හදුනාගෙන ඇති අතර සංශෝධනය බලපානු ලබන්නේ පවත්නා මූල්‍ය වර්ෂයට හෝ අනාගත කාලපරිච්ඡේදයක් සඳහාද එසේ නැතිනම් වර්තමාන හා අනාගත කාලපරිච්ඡේද යන දෙකම සඳහාද යන්න සංශෝධනයන් කරනු ලැබ ඇත.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුල පහත සටහන මත භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්ති වලින් වඩා වැදගත් බලපෑම් පවතින බව හදුනා ගෙන ඇත.

ගිණුම් ඇස්තමේන්තු/තීන්දු	සටහන් අංක	පිටු අංක
ආයෝජනදේපල වර්ගීකරණය	09	32

මූල්‍ය ප්‍රකාශන තුල අන්තර්ගත පහත වගුවෙන් පෙන්නුම් කරනු ලබන අයිතමයන්හි ද්‍රව්‍ය ගැලපුම් නිසා සැලකිය යුතු අවදානමක් පවතින බවට උපකල්පනය කර ඇත.

ගිණුම් ඇස්තමේන්තු/තීන්දු	සටහන් අංක	පිටු අංක
ආයෝජනදේපල	09	32
දේපල,පිරියතහාඋපකරණ	08	30
සේවක ප්‍රතිලාභ	30	39

1.3. ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතය

සෑම කාලපරිච්ඡේදයක් උදෙසාම ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කරන ලදී.

1.4.1. ඒකාබද්ධ කිරීමේ පදනම

(අ) ඒකාබද්ධ කිරීම

මිළදී ගන්නා ලද දිනට මිළදී ගැනීමේ පදනම භාවිතයට ගනිමින් ව්‍යාපාර ඒකාබද්ධ කිරීම ගිණුම්ගත කර ඇත. උදා. සමුහය වෙත පාලනය මාරු කරන විටදී, ව්‍යාපාර ඒකකයන්හි මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්ති නියම කිරීම සඳහා බලය ලබාදීම මෙන්ම එහි ක්‍රියාකාරකම් වලින් ප්‍රතිලාභ ලබාගැනීම පාලනය වේ. පාලනය තක්සේරු කිරීම තුල සමූහයක් අනාගත ජන්ද හිමිකම් ප්‍රති ඵාව තම යටතට ගනී.

සමූහය කීර්තිනාමය අත්පත් කරගන්නා දිනකදී පහත සඳහන් අයුරින් ගණනය කිරීම සිදු කරනු ලබයි.

- සැලකිල්ලට ගනු ලබන සාධාරණ අගය
- අත්පත් කරගනු ලබන තැනැත්තා සතු පාලනයක් නොමැති කොටස
- ව්‍යාපාරයක් අන්තර්ග්‍රහණය කොටස් වශයෙන් සිදුවේනම් එකී අන්තර්ග්‍රහණයට අදාලව පෙර දක්වන ලද හිමිකමෙහි සාමාන්‍ය අගය
- එලෙස සිදුකරන ලද අත්පත් කිරීමට අදාලව වන වත්කම් හා වගකීම් හි සාධාරණ අගය

මෙලෙස සිදු කරන ලද ගැලපුම ඍණ අගයක් නම් එය ලාභය හෝ අලාභයට ගැලපීමක්ද සිදු කරනු ලබයි. එසේම ව්‍යාපාර ඒකාබද්ධ කිරීමකදී ණය හා හිමිකම් සුරැකුම් සඳහා දරණ ලද ගණුදෙනු පිරිවැය එතුළින් ජනිත වූ වියදමක් ලෙස සලකනු ලබයි.

(ආ) පරිපාලිත සමාගම්

සමූහය විසින් පාලනය කරනු ලබන ව්‍යාපාර ආයතනයන් පරිපාලිතයන් ලෙස හඳුන්වනු ලැබේ. පරිපාලිතයන්හි පාලනය ආරම්භයේ සිට නවතා දමන තෙක් එම පරිපාලිත සමාගම් වල මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුල අන්තර්ගත කරනු ලැබේ. පරිපාලිතයන්හි ගිණුම්කරණ ප්‍රතිපත්ති අවශ්‍ය වන විට සමූහය විසින් භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සමඟ අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට වෙනස් කර ඇත.

(ඇ) ආශ්‍රිත සමාගම් වල ආයෝජනය (හිමිකම් ගිණුම්ගත පදනම අනුව ආයෝජන)

පරිපාලිත සමාගමක් වශයෙන් දැක්වෙනුයේ සමූහය විසින් සැලකිය හැකි බලපෑමක් ඉටුකල හැකි නමුත් මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරිත්වයට සෘජුව බලපෑමක් සිදුනොකල හැකි සමූහය සතු සමාගමිය. සැලකිය හැකි බලපෑමක් මඟින් දැක්වෙන්නේ සමූහය සතුව ජන්ද හිමි සාමාන්‍ය කොටස් වල හිමිකම 20% ත් 50% ත් අතර පවතින විටදීය.

ආශ්‍රිත සමාගම් වල ආයෝජනය පිරිවැය මත හඳුනාගෙන ඇති අතර හිමිකම් ක්‍රමය භාවිතයට ගනිමින් ගිණුම්ගත කර ඇත. ආයෝජනයේ පිරිවැය ලෙස ගණුදෙනු පිරිවැය ඇතුලත්ව ඇත. ආශ්‍රිත සමාගම් වල ලාභ හෝ අලාභයන්හි සමුහයේ කොටස හා වෙනත් විස්තීරණ ආදායම , ගැලපුම් යනාදිය ආරම්භයේ සිට නවතා දමන තෙක් එහි බලපෑම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන තුල අන්තර්ගත කරනු ලැබේ.
ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අන්තර් සමාගම් ගණුදෙනු වලින් පැන නඟිනු ලබන අන්තර් සමාගම් ශේෂයන් හා ගණුදෙනු සහ උපලබ්ධි නොවූ ආදායම් හා වියදම් ඉවත් කරනු ලැබේ.

අධිකාරියේ අලාභ කොටස හිමිකම් ගිණුම්ගත පදනම අනුව ආයෝජනයට වඩා වැඩිවන විට අදාල ආයෝජනයට අදාලව ඉදිරියට ගෙන ආ ශේෂය හා ඊට අදාල දීර්ඝ කාලීන ආයෝජන ශූන්‍ය කරනු ලබන අතර මීට අමතරව පවතින අලාභ තත්වයන් වර්තමාන අගය මත ගලපනු ලබයි. මෙසේ අමතර අලාභ තත්වයන් වර්තමාන අගයන්ට ගලපනු ලබන්නේ සමූහය විසින් අදාල ආයෝජනයට අදාල වියදම් අඩුකිරීමෙනි.

(ඈ) ඒකාබද්ධකරණය මත ගණුදෙනු ඉවත් කිරීම

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අන්තර් සමාගම් ගණුදෙනු වලින් පැනනඟිනු ලබන උපබ්දි නොවූ ආදායම් හා වියදම් සහ අන්තර් සමාගම් ශේෂයන් හා ගණුදෙනු ඉවත් කරනු ලැබේ. ගණුදෙනු වලින් පැනනඟිනු ලබන උපලබ්ධි නොවූ ලාභයන් සමඟ හිමිකම් ගිණුම්ගත පදනම අනුව ආයෝජන, ආයෝජනයට එරෙහිව ඉවත් කර ඇත. උපලබ්ධි නොවූ අලාභයන්ද ඉහත සඳහන් උපලබ්ධි නොවූ ලාභයන් ඉවත්කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ගයන්ම ඒ සඳහා අනුගමනය කරනු ලබයි. උපලබ්ධි නොවූ අලාභ උපලබ්ධි නොවූ ලාභ අයුරින්ම ඉවත් කරනු ලබන අතර එම ඉවත් කිරීම හානිකරන අගය සඳහා සීමා වේ.

1.4.2. විදේශ විනිමය ගනුදෙනු

සියළු විදේශ විනිමය ගනුදෙනු භාවිතයට ගනු ලබන මුදල් ඒකකය සඳහා අදාල ගනුදෙනුව සිදු වූ අවස්ථාවේ දී පවතින විනිමය අනුපාතය යටතේ සටහන් කරනු ලබයි. එසේම විදේශ මුදල් ඒකකය මඟින් දැක්වෙන සියළුම මූල්‍යමය වත්කම් සහ වගකීම් වාර්තා කරනු ලබන දිනයේ එතැන් විනිමය අනුපාතිකය අනුව මූල්‍ය ප්‍රකාශන වල සටහන් කරනු ලබයි.
ඒ අයුරින්ම ඓතිහාසික පිරිවැය මත ගණනය කළ විදේශ මුදල් ඒකකයන් මඟින් නිරූපණය වන මූල්‍ය නොවන වත්කම් හා වගකීම් එවැනි වටිනාකම් ගණනය කරන අවස්ථාවේ විනිමය අනුපාතිකය මත සඳහන් කරයි.

මෙලෙස මුදල් ඒකක මඟින් පරිවර්ථනය කරනු ලැබූ මූල්‍ය නොවන වත්කම් මඟින් පැන නැගුණු ලාභ හෝ අලාභ තත්වයන් මූල්‍ය වාර්තා වල සටහන් කිරීම සිදු කරනු ලබයි.

1.4.3. මූල්‍යමය වත්කම් හා වගකීම්

(අ) ව්‍යුත්පන්න මූල්‍ය වත්කම් (Non – DerivativeFinancial Assets(

අධිකාරිය විසින් ණය ගැනියන් හා ලැබිය යුතු ගිණුම් ශේෂ මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කරනුයේ අදාල ණය ගැනියන් , ලැබිය යුතු ගිණුම් ශේෂ ජනනය වන දින තුල දිය. මීට අමතරව අනෙකුත් මූල්‍ය වත්කම් මූල්‍යමය වත්කම් ප්‍රකාශනයන් හි වාර්තා කරනුයේ එම වත්කම් සඳහා අධිකාරිය විසින් ගිවිසුම් වලට එළඹි දින තුල දීය.

ඒ අනුව කිසියම් මූල්‍යමය වත්කමක් මගින් ජනනය වන මුදල් ප්‍රවාහය සඳහා වූ අයිතිය කල් පිරීමේ දී හෝ අයිතිය පැවරීමක් මගින් විතැන් වන ප්‍රතිපාදනයන් හා අවදානම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් කරනු නොලබයි. ඒ අනුව මූල්‍ය වත්කම් වල අයිතිය පැවරීමක දී අධිකාරිය විසින් රඳවා ගනු ලැබූ පොලිය විශේෂිත වූ වත්කමක් හෝ වගකීමක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල සටහන් කරනු ලබයි. මූල්‍යමය වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් නෛතික අයිතියක් ඇති අවස්ථාවන් හි දී හා ශුද්ධ අගය උපලබ්ධි කළ හැකි අවස්ථාවන්හි දී අදාල වත්කම් හා වගකීම් වල ශුද්ධ අගය මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගැනීම සිදු කරනු ලබයි.

මේ අනුව අධිකාරිය සතුව පහත සඳහන් ව්‍යුත්පන්න මූල්‍යමය වත්කම්, ණයගැති ලැබීම්, මූල්‍යමය ණය හා විකුණුම් ප්‍රතිග්‍රහනයක් සිදු කළ හැකි මූල්‍යමය වගකීම් පවති.

)i) ණයශේෂ හා ණයගැනියන්

ණයශේෂ හා ණයගැනියන් මූල්‍ය වෙළඳපොලේ ලැයිස්තුගත නොකළ මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලබන අතර මෙම මූල්‍යමය වත්කම් හී ලැබීම් ස්ථාවර හා නීරණය කළ හැකි වේ. මූලිකව මෙම වත්කම් අගයකිරීමේ දී සාධාරණ අගය මත පදනම්ව ඒ සඳහා සෘජුව ආරෝපණය කළ හැකි වියදම් ග්‍රහණය කරනු ලබයි.මූලික වත්කම් අගය කිරීමට පරිභාහිරව ණයශේෂ හා ණයගැනියන්ගේ ශේෂ ක්‍රමක්ෂය ශේෂ මත සඵල පොලී අනුපාතය උපයෝගි කර ගනිමින්, හානිකරන අලාභ ඉවත් කිරීමෙන් ගණනය කරනු ලබයි.මෙම ණයශේෂ හා ණයගැනිශේෂයන්හි මුදල් හා මුදල් වලට සමාන දෑ කාර්ය මණ්ඩල ණයගැනියන්, වෙළඳපොල හා අනෙකුත් ණයගැනියන් හා ආශ්‍රිත ණයගැනියන්ගෙන් සමන්විත වේ.

)ii(මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ශේෂ, ජංගම ගිණුම් ශේෂ හා තෙමස් හා ඊට අඩු කල් පිරීමට යටත් වන ස්ථාවර තැන්පතු, බැංකු අයිරා, අධිකාරිය විසින් සෙසු ආශ්‍රිත පරිපාලිත සමාගම් වෙත ලබා දුන් ණය මුදල් මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීමේ දී මුදල් හා මුදල් සමාන දෑ සඳහා අදාල කරගනු ලබයි.

)iii) කල් පිරීම සඳහා රඳවා ගත් මූල්‍යමය ආයෝජන

කල් පිරීම සඳහා රඳවා ගත් මූල්‍යමය ආයෝජන ව්‍යුත්පන්න මූල්‍ය වත්කමක් ලෙස විශ්ලේෂනය කරනු ලබන අතර එම වත්කම්හි ප්‍රතිලාභ ස්ථාවර ලෙස තීරණය කළ හැකි වේ. තව ද එම වත්කම් නිශ්චිත කල් පිරීමේ කාලයකින් සමන්විත වන අතර අධිකාරිය සතුව එම වත්කම රඳවා ගැනීමේ හැකියාවක් හා අවශ්‍යතාවයක් පවති. මූල්‍ය ප්‍රකාශන වල වාර්තා කිරීමේ දී මූලික ගණනය කිරීම් වලට පරිභාහිරව කල් පිරීම සඳහා රඳවා ගත් මූල්‍යමය ආයෝජන ක්‍රමක්ෂය ශේෂ ක්‍රමය මත සඵල පොලී අනුපාතය උපයෝගීකර ගනිමින්, හානිකරන අලාභ අඩු කිරීමෙන් ගණනය කරනු ලබයි.

ක්‍රමක්ෂය අගය ගණනය කිරීමේ දී අත්පත් කරගැනීම සඳහා වූ අධි මිල සහ අව මිල යොදා ගෙන සඵල පොලී අනුපාතය ගණනය කරනු ලබයි. මෙම ක්‍රමක්ෂය පොලිය ඒකාබද්ධ ආදායම් හා වියදම් ප්‍රකාශයේ සඳහන් කරනු ලබන අතර එමගින් ජනිත වන අලාභයක් වේ නම් ඒකාබද්ධ ආදායම් හා වියදම් ප්‍රකාශයේ වෙනත් මූල්‍ය වත්කම් මගින් ජනිත වූ ගෙවීමක් ලෙස සටහන් කරනු ලබයි.

(ආ) ව්‍යුත්පන්න මූල්‍යමය වගකීම් (Non – Derivative Financial Liabilities)

අධිකාරිය විසින් ණය සුරුකුම් මූල්‍ය ප්‍රකාශන වල සටහන් කරනුයේ අදාල ණය සුරකුම්පත් ජනනය වූ දිනදීය. අනෙකුත් සියලුම මූල්‍යමය වගකීම් මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් කරනුයේ අදාල ණය සුරකුම් සඳහා ගිවිසුම්ගත වූ දිනයන්හිදිය. එපරිද්දෙන් අධිකාරිය විසින් ගෙවා නිදහස් කරන ලද හෝ අවලංගු කරන ලද මූල්‍යමය වගකීම් මූල්‍ය ප්‍රකාශනයන්හි වාර්තා කරනු නොලබයි.

අධිකාරිය විසින් ව්‍යුත්පන්න මූල්‍යමය වගකීම් අනෙකුත් මූල්‍යමය වගකීම් වර්ගීකරණය යටතේ සටහන් කරයි. එකී මූල්‍යමය වගකීම් ප්‍රාථමිකව වෙළඳපොල වටිනාකම මත ආරෝපණය කල හැකි වියදම් ඇතුළුව අගය කරනු ලබයි. එලෙස ප්‍රාථමික වෙළඳපොල වටිනාකම මත අගය කල මූල්‍යමය වගකීම් ද්විතීකව සඵල පොලි අනුපාතය මත අගය කිරීම සිදු කරනු ලබයි.

අනෙකුත් සියලුම කෙටිකාලීන සහ හෝ වෙළඳපොල අගයක් නොමැති සාධාරණ අගයක් මඟින් ජනනය වනවගකීම් වෙළඳ හා අනෙකුත් ණයහිමියන් ලෙස වර්ගීකරණය කරනු ලබයි. ප්‍රාථමික වෙළඳ හා අනෙකුත්ණයහිමියන් සාධාරණ අගයක් මත ගණනය කිරීම සිදුකරනු ලබයි. කෙසේ නමුත්, මෙම වගකීම් අගය කිරීමේදී අධිකාරිය විසින් ක්‍රමක්ෂය ක්‍රමය අනුගමනය නොකරයි. මෙසේ ක්‍රමක්ෂය ක්‍රමය අනුගමනය නොකිරීමට හේතුව වනුයේ අදාල ණයහිමියන් සඳහා ගෙවීම් ඉල්ලීම් කරනු ලබන අවස්ථාවේදීම සිදුකිරීමට අවශ්‍ය වන හෙයිනි.
අධිකාරිය සතුව පවත්නා මූල්‍ය වගකීම් වල විස්තරාත්මක සටහනක් අංක 24 යටතේ දක්වා ඇත.අනෙකුත් මූල්‍ය වගකීම් ණයශේෂ, වෙළඳ හා අනෙකුත් ණයහිමියන්ගෙන් සමන්විත වේ.

(i). වන්දි ප්‍රතිපත්තිය

රජයේ උපදෙස් සහ ප්‍රතිපත්ති තීරණ මත විවිධ සංවර්ධන කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් දිවයින පුරා ඉඩම් අත්පත් කරගෙන ඇත. ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 45 වැනි වගන්තියට අනුව, එම අත්පත් කර ගත් ඉඩම් සඳහා වන්දි ගෙවීමේ නීත්‍යානුකූලභාවය ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ පිළිගත් දින සිට ආරම්භ වේ.
වන්දි සංරචකයට ප්‍රාග්ධන සංරචකය මෙන්ම පහත දැක්වෙන ආකාරයෙන් ගණනය කිරීම් හඳුනාගත් පොලී සංරචකද ඇතුළත් වේ.
1. ප්‍රාග්ධන සංරචකය: නිශ්චිත ඉඩම් ප්‍රමාණය සඳහා අදාළ අධිකාරිය විසින් නීරණය කරන ලද තක්සේරු අගය ප්‍රාග්ධන ගෙවීම ලෙස පිළිගනු ලැබේ.
2. පොලී සංරචකය: පිළිගත් දින 7 සිට ගෙවන දිනය දක්වා කාලය සඳහා ඉඩමේ හිමිකරුට ගෙවිය යුතු පොලී මුදල.
ඒ අනුව, ශේෂ පත්‍රයේ දිනට අත්පත් කරගත් මුළු ඉඩම් ප්‍රමාණයේ අයිතිකරුවන්ට ගෙවිය යුතු වන්දි මුදල, මූල්‍ය ප්‍රකාශනවල කාණ්ඩ දෙකක් යටතේ ගෙවිය යුතු වන්දියක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල පිළිගැනේ.
(ඒ). එළඹෙන සිව්වන වසරේ ගෙවිය යුතු සම්පූර්ණ වන්දි මුදල මුළු වටිනාකමින් 20%ක් පමණ වනු ඇතැයි උපකල්පනය කළහොත් ජංගම වත්කම ලෙස ගෙවිය යුතු සම්පූර්ණ මුදල වන්දි මුදලෙන් 20%කි.
(බී). ඉඩම් සඳහා උපචිත වන්දි ලෙස ජංගම නොවන වගකීම් යටතේ මුළු වන්දි වටිනාකමෙන් 80% ක් තවත් වසරකින් පසු ගෙවිය යුතු මුදල 80% ක් බව සලකයි.
මෙම වන්දි මුදලේ වත්මන් වගකීම් කොටස ගෙවනු ලබන්නේ ඉඩම් විකිණීමෙන් ලැබෙන ආදායම සහ දිගුකාලීන ආයෝජනවලින් ලැබෙන

පොලිය යොදා ගනිමින් එම වර්ෂය සඳහා අධිකාරියෙහි සමස්ත මුදල් ප්‍රවාහය සලකා බැලීමෙන් පසුවය. පසුගිය වසර දෙක තුළ අධිකාරියෙහි අරමුදල් යාන්ත්‍රණයෙන් සිදු කරන ලද වන්දි ගෙවීම් පහත පරිදි වේ.

වසර	ගෙවූ වන්දි මුදල (රු.)
2017	908,000,000
2018	1,663,000,000
2019	507,332,975

1.4.4. හානිවීම්

1.4.4.1 ව්‍යුත්පන්න මූල්‍ය වත්කම්

අධිකාරිය විසින් සාධාරණ අගය මත ගණනය කරනු නොලැබූ මූල්‍ය වත්කම් සෑම මූල්‍ය ප්‍රකාශන වාර්තාකරනු ලබන දිනකදීම තක්සේරු කිරීමක් සිදුකරයි. මූලිකවම මූල්‍ය වත්කමක් හානිවීම ගණනය කරනු ලබන්නේ එකී මූල්‍ය වත්කම ප්‍රාථමික ගණනය කිරීම් වලින් පසුව ඍණාත්මක බලපෑමක් මුදල් ප්‍රවාහයට සිදු වන බැව් තහවුරු වන අවස්ථාවකදීය. එවැනි නිශ්චිත වශයෙන්ම සිදු වන බලපෑම් සලකනුයේ ණයගැතියන් ගෙවීම පැහැරහැරීම් /කඩකිරීම අධිකාරිය විසින් ණය සංයුතියේ වෙනසක් සිදුකිරීම, ණයගැතියන් බුන්වත් වීම හෝ එවැනි බුන්වත් වීමේ ලක්ෂණ පෙන්නුම් කල අවස්ථාවන්හිදී සහ සුරැකුම් සඳහා වෙළඳපොල අහිමිවීමකදීය. මීට අමතරව හිමිකම් සහතිකයක සාධාරණ අගය දීර්ඝකාලීනව ශේෂවන අවස්ථාවන්ද එවැනි නිශ්චිත වශයෙන් සිදුවන බලපෑම් ලෙස සලකනු ලබයි.

අධිකාරිය විසින් ලැබිය යුතු ණයශේෂ සඳහා හානිවීම් නිශ්චිත වූ මට්ටමක් තුලදී සිදුකරනු ලබයි. මේ අනුව සියලුම සැලකිය යුතු ලැබිය යුතු ණයශේෂයන්හි හානිවීම් ගණනය කිරීම සිදුකරයි. මූල්‍ය වත්කමක් සඳහා වන හානිකරන අලාභය ගණනය කරනු ලබනුයේ ක්‍රමක්ෂය ක්ෂය ක්‍රමය මත ඉදිරියට ගෙනා ශේෂයන් මූලික සඵල පොලි අනුපාතිකය යටතේ ගණනය කල අනාගත මුදල් ප්‍රවාහයන්හි වර්තමාන අගය සලකා බැලීමක් මඟිනි.

මෙසේ ඇගයීමෙන් හටගනු ලබන හානිකරන අලාභය ආදායම් හා වියදම් ප්‍රකාශය යටතේ සඳහන් කරනු ලබන අතර ණයගැතියන්ට එරෙහිව කරනු ලබන ප්‍රතිදානයක් ලෙසද මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් කිරීම සිදුකරයි. හානීකරන මූල්‍ය වත්කම සඳහා වූ අදාල පොලිය වට්ටම් මත ගැලපීමක් සිදුකරන අතර හානිකරන අලාභය අවම වීම් ආදායම් හා වියදම්

i. ප්‍රමිතයට පටහැනිව ආදායම් උත්පාදනය නොවන නගර අලංකරණ කටයුතු සඳහා වැයකරන ලද රු.35,810,126 ක් වටිනාකමැති ව්‍යාපෘති 06 ක් හා නගර සංවර්ධන වැඩසටහන් වශයෙන් හඳුන්වා ඇති රු. 14,360,770,313 ක් වටිනාකමැති ව්‍යාපෘති 23 ක්

හා ආයෝජිත දේපල නොවන රු. 18,103,817 ක් වන අධිකාරිය සතු සංචාරක නිවාසද ආයෝජිත දේපල ලෙස ගිණුම්ගත කර තිබුණි.

ii. ප්‍රමිතයේ 30 , 32 (අ) සහ 34 ඡේදවල දක්වන ලද ව්‍යාතිරේඛ සමඟ 33 – 35 ඡේදවල දක්වන ලද සාධාරණ වටිනාකම් ආකෘතිය හෝ ඡේද 56 හි පිරිවැය ආකෘතිය ආයතනයක් විසින් එහි ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස තෝරා ගෙන ඡේද අංක 53 අනුව, සාධාරණ වටිනාකම විශ්වාසදායි ලෙස මිණුම්කිරීමට නොහැකියාවක් පවතින අවස්ථාවකදී හැර එහි සියළුම ආයෝජන දේපල සඳහා භාවිතා කල යුතු වුවද සිදුකරන ලද නියැදි පරීක්ෂාවට අනුව අධිකාරිය ආයෝජන දේපල යටතේ සාධාරණ අගය ආකෘතිය හෝ පිරිවැය ප්‍රකාරව එය මැන අත්දැයි යන්න නොසලකා මැන ඇති ආයෝජන දේපල පිරිවැය ආකෘතිය අනුගමනය කර ඇති විටක පවා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40 හි 79 (ඊ) ඡේදය මගින්ද සාධාරණ අගය හෙළිදරව් කිරීම අවශ්‍ය බව පෙන්වා දී තිබුනද අධිකාරිය විසින් එසේ කටයුතු කර නොතිබුණි. ඇතැම් දේපල පිරිවැයටත්, ඇතැම් ඒවා ප්‍රත්‍යාගණන අගයටත් **නවත් සමහර අවස්ථාවල වටිනාකම් දෙකේම එකතුවක් ලෙසද සටහන් කිරීම නිරීක්ෂණය විය.**

iii ප්‍රමිතය ප්‍රකාරව අනාගතයේදී ආයෝජිත අවස්ථාවන්හි ආයෝජන කිරීමට යෝජිත දේපල වන්නේ නම් ඒවා ආයෝජිත දේපල වශයෙන් ගිණුම්ගත කල යුතුය. අධිකාරියේ **ඉඩම් සංවර්ධන හා කළමනාකරණ අධ්‍යක්ෂකගේ 2021 මාර්තු 11 දින** ලිපිය අනුව පාර්ලිමේන්තු ඉඩමට අයත් අක්කර 1,167 ක මුළු ඉඩමින්, අක්කර 37 ක් නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන ව්‍යාපෘති වශයෙන් වෙන්කර දක්වා තිබුණි. නමුත් එම ඉඩම් කොටස් වෙන්ව හඳුනාගෙන වටිනාකම් අගය කර ආයෝජිත දේපල යටතේ ගිණුම්ගත කර නොමැති අතර එම සංවර්ධන ව්‍යාපෘති ඉඩම් හඳුනාගත හැකි තොරතුරු ඇතුළත් විස්තරාත්මක උපලේඛණයක්ද නොතිබුණි.

(උ) 2019 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කල ශේෂ පිරික්සුමේ දක්වා තිබුණ එකතුව රු.164,567,351,800 ක් වන සංවර්ධන වියදම් ගිණුම් 117 ක් පරීක්ෂා කිරීමට එයට අදාළව ලෙජර් ගිණුම් ඉදිරිපත්නොවූ අතර එම ශේෂයන් සමග මූල්‍ය ප්‍රකාශන සමග පරීක්ෂා කිරීමටද නොහැකි විය.

(ඌ) 2019 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ ශේෂ පිරිකසුමෙහි පූර්ව වර්ෂ ගැලපීම් ලෙස දක්වා තිබූ 1984 වර්ෂයේ සිට පැවත එන රු.131,891,461 ක් වටිනාකමැති හර ශේෂ ගිණුම් 19 ක් හා රු.74,389,771,544 ක් වටිනාකමැති බැර ශේෂ ගිණුම් 03 ක් හා ශේෂ පිරික්සුමේ RETSUP යන නාමයෙන් දක්වා තිබූ රු.993,270,282 ක බැර වටිනාකමක් ද මූල්‍ය ප්‍රකාශනයේ දක්වා නොතිබුණි. තවද එම ගිණුම් ශේෂ තහවුරු කරගැනීම සඳහා උප

ලේඛණයක් හෝ අදාළ සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශණයේ දක්වා නොතිබීමටද හේතුද විගණනයට ඉදිරිපත් නොවිය.

(ඒ) සමාලෝචිත වර්ෂය තුළ හදුනානොගත් මුදල් ලෙස ජ'නල් සටහන් 89 ක් මගින් රු. 42,456,567ක් මුදල් පොතට හර කර තිබුණි.

(ඓ) අධිකාරියේ අධ්‍යක්ෂ වරයෙක් ලෙස සේවය කර 2021 මාර්තු 19 දින සිට විශ්‍රාම ගත් නිලධාරියෙකු හට රු. මිලියන 1.125 ක් ගෙවීම් කර 2019 දෙසැම්බර් 31 දිනට බලාත්මක වන පරිදි 2021 වර්ෂයේ දී සිදුකරන ලද තක්සේරුවක් අනුව අධිකාරිය සතු ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු. 598,326,141,944 ක් ලෙස අගය කර තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කල මූල්‍ය ප්‍රකාශනයේ ඉඩම් ගොඩනැගිලි වටිනාකම රු. 137,181,325,312 ක් ලෙස දක්වා තිබුණි. .

(ඔ) රු.21,948,469,065 ක් වටිනාකමැති නොනිමී වැඩ ගිණුමේ වෙනත් ආයතන වෙනුවෙන් නිම කල රු. 112,929,689 ක් වටිනාකමැති ව්‍යාපෘති 03 ක් දක්වා තිබීම හේතුවෙන් නොනිමී වැඩ එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද, නොනිමී වැඩ සඳහා රු.13,856,162 ක වෙන්කිරීමක් කිරීම නිසා සහ රු.1,654,800 ක ඍණ ශේෂයක් ගැලපීම නිසා එකතුව රු.15,510,962 කින් අඩුවෙන්ද දක්වා තිබුණි.

(ඕ) අධිකාරියේ 2019 මූල්‍ය ප්‍රකාශනයේ ආදායම් යටතේ පාවෙන වෙළඳ සංකීර්ණ ව්‍යාපෘතිය සඳහා පසුගිය වර්ෂයන්හිදී වැඩිපුර ආදායමට දක්වා ඇති රු.4,228,436 ක Key Money ආදායම් පසුගිය වර්ෂයන්ට අදාලව නිවැරදි කිරීම වෙනුවට එම ව්‍යාපෘතියට අදාලව සමාලෝචිත වර්ෂයේ ආදායමෙන් අඩුකර ගිණුම්ගත කර තිබීම හේතුවෙන් සමුච්චිත ලාභය වැඩියෙන් හා සමාලෝචිත වර්ෂයේ ලාභය අඩුවෙන් දක්වා තිබුණි.

(ක) ක්ෂය ප්‍රතිශතය අනුව ක්ෂය කළ හැකි කාලය අවසන් වී වර්ෂ 2 ත් 15 ත් අතර කාළයක් ගතවී තිබූ වත්කම වලට ක්ෂය වැරදි ලෙස ගැලපීම් සිදුකිරීම නිසා 2019 දෙසැම්බර් 31 දිනට රු. 37,820,871 ක ලියාභල අගයක් මූල්‍ය ප්‍රකාශයේ දක්වා තිබුණි. එම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශයේ දේපල, පිරියත හා උපකරණවල ලියාභල වටිනාකම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඛ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් සඳහා වූ ක්ෂය රු. 7,188,215 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ග) හම්බන්තොට සිරිබෝපුර පරිපාලන සංකීර්ණයට යාබදව ඉදිකරන ලද නිල නිවාස 22 හි 2019 වර්ෂයට අදාලව ආයතනයට හිමි නොමැති රු.13,964,707 ක හිඟ කුලී ආදායමක් අධිකාරියේ හම්බන්තොට බස් නැවතුම සංවර්ධනය - කුලී ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඝ) රු.10,214,264 වටිනාකමැති බැංකු ගාස්තු, චෙක්පොත් ගාස්තු හා මුදල් මාරුකිරීම් සමාලෝචිත වර්ෂයේ මුදල් පොතට බැර කර නොතිබුණි. ඒ හේතුවෙන් වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ච) 2017 වර්ෂයේ සිට අක්‍රීයව පැවති බැංකු ගිණුම් 07 ක් අතුරෙන් එක් ගිණුමක ලෙජරයට අනුව රු. 400,000 ක බැර ශේෂය හා මූල්‍ය ප්‍රකාශය අනුව රු. 1,040,982 ක බැර ශේෂයක්ද වූ බැවින් එම බැංකු ගිණුමට අදාලව ලෙජරය හා මූල්‍ය ප්‍රකාශය අතර රු. 640,982 ක වෙනසක් ද නිරීක්ෂණය විය.

(ඡ) විලම්භිත කල්බදු කුලී වගකීම් ශේෂය තුළ ව්‍යාපෘති 05 කට අදාලව රු.21,019,626 ක හර වටිනාකමක් හිලව්කර දැක්වීම නිසා විලම්භිත කල්බදු කුලී වගකීම් ගිණුම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ට) වෙනත් රාජ්‍ය ආයතන වෙනුවෙන් කල ව්‍යාපෘති සඳහා ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ ව්‍යාපෘති වශයෙන් වෙන් වෙන්ව දැක්වීම වෙනුවට එකිනෙකට හිලව්කර දැක්වීමෙන් වෙනත් ආයතන වෙනුවෙන් සිදුකරන ලද ව්‍යාපෘති වෙනුවෙන් ලද මුදල් ජංගම වගකීම් යටතේ රු.4,632,974,727 කින් හා වෙනත් රාජ්‍ය ආයතන සඳහා සිදුකරන ලද ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද වියදම ජංගම වත්කම් යටතේ රු.3,746,878,450 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඩ) රාජ්‍ය ප්‍රදාන දායකත්වය තුළ සෙත්සිරිපාය පරිපාලන සංකීර්ණය යටතේ රු.679,584,894 ක් සඳහන් කර තිබුණු අතර ඉන් රු. 357,395,200 ක වටිනාකමක් සඳහා ගිණුම්ගතකළ යුතු රු.7,147,904 ක් වූ ක්‍රමාක්ෂය ආදායම් ප්‍රකාශයට ලියාහැර නොතිබුණි. ඒ හේතුවෙන් එම ප්‍රමාණයෙන් සමාලොචිත වර්ෂයේ ලාභය ද අඩුවෙන් දක්වා තිබුණි.

(ඪ) පාර්ලිමේන්තු සංකීර්ණය පිහිටා ඇති අක්කර 1,167 රූඩ් 03 පර්චස් 86.9 ක් වූ ඉඩම 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයේ ආයෝජිත දේපල වශයෙන් රු.3,975,027,731 ක් ලෙස දක්වා තිබුණ අතර අධිකාරියේ ඉඩම් අංශයෙන් විගණනය වෙත ලබාදුන් ලිපිය හා උපලේඛනය අනුව එම ඉඩමෙන් අක්කර 214 රූඩ් 01 පර්චස් 16.8 ක් හා වටිනාකම වශයෙන් රු.5,881,638,725 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශයේ ආයෝජිත දේපල රු.1,906,610,994 කින් අඩුවෙන් දක්වා ඇති බව නිරීක්ෂණය විය.

(ණ) රු.11,312,145 ක පිරිවැයකට පැලියගොඩ වෙයාහවුස් සමාගම විසින් මිලදී ගන්නා ලද ටොවිටේ රථ 2 යි, ලැන්ඩ් ක්‍රෘසර් රථ 01 යි, සඵාරු වැදි 01 යි සහ විවිධාකාර උපකරණ රථයක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත 2010 සහ 2012 වර්ෂයන්හි දී පවරා දී තිබූ නමුත් එම අවස්ථාවේ එම වත්කම් අගය කර නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කර නොතිබුණි. තවද අනෙකුත් වත්කම් (ලීබඩු හා කාර්යාල උපකරණ)

අධිකාරියට ලබාදුන් බව දක්වා තිබූ නමුත් අධිකාරියේ හෝ සමූහයේ ගිණුම්වලට මේ දක්වාම ගෙන නොතිබුණි.

(ත) මූල්‍ය ප්‍රකාශන අනුව ලැබියයුතු ගිණුම් ශේෂ, ගෙවියයුතු ගිණුම් ශේෂ, තැන්පතු ආදී එකතුව රු. 9,239,140,805 ක්ව පැවති ගිණුම් ශේෂ 13 ක් සඳහා ඉදිරිපත් කල උපලේඛන අනුව ශේෂයන් අතර රු. 3,455,570,097 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ද) රාජ්‍ය ආයතන, රාජ්‍ය සංස්ථා, සහ සමාගම් සමග නාගරික සංවර්ධන අධිකාරිය විසින් සිදුකර තිබූ ගණුදෙනු අනුව එකතුව රු. 641,471,664 ක් වූ ආයතන 08 ක ගෙවිය යුතු ශේෂය රු. 426,919,316 ක් හා එක් ආයතනයකින් ලැබිය යුතු ශේෂය රු. 190,000,000 ක් අදාල ආයතන වලින් ලද සනාථන සමඟ සැසඳීමේදී රු.616,919,316 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ධ) අධිකාරිය සතු තානායම් 2011 වර්ෂයේදී රෙස්ට් හවුසස් සමාගම ලෙස පිහිටුවීමේදී ණයගැති හා ණයහිමි ශේෂ හඳුනාගෙන නිසිපරිදි එම සමාගමට පවරා නොතිබීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට නාගරික සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනයන්හි රෙස්ට් හවුස් ණයගැති ශේෂය ලෙස රු.1,168,487,738 කට රු.1,053,794,027 ක් වූ බැර ශේෂයන් හිලව් කර රු.114,652,504 ක් ලෙස දක්වා තිබුණි.

(න) අධිකාරිය විසින් රාජ්‍ය ආයතන වල ව්‍යාපෘති සඳහා උපදේශණ සේවා සැපයීම වෙනුවෙන් ලැබිය යුතු කළමනාකරණ උපදේශන ගාස්තු වන රු.39,255,824 ක ශේෂයට රු.28,621,555 ක ගෙවිය යුතු ශේෂය හිලව් කර රු.10,634,268 ක ශේෂයක් ලැබිය යුතු ලෙස දක්වා ඇති අතර එම ශේෂය තුල වසර 35 කට වඩා පැරණි රු 19,589,853 ක හඳුනානොගත් ලැබිය යුතු ශේෂයක්ද රු.18,879,289 ක හඳුනානොගත් ගෙවිය යුතු ශේෂයක්ද ඇතුළත්ව තිබුණි.

(ඳ) මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී රු.9,112,177,812 ක් වටිනාකමැති ගිණුම් ශේෂ 08 ක් වෙනුවෙන් විස්තරාත්මක උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ප) එක් එක් ව්‍යාපෘති අංකය යටතේ පවතින දේපල මිලදී ගත් හෝ ,අත්පත් කරගත් දිනට වටිනාකම් සහ අත්පත් කරගත් දිනය, හා එදිනෙන් පසු කල වැඩි දියුණුකිරීම් ලියාපැදීම් සහ එම දිනයන් ද , එක් එක් ව්‍යාපෘති අංකය යටතේ දේපල බදු ලබාදුන් පදනම, අදාල වර්ෂ ගණන හා එම දිනයන් සහිත උපලේඛණයක් හා වත්කම් ලේඛණයක් ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සංවර්ධන කටයුතු වෙනුවෙන් පවරා ගන්නා ලද වර්ෂයේ ආරම්භයේ පැවති හා වර්ෂය තුල පවරාගත ඉඩම හා දේපල සියලුලම ආයෝජන දේපල යටතේ ගණුම්ගතව ඇත බව තහවුරු කිරීමේ හැකියාව හා බදු කාලය අවසන්වී ඇති වත්කම් නැවත අගය කිරීමේ අවශ්‍යතාවය හා සාධාරණ වටිනාකමට දක්වා ඇති බවට නිශ්චිතව හඳුනාගැනීමේ හැකියාව ද ඇතිරී නිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශයේ ආයෝජිත දේපල වටිනාකම් වන රු. මිලියන 96,706,779,657 ක නිවැරදිකාවය තහවුරු කිරීමට නොහැකිවිය.

(එ) පාර්ලිමේන්තු ඉඩමට අයත් ආයෝජිත දේපල යටතේ පැවති සෙත්සිරිපාය ගොඩනැගිල්ලේ වටිනාකමින් රු.1,613,133,333 ක් දේපල පිරියත හා උපකරණ යටතට සමාලෝචිත වර්ෂය තුල මාරු කර තිබුණි. එසේ මාරුකල වටිනාකමේ නිවැරදිතාවය සහතික කිරීමට, සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

(බ) මුල්‍ය ප්‍රකාශන තුල දක්වා ඇති රු.10,634,268 ක් වටිනාකමැති ලැබිය යුතු උපදේශන සේවා හා කළමනාකරණ ගාස්තු පරීක්ෂාකිරීම සඳහා තොරතරු විගණනය වෙත ඉදිරිපත් නොවීය.

(භ) රු. 1,153,102,808 ක් වටිනාකමැති ණයගැති/ලැබියයුතු ශේෂයන් වසර 3 – 4 අතර කාලයක සිට හිඟව පවතින අතර එම ශේෂ නහවුරුකර ගැනීමට අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණු අතර එම ශේෂ අයකර ගැනීමේ හැකියාව අවිනිශ්චිතය.

1.2.3 අධිකාරියේ පුර්ණ පරිපාලිත සමාගමක් වන ලංකා රෙස්ට් හවුසස් සමාගමේ විගණන වාර්තාවෙහි මතය ව්‍යාවනය කර තිබූ අතර වෝටර්ස් එජ් සමාගමේ හා නාගරික ආයෝජන සහ සංවර්ධන සමාගමේ විගණන මතය තත්ත්වාගණනය කර තිබුණි. ඉහතින් සඳහන් කල මත සඳහා හේතුවු කරුණු පහත දැක්වේ.

(අ) ලංකා රෙස්ට් හවුසස් සමාගම

---

i සමාලෝචිත වර්ෂය අවසානයට දේපල පිරියත හා උපකරණ ලෙස රු.10,289,128 ක් මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණද මෙකී පිරිවැයට ඇතුලත් කර තිබුනේ 2011 වර්ෂයට පසුව මිලට ගත් වත්කම් පමණි. 2011 වර්ෂයට පෙර සමාගම සතුව පැවති වත්කම් මුල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. 2011 වර්ෂයට පෙර පැවති වත්කම්වල අයිතිය සමාගම සතු බව හා තානායම් ඇතුළු අනෙකුත් වත්කම් පවතින බවද සමාගමේ කළමනාකරණය පිලිගත්තද එම වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ඇතුලත් කිරීමට පියවර ගෙන නොතිබුණි. එසේම සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මුල්‍ය ප්‍රකාශන අනුව රු.10,289,128 ක් වූ දේපල පිරියත හා උපකරණ සඳහා සමාගම විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් යාවත්කාලීනව හා සම්පූර්ණව නඩත්තු නොකිරීම නිසා මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ස්ථාවර වත්කම්වල නිවැරදිතාවය විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

ii සමාලෝචිත වර්ෂයේදී මහයංගන තානායමේ සිදුකරන ලද ප්‍රතිසංස්කරණ වලට අදාලව ගෙවිය යුතු රු.3,194,655 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස හා ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

iii සමාගම සහ මව් සමාගම සමඟ පවතින ජංගම ගිණුමේ ශේෂය රු.57,637,911 ක් හා නාගරික සංවර්ධන අධිකාරියේ ගිණුමට අනුව සමාගමට අදාලව පැවති ජංගම ගිණුමේ ශේෂය

රු.61,686,503 ක් වූයෙන් ගිණුම් අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.4,054,592 ක වෙනසක් නිරීක්ෂණය විය. එසේ වුවත් එම ගිණුම් අතර වෙනස්කම් හඳුනාගෙන අදාල ශේෂයන් ගැලපීමට කටයුතු කර නොතිබුණි.

iv ලංකා රෙස්ට් හවුසස් සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි 60 වන ඡේදයට අනුව වත්කම් හා වගකීම් ද්‍රවශීලතා අනුපිළිවෙලට ඉදිරිපත් කල යුතු වුවත් ඒ අනුව ඉදිරිපත් කර නොතිබුණි.

v ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 16 යේ 81 ඡේදය අනුව, තල්බදු ගැණුම්කරුවෙකුගෙන් මෙහෙයුම් කල්බදු සඳහා ලැබෙන ආදායම් සරල මාර්ග පදනම හෝ වෙනත් ක්‍රමවත් පදනමක් මත හඳුනාගත යුතුය. එසේ වුවත් වර්ෂ 10 ක කාලයක් සඳහා බදු දී තිබුණු තානායම් 03 ක් වෙනුවෙන් නැවත නොගෙවීමේ පදනම මත 2019 ජූලි 10 දින අයකර තිබුණු රු.2,787,000 ක මුදලක් ක්‍රමවත් පදනමක් මත බදු කාලය මත හඳුනාගැනීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගැනීම නිසා සමාලෝචිත වර්ෂයේ ලාභය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

vi 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය රු.745,519 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

vii තානායම් වලින් ලැබිය යුතු කුලි ආදායම රු.1,499,047 ක් වැඩියෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයේ දක්වා තිබීම නිසා වර්ෂයේ ලාභය හා වෙළඳ ණයගැතියන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

viii පළාත් පාලන ආයතන සතු සමාගම මහින් පාලනය කරනු ලබන තානායම් මහින් උපයා තිබුණු ආදායම් මත අයකර පළාත් පාලන ආයතන සඳහා නැවත ගෙවිය යුතු රු.3,668,269 ක එකතු කල අගය මත බදු මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

ix ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි නියමයන්ට පටහැනිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමෙදී උපලබධි කාලය වර්ෂයක් ඉක්මවන රු.39,498,342 ක් වූ ස්ථාවර තැන්පතු, මුදල් හා මුදල් සමාන අයිතම යටතේ දක්වා තිබුණි. ඊට අමතරව වර්ෂයේ මිලටගත් දේපල හා පිරියත වල පිරිවැය වෙනුවට ක්ෂය අඩුකිරීමෙන් පසු අගය මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගැලපීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් වල ශුද්ධ මුදල් ප්‍රවාහයෙහි මුදල් ගලායාම රු.631,899 ක් අඩුවෙන් දක්වා තිබුණි.

x සමාලෝචිත වර්ෂය තුල බොල්ණය ලෙස රු.4,152,161 ක් පොත් වලින් කපාහැර තිබුණද, මෙකී බොල්ණය ගණනය කිරීමට අදාල උපලේඛන විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

xi සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් බදු ගණනය කිරීමට අදාල විස්තර හා උපලේඛන විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

xii වෙළඳ ණය හිමියන් රු.21,125,835 ක් හා වෙනත් ණය හිමියන් රු.7,154,819 ක් වන ශේෂයන් සඳහා ශේෂ සනාථන ලිපි ලැබී නොතිබුණු අතර මෙකී ණයහිමි ශේෂ වල පැවැත්ම විගණනයට තහවුරු කරගත නොහැකි විය.

(ආ) **වෝටර්ස් එජ් සමාගම**

i ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 ට අනුව, සම්පූර්ණ ක්ෂය කර ඇති නමුත් දැනට භාවිතා කරන ලබන ස්ථාවර වත්කම් පිළිබඳ මුල්‍ය ප්‍රකාශන වලින් හෙලි කල යුතු අතර එම වත්කම් වල ඵලදායී ජීවන කාලය නැවත තක්සේරු කර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 අනුව මුල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කල යුතුය. එසේවුවද සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් දැනටමත් භාවිතා කරනු ලබන රු.මිලියන 105.8 ක වත්කම් සම්බන්ධව එපරිදි කටයුතු කර නොතිබුණි.

ii සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුලදී සහ ඉකුත් වර්ෂ වලදී අක්කර 23 රූඩ් 01 පර්චස් 9.05 ක ඉඩමක් 99 අවුරුදු බදු පදනම මත රු.4,275,046,738 ක මුදලකටද තවත් අක්කර 01 රූඩ් 03 පර්චස් 34.02 ක ඉඩමක් අවුරුදු 20 ක බදු පදනම මත රු.80,000,000 ක මුදලකට නාගරික සංවර්ධන අධිකාරිය වෙතින් ලබාගෙන තිබුණි. එසේ වුවත් ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 16 හි 24 සහ 26 ඡේද ප්‍රකාරව බදු පදනම මත ඉඩම් පරිහරණය කිරීමේ අයිතිය සහ ඊට අදාල කල්බදු වගකීම මුල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි.

iii රේඛිය අමාත්‍යාංශය සමඟ රු.642,533 ක් වූ සම්බන්ධිත පාර්ශව ගණුදෙනු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි විධිවිධාන අනුව මුල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි.

iv ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව සමාගම විසින් රථගාල් සහ මාර්ග වලට අදාල ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය වසර 05 සිට 25 දක්වා සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශනවල වෙනස්කර තිබුණද ඒ සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් ලබාගෙන නොතිබු අතර ප්‍රමිතිය ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුව වෙනස්වීම මහින් මුල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම සමාලෝචිත වර්ෂයේදී හෙලිදරව් කල යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

v සමාගම විසින් 2019 දී රු. මිලියන 14.7 ක් වැයකර ඕකිඩ් පැල මිලදීගෙන වානිජමය අරමුණු සඳහා සමාගම් භූමියේ රෝපණය කර තිබුණි. එසේවුවත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 41 ට අනුව මෙකී ජීව විද්‍යාත්මක වත්කම් සම්බන්ධව මුල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

vi ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනයකිරීමේ සංස්ථාව විසින් රු.125,442,300 ක් වැයකර ඉදිකර තිබූ දුම්රිය ආපනශාලාව මෙහෙයුම් කටයුතු සඳහා 2018 පෙබරවාරි 28 දින

සිට සමාගම වෙත පවරාදී තිබූ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ප්‍රමාදවීමේ පොලියද සමඟ රු.130,881,116 ක් සමාගම වෙතින් ඉල්ලුම් කර තිබුණි. කෙසේවුවද සමාලෝචිත වර්ෂයේදී සමාගම විසින් මෙම වගකීම් සඳහා මුල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන ඇතිකර නොතිබුණු අතර මුල්‍ය ප්‍රකාශනවල සටහන් 13 (ආ) යටතේ හෙළිදරව් කිරීමක් පමණක් සිදුකර තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ ලාභය සහ සමාලෝචිත වර්ෂය අවසානයට රදවාගත් ලාභ ආසන්න වශයෙන් පිළිවෙලින් රු.26,429,883 ක් සහ රු. 22,024,486 ක් වැඩියෙන් වෙළඳ හා අනෙකුත් ණයහිමි ශේෂය රු.136,881,116 කින් අඩුවෙන්ද දක්වා තිබුණි.

vii ඒෂියා පැසිපික් ගොල්ෆ් කෝස් සමාගම වෙතින් 2009 වර්ෂයේදී චෝටර්ස් එජ් හෝටලය නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමේදී රු. 262,284,393 ක් වන එහි පැවති කාර්යාල උපකරණ, මුළුතැන්ගෙයි උපකරණ ඇතුළු අනෙකුත් ජංගම වත්කම්ද පවරාගෙන තිබුණි. එසේ වුවත් චෝටර්ස් එජ් සමාගම විසින් එසේ පවරාගත් වත්කම් ඉන්වෙන්ට්‍රිගත කිරීමට හා තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

viii මාස 06 ක් තුල ළමා උද්‍යානයක් ඉදිකිරීම සඳහා සමාගම 2017 දෙසැම්බර් 21 දින විදේශීය පෞද්ගලික සමාගමක් සමඟ සංවර්ධන ගිවිසුමකට එළඹ තිබුණු අතර සංවර්ධන ගිවිසුමේ 4.1 වගන්තියට අනුව එම ගිවිසුමේ 5.1.1 වගන්තියට අනුව කළමනාකරණ කාලය තුල සංවර්ධකයා විසින් රු.600,000 ක මාසික කුලියක් සමාගමට ගෙවිය යුතු වේ. එසේවුවත් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කිසිදු මුදලක් ගෙවා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසානයට සංවර්ධකරුගෙන් සමාගමට ලැබිය යුතුව තිබුණු රු.මිලියන 108.8 ක් සමාගමේ මුල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

ix රු.මිලියන 8,177 ක ඇස්තමේන්තු වටිනාකමින් යුතු කාමර 182 ක හෝටලයක්, නිවාස ඒකක 185 ක් හා අනෙකුත් පොදු පහසුකම් සහිතව මහල් 18 කින් යුතු ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීම 2014 වර්ෂයේදී චෝටර්ස් එජ් සමාගම පිහිටි භූමියේ ආරම්භකර 2015 ජනවාරි මස සිට එහි වැඩ කටයුතු තාවකාලික නතර කර තිබූ අතර, නැවත ආරම්භ නොවූ හෙයින් අදාළ කොන්ත්‍රාත් සමාගම විසින් කොළඹ වාණිජ මහාධිකරණයේ නඩුවක් පවරා තිබුණි. එමඟින් කළ වැඩ සඳහා නොගෙවූ බිල්පත් වටිනාකම රු.179,937,010 ක් හා ඊට අදාළ නෛතික පොළිය හා රු.180,600,000 ක නඩු ගාස්තුවක් ඉල්ලා ඇති අතර ඒ සම්බන්ධව ඒකාබද්ධ මුල්‍ය ප්‍රකාශයේ හෙළදරව් කර නොතිබුණි.

x සමාලෝචිත වර්ෂයේ අවසානයට සමාගම වෙත රාජ්‍ය ආයතන 04 කින් රු. 16,868,794 ක් වසර 02 ත් වසර 06 ත් අතර කාලයක සිට ලැබිය යුතු ණය ශේෂ ලෙස මුල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.කෙසේවෙතත් එම රාජ්‍ය ආයතන වලට අදාල මුල්‍ය ප්‍රකාශන වලට අනව මෙවැනි ණය මුදලක් සමාගමට ගෙවිය යුතු ලෙස දක්වා නොතිබුණි.

(ඇ) නාගරික ආයෝජන හා සංවර්ධන සමාගම

---

i සමාලෝචිත වර්ෂය අවසානයේදී මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය රුපියල් 49,657,265 කි. කෙසේ වුවද, ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබූ අතර සමාගම විසින් එකී වත්කම් සත්‍යාපනය කිරීමක් සිදු කර නොතිබුණි. එබැවින් විගණනයේදී එම වත්කම්වල වටිනාකම සහ පැවැත්මේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය.

ii විගණනය සඳහා ඉදිරිපත් කර ඇති සවිස්තරාත්මක උපලේඛනය හා ණයගැති ලෙජරයේ දක්වා ඇති වටිනාකම අතර රු.7,225,918 ක වෙනසක් නිරීක්ෂණය විය. කෙසේවුවද, එකී වෙනස අනාවරණය කර ගැනීම සඳහා කිසිදු සැසඳීමක් සිදු කර නොතිබුණි.

ඉහත විස්තර කර ඇති පරිදි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීරණ ආදායම් ප්‍රකාශයේ, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ඇතුලත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මඟින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මට නොහැකි විය. මේ හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සැකසෙන වටිනාකම් හෝ අයිතමයන්වල වාර්තාගත හෝ වාර්තා නොකල වටිනාකම් හෝ ගණුදෙනු සම්බන්ධයෙන් කිසියම් ගැලපීමක් කිරීමට අවශ්‍යදැයි මට නිශ්චය කිරීමට නොහැකි විය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැතමට අදාළ කරුණු අනාවරණය කරමද කළමනාකරණයෙ වගකමක.

සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ සහ සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අධිකාරියේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේවුවද, මතය ව්‍යාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මා හට නොහැකි විය.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා ලබාගෙන නොමැති අතර. නිසි ගිණුම් වාර්තා අධිකාරිය තබා තිබේද යන්න තීරණය කිරීමට මට නොහැකි විය.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ මතය ව්‍යාචනය සඳහා පදනම් කොටසේ 1.2 (අ) සිට (ඔ) දක්වා ඇති නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති රීති විධානයට යොමුව	**විගණන නිරීක්ෂණය**
(අ)	1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත II වන කොටසේ 8 ඡේදයේ (එ) වගන්තිය	අධිකාරිය විසින් නාගරික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම සිදුකලයුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ආ)	භාණ්ඩාගාර චක්‍රලේඛ	
(i)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	චක්‍රලේඛය ප්‍රකාරව අධිකාරියට අයිත් සහ අධිකාරිය භාරයේ පවත්නා, ප්‍රයෝජනයට ගනු ලබන සියලුම ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් පොදු 287 ආකෘතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ii)	2011 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය	පරිගණක යන්ත්‍ර මිලදීගැනීම, භාරකාරත්වය, නඩත්තුව, අළුත්වැඩියාකිරීම් සහ අපහරණය කිරීම ආදී විස්තර ඇතුලත් වන පරිදි පරිගණක යන්ත්‍ර සම්බන්ධයෙන් හා පරිගණක මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කර නොතිබුණි.
(ඇ)	2014 පෙබරවාරි 11 දිනැති අංක 01/2014 රාජ්‍ය මුදල් චක්‍රලේඛ 5 (2) ඡේදය	2019-2021 සඳහා වූ සංයුක්ත සැලැස්මෙහි ඇතුළත් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම් ඇතුළත් කරමින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.
(I)	8.2.3 වගන්තිය	පරිපාලිත සමාගම් ලෙස අධිකාරිය විසින් 2014 නොවැම්බර් 21 දින පිහිටුවා තිබූ නාගරික ආයෝජන සහ දේපල වෙළඳාම් පෞද්ගලික සමාගම, නාගරික ආයෝජන සහ හෝටල් සංවර්ධන සමාගම, ඕච්රඩ් (Orchard) නාගරික නිවාස සංවර්ධන සමාගම සහ චෝටර්ස් එජ් හෝටල් සංවර්ධන සමාගම පිහිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(II)	8.3.9 වගන්තිය	පොදු ව්‍යාපාර සතු වත්කම් රේඛීය අමාත්‍යාංශයට හෝ වෙනත් රාජ්‍ය ආයතන වලට මුදාහැරිය නොහැකි වුවත් ඊට පටහැනිව අධිකාරිය විසින් රු.2,313,550 ක් වැයකර මිලදීගත් කැමරා උපකරණ 2018 වර්ෂයේදී

	අමාත්‍යාංශය මාධ්‍ය ඒකකය වෙත ලබාදී තිබූ බව දැක්වුණි. පසුව 2020.06.29 වන දින සිට අග්‍රාමාත්‍යතුමාගේ මාධ්‍ය ඒකකය වෙත එම වන්කම් ලබා දුන් බව ද දක්වා තිබුණි.
(III) 9.4 වගන්තිය	අමාත්‍ය මණ්ඩල අනුමැතියෙන් තොරව රාජ්‍ය ව්‍යාපාර වල නිළධාරීන් අමාත්‍යාංශය වෙත හෝ වෙනත් ආයතනයකට නිදහස් කල නොහැකි වුවත් අධිකාරියේ පරිපාලිත සමාගමක් වන නාගරික ආයෝජන හා සංවර්ධන සමාගමේ නිළධාරීන් 82 කු හට සාමාලෝචිත වර්ෂයේදී රු. 40,946,517 ක් ගෙවා අධිකාරිය විසින් සේවයේ යොදවා ගෙන තිබුණි.
(ඇ) 2009 අප්‍රේල් 17 දිනැති අංක 597/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය V වන උපලේඛනයේ 7 ඡේදය	අධිකාරිය විසින් වසර කිහිපයකට පෙර කොළඹ මහනගර සීමා බල ප්‍රදේශය තුල මහනගර හා ඇලමාර්ග ආශ්‍රිතව සිදුකරනු ලැබූ සම්ක්ෂණයකට අනුව අනවසර ඉදිකිරීම් සහ අනවසර වෙනස් කිරීම් 1,868 ක් හඳුනාගෙන තිබුණද, ඊට අදාළ ගැසට් පත්‍රයේ විධිවිධාන අනුව අනවසර ඉදිකිරීම් නියමානුකූල කල හැකිනම්, ආවරණ අනුමැතියක් සඳහා වූ ගාස්තුවක්ද, භාවිතය වෙනස් වීම සඳහා ගාස්තුවක්ද අධිකාරිය විසින් අයකරගෙන, එකී ඉදිකිරීම් නියමානුකූල කිරීමට හෝ අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.
(ඈ) 2010 පෙබරවාරි 03 දිනැති අංක SP/RD/02/10 දරන ජනාධිපති කාර්යාල වක්‍රලේඛය 3.4 ඡේදය	අධිකාරිය විසින් නාගරික සංවර්ධනය සඳහා ලබාදී ඇති ඉඩම් විශාල ප්‍රමාණයක් පවරා ගත් කාර්යයට නොයොදවා පෞද්ගලික ආයතන සඳහා දීර්ඝකාලීන බදු යටතේ ලබා දී තිබුණි. නවත් වටිනා ඉඩම් සුඛෝපභෝගී නවාටු නිවාස ඉදිකිරීම සඳහා ලබා දී තිබූ අතර වර්ෂ ගණනාවකට පසු මුල් අයිතිකරුවන්ටම නැවත ලබා දී (අවසතු) තිබුණි.
(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 113 (3)	ජ'නල් සටහන් 4 ක් මඟින් රු. 32,068,113 ක් වටිනාකමැති පසුගිය වර්ෂයන්ට අදාල ණයගැති ශේෂ මුදල් අමාත්‍යාංශයේ අනුමැතියෙන් තොරව ලියාපැරීමට කටයුතු කර තිබූ අතර එම ශේෂයෙන් රු. 17,872,956 ක් සඳහා අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හෝ ලබාගෙන නොමැති බව නිරීක්ෂණය විය.

2.2.3 2018 අංක 19 දරණ පාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ

ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) අධිකාරිය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව ඉදිරි වර්ෂ 03 කට අදාල (2019-2021) ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් ඇතුලත් වන පරිදි ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සහ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි.

(ආ) අධිකාරිය විසින් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ දී පහත සඳහන් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනනුකූලව කටයුතු කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය.

- තාක්ෂණික ඇගයුම් කමිටුවට සාමාජිකයන් පත්කරන ලද පත්වීම් ලිපි, ලිපිගොනු තුල ඇතුලත්ව නොතිබීම.
- ඉඩම නිරවුල් කර ගැනීම, නිශ්චිත සැලසුම් සකස් කරගැනීම වැනි ප්‍රධාන කාරණා සම්පූර්ණ නොකර කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබීම සහ ඉඩම් නිරවුල් නොකරන ලද කොන්ත්‍රාත් සඳහා අත්තිකාරම් ගෙවා තිබීම.
- ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට අනුකූල නොවන ලෙස කාර්ය සාධන බැඳුම්කර ලබාගෙන තිබීම.
- බැඳුම්කරවල කාලය දීර්ඝ කිරීම නිසි වේලාවට සිදු නොවීම.
- මිල ඇගයීමේදී අයිතමයෙන් අයිතමය මිල ගැලපුම් කරන ලද සවිස්තරාත්මක ලේඛන තාක්ෂණික ඇගයුම් වාර්තාව තුල ඇතුලත් නොවන අතර මුළු මිල සඳහා පමණක් ගැලපුම් සිදු කරමින් ඇගයීම් සිදුකර තිබීම.
- ඇගයුම් ක්‍රියාවලියේදී ලකුණු ලබාදීමේදී , මිල සාධකයට ඉතාමත් අඩු බර තැබීමත් අනෙකුත් සාධක සඳහා ඉතා වැඩි බර තැබීමක් සිදුවී ඇත. ඒ හේතුවෙන් ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සැලකිය යුතු ප්‍රතිශතයකින් මිල අඩු ලංසු ප්‍රතිකෂේප වී තිබීම.
- තාක්ෂණික ඇගයුම් වාර්තාවෙහි ඇගයුම් ක්‍රමවේද සහ නිරණ පිළිබඳ සටහන් ඇතුලත් කර නොතිබීම.
- ඉංජිනේරුමය ඇස්තමේන්තුවට වඩා වැඩි මිලකට ප්‍රසම්පාදනය පිරිනැමීමට ඇගයීමේ වාර්තාව නිර්දේශ කරන අතර එසේ ඉක්මවීම් පිළිබඳ සහ ඉංජිනේරු ඇස්තමේන්තුව පළබඳ අවශ්‍ය පැහැදිල කරම නොකොට ගවසුමට එලබම.
- ප්‍රසිද්ධ මිල කැඳවීම් වලින් තොරව ඉඩම් දීර්ඝකාලීනව බදුදීම් සිදුකර තිබුණි.

(ඇ) රු. මිලියන 190 ක ඇස්තමේන්තු මුදලකට ERP (Enterprises Resource Planning) පරිගණක පද්ධතියක් ඇතිකිරීමට උපදේශක සේවාව සැපයීම වෙනුවෙන් එකතුව රු. 3,875,995 ක

උපදේශණ ගාස්තුවක් ගෙවා උපදේශන සමාගමේ සේවාව ලබාගෙන තිබුණ නමුත් මෙම පද්ධතිය ස්ථාපනය කිරීම අත්හිටුවා තිබුණි.

(ඇ) වර්තමානයේ පවතින කළමණාකරන ගිණුම්කරණ පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා රු. 8,300,000 ක් හා 2022 ජූලි 22 දක්වා වන විට නඩත්තු හා සේවාවන් සඳහා වූ සේවා ගිවිසුම් 02 ක් වෙනුවෙන් වර්ෂ 2ක් සඳහා රු. 2,160,000 ක් ද ගෙවා තිබුණද 2019 දෙසැම්බර් 31 දිනට වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය සහ මූල්‍ය තත්ව ප්‍රකාශය , ණයගැති / ණයහිමි කාල විශ්ලේෂණ, ණයගැති / ණයහිමි සැසඳුම් වාර්තා , වාර්ෂික ක්ෂය ගණනය කිරීම , VAT Schedules (උප කාර්යාල ඇතුළුව) , ආයෝජිත දේපල ලේඛණයක්, දෙන ලද කාල පරිච්ඡේදයකට ස්ථාවර කැන්පතු ලේඛණයක්, අගරු චෙක්පත් උප ලේඛණය , බැංකු සැසඳුම් ආදී වාර්තාවන් ගිණුම්කරණ පද්ධතිය තුළින් ලබාගත නොහැකි බව නිරීක්ෂණය විය.

(ඉ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8:13:4 වගන්තිය ප්‍රකාරව මුල් පිරිවැයෙන් උපරිමයකට 10% ක කොන්ත්‍රාත් විචලනයක් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහාය ඇතිව ප්‍රසම්පාදන කමිටුවට තීරණය කළ හැකි අතර සියයට 10 ඉක්මවන්නේ නම් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8:13:4 ප්‍රකාරව ආයතන ප්‍රධානී විසින් අනුමත කල යුතු නමුත් අධිකාරියේ ගිණුම්කරණ පද්ධතියෙහි අතිරේඛ වැඩ සඳහා නියමිත ප්‍රමාණයට වඩා රු. 4,170,000 ක් එනම් සියයට 60 ක් කළමනාකරණ අනුමැතිය මත ගෙවා තිබුණි.

(ඊ) කළමණාකරණ ගිණුම්කරණ පද්ධතිය සැකසීමට ඇතිකරගත් ගිවිසුමට අනුව වැඩ අවසන් කිරීමෙන් පසු පළමු වර්ෂයේදී නඩත්තු හා සේවා නිදහස් වන අතර දෙවන වසරේ සිට මුළු පිරිවැයෙන් සියයට 10 ක් නඩත්තු හා සේවා සඳහා ගෙවීමට ලංසු ලියවිල්ල ඉදිරිපත් කරන අවස්ථාවේ සඳහන් කර තිබුණි. වැඩ අවසන් කිරීමේ සහතිකය 2021 ජූලි 28 දින අධිකාරිය විසින් නිකුත් කර තිබූ අතර නඩත්තු හා සේවා සැපයීම සඳහා මුදල් අයකිරීමක් නොමැතිව 2022 ජූලි 28 දින දක්වා සිදුකළ යුතු නමුත් එම ගිවිසුමට පටහැනිව 2020 ජූලි 23 දින සිට 2022 ජූලි 22 දක්වා වූ කාලය වෙනුවෙන් නඩත්තු හා සේවා සැපයීම සඳහා වාර්ෂිකව රු. 1,080,000 ක් වන ලෙස ගෙවීමට සේවා ගිවිසුම් 02 ක් අධිකාරිය අදාල ආයතනය සමග අත්සන් කර තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් එම කාලය තුල රු. 2,160,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) අධිකාරියට අයත් පිටකොටුව පාර්මෙස් ධාන්‍යාගාර ඉඩම බදු දීමෙදී / මිළ ගණන කැඳවමෙදී ඉදිරිපත් කරන ලද කොන්දේසි වලට පටහැනිව නීත්‍යානුකූල නොවන අයුරින් බදු හිමිකරු විසින් සිදුකරනු ලබන අතුරු බදුදීම් සහ ස්ථිර කඩකාමර සඳහා වක්‍ර ආකාරයෙන් අධිකාරිය විසින් අනුමැතිය ලබාදීම අද දින දක්වාම සිදුවී තිබූ නිසා ඉඩම දිර්ඝකාලීනව බදු දීම සම්බන්ධ නීතිමය ගැටළු ඇතිවී තිබුණි. එසේම බදු කොන්දේසි බදුදීමෙන් පසුව වෙනස්කිරීම නිසා මෙම

ඉඩම බදුදීමේදී ඉහළම්ළ ගණන් ලබාගැනීමට තිබූ අවස්ථාව අධිකාරිය විසින් අහිමි කරගෙන තිබුණි.

(ආ) අධිකාරිය සතු කොටුව ඩී.ආර්.විජේවර්ධන මාවතේ පිහිටි ඉඩමේ කායික භුක්තිය ප්‍රසිද්ධ මිලකැඳවීමෙන් තොරව අමාත්‍ය මණ්ඩල අනුමැතියට පෙර 2007 වසරේ සිට පුද්ගලික සමාගමක් වෙත ලබාදී තිබුණ අතර 2017 පෙබරවාරි 16 දින වසර 50 කට මුල් සමාගමේ හිමිකරු සතු තවත් සමාගමකට බදු දී ඇත. තවද අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධිමත් අනුමැතියකින් තොරව රජයේ තක්සේරු වටිනාකමට වඩා රු.මිලියන 330 ක් අඩුවෙන් මෙම ඉඩම බදුදීමට එකඟවීම හේතුවෙන් මෙම ඉඩම බදු දීමේ දී රු.මිලියන 330 ක අලාභයක් හා දීර්ඝකාලීනව ආදායම අහිමිවීමෙන් අධිකාරියට අලාභයන් සිදුවී තිබුණි. මෙම අලාභයට වගකිව යුතු පාර්ශවය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් මේ දක්වා ගෙන නොතිබූ අතර කිසිදු සංවර්ධන කටයුත්තක්ද සිදුකර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේ අගභාගයේදී ආරම්භකරන ලද යාපනය තානායම ඉදිකිරීම සඳහා රු.77,488,987 ක වියදමක් දරා තිබුණ අතර මෙම ව්‍යාපෘතිය අතර මහදි නවතා දැමීම හේතුවෙන් ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිම නොකර අත්හැර දමා තිබුණි. ඒ සඳහා වැයකරන ලද මුදල නිශ්කාර්ය වියදමක් විය.

(ඈ) 2017 වසරේ කසල කන්ද නායයාමෙන් අනතුරුව මීතොටමුල්ල පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ නාගරික උද්‍යානයක් ඉදිකිරීමට සැලසුම් කර එම කසල කන්ද ස්ථායීකරණය (trial compaction) සඳහා මීටර් 30 සිට මීටර් 12 දක්වා මට්ටම් කර බැලන්කට් ලේයරයක් යෙදීම හා හරිතාගාර වායු විමෝචන ඒකක ස්ථාපනය කිරීමේ කොන්ත්රාත්තුව රු. මිලියන 269.5 කට පෞද්ගලික ආයතනයක් වෙත 2020 ජූනි 09 දින ලබාදී තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා රු.432,946,468 ක මුදලක් අධිකාරිය විසින් ගෙවා තිබූ අතර 2020 නොවැම්බර් 25 දින වැඩ අවසන්ව භාරදීමේ සහතිකයද නිකුත් කර තිබුණද සැලසුම් කල පරිදි උද්‍යානයක් ඉදිකර නොතිබුණි. තවද ස්ථායීකරණය කරන ලද කසල පිහිටි ස්ථානය වර්තමානය වන විට නිසි කළමනාකරණයකින් හා අධීක්ෂණයකින් තොරව පවතින අතර මෙම ස්ථානයෙන් ස්ථාපිත කර ඇති බැහැර වන අප ජලය ඇලමාර්ග වලට හා භූගත ජලයට එකතුවීම වැලැක්වීමට හා අඛණ්ඩ වායු විමෝචන මධ්‍යස්ථානය හරහා ගෑස් එකතුකිරීමේ පද්ධතියද වල්බිහිවී අතහැර දමා ඇති බව 2021 දෙසැම්බර් 23 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ඉ) හම්බන්තොට සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා ප්‍රාග්ධන වියදම් ලෙස රු. 3,830,874,596 ක් රජයේ අරමුදල් වලින් හා විදේශ ණය යටතේ 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රු. 851,200,000 ක් (ඇ.ඩො. මිලියන 6.4 ක්) වැයකර තිබුණි. ඊට අමතරව අයභාර වියදම් ලෙස මෙය පවත්වා ගෙන යාමට 2017 සිට 2019 වර්ෂය දක්වා පමණක්

රු.75,889,769 ක් වැයකර තිබූ නමුත් එම ව්‍යාපෘතියෙන් 2017 සිට 2019 දක්වා ආදායම් ලෙස උපයා තිබුනේ රු.15,896,360 ක් පමණි.

(ඊ) නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියෙහි උපව්‍යාපෘති 21 යටතේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා රු.මිලියන 48,090 ක් වැය කරමින් නිවාස 13,580 ක් ඉදිකර 2013 වර්ෂයේ සිට 2021 දක්වා පවරා ඇති නමුත් නිවාස 12,875 ක් සඳහා සභාධිපත්‍ය කළමණාකරන අධිකාරී සභනිකය ලබානොගැනීම හේතුවෙන් එම නිවාස වල නඩත්තු කටයුතු නිවාසලාභීන්ට හිමි නොවීම නිසා නඩත්තු වෙනුවෙන් අධිකාරියට විශාල පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(උ) කොම්පඤ්ඤවීදිය ප්‍රතිසංවර්ධන ව්‍යාපෘතියට අයත් ඉඩමෙහි පදිංචිවී සිටි පවුල් සඳහා මහල් නිවාස ඒකක ඉදිකිරීමේ කාර්යය 2015 වර්ෂයේදී නිමකල යුතු වුවද ඉඩම් සංවර්ධනකරු විසින් ඉදිකිරීම් කටයුතු භාරදී තිබූ කොන්ත්‍රාත්කරුගේ ප්‍රමාදය මත අදාළ ව්‍යාපෘතිය ප්‍රමාද වී තිබුණි . ඒ හේතුවෙන් 2017 වර්ෂය තුළ අදාළ ඉදිකිරීම් කාර්යයන්හි උපදේශක ආයතනය වෙත රු . 5,496,000ක අමතර උපදේශක ගාස්තුවක් හා ඉඩමෙහි පදිංචිකරුවන් සඳහා මහල් නිවාස ඒකක ලබාදෙන තෙක් මාසික කුලී රු. 61,198,000 ක් ලෙස එකතුව රු. 63,694,000 ක් අධිකාරිය විසින් ගෙවීම් කර තිබුනද ඉඩම් සංවර්ධන සමාගමෙන් එම මුදල ප්‍රතිපූර්ණය කරගෙන නොතිබුණි.

(ඌ) නිවාස ඒකක 608 කින් සමන්විත ඕවල් විවී නිවාස ව්‍යාපෘතියෙහි සහ අංගොඩ ලේක් ක්‍රෙස්ට් නිවාස ව්‍යාපෘතියෙහි නිවාස ලාභීන් විසින් පිළිවෙලින් රු. මිලියන 4,756.32 ක් සහ රු. මිලියන 816.3 ක මුදලක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ගෙවා නිමකර තිබියදී එම නිවැසියන් වෙත නීත්‍යානුකූල අයිතිය පැවරීම් විගණිත දින දක්වාම සිදුකර නොතිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහාද ස්වාධිපත්‍ය අධිකාරී සභනිකය මේ දක්වා ලබාගෙන නොතිබුණි.

(එ) රාජගිරිය ශ්‍රී ජයවර්ධනපුර මාවතේ පිහිටි චරිපනම් අංක 294/800 හා 953/1 දරණ ස්ථාන වල ප්‍රමාණයෙන් අක්කර 03 රූඩ් 02 පර්චස් 03 වූ ඉඩම් කොටස් 03 ක් මූල්‍ය හා පරිපාලන ආයතන ඇතුලු නාගරික සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා 2013 ඔක්තෝබර් 09 දින අධිකාරිය විසින් අත්කරගෙන තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ මෙලෙස අත්පත් කරගනු ලැබූ ඉඩම් කොටස් 02 පිළිවෙලින් 2015 පෙබරවාරි 02 හා 2016 නොවැම්බර් 18 දින මුල් හිමිකරුවන්ට නැවත අවසතුකර තිබූ අතර ඉතිරි කොටස වූ රූඩ් 01 පර්චස් 12 ක ඉඩම් ප්‍රමාණය විගණිත දිනය වන විටත් කිසිදු සංවර්ධන කාර්යයක් සඳහා යොදවා නොතිබුණි. එසේ වුවද මෙම්ව්‍යාපෘතිය වෙනුවෙන් කළ වියදම් ලෙස රු. 213.217.963 ක් නෙනිම් වැඩ යටතේ දක්වා තිබුණි. තවද 2013 වර්ෂයේදී ඉඩම් පවරාගැනීමේ අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව උක්ත ඉඩම අත්පත් කරගෙන ඇති බව නිරීක්ෂණය විය.

(ඒ) අධිකාරිය විසින් නාගරික සංවර්ධනය සඳහා ලබ ගෙන ඇති ඉඩම්ද විශාල ප්‍රමාණයක් පවරාගත් අරමුණට නොයෙදවා වෙනත් කාර්යයන් සඳහා යොදවාගෙන හෝ වර්ෂ ගණනාවකට පසු අවසතුකර තිබුණි. උදාහරණ කිහිපයක් පහත දැක්වේ.

(i) මිල්ලෑව අක්කර දහසක වත්ත.

(ii) පිටකොටුව ඔල්කට් මාවතේ පර්චස් 125 ක ඉඩම

(iii) ගාල්ල දඩැල්ල ඉඩම.

(iv) රාජගිරිය ශ්‍රී ජයවර්ධනපුර පාරේ පිහිටි අක්කර 03 රූඩ් 2 පර්චස් 3ක ඉඩම

(ඔ) නාගරික සංවර්ධන අධිකාරියෙහි නිත්‍ය කාර්යයක් වන දිවයිනේ සංවර්ධන ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කල ප්‍රදේශයන් සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම (44 සංවර්ධන සැළසුම් සකස්කිරීමේ ව්‍යාපෘතිය) සඳහා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන ලබාගෙන තිබු අතර 2018 වර්ෂයේ සියයට 50 භෞතික කාර්යසාධන මට්ටමක් අත්කරගෙන තිබුනද 2019 වර්ෂයේදී ක්‍රියාත්මක තත්ත්වයේ පැවති බවට කාර්යසාධන වාර්තාව අනුව සාක්ෂි නොතිබුණි

(ඕ) කොළඹ නගරයේ පැල්පත් වාසින්ට ස්ථිර නිවාස 68,000 ක් ඉදිකිරීමේ ජාතික වැඩපිළිවෙලට අරමුදල් සපයා ගැනීමේ අරමුණින් අධිකාරිය විසින් 2010 ඔක්තෝබර් මාසයේදී රු.බිලියන 10 ක් වටිනා අවුරුදු 5 කින් නිදහස් කළ යුතු ණයකර නිකුත් කර තිබුණි. 2015 වර්ෂයෙහි එම ණයකර නිදහස් කිරීම සඳහා ලංකා බැංකුවෙන් බිලියන 11 ක ණය පහසුකමක් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා 2017 වර්ෂයේදී මහාභාණ්ඩාරයෙන් රු.බිලියන 8.5 ක් ලබා ගෙන තිබුණි. එහෙත් ණයකර නිකුත්කර වර්ෂ 5 ක් ගතව තිබුණද එමගින් අපේක්ෂිත අරමුණු වූ කොළඹ නගරය තුළ ඇති පැල්පත් වාසීන්ගේ ඉඩම් අක්කර 142 ක් සංවර්ධනය කිරීම සහ ව්‍යාපාර සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණු අතර යෝජිත නිවාස ඒකක 68,000 කින් නිවාස ඒකක 12,657 ක් පමණක් ඉදිකර ඉන් නිවාස ඒකක 8407 ක් පමණක් 2019 දෙසැම්බර් 31 දින වන විට ජනතා අයිතියට පවරා තිබුණි.

(ක) අධිකාරියට අයත් බම්බලපිටිය දුම්රියපොළ පාරේ අක්කර 01 යි පර්චස් 23.1 ක භූමියක මහල් නිවාස හා කඩකාමර ඉදි කිරීම සඳහා 1993 වර්ෂය අවසානයට, අධිකාරිය විසින් රු.මිලියන 92 ක් සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය රු.මිලියන 120 ක් වැයකර තිබුණි. මෙම දේපල කළමනාකරණය කිරීම සඳහා සී/ස ඕෂන්විව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම නමින් නාගරික සංවර්ධන අධිකාරියේ සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ බද්ධ ව්‍යාපාරයක් ආරම්භ කර තිබුණි. අධිකාරිය විසින් මෙම ඉඩම 99 අවුරුදු බද්ධකට වර්ෂයකට රු.100 ක නාමික අගයකට සී/ස ඕෂන්විව් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම වෙත ලබාදී තිබුණි. මෙම සමාගම විසින් ගොඩනැගිලි කුලියට දීමෙන් ආදායම් උපයාගෙන තිබුණද 1993 වසරේ සිට 2019 වර්ෂයේ අවසානය දක්වා අධිකාරියට කිසිදු ලාභාංශයක් ලබාදී නොතිබුණි. මේ නිසා අධිකාරිය විසින් වැයකරන ලද මුදලට කිසිදු ප්‍රතිලාභයක් ලැබීනොමැති අතර අදාළ සමාගම විසින්ම ප්‍රතිලාභ භුක්ති විඳ තිබුණි.

(එ) රු. 1,306,655 ක් වටිනාකමැති ව්‍යාපෘති 15 ක් 2017 වර්ෂයේ ආරම්භ කර විගණිතදින වන විට අත්හැරදමා දමා තිබුණ අතර නොනිමී වැඩ යටතේ ඇතුළත් කර තිබුණි.

(ඒ) රේඛීය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියක් වෙනුවෙන් ලැබීමට නියමිත උපදේශණ ගාස්තු ආදායම උපයෝගීකරගෙන අධිකාරිය විසින් ව්‍යාපෘති පිළිබඳ ප්‍රචාරය කිරීම සඳහා 2019 වර්ෂය තුල පුවත්පත් 13 ක දැන්වීම් පළ කිරීම වෙනුවෙන් රු. 4,052,134 ක වියදමක් දරා තිබුණි.

(ඔ) 2014 වර්ෂයේදී 99 බදු ක්‍රමය යටතේ සංවර්ධනය සඳහා පෞද්ගලික ආයතන දෙකකට, මරදාන හා රාජගිරියේ පිහිටි අක්කර 03 කට වඩා වැඩි විශාලත්වයකින් යුතු ඉඩම් කැබලි 02 ලබා දී තිබුන අතර එම ඉඩමේ වන විටත් සංවර්ධන කටයුතු සඳහා යොදාගෙන නොතිබුණි.

(ඕ) පොදු ව්‍යාපාර පිළිබඳ යහපාලනය සඳහා මහපෙන්වීම (පිරිඩි-12) හි 9.3.1 ඡේදය අනුව හා 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හා 2006 අප්‍රේල් 25 දිනැති අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව අධිකාරිය සඳහා කාර්යසාධනය පදනම් කරගත් උසස්වීම් ක්‍රමයක් හඳුන්වා දී නොතිබුණු අතර තනතුරු නව වැටුප් ව්‍යුහයක පිහිටුවීමෙන් පසු එය ක්‍රියාත්මක කිරීමට බදවා ගැනීම් හා උසස් කිරීම් පටිපාටියක් සකස් කර ඒ සඳහා අමාත්‍යාංශයේ හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් හා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ අනුමැතිය ද ලබාගෙන නොතිබුණි.

(ක) අධිකාරියේ පුරප්පාඩුව පවතින තනතුරු සඳහා නිලධාරීන් වෙත උසස්වීම් පිරිනැමීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ඉල්ලීම් කර තිබු අතර අධිකාරියේ සේවක සංඛ්‍යා සම්බන්ධ ප්‍රතිව්‍යුහකරණය කර නොමැති බැවින් අධිකාරියේ බදවාගැනීමේ පරිපාටි අනුමත කර ගැනීමෙන් අනතුරුව, එම බදවාගැනීමේ පරිපාටිවල විධිවිධාන අනුව පමණක් ආයතනයේ කාර්යමණ්ඩලය සඳහා උසස්වීම් ලබාදීමට කටයුතු කල යුතු බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් දක්වා තිබුණි. එසේ තිබියදී කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත නව අධ්‍යක්ෂ තනතුරු වලට නිලධාරීන් 10 දෙනෙකු සඳහා උසස්වීම් ලබාදී තිබුණි..

(බ) 2008 ජුනි 26 දිනැති අංක 14/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 2015 මැයි 25 දිනැති අංක-පිරිඩි/ 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව පෞද්ගලික වාහන සිය නල වාහනය ලෙස භාවිතා කරමින් දමනා ලබාගන්නා නිලධාරීන්ට අධිකාරියේ රියදුරන් යොදවාගත නොහැකි වුවද නිලධාරීන් 20 දෙනෙකු එසේ අධිකාරියේ රියදුරන් යොදවාගෙන තිබුණි. එම රියදුරන්ට අතිකාල දීමනා ලෙස පමණක් ඉකුත් වර්ෂයේදී රු. 3,679,290 ක් ද සමාලෝචිත වර්ෂයේදී රු. 8,261,590 ක් ද ගෙවීම් කර තිබුණි.

(ග) නිලධාරින් 2 කුගේ විශමාචාර ක්‍රියා සම්බන්ධයෙන් චෝදනා පත්‍ර ලබාදී ඒ පිළිබඳ විධිමත් විනය පරීක්ෂණ පවත්වා එම චෝදනා වලින් කොටසකට වරදකරු වී ඇති බවත් එම චෝදනා ආයතන සංග්‍රහයේ දෙවන කාණ්ඩයේ යටතට ගැනෙන බරපතළ විෂමාචාරයන් බැවින් සේවයෙන් පහකල යුතු වුවත් වයස 60 ට ආසන්න බව සැලකීමට ගෙන ඔවුන්ව 2017 වර්ෂයේ අනිවාර්යයෙන් විශ්‍රාම යවා තිබුණි. එසේ විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා වරදකරුවූ එම පුද්ගලයින් දෙදෙනාව නිවැරදි ක්‍රමවේදයක් අනුගමණය කිරීමකින් තොරව 2019 /2020 වර්ෂවල නැවත සේවයේ පිහිටුවා තිබුණි.

(ච) අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩල සටහන අනුව අනුමත නොවූ තනතුරු 64 ක් වෙනුවෙන් ප්‍රසිද්ධ දැන්වීම් මගින් අයදුම් පත් කැඳවීමෙන් තොරව අධිකාරිය යටතේ ඇති උප සමාගමක් හරහා සේවකයන් බඳවාගෙන ඉන්පසු එකී නිලධාරින් අධිකාරියේ සේවයට යොඳවා 2018 වර්ෂයේ වැටුප් හා දීමනා ලෙස රු.43,520,826 ක් හා 2019 වර්ෂයේ රු. 46,345,540 ක් ලෙස ගෙවා තිබුණි. එසේම වැටුප් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත නාගරික ආයෝජන හා සංවර්ධන සමාගම වෙත නිලධාරින් 08 ක් ද්විතිය පදනම මත නිදහස්කර තිබුණි.

(ඡ) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශ ලේකම්ගේ 1997 ජනවාරි 24 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ අංක 116 සහ 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාරවල නිලධාරින් අමාත්‍යාංශයේ හෝ වෙනත් රාජ්‍ය ආයතන වල සේවය සඳහා මුදානොහැරිය යුතු බව නියමකර තිබියදී අධිකාරියේ සේවකයින් 19 දෙනෙකු වැටුප් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත වෙනත් රාජ්‍ය ආයතන වෙත නිදහස් කර තිබුණි.

(ජ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අංක පිරීඩී/58 දරණ හා 2011 අප්‍රේල් 29 දිනැති චක්‍රලේඛයේ 2.5 ඡේදය ප්‍රකාරව මාසික පාරිශ්‍රමික ලබාගන්නා නිලධාරින් කළමනාකරණ මණ්ඩල රැස්වීම් වලට සහභාගිවීමේදී දීමනා ලබාගත නොහැකි වුවද හිටපු සභාපති, අධ්‍යක්ෂ ජනරාල් හා ක්‍රියාකාරී අධ්‍යක්ෂවරුන් චක්‍රලේඛයට පටහැනිව 2015 මාර්තු මස සිට 2020 ඔක්තෝම්බර් දක්වා රු.3,202,750 ලබාගෙන තිබූ අතර විගණනයෙන් පෙන්වා දීමෙන් පසු තවදුරටත් දීමනා ගෙවීම නතර කල තිබුනද කලින් ගෙවන ලද දීමනා නැවත අයකරගෙන නොතිබුණි.

ඩබ්ලිව් පී සී. විකුමරත්න

විගණකාධිපති

---------- මෙම පිටුව හිතාමතාම හිස්ව තබා ඇත----------



01

02

03

04

05

06

AUDIT

විගණකාධිපති වාර්තාව පිළිබඳ සභාපතිවරයාගේ අදහස්

---------- මෙම පිටුව හිතාමතාම හිස්ව තබා ඇත----------

නාගරික සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිතයන්ගේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාකාශන

1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

1.2.1 සමූහය

(අ)

(i) <u>නිරීක්ෂණය</u>

ඉහත ප්‍රකාශය හා එකඟ නොවේ.

සැසඳුම් ප්‍රකාශනයේ දක්වා ඇති බැර ශේෂ 2 කෙහි වටිනාකම රු 29,374,815 ක නොව 29,314,686 කි. එම බැර ශේෂ දෙකින් දක්වා ඇත්තේ අධිකාරිය හා පරිපාලිත සමාගම් අතර ඇති වූ පහත සඳහන් අන්තර් සමාගම් ගනුදෙනු වෙනුවෙන් කරන ලද ගැලපීම් වේ.

වෝටර්ස් එජ් සමාගම හා අධිකාරිය 2019 වර්ෂයේ ඇති කරගන්නා ලද 99 සහ 20 අවුරුදු කුලී බදු ගිවිසුම් වලට අදාල සමාලෝචිත වර්ෂයේ බදු කුලී ආදායමට අදාල ගැලපීම වන වටිනාකම රු.29,036,877.12 වන අතර ඊට අදාල අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලැබූ ලිපිගොනුව රජයේ විගණන අංශය වෙත 2021.12.06 දින ලබා දී ඇත.

එලෙසම විමසුමේ සඳහන් පරිදි ඉතිරි රු. 277,809 ක වටිනාකම අදාල වනුයේ ඔනාලි සමාගම විසින් නාගරික ආයෝජන සහ සංවර්ධන සමාගම වෙත සමාලෝචිත වර්ෂයේ ලබා දී ඇති ලාභාංශ ආදායම වන අතර එකී සමාගමේ ගිණුම් විගණනය කිරීමේදී ඊට අදාල උපයෝගී ලේඛනද රජයේ විගණන අංශය වෙත ලබා දී ඇත.

(ii) <u>නිරීක්ෂණය</u>

ලංකා රෙස්ට් හවුස් සමාගමේ ගෙවිය යුතු රු.6,488,108 ක මුදල පහත පරිදි සමන්විත වී ඇත.

Description	Amount (Rs.)
Value Added Tax	73,630.46
Salary Payable	88,613.00
Service Charge Payable	1,787,713.29
Refundable Tender Deposits	2,585,685.18
Rent Deposits	388,482.41
NBT Payable to Local Authority	3,200.00
Accrued Expenses	685,259.35
Audit Fees Payable	310,992.00
Dividend Payable	439,735.11
EPF Payable	111,306.78
ETF Payable	13,490.00
Total	6,488,108.52

උක්ත වගුවට අනුව විමසුමේ සඳහන් ලංකා රෙස්ට් හවුස් සමාගමේ ගෙවිය යුතු ශේෂය රු.6,688,108 ක මුදල රු.6,488,108 ක් ලෙස නිවැරදි විය යුතු අතර එකී නිවැරදි ශේෂය ඒකාබද්ධ ගිණුම් කටටලය තුල සටහන් අංක 32 වියදම් හා අනෙකුත් ණයහිමි ශීර්ෂය (Expense & Other Creditors) යටතේ ණයහිමි ගිණුම් (Expense Creditors) කාණ්ඩය යටතේ පෙන්වීමට කටයුතු කර ඇත.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නාගරික ආයෝජන හා සංවර්ධන සමාගමේ මූල්‍ය ප්‍රකාශන කට්ටලයට අදාලව රු.3,087,684 ක මුදලක් 2019 වර්ෂයේ පාඩු හා කපා හැරීම් වියදම් ශීර්ෂය යටතේ වියදම් සේ සලකා සටහන් වී ඇත. මෙම අගය 2020 වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී නිවැරදි කිරීමට කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිමි.

ඒ අනුව, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධව විමසුමේ සඳහන් කර ඇති ලංකා රෙස්ට් හවුස් සමාගම හා සම්බන්ධ කරුණ සමඟ එකඟ නොවන අතර නාගරික ආයෝජන හා සංවර්ධන සමාගම හා සම්බන්ධව සඳහන් කර ඇති කරුණ සමඟ එකඟ වන බව දන්වා සිටිමි.

(iii) <u>නිරීක්ෂණය</u>

ඉහත ප්‍රකාශය හා එකඟ නොවේ.

අධිකාරිය 2019 වර්ෂයේ ඒකාබද්ධ ගිණුම් සැකසීමේදී දේපල පිරියත හා උපකරණ කාණ්ඩය යටතේ අඩංගු කාර්යල උපකරණ වල ශේෂය සැකසීමේදී වෝටර්ස් ඒජ් සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත කාර්යල උපකරණ වල ශේෂය පහත පරිදි ගිණුම් වලට ගෙන ඇත.

	අයිතමය	රජයේ විගණන අංශය විසින් වෝටර්ස් ඒජ් සමාගමේ කාර්යාල උපකරණ ලෙස සලකන ලද සංරචක වල එකතුව (රු.)	නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඒකාබද්ධ ගිණුම් සැකසීමේදී වෝටර්ස් ඒජ් සමාගමේ කාර්යාල උපකරණ ලෙස සලකන ලද සංරචක වල එකතුව (රු.)
1	Office Equipment	45,711,202	45,711,202
2	Kitchen Equipment & utensils	215,744,811	215,744,811
3	Other Equipment	110,250,649	110,250,649
4	Cattery and cookery & glassware		83,293,054
5	Elevator		3,256,219
6	Car Park		46,757,824
7	Landscaping at grand lawn		13,984,802
	Total Cost	371,706,662	518,998,561
	<u>Less - Depreciation</u>		
	Total Depreciation	187,941,668	264,919,026
	Net Book Value	183,764,994	254,079,535

ඒ අනුව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම කාර්යාල උපකරණ යටතේ පෙන්වා තිබූ ඉහත අංක 04.05,06,හා 07 හි දක්වා ඇති අයිතමයන් විගණන විමසුමෙහි දක්වා ඇති අගයට ඇතුලත්ව නොතිබීම නිසා ඉහත සඳහන් වෙනස දක්නට ඇත.

එසේම ගොඩනැගිලි හා යන්ත්‍ර සහ උපකරණ යටතේ රු.12,641,929 ක වෙනසක් ලෙස දක්වා ඇත්තේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාහන පිළියෙළ කිරීමේ වෝටර්ස් ඒජ් සමාගමේ ඕකිඩ් පැලෑටි යන්ත්‍ර වල වටිනාකම වූ රු 14.763.141 ක මුදල විමසුමෙහි දැක්වෙන අගයට ඇතුලත් නොවීම හා ගොඩනැගිලි ශේෂයේ පැවති රු.2,121,212 ක් අඩුවෙන් දක්වා තිබීම හේතුවෙනි.

කෙසේවෙතත් අධිකාරිය විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී භාවිතා කර ඇති වෝටර්ස් ඒජ් සමාගමේ සමස්ථ වත්කම් වල එකතුව හා ගිණුම් අතර කිසිදු වෙනසක් දක්නට නොමැති බව දන්වමි.

1.2.2 නාගරික සංවර්ධන අධිකාරිය (මව් සමාගම)

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

I නිරීක්ෂණය

නාගරික සංවර්ධන අධිකාරිය යටතේ 1993-1999 වර්ෂයන් තුල ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වූ නාගරික සංවර්ධන අංශ ව්‍යාපෘතිය 1999 වර්ෂයේදී එහි කටයුතු අවසන් කර නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ඇත. ඒ අනුව එදිනට පැවති වත්කම් වගකීම් නාගරික සංවර්ධන අධිකාරිය වෙත මාරු කර ඇති අතර එදිනට එම ව්‍යාපෘතියේ ප්‍රාග්ධන සංචිත ලෙස පැවති රු.7,433,382 ක මුදල අධිකාරියේ සංචිත ලෙස ගිණුම් වල පෙන්වා තිබුණි.

එසේම අධිකාරිය විසින් ව්‍යුහයන් බිඳ දැමීම සඳහා ප්‍රාග්ධන සංචිතයක් ලෙස (Demolition of Structure) ලෙස 1999 වර්ෂයේ සිට පවත්වාගෙන ගොස් ඇති අතර 2018.12.31 දිනට පැවති ශේෂය රු. 1,028,303 කි.

මේ සම්බන්ධයෙන් මීට පෙර විගණන විමසුම් හරහා පෙන්වාදී තිබූ පරිදි තව දුරටත් මෙම සංචිත පවත්වාගෙන යාමේ අවශ්‍යතාවයක් නොතිබූ බැවින් හා මෙවැනි සංචිත පවත්වාගෙන යාම ගිණුම් ප්‍රමිතයන්ට අනුකූල නොවූ බැවින් 2019 වර්ෂයේදී මෙම සංචිත 2 යටතේ පෙන්වා තිබූ රු. 8,462,785 ක මුදල රඳවාගත් ලාභ ගිණුම (Retained Surplus) යටතේ පෙන්වීමට කටයුතු කර ඇත.

II නිරීක්ෂණය

අධිකාරිය විසින් ව්‍යාපෘති සඳහා උපදේශන සේවා සැපයීමේදී ඇතැම් ව්‍යාපෘති සඳහා MEP උපදේශනයන් ලබාදීම සඳහා අධිකාරිය තුල අදාල පිරිස් බලය නොමැතිවීම මත MEP උපදේශනයන් පිටස්තර ආයතන වෙතින් ලබාගෙන ඇත. ඒ අනුව, ලබා ගන්නා සම්පූර්ණ ගාස්තුව අධිකාරියේ ආදායමක් නොවන බැවින් අදාල සම්පූර්ණ උපදේශන ගාස්තුව අධිකාරිය වෙත ලැබීමෙන් පසු එම ගිණුමෙන්ම අදාල සමාගම් වල උපදේශන ගාස්තුව ගෙවීම හේතුවෙන් මෙම අගයන් එම ගිණුමට හර වී ඇත. එසේම යාපනය ප්‍රදේශයේ සිදු කරනු ලබන සංවර්ධන කාර්යයන් සඳහා යාපනය නගර සභාවේ නිලධාරීන්ගේ උපදේශනය ලබාගැනීමට අවශ්‍ය වූ බැවින් ඔවුන් වෙත කරන ලද ගෙවීම්ද මෙලෙස ලද මුදලින් සිදු කර ඇත.

ඒ අනුව, මෙසේ ලද සම්පූර්ණ මුදලම අධිකාරියේ ආදායම නොවන අතර භාහිරව ලබාගත් උපදේශන සේවය සඳහා වෙනත් ආයතන වෙත ගෙවන ලද මුදල් එකී ලැබීම් තුල අඩංගු අතර එම භාහිර පාර්ශවයන්ට ගෙවීම් අඩුකර ගිණුම්ගත කිරීම තුළින් සමාලෝචිත වර්ෂයේ ආදායම අඩුවෙන් පෙන්වීමක් සිදු වී නොමැත. කෙසේ නමුත්, මින් ඉදිරියේදී එවැනි ව්‍යාපෘති වලින් ලබන උපදේශන ගාස්තු ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු සිදු කරනු ලබන බව කාරුණිකව දන්වමි.

මුදල් පොත	- හර
උපදේශන සේවා ගාස්තු ආදායම් ගිණුම	- බැර
ගෙවිය යුතු උපදේශන සේවා ගාස්තු	- බැර
උපදේශන සේවා ගාස්තු ගෙවීමේදී,	
ගෙවිය යුතු උපදේශන සේවා ගාස්තු	- හර
මුදල් පොත	- බැර

(ආ) නිරීක්ෂණය

අධිකාරිය විසින් උක්ත අඩු අදායම් ලාභීන් සඳහා මහල් නිවාස ලබා දීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබුයේ හුදෙක්ම ලාභ ලැබීමේ පරමාර්ථයකින් නොව කොළඹ නගර ආශ්‍රිතව පැල්පත් වාසීන්ගේ ජන ජීවිතය හා ඔවුන්ගේ ජීවන තත්වය උසස් කිරීම යන සාමාජීය අවශ්‍යතාවය හා වගකීම සපුරාලීම සඳහා වූ රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම හා ඒ තුලින් හඳුනා ගනු ලබන ඌණ උපයෝජනය වූ කොළඹ නගරය කේන්ද්‍ර වූ වාණිජ වටිනාකමක් සහිත ඉඩම් ආර්ථික වශයෙන් වාසිදායක වූ ආයෝජනයන් සඳහා නිදහස් කිරීමේ පරමාර්ථය සහිතවය.

ඒ අනුව, රටෙහි ඇතිවූ යම් යම් ස්වභාවික ආපදා තත්වයන් හා රජය විසින් සිදුකරගෙන යනු ලබන ඇතැම් සංවර්ධන ව්‍යාපෘතීන් වලින් අගතියට පත් නිවාසලාභීන් වෙත ඉහත නිවාස ව්‍යාපෘතිය යටතේ

ක්‍රියාත්මක කරන ලද නිවාස ව්‍යාපෘති වෙතින් නිවාස ලබා දීම සිදුකර ඇත. උදා මීතොටමුල්ල කසල කන්ද නාය යාම හේතුවෙන් අවතැන් වූ නිවාස හිමියන්, කැලණිවැලි දුම්රිය මාර්ගය පුළුල් කිරීම හේතුවෙන් නිවාස අහිමි වූ නිවාස ලාභීන් ආදිය.

ඒ අනුව එම අවස්ථාවලදී එම ආයතන වෙත නිවාස ලබා දීමේදි ඒවායේ විකුණුම් මිල තීරණය කර ඇත්තේ එම නිවාස ව්‍යාපෘති වලට අදාල ඇස්තමේන්තු ගත පිරිවැය පදනම් කර ගනිමිනි.

ඒ අනුව මෙම නිවාස මිළදී ගැනීම සඳහා රාජ්ය ආයතන හා ශ්‍රී ලංකා මුල්ය වාර්තාකරණ ප්‍රමිත 15 ට අනුව සපුරා තිබිය යුතු කරුණු 05 ට අදාල කාර්යයන් සපුරා තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී එලෙස නිවාස බැහැර කිරීමට අදාලව හඳුනා ගන්නා ලද සම්පූර්ණ අලාභය වන රු. මිලියන 443 ක මුදල පෙර වර්ෂ ගැලපීම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. එනම්, නිවාස මිළදී ගැනීමට අදාලව නිවාස වල භෞතික මෙන්ම නීතිමය අයිතිය සමාලෝචිත වර්ෂයේදී නිවාසලාභියා වෙත මාරු වුවද, මුදල් ලැබීම් හා දෙපාර්ශවය අතර ගිවිසුම් ඇති කර ගැනීම පෙර වර්ෂයන්හිදී සිදු වී ඇති බැවින් මෙකී නිවාස බැහැර කිරීමට අදාල ලාභය / අලාභය පෙර වර්ෂ ගැලපීම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු සිදු කර ඇත.

(ඇ) <u>නිරීක්ෂණය</u>

මෙය සමාජීය අවශ්‍යතාවයන් පදනම් කරගෙන රජයේ අවශ්‍යතාවය පරිදි ක්‍රියාත්මක ව්‍යාපෘතියක් වන අතර ලාභ ලැබීමේ අරමුණින් පදනම්ව අධිකාරිය විසින් ක්‍රියාත්මක කල ව්‍යාපෘතියක් නොවන බැවින් ඉඩමේ වටිනාකම ව්‍යාපෘතියේ ලාභය / අලාභය ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන නොමැත. එසේම මෙම ඉදිකිරීම් වල පිරිවැය ආවරණය කර ගැනීම සඳහා රජය විසින් යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් සලසා ඇත.

එසේම එක් නිවාස ඒකකයක් වෙනුවෙන් අදාල නිවාසලාභියාගෙන් රු.3000/- බැගින් වූ මාසික වටිනාකමක් වසර 30 ක කාලයක් පුරාවට නාමික අගයක් ලෙස අයකිරීමට කටයුතු කර ඇත. ඉහත ආකාර 2න්ම හා අදාල පුනස්ථාපනයෙන් පසු ලැබෙන ඉඩම් වාණිජ කටයුතු සඳහා ලබා දීමෙන් ලැබෙන ආදායමද මෙම ව්‍යාපෘතියේ පිරිවැය ආවරණය කර ගැනීම සඳහා යොදා ගැනේ.

එසේම, ජනතාව අදාල නිවාස වල පදිංචි කරනු ලැබුවද ඔවුන් වෙත මෙම නිවාස වල පූර්ණ හිමිකාරිත්වය මෙතෙක් ලබා දී නැත. ඒ අනුව, ප්‍රමිත අංක 16 පරිදි මූල්‍ය කල්බදු ලෙස සලකා ඉහත නිවාස බැහැර කිරීම් ගිණුම්ගත කල නොහැකිය.

ඒ අනුව, ඉහත විමසුමේ ඇති අන්තර්ගතය සම්බන්ධයෙන් එකඟ විය නොහැක.

(ඈ) <u>නිරීක්ෂණය</u>

මෙය සමාජීය අවශ්‍යතාවයන් පදනම් කරගෙන රජයේ අවශ්‍යතාවය පරිදි ක්‍රියාත්මක ව්‍යාපෘතියක් වන අතර ලාභ ලැබීමේ අරමුණින් පදනම්ව අධිකාරිය විසින් ක්‍රියාත්මක කල ව්‍යාපෘතියක් නොවන බැවින් ඉඩමේ වටිනාකම ව්‍යාපෘතියේ ලාභය / අලාභය ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන නොමැත. එසේම මෙම ඉදිකිරීම් වල පිරිවැය ආවරණය කර ගැනීම සඳහා රජය විසින් යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් සලසා ඇත.

එසේම එක් නිවාස ඒකකයක් වෙනුවෙන් අදාල නිවාසලාභියාගෙන් රු.3000/- බැගින් වූ මාසික වටිනාකමක් වසර 30 ක කාලයක් පුරාවට නාමික අගයක් ලෙස අයකිරීමට කටයුතු කර ඇත. ඉහත ආකාර 2න්ම හා අදාල පුනස්ථාපනයෙන් පසු ලැබෙන ඉඩම් වාණිජ කටයුතු සඳහා ලබා දීමෙන් ලැබෙන ආදායමද මෙම ව්‍යාපෘතියේ පිරිවැය ආවරණය කර ගැනීම සඳහා යොදා ගැනේ.

එසේම, ජනතාව අදාල නිවාස වල පදිංචි කරනු ලැබුවද ඔවුන් වෙත මෙම නිවාස වල පූර්ණ හිමිකාරිත්වය මෙතෙක් ලබා දී නැත. ඒ අනුව, ප්‍රමිත අංක 16 පරිදි මූල්‍ය කල්බදු ලෙස සලකා ඉහත නිවාස බැහැර කිරීම් ගිණුම්ගත කල නොහැකිය.

ඒ අනුව, ඉහත විමසුමේ ඇති අන්තර්ගතය සම්බන්ධයෙන් එකඟ විය නොහැක.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 - දේපල පිරියත උපකරණ

(i) <u>නිරීක්ෂණය</u>

විමසුමේ සඳහන් පරිදි සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම ඒ පිළිබඳ දැනුමක් ඇති පාර්ශවයන් මාර්ගයෙන් සිදු කල යුතු බැවින් හා ඒ සඳහා සැලකිය යුතු කාලයක්ද ගත වන බැවින් අදාල වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කර ඒ හා සම්බන්ධ අදාල ගැලපීම් **2021** ගිණුම් පොත් වල ගැලපීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වා සිටිමි.

(ii) <u>නිරීක්ෂණය</u>

අදාල හෙළිදරව් කිරීම ප්‍රත්‍යාගණනය කරනු ලැබූ **2021** මූල්‍ය වර්ෂයේදී අදාල අගයන් වත්කම් වලට ගලපන අවස්ථාවේදී නියමිත පරිදි අනාවරණය කිරීමට කටයුතු සිදු කරනු ඇත.

(iii) <u>නිරීක්ෂණය</u>

අධිකාරියේ ආයෝජිත දේපල සම්බන්ධ තක්සේරු වාර්තාව ඉඩම් අංශය විසින් රජයේ විගණන අංශයේ නිර්දේශයන්ට අනුකූලව සකස් කරමින් පවතී. තවද, බදුකරු සමඟ ඇති කරගනු ලබන බදු ගිවිසුමේ කල්බදු ක්‍රියාකාරකම්වල ස්වභාවය හා බදුකරු වෙත අදාල වන කොන්දේසි හා අධිකාරිය සතු බලතල පැහැදිලිව දක්වා ඇත. ඒ අනුව, එම ආයෝජිත දේපල තක්සේරු වාර්තාව සකස් කිරීමෙන් අනතුරුව එකී වාර්තාව හා අදාල ගිවිසුම් වල දත්ත අධිකාරියේ වත්කම් කළමණාකරන හා අයකරගැනීම් අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව එකී ආයෝජිත දේපල කල්බදු දීමනා සම්බන්ධයෙන් ගිණුම්කරණ පද්ධතියේ සිදු කලයුතු යාවත්කාලීන කිරීම **(Update)** සිදු කරනු ඇත.

අධිකාරිය විසින් මේ වනවිට දේපල විශාල ප්‍රමාණයක් (ආසන්න වශයේ **5000** පමණ) විවිධ බදු කාල සීමාවන් යටතේ බදු දීම් සිදු කර ඇති බැවින් ඒ එක් එක් දේපලට අදාලව කරුණු ගිණුම් ප්‍රකාශයේ දැක්වීම ප්‍රායෝගික නොවන බැවින් ඉඩම් බැහැර කිරීමේ පොදු ක්‍රියාකාරකම්වල ස්වභාවය එනම් කාර්මික, යටිතල පහසුකම්, බහුමහල් සංකීර්ණ පවත්වාගෙන යාම වැනි ක්‍රියාකාරකම් හා අවධානම අවම කර ගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ලෙස උදා, උපකල්බදු දීම සඳහා අධිකාරියේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වීම. ලබාගත් අරමුණු වෙනුවෙන් පමණක් භාවිතා කිරීම වැනි සීමාවල් පනවා ඇති අතර එම කරුණු ගිණුම් ප්‍රකාශනයේ හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. තවද, එක් එක් බදු ගිවිසුමට අදාල මෙම විස්තර වත්කම් කළමනාකරණ හා අයකරගැනීම් අංශය මඟින් විලම්භිත බදු කුලී ලෙජරය යාවත්කාලීන කිරීම මඟින් රජයේ විගණන අංශය වෙත ලබා දීමට පද්ධති සැකසුම්කරු සමාගම සමඟ සාකච්ඡා කර කටයුතු සිදු කරනු ලැබේ.

ඒ අනුව, අධිකාරියේ ආයෝජිත දේපල සම්බන්ධව තක්සේරු වාර්තාව පදනම් කරගනිමින් ගිණුම්කරණ පද්ධතියේ සිදු කල යුතු යාවත්කාලීනයන් හා මූල්‍ය ප්‍රකාශනයන්හි සිදු කල යුතු හෙළිදරව් කිරීම් සිදු කිරීමට කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිමු.

(iv) <u>නිරීක්ෂණය</u>

අධිකාරිය විසින් වත්කම් දිගුකාලීන බදු පදනම මත ලබා දීම තුලින් හඳුනාගනු ලබන ප්‍රදේශයන් තුල විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය පිහිටුවන ලද පනතේ ප්‍රකාරව දිගුකාලීන පදනම මත ඉඩම් නිදහස් කිරීම අධිකාරිය ආරම්භයේ සිට සිදුකර ඇත. ඒ අනුව අතීතයේදී එම ඉඩම් නිදහස් කිරීමේදී බදු ලබා දෙනු ලබන කාලසීමාව හා අය කරනු ලබන ක්‍රමවේදය විවිධ පදනම් මත ලබා දීම සිදු කර ඇත.

කෙසේ වෙතත්, මේ සෑම අවස්ථාවකදීම එම එකම ක්‍රමවේදයකට අදාලව රජයේ තක්සේරුකරු වෙතින් ලබා දී ඇති තක්සේරු මිල පදනම්ව අදාල ඉඩම් වෙන් කිරීම සිදුකර ඇත.

අධිකාරියේ වත්කම් දිගුකාලීන බදු පදනම මත ලබාදීමෙන් පසු බදු වටිනාකම එම බදු කාලය මුළුල්ලේ අධිකාරියේ ආදායමට ගැනීමේදී ඒකාකාරී ක්‍රමයක් ක්‍රියාත්මක වන අතර, විලම්භිත කල්බදු ගිණුමේ පවතින ගිණුම් දෝෂ හේතුවෙන් අදාල ආදායම් ඒකාකාරී ක්‍රමයකට ගිණුම්ගත වී නොමැති අවස්ථාද දක්නට ලැබේ.

විමසුම්හි ඉදිරිපත් කර තිබුණු එවැනි ගිණුම් දෝෂ දැනමටත් නිවැරදි කර ඇති අතර, **(අංක.37/03/06 දරණ 2022.03.14** ලිපිය මේ සමඟ අමුණා ඇත.) ඇමුණුම **01** තවදුරටත් විලම්භිත කල්බදු ලේඛනයේ

පවතින මෙවැනි ගිණුම්කරණ දෝෂ හේතුවෙන් බදු ආදායම් ඒකාකාරීව වාර්ෂික ආදායමට එකතු නොවීම් කල්බදු ගිණුම් නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

(ඊ) <u>නිරීක්ෂණය</u>

විලම්හීත කල්බදු කුලී ගිණුමට අදාල උපලේඛනයක් විගණන අංශය වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අතර එම වාර්තාවේ ව්‍යාපෘතියේ නම, ගනුදෙනුකරුගේ නම, කල්බදු විටිනාකම, කාලසීමාව ආදී විස්තර ඇතුලත්ව ඇත. එසේම අධිකාරිය විසින් කල්බදු පදනම මත විශාල දේපල ප්‍රමාණයක් ලබා දී තිබීම හේතුවෙන් මේ සම්බන්ධයෙන් වෙනමම හෙළිදරව් කිරීම් සිදු කිරීම සඳහා අධිකාරිය විසින් මෑතකදී සිදුකරන ලද ප්‍රත්‍යාගණන තොරතුරු පදනම් කරගනිමින් ගිණුම් ප්‍රකාශන වල සිදුකල යුතු හෙලිදරව් කිරීම් 2020 වර්ෂයේ අවසන් ගිණුම් වලදි සිදුකිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 40 - ආයෝජිත දේපල

---

i. <u>නිරීක්ෂණය</u>

Ser.No.	Project Code	Project Name	Amount (Rs.)	Remarks
1	5210500	Landscape Improvement at Sethsiripaya Stage I	15,812,531.94	ආයෝජිත දේපල වල ඇතුලත් සෙත්සිරිපාය පදික ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම හා භූමි දර්ශන වැඩිදියුණු කිරීම වෙනුවෙන් වැය කර තිබූ මුදල ආයෝජිත දේපල වලින් ඉවත්කර ලාභ අලාභ ගිණුමෙහි පෙර වර්ෂයේ ගැලපීම් ලෙස 2022 මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමට කටයුතු සිදුකරනු ඇත.
2	3001200	Proposed Town Beautification Programme at Miniwangoda	4,995,475.10	අධිකාරිය විසින් නගර සංවර්ධන වැඩසටහන් සිදු කිරීමේ පරමාර්ථයෙන් මිනුවන්ගොඩ නගර සංවර්ධන වැඩසටහන උදෙසා දරන ලද පිරිවැය මෙම මුදලින් නිරූපණය වන අතර මෙය 2022 මූල්‍ය ප්‍රකාශනවල ලාභ අලාභ ගිණුමට ගැලපීමට කටයුතු කරනු ලැබේ.
3	3190900	Urban Wetland Park at Nugegoda	97,992,095.94	නුගේගොඩ නාගරික තෙත්බිම් උද්‍යාන ව්‍යාපෘතිය මගින් ඡායාරූපකරණය හා ටිකටපත් අලෙවිය ආදියෙන් ආදායම් උත්පාදනය වේ. එමනිසා මෙහි පිරිවැය ආදායම් උත්පාදනය වන දේපලක් ලෙස ආයෝජිත දේපල යටතේ නිරූපණය කිරීම නිවැරදි බව මෙයින් සඳහන් කරමි.
4	3410700	Landscaping of Urban Park & Construction of Pola I	795,000.00	නාගරික උද්‍යානයේ භූමි අලංකරණය සහ පොළ ඉදිකිරීම 1 යටතේ දරා ඇති පිරිවැය ආයෝජිත දේපල වලින් ඉවත්කර ලාභ අලාභ ගිණුමෙහි පෙර වර්ෂයේ ගැලපීම් ලෙස 2022 මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමට කටයුතු සිදුකරනු ඇත.
5	6970100	Con. of Children Park Embilipitiya	7,677,825.75	නගර අලංකරණය යටතේ ඇඹිලිපිටිය පොළ සංවර්ධනය කිරීමේදී අසල ළමා උද්‍යාන භූමිය අවහිර වූ බැවින් එම ළමා උද්‍යානය ඉදිකිරීම සමාජ අවශ්‍යතාවයක්

				ලෙස සළකා, භාණ්ඩාගාර මුදල් ලැබීමේ අපේක්ෂාවෙන් නාගරික සංවර්ධන අධිකාරිය මගින් ළමා උද්‍යානය ඉදිකිරීම සිදුකරන ලදී. මෙම පිරිවැය ආයෝජිත දේපල වලින් ඉවත්කර ලාභ අලාභ ගිණුමෙහි පෙර වර්ෂයේ ගැලපීම් ලෙස **2022** මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමට කටයුතු සිදු කරනු ඇත.
6	9970100	Hanwella Riverside Park	539,781.60	හංවැල්ල ගඟඅද්දර උද්‍යානය සඳහා මෙම පිරිවැය දරා ඇත. **2007** වර්ෂයට පෙර තානායම් කළමනාකරණය නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදුවූ අතර පසුව **Lanka Rest House** සමාගම පිහිටුවා එම කටයුතු පවරන ලදී. ඒ හේතුවෙන් එම සමාගම සඳහා වත්කම්, වගකීම් පැවරීමේ කටයුතු දැනට සිදුවෙමින් පවතින අතර එහිදී මෙම පිරිවැයද පැවරීමට ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු සිදු කරනු ඇත.
7	9192300	Landscape Improvement at Jayasekararamaya Temple	5,989,512.18	මෙය **31.12.2020** දින ජර්නල් අංක **J30736** යටතේ සේවාදායක තැන්පතු වලට ගැලපුම් කර ඇත.

තවද අධිකාරිය සතු සියලුම දේපල සඳහා අදාල ඉඩමේ මූලික පිඹුරු අංකය, කැබලි අංකය හා ලිපිනය ආදී තොරතුරු ඇතුලත් උප ව්‍යාපෘති අංකයක් ලබාදී ඒ එක් එක් කැබැල්ලට අදාළ නව තක්සේරු වටිනාකම ගිණුම් ප්‍රකාශ වලට ගැලපීම පිළිබඳව නිරීක්ෂණ මීට ඉහත ඉදිරිපත් කර ඇත.

අනු අංකය	ව්‍යාපෘති අංකය	ව්‍යාපෘතිය	වටිනාකම (රු.)	ඉඩම් කොටස් ගණන	UDA / Client
1.	3210200	Battaramulla Town Development	32,327,500.00	01	UDA
2.	3220300	Homagama Town Development Project	320,072,873.31	02	UDA
3.	3270200	Kottawa Town Development	974,365,645.34	01	Client
4.	3520100	Dambulla Town Development	70,517,797.79	02	UDA
5.	3520200	Dambulla Town Development – Stage I	425,875,525.83	10	UDA
6.	3550600	Small Town Development Imaduwa	14,087,486.16	-	UDA
7.	5020200	Re-development Project Slave Island	1,584,334,036.26	-	UDA
8.	5330200	Peliyagoda Development Stage-I	6,839,201,620.98	74	UDA
9.	5330300	Peliyagoda Development Stage-II	144,367,827.39	01	UDA
10.	5940200	Development of Kataragama	1,056,355,617.07	06	Client
11.	5950100	Rathnapura Town	780,007,707.88	04	Client

		Development			
12.	5990100	Warakapola Integrated Town Development fee for use 41 lease premium 04	189,555,453.43	01	Client
13.	8812100	Development of Maho Town	12,454,500.00	01	Client
14.	2940100	Kataragama Development	467,892,600.00	01	Client
15.	9720100	Proposed Mankulam Town Development	1,132,680.00	-	UDA
16.		Bolgoda Lake Development Project	130,678,534.02	-	Client
17.	3870200	Kaduruwela Town Expectation Project	376,279,416.31	-	Client
18.		Balangoda Town Development	21,236,093.40	-	Client
19.	3820200	Dankotuwa Town Development	1,969,924.46	-	Client
20.	3240600	New Township Development Project	242,790,911.84	-	Client
21.	3240700	Kottawa Town Centre Development	7,413,005.50	-	Client
22.	3960100	Balangoda Town Development	21,236,093.40	-	Client
23.	5390200	Modarawila Development	646,617,463.18	-	UDA

ඉහත වගුව අනුව ආයෝජිත දේපල වශයෙන් හඳුනාගත් ව්‍යාපෘතීන් සහ වෙනත් ආයතන වෙනුවෙන් සිදුකරන ලද ව්‍යාපෘති **2022** වර්ෂයේ ගිණුම් ප්‍රකාශන වල නිවැරදි වර්ගීකරණය යටතේ පෙන්නුම් කිරීමට කටයුතු කරනු ලබන බව දන්වමි.

සංචාරක නිවාස වලින් කුලී ආදායම් ජනනය වන බැවින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අදාළ වත්කම් ආයෝජිත දේපළ යටතේ රු. **18,103,817/-** පෙන්වා ඇත. කෙසේ නමුත් **2022** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී එය දේපළ පිරියත හා උපකරණ යටතේ නිවැරදිව පෙන්නුම් කිරීමට කටයුතු කරනු ඇත.

ii. <u>නිරීක්ෂණය</u>

අධිකාරිය සතු ආයෝජිත දේපළ තුල ඇතුලත්ව ඇත්තේ අධිකාරිය සතුව පවත්නා ඉඩම් සහ ගොඩනැගිලි වේ. ඒ අනුව එම දේපළ විවිධ වූ සංවර්ධන කාර්යයන් සඳහා බාහිර පාර්ශවයන් වෙත **30, 50** හා **99** අවුරුදු යනාදී ලෙස දිගුකාලීන බදු පදනම මත ලබා දී ඇත. එලෙසම අධිකාරිය විසින් මෙම ඉඩම් හා ගොඩනැගිලි **2012** වර්ෂයේදී වන ගිණුම්කරණ ප්‍රමිත වෙත අනුගත වීමේදී ඒ සඳහා අධික පිරිවැයක් දැරීමට හා දිගුකාලයක් ගතවීම හේතුවෙන් එවකට රජයේ විගණන අංශය සමඟ සාකච්ඡා කර අභ්‍යන්තර තක්සේරු කමිටුවක් මඟින් ප්‍රත්‍යාගණනය සිදු කරන ලදි. අධිකාරිය සතුව ඇති ආයෝජිත දේපල ප්‍රත්‍යාගණනය කර සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරී ආයතනයක ගිණුම්කරන සහාය ඇතිව **2011.01.01** දිනට පැවති වටිනාකම් ගිණුම් පොත් වලට ගැනීම සිදු කර ඇත. එහිදී අධිකාරිය සතු **99** අවුරුදු බදු පදනම මත ලබා දුන් දේපල හැර අනෙකුත් දේපල තක්සේරු වාර්තා පදනම්ව ගිණුම් වලට ගැනීමට කටයුතු කර ඇත. **99** අවුරුදු බදු පදනම මත ලබා දුන් ඉඩම් වත්කම් බැහැර කිරීමක් සේ සලකා පොත් වලින් ඉවත් කල යුතු බවට දන්වන ලදි.

මෙහිදී **99** අවුරුදු ලෙස බදු දී තිබූ ආයෝජිත දේපල ඓතිහාසික පිරිවැය යටතේ ගිණුම්ගත කරනු ලැබුවේ මෙකී ඉඩම් රජය සතු ඉඩම් වන අතර ඒවා ගිණුම් පොත් වලින් සම්පූර්ණයෙන් ඉවත් කිරීමක්

සිදු කලහොත් ඒ සම්බන්ධයෙන් කිසිදු විස්තරයක් ලබා ගැනීමේ හැකියාවක් නොමැති වීම මත අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සහිතවය.

කෙසේවෙතත්, 2021.12.15 දින ජාතික විගණන කාර්යාලයේ විගණකාධිපතිතුමන් හා මෙම අධිකාරියේ නිලධාරීන් සමඟ පැවති සාකච්ඡාවට අනුව අධිකාරියේ 99 අවුරුදු බදු දී ඇති ආයෝජිත දේපල සම්පූර්ණ විකුණුමක් (Outright sale) සේ සලකා ගිණුම්ගත කිරීම සිදු කල යුතු බවට උපදෙස් ලබා දෙන ලදි.

කෙසේ වෙතත් මේ වන විට එම ප්‍රත්‍යාගණන අගයන් ගිණුම් වලට ගැනීම හා ප්‍රතිපත්ති වල සිදුකල යුතු වෙනස්කම් සිදුකිරීම සම්බන්ධයෙන් විශේෂඥ උපදේශන සේවාව ලබා ගැනීම සඳහා සුදුසුකම් ලත් ආයතනයක් තෝරා ගැනීම සඳහා අදාල ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී.

iii. <u>නිරීක්ෂණය</u>

නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන ව්‍යාපෘති සඳහා වෙන් කර ඇති ඉඩම් ප්‍රමාණය වැරදීමකින් අක්කර 374 ක් ලෙස සටහන් වී ඇති අතර එය අක්කර 37 ක් ලෙස සංශෝධනය විය යුතු බවත් එම ඉඩම් ප්‍රමාණය එක් එක් ව්‍යාපෘතිය සඳහා වෙන් වී ඇති ආකාරයත් 10/1/Audit හා 2021.04.01 දිනැති ලිපිය මඟින් ඔබ වෙත දැනුම් දී ඇත. (පිටපතක් අමුණා ඇත.) ඇමුණුම 03 එම ඉඩම් ප්‍රමාණයෙහි වටිනාකම 2021 වර්ෂයේදී නියමිත පරිදි ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඌ) <u>නිරීක්ෂණය</u>

ඉහත ප්‍රකාශය සමඟ සම්පූර්ණයෙන් එකඟ නොවන අතර අප ආයතනය විසින් රට පුරා ක්‍රියාත්මක වන නොයෙකුත් ව්‍යාපෘති සම්බන්ධයෙන් එම එක් එක් ව්‍යාපෘතිය සඳහා වෙන් වූ ව්‍යාපෘති අංකයක් යටතේ (Project Code) එක් එක් වියදම් ශීර්ෂයන් භාවිතා කරමින් (Account Code) ගණුදෙනු සටහන් කිරීම සිදු කරනු ලබයි.

විගණන විමසුමේ සඳහන් 2019.12.31 දිනට ශේෂ පිරික්සුමේ සංවර්ධන වියදම් වලට අදාල ගිණුම් අංක සියල්ලෙහි සමස්ත එකතුව වන රු.164,567,346,305.79 පහත පරිදි සැදුම්ලත්ව ඇත.

	රු.
සංවර්ධන වියදම් ගිණුම් 115 හි එකතුව	159,724,489,761.79
(විගණන විමසුමේ ගිණුම් අංක 117ක් ලෙස සටහන් වුවද එය ගිණුම් අංක 115 ක් ලෙස නිවැරදි විය යුතුය.)	
(ගිණුම් අංක 2101-2699)	
උපලේඛන5හි එකතුව(පැරණි ගිණුම් පද්ධතිය මඟින් 2001 වර්ෂයේදී	
ඉදිරියට ගෙන එනු ලැබූ ආරම්භක ශේෂයන්) (ගිණුම් අංක 2995-2999)	4,842,856,544.00
සමස්ත එකතුව	164,567,346,305.79

අධිකාරිය ආරම්භයේ සිටම ශේෂ පිරික්සුම සැකසීමේදී ගිණුම් අංක ලබාදීම සිදු කර ඇත්තේ අදාල වියදම් ස්වභාවය නිරූපණය වන පරිදිය. ඒ අනුව, අප වෙත සෑම වර්ගීකරණයන් යටතේ දරන ලද වියදම් පැහැදිලිව හඳුනාගත හැකි වී ඇත. එනම් අත්පත් කරගැනීමට අදාල වියදම්, ඉදිකිරීම් වලට අදාල වියදම්, සේවක වැටුප් ආදී වශයෙන්ය. ඒ අනුව, කිසියම් ව්‍යාපෘතියකට අදාල වියදම් එම ව්‍යාපෘති අංකය ලබාදීම තුළින් ලබා ගැනීමේ හැකියාව ඇත. ඒ අනුව, ව්‍යාපෘති වෙනුවෙන් දරනු ලබන අයභාර වියදම් ලාභාලාභ ගිණුමටත්, ප්‍රාග්ධන වියදම් නියමිත වර්ගීකරණය යටතේ ප්‍රාග්ධන වියදම් යටතේ පෙන්වීමට කටයුතු කර ඇත.

අධිකාරියේ පැවති පැරණි ගිණුම් පද්ධතියේ හා නව ගිණුම් පද්ධතියේ ඉහත සඳහන් සංවර්ධන වියදම් වලට අදාල ගිණුම් වල එකතුව සංවර්ධන වියදම් උපලේඛනය තුල වර්ගීකරණය කර පවතිනුයේ කෙරිගන යන වැඩ, ආයෝජන දේපල, දේපල පිරියත, ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපෘති හා වැඩ අවසන් කල නිවාස ව්‍යාපෘති ලෙසයි. ඒ අනුව අප විසින් ශේෂ පිරික්සුමේ 2019.12.31 දිනට ඉහත ගිණුම් අංක 115 සහ උපලේඛන 5 හි පැවති ශේෂයන්ගේ එකතුව අදාල වර්ගීකරණයන් යටතේ 2019 මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව පෙන්නුම් කර ඇති අතර ඊට අදාල නිවැරදි උපලේඛනද අප විසින් රජයේ විගණන අංශය වෙත ලබා දී ඇත.

(එ) <u>නිරීක්ෂණය</u>

RETSUP ලෙස ශේෂ පිරික්සුමේ දක්වා ඇති රු.993,270,282 ක මුදලින් නිරූපණය වනුයේ 2016.01.01 දිනට පැවති රදවා ගත් අතිරික්ත වල ශේෂය වේ. එනම් අධිකාරිය ආරම්භයේ සිට වාර්තා කර තිබූ ලාභ හා අලාභයන්ගේ එකතුව වේ.

ඒ අනුව, ඉහත **1.2.2.4 (න)** හි දක්වා ඇති පරිදි මෙම ගිණුමේ ශේෂය රදවා ගත් ලාභ (Retained Surplus) ගිණුම අංකය වෙත මාරු කිරීමට ජර්නල් අංක J31703 මගින් 2020 වර්ෂයේ ගිණුම් වලට ගැලපීමට කටයුතු කර ඇත.

(ඒ) <u>නිරීක්ෂණය</u>

ඔබගේ විමසුමෙහි සඳහන් මුදල් පොතට අදාල ගනුදෙනු මුදල් ලැබීම් ගෙවීම් වලින් පහත සඳහන් පරිදි ඇතැම් ගනුදෙනු ගිණුම්ගත කිරීම් සඳහා ජර්නල් සටහන් භාවිතා කර ඇත. එනම්, කල්පිරුණු ස්ථාවර තැන්පතු වලට අදාල මුදල් ලැබීම් සටහන් කිරීම, ගනුදෙනුකරුවන් විසින් ඍජුවම මෙම අධිකාරිය වෙත ගෙවිය යුතු පෙරසැරි ගාස්තු ගිණුම්ගත කිරීම මෙන්ම මෙම අධිකාරියට අයත් ගිණුම් අතර මුදල් මාරුකිරීම සඳහා සැලසුම් අනුමත කිරීමේදී අදාළ අයදුම්පත් මාර්ග ගත පද්ධතියක් (online system) මගින් සිදුකරන බැවින් අදාළ ගනුදෙනුකරුවන් විසින් එකී ගාස්තු බැංකුව වෙත ඍජුවම තැම්පත් කරනු ලැබේ.

එවැනි තැම්පතු වලට අදාළ බැංකු කුවිතාන්සි මෙම අධිකාරියට ලැබීමට යම් කාලයක් ගතවන අතර එතෙක් එකී ආදායම් විගණන විමසුමේ සඳහන් පරිදි හඳුනා නොගත් ආදායම් ලෙස ජර්නල් සටහන් මගින් ගිණුම්ගත කර ඇත.

එයට අදාල මූලාශ්‍ර කාලපරිච්ඡේදයේ බැංකු ගිණුම් විස්තර හා සංසන්දනය කර හඳුනාගැනීමකින් අනතුරුව තාවකාලිකව ආදායම් බැර කර ඇති ගිණුමෙන් ඉවත්කර නිවැරදිව හඳුනාගත් අදාළ ආදායම් ගිණුම් වෙත ගිණුම්ගත කිරීමට කටයුතු කරයි.

ඒ අනුව විමසුමෙහි සඳහන් පරිදි මුදල් අයතා පරිහරණය මෙම අධිකාරියේ කිසිදු නිලධාරියකුට හැකියාවක් පැන නොනගී.

(ඓ) <u>නිරීක්ෂණය</u>

ඉහත **1.2.2.1 (අ) (i)** හි සඳහන් කල පරිදි, අධිකාරිය විසින් 2012 වර්ෂයේදී නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (SLFRS & LKAS) වෙත අන්තර්ග්‍රහණ ක්‍රියාවලියේදී ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක **1** අනුව තිබූ ව්‍යාතිරේක අවස්ථා දෙක අතුරින් ආයතනය සතු ආයෝජිත දේපළ සලකනු ලබන පිරිවැය (Deemed Cost) පදනම මත ගිණුම්වලට නිරූපණය කිරීම සඳහා තීරණය කරන ලදී. ඒ අනුව, එදිනට අධිකාරිය සතු ඉඩම් හා දේපළ ප්‍රත්‍යාගණන සිදු කර (99 අවුරුදු බදු දේපළ හැර) එම අගයන් එදිනට පිරිවැය ලෙස සලකා ගිණුම්වලට ගැලපීමට සිදුකරන ලදී.

අධිකාරිය විසින් එම පදනම මත ගිණුම් තැබීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ අධිකාරිය සතු දේපළ ප්‍රමාණය හා ඒ සම්බන්ධයෙන් දැරීමට සිදුවන පිරිවැය සැළකිල්ලට ගැනීමෙන් හා මෙම කාර්යය සිදුකිරීම සඳහා එවකට උපදේශන සේවය ලබා ගන්නා ලද වරලත් ගණකාධිකාරී ආයතනයේ නිර්දේශය හා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මතය. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් අප අමාත්‍යාංශයේ ලේකම්තුමා සහ විගණකාධිපතිතුමා සමඟ පැවැති සාකච්ඡාවේදී මෙම කරුණු පිළිබඳව සලකා බලා

ස්වාධීන තක්සේරුකරුවකු පත්කර **2021** වර්ෂයේදී ඒ වන විට අධිකාරිය සතු සියලුම ඉඩම් හා ගොඩනැගිලි වල තක්සේරු වටිනාකම ලබා ගැනීමට කටයුතු කරන ලදි. ඒ අනුව, ඔහු විසින් ලබා දුන් වාර්තාව පදනම් කර ගෙන 2019 වර්ෂයේදී ගිණුම්වලට තක්සේරු වාර්තාවේ සම්පූර්ණ වටිනාකම වන රු.598,326,141,944 ක අගය ප්‍රධාන වර්ගීකරණයන් 03 ක් යටතේ සාරාංශ කර හෙළිදරව් කිරීමක් පමණක් සිදුකරන ලදී.

ඒ අනුව, මේ දක්වා අධිකාරිය විසින් ආයෝජන වත්කම් සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය වන පිරිවැයට නිරූපණය කිරීමේ පදනම මත ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කර ඇත.

(ඔ) <u>නිරීක්ෂණය</u>

ව්‍යාපෘති අංකය	ව්‍යාපෘතිය	වටිනාකම (රු.)	නිරීක්ෂණය
6131000	Sugathadasa Indoor Stadium	2,851,204	සුගතදාස ගෘහස්ත ක්‍රීඩාංගනය ඉදිකිරීමේ කටයුතු **(ක්‍රීඩා අමාත්‍යාංශය** වෙනුවෙන්**)** එවකට නාගරික සංවර්ධන අධිකාරිය මගින් සිදු කර ඇත. ඒ අනුව මෙම ව්‍යදම් **6131000** යන ව්‍යාපෘතිය වෙනුවෙන් විවිධ පාර්ශව යටතේ ගනුදෙනුකර තැම්පතු මුදල් වලින් හිලව් කිරීමට **2020** ගිණුම් වර්ෂයේදී කටයුතු කරනු ලබන අතර එම ව්‍යාපෘතිය නොනිමී වැඩ ව්‍යාපෘති වෙතින් ගනුදෙනුකාර ව්‍යාපෘති යටතට **2020/12/31** දින වන විට මාරු කිරීමට කටයුතු කර ඇත.
3220200	Kotikawatta Town Center Development	109,919,235	**3220200** යන අංකය යටතේ දක්වා ඇති **Kotikawatta Town Center Development** යන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති අංකය **3230200** ලෙස නිවැරදි විය යුතුය. **3230200** යන ව්‍යාපෘති පිලිබඳ විමසා බැලීමේදී, අදාළ ව්‍යාපෘතිය අත්පත් කර ගැනීමේ කටයුතු **(Land Acquisition)** නාගරික සංවර්ධන අධිකාරිය මඟින් මේ වන විට සිදු කරමින් පවතී. අදාල ඉඩමේ භුක්තිය මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාර දී ඇත. ඒ වෙනුවෙන් මේ දක්වා ගනුදෙනුකාර තැම්පතු **(6605)** කිසිවක් ලැබී නොමැත. එබැවින් එම ව්‍යාපෘතිය නොනිමී වැඩ ව්‍යාපෘති වෙතින් ගනුදෙනුකාර තැම්පතු ව්‍යාපෘති යටතට මාරු කිරීමට හැකියාවක් නොමැත. අදාළ ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් වන තෙක් එය නොනිමී වැඩ ව්‍යාපෘති කාණ්ඩය යටතේ දක්වා තිබූ අතර ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් වූ වහාම එය නියමිත ව්‍යාපෘති කාණ්ඩය යටතට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ.
3350300	Acq.of Land at Delghoda for Township Development	159,250	**3350300** යන අංකය යටතේ දක්වා ඇති **Acq.of Land at Delgoda for Township Development** යන ව්‍යාපෘතියෙහි ව්‍යාපෘති අංකය **3350500** ලෙස නිවැරදි විය යුතුය.

			අදාළ ඉඩම නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කරමින් පවතී. අදාළ ව්‍යාපෘති කටයුතු නාගරික සංවර්ධන අධිකාරියේ අරමුදල් මගින් සිදුකර ඇත. එබැවින් එම ව්‍යාපෘතිය නොනිමී වැඩ ව්‍යාපෘති වෙතින් ගනුදෙනුකාර තැම්පතු ව්‍යාපෘති යටතට මාරු කිරීමට හැකියාවක් නොමැත. අදාළ ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් වන තෙක් එය නොනිමී වැඩ ව්‍යාපෘති කාණ්ඩය යටතේ දක්වා තැබීමට සිදු වන අතර ව්‍යාපෘතියේ වැඩ කටයුතු අවසන් වූ වහාම එය නියමිත ව්‍යාපෘති කාණ්ඩය යටතට මාරු කිරීම සිදු කරනු ලැබේ.
	එකතුව	**112,929,689**	

(ඕ) <u>නිරීක්ෂණය</u>

2018 වර්ෂය දක්වා පාවෙන වෙළඳ සංකීර්ණයේ ගණුදෙනුකරුවන්ගේ ලැබිය යුතු අක් මුදල් පරිගණක පද්ධතියේ වැඩියෙන් ගිණුම්ගත වීම හේතුවෙන් එම වැඩියෙන් ගිණුම්ගත වූ ශේෂයන් සමාලෝචිත වර්ෂයේ ආදායමට එරෙහිව ලියාහැරීමට වැරදීමකින් කටයුතු කර ඇත.

කෙසේ වෙතත් මෙවැනි ගිණුම් කරන දෝෂ ඉදිරියේදී සිදුනොවීමට අවශ්‍ය පියවර ගන්නා බව සඳහන් කරමි.

(ක) <u>නිරීක්ෂණය</u>

මෙම ප්‍රකාශය හා එකඟ වේ. දේපල පිරියත හා උපකරණ වලට අදාලව දැනට පවතින ක්ෂය වෙන්කිරීම් උපලේඛණය 2001 වර්ෂයේ ආරම්භක ශේෂයන්ගෙන් සැදුම්ලත්ව ඇති අතර මේ දක්වා එම ලේඛනයම යාවත්කාලීන කරමින් අධිකාරිය විසින් ක්ෂය වෙන් කිරීම් ගණනය කරනු ලබයි. (එම ලේඛනයේ යන්ත්‍ර, ලී බඩු උපකරණ, මෝටර් රථවල පිරිවැය පිළිවෙලින් රු.9,575,577, රු.2,559,834, රු.21,609,276 ක එනම් එහි සමස්ථ පිරිවැය වන රු.33,744,687 ක ශේෂය 2001 වර්ෂයේ සිට පැවත එන ශේෂයකි. එබැවින් රු. 33,744,687 ක් වන මෙම අගය ක්ෂය වෙන් කිරීම් ලෙස ගිණුම්ගත විය යුතු බැවින් මෙම ක්ෂය වීම් පෙර වර්ෂ වලට අදාල වන හෙයින් පෙර වර්ෂ ගැලපීම් ලෙස 2020 මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමට කටයුතු සිදු කරනු ඇත.

එලෙසම ලී බඩු , මෝටර් රථ හා ගෘහ භාණ්ඩ හා උපකරණ සම්බන්ධව ක්ෂය ගණනය කිරීමේදී විමසුමේ සඳහන් පරිදි අදාල වර්ෂයන්හිදී අතපසු වීමකින් පිළිවෙලින් රු.1,340,370, රු.2,289,402 හා රු.446,412 ක් අඩුවෙන් ගිණුම්ගත කර ඇත. කෙසේවෙතත්, මෙම ක්ෂය වෙන් කිරීම් වලට අදාලව සමස්ත ක්ෂය එකතුව වන රු.37,820,871 ක මුදල පෙර වර්ෂ වලට අදාල වන බැවින් එය නිවැරදිව 2020 ගිණුම් වල පෙර වර්ෂ ගැලපීම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිමි.

(ඛ) <u>නිරීක්ෂණය</u>

ප්‍රකාශය හා එකඟ වේ. ඒ අනුව ගිණුම්වල සිදුකළ යුතු ගැලපීම් පෙර වර්ෂ ගැලපීම් ලෙස සිදුකිරීමටත් විමසුමේ දක්වා ඇති අඩුවෙන් කරන ලද වෙන්කිරීම් 2020 වර්ෂයේ අවසන් ගිණුම් වලදී ගැලපීමටත් අවශ්ය කටයුතු සිදුකරනු ලැබේ.

(ග) <u>නිරීක්ෂණය</u>

හම්බන්තොට පරිපාලන සංකීර්ණයට යාබදව ඉදිකරන ලද නිල නිවාස සංකීර්ණයේ ආදායම් මේ දක්වා ගිණුම්ගත වන්නේ හම්බන්තොට බස් නැවතුම් සංවර්ධන ව්‍යාපෘතිය (ව්‍යාපෘති අංක 9590200) යටතේය.

කෙසේ වෙතත්, 2019 වර්ෂය වන විට මෙම නිවාස ඒකකයන් හි අයිතිය අධිකාරිය වෙත ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පැවති අතර මේ වන විට ඒවායේ අයිතිය නාගරික සංවර්ධන අධිකාරිය වෙත හිමි වී ඇත.

(ඝ) <u>නිරීක්ෂණය</u>

අධිකාරිය විසින් භාවිතා කරනු ලබන නව ගිණුම්කරණ පද්ධතියට මාරුවීමේදී එම පද්ධතියට සිදුකල යුතු වැඩිදියණු කිරීම සිදුකිරීම සඳහා ප්‍රමාණවත් කාලසීමාවක් ගතවීම හේතුවෙන් හා මාර්ගගත ක්‍රමය යටතේ සැලසුම් අනුමැතිය ලබා ගැනීම සඳහා අයදුම් කිරීමේ ක්‍රමවේදය හඳුන්වා දීමත් සමඟ බැංකු සැසඳුම් සකස් කිරීමේ ක්‍රියාවලියේ යම් ප්‍රමාදයක් 2018 හා 2019 වර්ෂයන් තුලදී ඇතිවිය. කෙසේ වෙතත් මේ වන විට ප්‍රමාදය වලක්වා ගැනීමට කටයුතු සිදුකර ඇත. මෙම හේතුවෙන් 2019.12.31 දිනට රු.10,214,264 වටිනාකමැති බැංකු ගාස්තු, චෙක්පොත් ගාස්තු හා මුදල් මාරුකිරීම් සමාලෝචිත වර්ෂයේ මුදල් පොතට බැර වී නොතිබුණි. නමුත් අදාල ගැලපීම් ඊට පසුව සිදු කර ඇත.

(ච) <u>නිරීක්ෂණය</u>

පහත සඳහන් බැංකු ගිණුම් පසුගිය වසර පහ තුළ ක්‍රියාත්මක කර නොමැති අතර නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය වෙතින් අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමෙන් පසු අදාළ බැංකු ගිණුම් වසා දැමීමට කටයුතු කරනු ලැබේ.

	බැංකු ගිණුමේ නම	නිරීක්ෂණ
	ආදායම් එකතු කිරීමේ ගිණුම්	
01	ලංකා බැංකුව - මහියංගන ශාඛාව	මෙම ගිණුම අධිකාරියේ කළමනාකරණය විසින් තානායම් කළමනාකරණය කිරීම සහ පවත්වාගෙන යාම සඳහා පූර්ණ අනුබද්ධිත ආයතනයක් ලෙස සංස්ථාපිත ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් වෙත මහියංගනය තානායම පවරන තෙක් එහි ආදායම් එකතු කිරීම සඳහා අධිකාරිය විසින් භාවිතා කරන ලදී. සීමාසහිත ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ්හි සම්බන්ධීකරණය ඇතිව මෙම ලෙජර ගිණුම සැසඳුම් කොට බැංකු ගිණුම වසා දැමීමට කටයුතු කරනු ලැබේ.
	ජංගම ගිණුම්	
02	ලංකා බැංකුව - හම්බන්තොට ප්‍රමුඛතා ව්‍යාපෘතිය	මෙම ගිණුම අධිකාරියේ ප්‍රධාන බැංකු ගිණුම හරහා හම්බන්තොට ප්‍රමුඛතා ව්‍යාපෘතිය සඳහා කරන ලද සුළු මුදල් හුවමාරු ගිණුම්කරණය සඳහා අධිකාරිය විසින් භාවිතා කර ඇත. කෙසේ වෙතත්, 2010 වර්ෂයේදී එම ක්‍රියාවලිය නතර කර ඇති අතර භාණ්ඩාගාරයෙන් වෙන් කරන ලද මුදල් යොදවා ව්‍යාපෘතිය මඟින් මෙම ගිණුම හසුරුවා ඇත. ඒ අනුව ඔවුන් විසින් 2016.06.30 දින දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශන සකස් කර ඇත. දැනට මෙම ගිණුම භාවිතා නොවන අතර අධිකාරියේ ගිණුම් පොත්වල ඇති මෙම ගිණුම් ශේෂය සැසඳීමට කටයුතු කර කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන බැංකු ගිණුම වසා දමා නාගරික සංවර්ධන අධිකාරියට ලැබිය යුතු ශේෂය මාරු කර ගැනීමට පියවර ගනු ලැබේ.
03	ලංකා බැංකුව - යාපනය ශාඛාව	2013 වසරේ කුඩා මධ්‍යම නගර සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති ගෙවීම් කිරීම සඳහා මෙම ජංගම ගිණුම විවෘත කරන ලදී. ලංකා බැංකුව - යාපනය ශාඛාවේ පවත්වා ගෙන මෙම ජංගම ගිණුම් අංක

		“73485688” හි වර්ෂය තුළ කිසිදු ගනුදෙනුවක් සිදුවී නොමැති බව නිරීක්ෂණය වන අතර 2021.12.31 දින පෙන්වා ඇති ශේෂය රු. 20,801.80 කි. ඉහත වැඩසටහන දැනටමත් අවසන් කර ඇති බැවින් ජංගම ගිණුම වසා දමා ඉතිරි ශේෂය අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ජංගම ගිණුමට මාරු කිරීමට කටයුතු කරනු ලැබේ.
04	ලංකා බැංකුව - අධිශ්‍රේණි ශාඛාව රත්නපුර	ලංකා බැංකුව - රත්නපුර ශාඛාවේ පවත්වාගෙන යනු ලබන "0073516300" ජංගම ගිණුම අක්‍රිය ගිණුමක් ලෙස පෙන්වා ඇත. මෙම ගිණුම අධිකාරිය විසින් දැනට භාවිතා නොකරන බැවින්, මෙම ගිණුම වසා දමා එහි ඇති ශේෂය රුපියල් 1,500 ක මුදල අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ ජංගම ගිණුමට මාරුකිරීමට කටයුතු කරනු ලැබේ.
05	ලංකා බැංකුව - ණයකර ගිණුම	මෙම බැංකු ගිණුම් දෙක ප්‍රධාන වශයෙන් ආරම්භ කර ඇත්තේ 2010 දී නිකුත් කර 2015 දී ගෙවා නිදහස් කර ඇති රුපියල් බිලියන 10 ක ණයකර නිකුතුවේ බැංකු කටයුතු සඳහාය. ඉන් අනතුරුව, අධිකාරිය විසින් මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘති සඳහා අවශ්‍ය අරමුදල් සපයා ගැනීමට තවත් රුපියල් බිලියන 25ක නව ණයකර නිකුතුවක් සිදු කිරීමට අදහස් කළ අතර එම යෝජිත නව ණයකර නිකුතුව භාවිතා කිරීම සඳහා මෙම ගිණුම් දෙක පවත්වා ගෙන යන ලදී. කෙසේ වෙතත්, රටේ වත්මන් තත්ත්වය සහ ණයකර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සැලකිල්ලට ගනිමින් හා මෙම ගිණුම් දෙක මේ වන විට ක්‍රියාත්මක නොවන බැවින් කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඉහත ජංගම ගිණුම් දෙක වසා දැමීමට කටයුතු කරනු ඇත.
06	ලංකා බැංකුව - ණයකර පොලී ගිණුම	
07	ලංකා බැංකුව - හම්බන්තොට ශාඛාව (රෙස්ට් හවුස්)	1999 වර්ෂයේදී මෙම ගිණුම ආරම්භ කර ඇත්තේ හම්බන්තොට ප්‍රදේශයේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් බදු පදනම මත ලබා දී ඇති වෙළඳසැල්වලින් ලබා ගන්නා කුලී ආදායම රැස් කිරීම සඳහාය. අනතුරුව හම්බන්තොට තානායමේ දෛනික ආදායම තැන්පත් කිරීම සඳහා මෙම ගිණුම භාවිත කර ඇත. කෙසේ වෙතත්, 2014 වර්ෂයේදී හම්බන්තොට තානායම හම්බන්තොට මහ නගර සභාවට පවරා දී ඇති අතර මෙම ගිණුමේ ඉතිරි ශේෂය වන රුපියල් 201,368.32 මුදල අධිකාරියේ ලංකා බැංකු ගිණුමට (ගිණුම් අංක 1534) මාරු කිරීමට 2020 වර්ෂයේදී අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත. එසේම සීමාසහිත ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් සහ අධිකාරියේ හම්බන්තොට උප කාර්යාලයේ සම්බන්ධීකරණයෙන් ගිණුම් පොත් ශේෂයන් සැසඳුම් කොට මෙම බැංකු ගිණුම වසා දැමීමට කටයුතු කරනු ලැබේ.

(ඡ) <u>නිරීක්ෂණය</u>

5290200 - Modarawila Development Project - 45,920,000.00

ව්‍යාපෘති අංක **5390200** යටතේ මෝදරවිල සංවර්ධන ව්‍යාපෘතියේ වෙත අවුරුදු **99** බදු පදනම යටතේ අක්කර **10** ක ඉඩමක් **1994.01.12** දින ලබාදී තිබූ අතර, සංවර්ධන කටයුතු නිසි පරිදි සිදු නොවීම හේතුවෙන් **2000.11.30** දින පැවති කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී කල්බදු වගකීම අවලංගු කිරීමටත්, සමාගම විසින් අධිකාරිය වෙත ගෙවා තිබුණු රු.මිලියන **29** ක මුදල පහත පරිදි ගෙවීමටත් තීරණය විය. **(ඇමුණුම 04)**

සමාගම විසින් අධිකාරිය වෙත ගෙවා ඇති මුදල	B19298, 1994.01.11	-	10,000,000.00
	B24651, 1994.06.16	-	19,000,000.00
			29,000,000.00
අඩුකලා - සමාගම වෙත නැවත ගෙවූ මුදල	001302 – 2003.02.24 005106 – 2003.07.17		(7,000,000.00)
අඩුකලා - කල්බදු ලෙස අධිකාරිය වෙත රඳවාගත් මුදල			22,000,000.00 (6,080,000.00)
2017.11.24 දින 011699 මඟින් සමාගම වෙත කල අවසාන ගෙවීම			15,920,000.00

ඉහත ගෙවූ අවසාන ගෙවීම (ඇමුණුම 05) නිවැරදිව ගණුදෙනුකරුගේ සංකේත අංකයට ගිණුම් ගතවී ඇති අතර, එය විලම්භීත කල්බදු ලේඛනයට යාවත්කාලීන නොවීම හේතුවෙන් හර ශේෂයක් වශයෙන් සටහන්ව ඇත.

8211000 – Jayawardhanagama Housing Scheme – 23,989.00

ගණුදෙනුකරුගේ සංකේත අංකයක්, නමක්, ලිපිනයක් අංකයක් රහිතව 2016 වසරේ සිට (ඇමුණුම 06) විලම්භීත කල්බදු ලේඛනයේ පැවති කල්බදු වගකීමට අදාල ඍණ ශේෂය නිවැරදි කිරීම සඳහා 2019 වසරේ ගණුදෙනුකරුගේ සංකේත අංකය ලෙස 17 CSM යටතේ ධන වටිනාකමක් යොදා ඇත. (ඇමුණුම07)

තවද ලිපිනයක් තවදුරටත් පරීක්ෂා කිරීමෙන් ගණුදෙනුකරු අංකය සොයා ගැනීමෙන් පසුව නිවැරදි ගණුදෙනුකරු වෙත ජර්නල් සටහන් මඟින් නිවැරදි කිරීම සිදු කිරීමට ඇත.

(ට) නිරීක්ෂණය

විමසුමේ සඳහන් රු.4,632,974,727 ක මුදලින් නිරූපනය වනුයේ රජය හෝ වෙනත් රාජ්‍ය ආයතන වෙනුවෙන් සිදු කරනු ලබන ඇමුණුමේ සඳහන් ව්‍යාපෘති 268 කට අදාලව අධිකාරිය වෙත 2019/12/31 දිනට ගණුදෙනුකාර තැන්පතු ලෙස ලද මුදල් වල ශේෂය වේ. මෙම මුදලින් 2019/12/31 දිනට පැවති සමහරක් ව්‍යාපෘති වියදම් හිලව් කිරීමට කටයුතු කිරීමෙන් පසුව තවදුරටත් එම ගිණුමේ විවිධ ව්‍යාපෘති අංකයන් යටතේ ඉතිරි ශේෂය වේ. මෙම ශේෂයෙන් 2020.12.31 දින වන විට රු.මිලියන 533,616,605.63 සහ 2021.12.31 දිනට රු.මිලියන 726,825,629.78 ක මුදලක් ප්‍රාග්ධන වියදම් ලෙස ගණුදෙණුකාර තැම්පතු වලට එරෙහිව කපා හැරීමට කටයුතු කර ඇත. මෙම මුදල් ලැබීම් ප්‍රධාන වශයෙන් ව්‍යාපෘති පිරිවැය ආවරණය කරගැනීම, උපදේශන සේවා ගාස්තු ආවරණය කරගැනීම ආදී සමහරක් ව්‍යාපෘති වලට අදාල මුදල් ලැබීම් එහි ප්‍රධාන ව්‍යාපෘතිය යටතේ සටහන් කර ඇතත් වියදම් දැරීම එක් එක් උප ව්‍යාපෘති යටතේ සඳහන් කර ඇත.

එලෙසම, විමසුමේ සඳහන් රු.4,404,885,268 මුදලින් නිරූපණය වනුයේ නොනිමී වැඩ යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති හා සමහරක් උප ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද වියදම් වල එකතුව වේ. කෙසේවෙතත්, වෙනත් රාජ්‍ය ආයතන වෙනුවෙන් කල ව්‍යාපෘති වෙනුවෙන් ලැබී ඇති අරමුදල් අදාල ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද වියදම් වලට එරෙහිව පමණක් ලියා හැරීමට කටයුතු කර ඇත. මේ වනවිට මෙම ගිණුම් දෙකට අදාලව සැසඳීම් ක්‍රියාවලිය තවදුරටත් සිදු කරමින් පවතින අතර මෙම ගිණුමේ සඳහන් සමහරක් තැන්පතු දැනට වසර 30 කට පමණ පෙර සිට ගිණුම්ගත වී ඇති අතර ඒවායේ තොරතුරු ලබා ගැනීම සඳහා අවශ්‍ය මූලාශ්‍ර ලේඛන සොයා ගැනීමට නොහැකි වී ඇත. ඒ අනුව, මෙසේ දිගු කාලයක සිට මෙම ගිණුමේ පවත්නා එවැනි ශේෂයන් අදාල අනුමැතීන් ලබා ගැනීමෙන් පසු ගිණුම් වලින් ඉවත් කිරීමට අදාල කටයුතු සිදු කරනු ඇත.

(ඩ) නිරීක්ෂණය

සෙත්සිරිපාය අදියර 1 ගොඩනැගිල්ල හා මැද කොළඹ වෙළඳ සංකීර්ණය වෙනුවෙන් මෙම අරමුදල් පිලිවෙලින් 1981,1984 හා 1991 වර්ෂ වලදී ලැබී ඇත. ඒ අනුව සෙත්සිරිපාය අදියර 1 ගොඩනැගිල්ලට ලැබී ඇති මුදල් ගිණුම් අංක 6161,6164 යටතේ ද මැද කොළඹ වෙළඳ සංකීර්ණය වෙනුවෙන් ලද මුදල 6162 යටතේ ද ගිණුම් ගත කර ඇත. ඒ අනුව සෙත්සිරිපාය අදියර 1ට අදාලව ලැබී තිබූ අරමුදල් වලට

අදාල ගැලපීම ගිණුම් අංක 6161 යටතේ පමණක් සිදු කිරීම හේතුවෙන් ගිණුම් අංක 6164 යටතේ දක්වා ඇති අගයේ වෙනසක් සිදු වී නොමැත. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් තවදුරටත් ගිණුම් වලට ගැලපීමක් සිදු කිරීමට අවශ්‍ය වන්නේ නම් අදාල ලිපිගොනු පරීක්ෂා කර බලා 2020 ගිණුම් වර්ෂයේ සිට ගිණුම් වල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

ඔ) <u>නිරීක්ෂණය</u>

මෙම වාර්තාව පිළියෙල කිරීමේදී **2019** නව තක්සේරු වාර්තාව පිළියෙල කරමින් පැවති බැවින් අදාල ඉඩම් වල තක්සේරු වටිනාකම් නිවැරදිව ඉදිරිපත් කිරීමට නොහැකි විය. එම නිසා ඉඩම් බැහැර කිරීමේ දිනට ඉඩම බැහැර කිරීමට ගත් වටිනාකම අදාල වාර්තාවේ සඳහන් කරන ලදී. මුල්‍ය ප්‍රකාශන වල දක්වනු ලබන්නේ **2012** වර්ෂයට අදාල තක්සේරු වටිනාකම වන අතර **2021** වර්ෂයේදී නව ඉඩම් තක්සේරුවට අනුව ආයෝජිත දේපල ගිණුම්ගත කිරීමෙන් පසුව මෙම ඉඩම්වල නිවැරදි වටිනාකම ගිණුම් වල නිවැරදිව පෙන්වනු ලැබේ.

(ණ) <u>නිරීක්ෂණය</u>

2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා සමාගම ඇවරකිරීමේ කටයුතු ආරම්භ කිරීමට පෙර සිට මෙම වාහන නාගරික සංවර්ධන අධිකාරිය වෙත භාර දී ඇත. කෙසේ වෙතත්, මෙම වාහන ඇවර කිරීම් කටයුතු ආරම්භ කිරීම තෙක්ම PWCC සමාගමේ වත්කම් ලෙස ගිණුම් පොත් වල පෙන්වා තිබුණි. එසේම අනෙකුත් කාර්යාල උපකරණද එම සමාගම් ගිණුම් පොත් වලින් ඉවත් කිරීමක් සිදු කර නොමැත. ඒ අනුව ඇවරකරු විසින් ඇවර කිරීම් ගිණුම් ඉදිරිපත් කිරීමෙන් පසු අදාළ වත්කම් ගිණුම් වලට ගැලපීමට කටයුතු කරනු ලැබේ.

(ත) <u>නිරීක්ෂණය</u>

<table>
<tr><th>විස්තරය</th><th>අවසාන ගිණුම අනුව ශේෂය (රු)</th><th>උපලේඛනය අනුව ශේෂය (රු)</th><th>වෙනස (රු)</th><th>නිරීක්ෂණය</th></tr>
<tr><td>විලම්භිත කල්බදු කුලී වගකීම්</td><td>618,419,146</td><td>3,806,205,396</td><td>3,187,786,250</td><td>2019 මූල්‍ය ප්‍රකාශන වල ආදායම් හා වියදම් ගිණුමෙහි අන්තර්ගත කුලී ආදායම් ගිණුම(Lease Rent) පහත පරිදි සැකසී ඇත.
<table>
<tr><th>විස්තරය</th><th>වටිනාකම (රු)</th></tr>
<tr><td>වාර්ෂික බදුකුලී (4402)</td><td>44,129,799</td></tr>
<tr><td>වාර්ෂික බදුකුලී මත ජාතිය ගොඩනැගීමේ බද්ද (4427)</td><td>15,635,036</td></tr>
<tr><td>විලම්භිත බදුකුලී (4411) (වර්ෂයට අදාල</td><td>558,654,311</td></tr>
<tr><td>එකතුව</td><td>618,419,146</td></tr>
</table>
ඒ අනුව, සමාලෝචිත වර්ෂයට අදාලව වාර්ෂික බදුකුලී, වාර්ෂික බදුකුලී මත ජාතිය ගොඩනැගීමේ බද්ද හා විලම්භිත බදුකුලී ගිණුමෙන් වර්ෂයේ ආදායම ලෙස හඳුනාගත් ශේෂයන්හි සමස්ථ එකතුව වන රු.618,419,146 ක මුදල නිවැරදිව මූල්‍ය</td></tr>
</table>

				ප්‍රකාශනවල පෙන්නුම් කිරීමට කටයුතු කර ඇති අතර ඊට අදාල උපලේඛනද රජයේ විගණන අංශයට ලබා දීමට කටයුතු සිදු කර ඇති බව දැනුම් දීමට කැමැත්තෙමු. විලම්භිත බදුකුලී ලේඛනයේ සඳහන් ලියාහැරීම් ලෙස දක්වා ඇති අගය වන රු.**3,806,205,396** ක මුදලින් රු.**558,654,311** මුදලක් පමණක් වර්ෂයේ ආදායමට ලියා හැර ඇති අතර ඉතිරි රු.**3,247,551,085** හර සටහන් ලෙස යොදා ඇත්තේ එම ගිණුමේ සිදු කරන ලද සැසඳීම් කටයුතු සඳහා කරන ලද නිවැරදි කිරීමේ සටහන් වන අතර එය වර්ෂයේ ආදායමේ කොටසක් ලෙස සැලකීම නිවැරදි නොවේ.
කුලී ආදායම් ණයගැතියෝ	1,358,927,421	1,389,574,117	30,646,696	කුලී ආදායම් ණයගැති ගිණුමේ **2019.12.31** දිනට අවසාන ගිණුම්වල හා උපලේඛන අතර වෙනසක් පැවති අතර, එකී වෙනසට හේතු වූ ගිණුම්කරණ දෝෂ පරීක්ෂා කර බලා **2020.12.31** දිනට අදාල නිවැරදි කිරීම් සිදුකර ඇත. ඒ අනුව **2020.12.31** දිනට කුලී ආදායම් ණයගැති ශේෂය මූල්‍ය ප්‍රකාශනවල හා උපලේඛනයේ සැසඳී ඇත.
	78,719,000	135,310,000	56,591,000	මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ අන්තර්ගත රු.**78,715,877** ක් ලෙස සඳහන් කළමනාකරණ ගාස්තු හා උපදේශන සේවා ගාස්තු ආදායමට අදාළ උපලේඛනය රජයේ විගණන අංශය වෙත ලබා දී ඇත. ඔබගේ විගණන විමසුමේ දක්වා ඇති ව්‍යාපෘති අංශය මගින් ලබා දුන් ව්‍යාපෘති **31**ට අදාළ ලැබිය යුතු උපදේශන සේවා ගාස්තු අදායම වන රු මිලියන **135.31** ක මුදලින් හා ගිණුම් වල දක්වා ඇති මුදල වන රු මිලියන **77.4** අතර පවතින රු මිලියන **57.9** ක වෙනස පහත පරිදි වේ. **විස්තරය** — **වටිනාකම (රු.මි)** මැනිං මාර්කට් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සඳහා ලැබිය යුතු උපදේශන ගාස්තු — **27.39** යාපනය නගර ශාලාව ඉදිකිරීම වෙනුවෙන් ලැබිය යුතු ගාස්තු මුදලින් **2020** වර්ෂය සඳහා ගිණුම් ගත කල යුතු මුදල — **23.28**

				අනෙකුත් ව්‍යාපෘති වලින් ලැබිය යුතු මුදල 7.23 මැනිං මාර්කට් ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලැබිය යුතු 2019 වර්ෂයට අදාල උපදේශන ගාස්තු මුදල වූ රු.මිලියන 35.89 ක මුදලින් රු.මිලියන 8.5 ක මුදලක් පමණක් ලබා දී ඇත. ඉතිරි රු.මිලියන 27.39 ක උපදේශන ගාස්තු ලබා දෙන ලෙස රේඛීය අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කර තිබුනද මෙතෙක් ලබා දී නොමැති බැවින් හා ඒ සඳහා කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය බැවින් එම මුදල එම වර්ෂයේ උපදේශන ගාස්තු ලෙස ගිණුම් ගත කර නොමැත. කෙසේ වෙතත්, මේ සම්බන්ධයෙන් අදාල කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව ගිණුම්ගත කිරීමට අදාල ක්‍රියාමාර්ග ගනු ලබන බව කාරුණිකව දන්වා සිටිමි. යාපනය නගර ශාලාව ඉදිකිරීමේ කාර්යයට උපදේශන සේවාවට ලැබිය යුතු උපදේශන ගාස්තුවෙන් 2019 වර්ෂයට අදාල රු. මිලියන 38 ක මුදලක් ලෙස දක්වා ඇති අතර අදාල උපදේශන ගාස්තු ගිණුම් ගත කිරීම සිදු කල යුතු වන්නේ අදාළ ව්‍යාපෘතියේ 2019/12/31 දිනට ප්‍රගතිය අනුව වේ. මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත්තේ 2019.10.10 දින වන බැවින් ඉහතින් දක්වා ඇති උපදේශන සේවා ගාස්තුවෙන් රු මිලියන 15.67 සමාලෝචිත වර්ෂයේ උපදේශන ගාස්තුව ලෙස ගිණුම් ගත කර ඉතිරි අගය වන රු මිලියන 23.28 ක මුදල 2020 වර්ෂයේ කළමනාකරණ ගාස්තු ලෙස ගිණුම් ගත කිරීම සඳහා ගනුදෙනුකරුවන්ගේ තැන්පතු ගිණුමේ දක්වා ඇත. එසේම අනෙකුත් ව්‍යාපෘති වෙනුවෙන් ලැබිය යුතුව පවතින ගිණුම්ගත නොවී පවතින ලැබිය යුතු කළමනාකරණ ගාස්තු ද 2020 වර්ෂයේ ගිණුම් වල ගැලපීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ.
අවලංගු වෙක්පත් පාලන ගිණුම	72,721	31,438,017	31,365,296	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ අවලංගු වෙක්පත් පාලන ගිණුම පහත පරිදි සැදුම්ලත් වී ඇත. **ගිණුම් අංක** — **2019/12/31 දිනට ශේෂය** **7671/6671** — **31,438,017** **7672/6672** — **6,270**

				<table><tr><td>7579/6579</td><td>(31,371,566)</td></tr><tr><td>ශුද්ධ අගය</td><td>72,721</td></tr></table> ඒ අනුව, අප රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කරන ලද ගිණුම් අංක **7672/6672** හා **7579/6579** හි උපලේඛනයන් හි පිළිවෙලින් අන්තර්ගත ශේෂයන් වන රු.**6,270** හා රු.**(31,371,566)** ක වටිනාකම් සැලකිල්ලට ලෙන නොමැති බව පෙනේ. ඒ අනුව, විමසුමේ සඳහන් පරිදි මෙම ගිණුමට අදාලව අවසන් ගිණුම් ශේෂ හා උපලේඛන ශේෂ අතර වෙනසක් නොමැති බව දන්වා සිටීමට කැමැත්තෙමු.
ලැබිය යුතු ණයවාරික (UDSP)	287,182,602	298,012,069	10,829,467	මෙම ගිණුම සම්බන්ධව සැසඳීම් කටයුතු සිදු කරමින් පවතින අතර අදාල ගැලපීම් **2020/2021** ගිණුම් වල සිදු කිරීමට කටයුතු කරනු ඇත.
සේවක අත්තිකාරම් 6708-6707	3,811,988	2,647,428	1,164,560	සමාලෝචිත වර්ෂය තුළ මූල්‍ය ප්‍රකාශන කට්ටලය තුළ අන්තර්ගත සේවක අත්තිකාරම් ගිණුම් ශේෂය සම්බන්ධයෙන් පහත උපලේඛන රජයේ විගණන අංශය වෙත ලබා දී ඇත. <table><tr><th>ගිණුම් අංක</th><th>විස්තරය</th><th>වටිනාකම (රු)</th></tr><tr><td>6706</td><td>වැටුප් අත්තිකාරම්</td><td>662,000</td></tr><tr><td>6707</td><td>ඉන්ධන අත්තිකාරම්</td><td>1,164,074</td></tr><tr><td>6705</td><td>ගමන් අත්තිකාරම්</td><td>482,069</td></tr><tr><td>6708</td><td>වෙනත් අත්තිකාරම්</td><td>1,483,754</td></tr><tr><td>එකතුව</td><td></td><td>3,791,897</td></tr></table> ඒ අනුව, **2019.12.31** දිනට සේවක අත්තිකාරම් ගිණුම සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන අතර වෙනස විමසුමේ සඳහන් පරිදි රු. **1,164,560** ක් නොවන අතර රු. **20,091/-** කි. මෙම වෙනසද ගිණුම් අංක **6705** (ගමන් අත්තිකාරම්) හි ආරම්භක ගිණුම් ශේෂ **(Opening Balance difference)** බව සඳහන් කිරීමට කැමැත්තෙමු. කෙසේ නමුත්, සේවක අත්තිකාරම් ගිණුමේ ශේෂය ගණනයේදී ගිණුම් අංක **6705** හා **6706**

				හි අන්තර්ගත ශේෂයන් සැලකිල්ලට ගෙන නොමැති බව නිරීක්ෂණය වේ.
ලැබිය යුතු ණයපොළිය (UDSP)	395,636,126	394,791,166	844,960	මෙම ගිණුම සම්බන්ධව සැසඳීම් කටයුතු සිදු කරමින් පවතින අතර අදාල ගැලපීම් **2020/2021** ගිණුම් වල සිදු කිරීමට කටයුතු කරනු ඇත
ගණුදෙනුකාර තැන්පතු	4,737,238,364	4,737,268,204	29,840	මෙම ගිණුම සම්බන්ධව සැසඳීම් කටයුතු සිදු කරමින් පවතින අතර අදාල ගැලපීම් **2020/2021** ගිණුම් වල සිදු කිරීමට කටයුතු කරනු ඇත
ගෙවිය යුතු රදවාගැනීමේ බදු	2,673,698	2,611,969	61,729	**2019/03/15** දින ජර්නල් අංක **j28471** මඟින් රු.**71,500** ක චෙක්පතක් අවලංගු කිරීම ගණුදෙනුකරු අංකයක් නොමැතිව ගෙවිය යුතු රදවාගැනීමේ බදු ගිණුමට බැර කර ඇත. කෙසේනමුත්, මෙම වටිනාකම සමාලෝචිත වර්ෂයේ ශේෂ පිරික්සුමේ අන්තර්ගත වුවද ගෙවිය යුතු රදවාගැනීමේ බදු උපලේඛනය සැකසීමේදී ගණුදෙනුකාර අංකයක් නොමැති බැවින් මෙම අගය සැලකිල්ලට නොගැනීම හේතුවෙන් මෙම වෙනස පැන නැගී ඇති බව දන්වා සිටීමට කැමැත්තෙමු.
ටෙන්ඩර් තැන්පතු	18,444,610	18,554,609	109,999	මෙම වෙනස **2017.01.01** දිනට මෙම ගිණුමේ ආරම්භක ශේෂයන්හි පැවති වෙනස වන අතර පද්ධති සැකසුම්කරුගේ සහාය ඇතිව මෙම ශේෂය ගණුදෙනුකරුවන්ගේ උපලේඛනය තුල නිවැරදි කිරීමට කටයුතු සිදු කරනු ඇත.
උපචිත බෝනස්, වෛද්යාධාර	122,867,017	78,341.177	44,525,840	මෙම ගිණුම් සම්බන්ධව පරිගණක පද්ධති උපලේඛන හා ශේෂ පිරික්සුම අතර කිසිදු වෙනසක් දක්නට නොමැත. කෙසේවෙතත්, වැටුප් උපලේඛනය රජයේ විගණන අංශය වෙත ලබා දීමේදී මුදල් අංශය සතුව පැවති සත්‍ය උපචිත වැටුප් සම්බන්ධ විස්තර පමණක් ඇතුලත් කර සකසන ලද උපලේඛනය ලබා දීමට කටයුතු සිදු කර ඇත. ඒ අනුව, වැඩිපුර ගිණුම්ගතව තිබූ උපචිත වැටුප් වියදම් ජර්නල් අංක **J30745** මඟින් **2020/12/31** දිනට ගිණුම් වලට ගැලපීමට කටයුතු සිදු කර ඇත.
විදුලිය සඳහා	111,146,864	107,251,574	3,895,290	ඉහත ගිණුමේ අවසාන ගිණුම් අනුව ශේෂය හා

කළ තැන්පතු				උපලේඛනය අනුව ශේෂය අතර, වෙනසක් පවතී. දැනට එම වෙනස්කම් හඳුනාගනිමින් පවතින අතර අවශ්‍ය නිවැරදි කිරීම් **2021.12.31** දිනට අවසාන ගිණුමෙහි සිදුකරනු ඇත.
ලැබිය යුතු මාසික කුළී ආදායම් හා ලැබිය යුතු බදු මුදල්	96,666,320	96,069,530	596,772	ලැබිය යුතු මාසික කුලී ආදායම් අවසාන ගිණුම් අනුව හා උපලේඛන අනුව ශේෂයන් **2020.12.31** දිනට නිවැරදි කිරීම් සිදුකර ඇති අතර, ලැබිය යුතු බදු මුදල් ශේෂය **2021.12.31** දින අවසාන ගිණුම්හි නිවැරදි කරනු ඇත.
මාසික කුළී හා භාවිත ගාස්තු මත මේ දක්වා නොලැබූ දඩ මුදල්	52,292,216	141,353,736	89,065,558	මාසික කුලී හා භාවිත ගාස්තු මත අය කරනු ලබන දඩ මුදල් ශේෂයන් අවසාන ගිණුම් හා උපලේඛන අනුව වෙනසක් පවතින අතර, එම වෙනස්කම් **2021.12.31** දිනට අවසාන ගිණුම්හි නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.

(ද) **<u>නිරීක්ෂණය</u>**

	ආයතනයේ නම	මුල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු / ගෙවිය යුතු ශේෂය		වෙනස රු.	නිරීක්ෂණ
		නාගරික සංවර්ධන අධිකාරියේ රු.	අදාල ආයතනයේ රු.		
01	ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවිය යුතු	**200,087,187**	නැත	**200,087,187**	**ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවිය යුතු ලෙස 2018.12.31 දිනට පැවති රු.200,087,187 ක මුදල පහත පරිදි සැකසී ඇත.** **ව්‍යාපෘති අංකය** / **ව්‍යාපෘති යේ නම** / **වටිනාකම (රු.)** **3240600** / New Township Development Project / 117,864,228.22 **5332000** / Peliyagoda Development Stage – I / 2,903,040.00 **6180200** / 216 Housing unit at Kollonnawa / 79,319,919.02 එකතුව / / 200,087,187.24 **ඒ අනුව, ඉහත සඳහන් ව්‍යාපෘති අංක**

					3240600 හා **6180200** ට අදාලව ගෙවිය යුතුය තිබූ මුදල් පිළිවෙලින් රු.117,864,228.22 හා රු.79,319,919.02 අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසානයේදී නිරවුල් කිරීමට කටයුතු කර ඇති අතර තවදුරටත් නිරවුල් කිරීමට පවතිනුයේ ව්‍යාපෘති අංක **5330200** යටතේ පවතින රු. 2,903,040.00 මුදල පමණි. ඒ අනුව ඔබගේ විමසුමේ දක්වා ඇති පරිදි **2019** ගිණුම් වර්ෂය අවසානයේ SLRDC ආයතනයට ගෙවිය යුතු මුදල රු. **200,087,187**ක් නොව රු.**2,903,040.00** ක් බව දන්වමි.
02	වෝටර්ස් ඒජ් සමාගමින් ලැබිය යුතු	**190,000,000**	නැත	**190,000,000**	මෙම වෙනස නිරවුල් කිරීමට කටයුතු සිදු කර ඇත.
03	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයට ගෙවිය යුතු	**84,615,679**	නැත	**84,615,679**	මෙම අගය පොත් වලින් ලියාහැරීම සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර 2020 මූල්‍ය ප්‍රකාශන වල අදාල ගැලපීම් සිදු කර ඇත.
04	රෙස්ට් හවුස් පෞද්ගලික සමාගමට ගෙවිය යුතු	**62,254,542**	**57,631,910**	**4,622,632**	පරිපාලක හා පරිපාලිත සමාගමේ ජංගම ගිණුම් අතර සැසඳීම් කටයුතු සිදු කරමින් සිටින අතර මෙම වෙනසට හේතු සොයා බලා අදාල ගැලපීම් 2020 මූල්‍ය ප්‍රකාශන වල සිදු කිරීමට කටයුතු සිදු කරනු ඇත.
05	ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	**39,838,029**	**47,600,285**	**7,762,256**	නාගරික සංවර්ධන අධිකාරිය හා ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ජංගම ගිණුම් සම්බන්ධ සැසඳීම් කටයුතු සිදු කරනු ලබන අතර අදාල ගැලපීම් 2020 මූල්‍ය ප්‍රකාශන වල සිදු කිරීමට කටයුතු සිදු කරනු ඇත.
06	රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවිය යුතු	**25,136,182**	**116,100,000**	**90,963,818**	රු.**25,136,182** අගය අයකරගත නොහැකි ශේෂයක් බැවින් පොත් වලින් ලියාහැරීම සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර 2020 මූල්‍ය ප්‍රකාශන වල අදාල ගැලපීම් සිදු කර ඇත.
07	නාගරික සංවර්ධන හා මහජන උපයෝගිතා අමාත්‍යාංශයට ගෙවිය යුතු	**25,007,130**	නැත	**25,007,130**	මෙම අගය අයකරගත නොහැකි ශේෂයක් බැවින් පොත් වලින් ලියාහැරීම සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර 2020 මූල්‍ය ප්‍රකාශන වල අදාල ගැලපීම් සිදු කර ඇත.

08	ඕෂන් විවි පෞද්ගලික සමාගමට ගෙවිය යුතු	**10,085,613**	**672,301**	**9,413,312**	නාගරික සංවර්ධන අධිකාරිය හා ඕෂන් විවි පෞද්ගලික සමාගමේ ජංගම ගිණුම් සම්බන්ධ සැසඳීම් කටයුතු සිදු කරනු ලබන අතර අදාල ගැලපීම් 2020 මූල්‍ය ප්‍රකාශන වල සිදු කිරීමට කටයුතු සිදු කරනු ඇත.
09	කොළඹ මහනගර සභාවට ගෙවිය යුතු	**4,447,302** ----------	නැත ----------	**4,447,302** ----------	මෙම අගය අයකරගත නොහැකි ශේෂයක් බැවින් පොත් වලින් ලියාහැරීම සඳහා කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබා ගෙන ඇති අතර 2020 මූල්‍ය ප්‍රකාශන වල අදාල ගැලපීම් සිදු කර ඇත.
		641,471,664 ==========	**222,004,496** ========	**616,919,316** ========	

(ධ) <u>නිරීක්ෂණය</u>

මෙම අගයෙන් නිරූපනය වන්නේ තානායම් ණයගැතියන් යටතේ අධිකාරියට ලැබිය යුතු මුදලෙහි එකතුව වේ. ඒ අනුව එහි අන්තර්ගත හර සටහන් මගින් නිරූපනය වන්නේ එම ණයගැතියන්ට අදාලව යොදනු ලබන ඉන්වොයිස් ගිණුම්ගත කිරීම හා වැරදි නිවැරදි කිරීම සඳහා යොදන ලද ගිණුම් සටහන් වේ.

එසේම බැර සටහන් මගින් නිරූපනය වන්නේ මුදල් ලැබීම් හා වැරදි නිවැරදි කිරීමට යොදනු ලබන සටහන් වේ. ඒ අනුව එම හර හා බැර ශේෂයන් තුලනය වීමෙන් ලැබී ඇති අගය නිවැරදිව ගිණුම් වල දක්වා ඇත.

කෙසේ වෙතත්, මෙම ගිණුම් වල ශේෂයන් සැසඳීම සඳහා මේ වනවිට කමිටුවක් පත්කර ඇති අතර ඔවුන්ගේ නිර්දේශ මත ඊට අදාල ගැලපීම් ඉදිරියේදී සිදුකිරීමට කටයුතු කරනු ලැබේ.

(න) <u>නිරීක්ෂණය</u>

ලැබිය යුතු කළමනාකරණ හා උපදේශන ගාස්තු තුළ හඳුනා නොගත් හා විවිධ ලෙස සඳහන් කර ඇති ලැබිය යුතු හා ඍණ ශේෂයන් තුළ වර්ෂ 1983 සහ 1984 කාල පරිච්ඡේද වල සිදු වූ වර්ෂ 35 කට වඩා පැරණි ගනුදෙනු ශේෂයන් බොහොමයක් ද අන්තර්ගත වේ. එම ශේෂයන්හි ගනුදෙනුකරු හා අදාල විස්තර පරීක්ෂා කර නිවැරදි කිරීම සඳහා මෙන්ම මූලාශ්‍ර ලේඛන සොයා ගත නොහැකි වී ඇත. කෙසේවෙතත්, මෙම ගිණුම්වල සඳහන් එම ශේෂයන් නිවැරදි කිරීම සඳහා මේ වන විට සැසඳීම් කටයුතු සිදු කරමින් පවතින අතර එම සැසඳීම් කටයුතු අවසානයේ ලියා හැරිය යුතු ශේෂයන් වෙතොත් එම ශේෂයන් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය අනුව ගිණුම් වලින් ලියා හැරීමටද 2022.06.30 දිනට පෙර ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(ඳ) <u>නිරීක්ෂණය</u>

මෙම වටිනාකම තුළ ඇතුලත්ව තිබූ රු. **96,706,779,657.05** ක වටිනාකමැති ආයෝජිත දේපල වලට අදාල උපලේඛනය විගණන අංශය වෙත **2021/06/30** දින ලබා දීමට කටයුතු සිදු කර ඇත. එසේම ඉහිරි ණයගැති ,ණයහිමි හා අන්තර් සමාගම් ජංගම ගිණුම් වල ශේෂයන්ට අදාල උප ලේඛන වරින් වර රජයේ විගණන අංශය වෙත ලබා දීමට කටයුතු සිදු කර ඇත.

(ප) <u>නිරීක්ෂණය</u>

2019 මූල්‍ය ප්‍රකාශනයේ ඇති රු. **96,706,779,657** ක වටිනාකමට අදාළ දේපල හා ඉඩම් සමඟ **2020** වර්ෂයට අදාළ නව තක්සේරු වාර්තාවේ සඳහන් දේපල හා ඉඩම් සමග හඳුනාගෙන සැසඳීම මේ වන විට සිදුකරගෙන යනු ලබයි.

2020 වර්ෂයට අදාළව පිළියෙල කළ නව තක්සේරු වාර්තාවෙහි සියලුම දිර්ඝකාලීන බදු හා මාසික, වාර්ෂික ලෙස කුලී පදනමට ලබාදී ඇති ඉඩම් හා දේපල වල බදු ගිවිසුම් අංකය, බදු ලබාදුන් කාලය, බදු ලබා දුන් දිනයන් ඉතිරි බදු කාලය, එම දේපල අත්කර ගැනීමේ විස්තරයන් හා එක් එක් ව්‍යාපෘතිය යටතේ **2020** දෙසැම්බර් **31** දිනට තක්සේරු වටිනාකම ඇතුලත් කෙරේ.

තවද මේ වන විට මෙම වත්කම් අදාළ උප ව්‍යාපෘති යටතේ ගිණුම්වල පෙන්වීම සඳහා ඉඩම් අංශය හා මුදල් අංශයෙහි නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් කටයුතු සිදුකරනු ලබන අතර එම ක්‍රියාවලියෙන් පසු මෙම රු. **96,706,779,657** ට අදාළ ඉඩම් හා දේපල වල නව තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට ගැලපීමත් ඒ සම්බන්ධ වාර්තාවන් විගණනයට ඉදිරිපත් කිරීමටත් කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි.

අධිකාරිය විසින් බදු ලබාදී ඇති වත්කම් නිවැරදි ලෙස ගිණුම් තැබීමට අවශ්‍ය බදු ලබාදී ඇති පදනම එනම් වර්ෂ **99, 50, 30** ලෙස දිගු කාලීනව හෝ මාසික, වාර්ෂික ආදී වශයෙන් වෙන්කර හඳුනා ගැනීමට සහ බදු කාලය අවසන් වීමට ඇති කාලය ආදී තොරතුරු සියල්ල **2020** නව තක්සේරු වාර්තාවේ ඇතුලත් වන බව කාරුණිකව දන්වමි.

(එ) <u>නිරීක්ෂණය</u>

නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ පරිපාලන කටයුතු පවත්වාගෙන යනු ලබන **6** සහ **7** වන මහල් වල ගොඩනැගිලි පිරිවැය වූ රු. **1,613,133,333** ක වටිනාකම **2012** වර්ෂයේදී J 22548 දරණ ජර්නල් අංකය මඟින් පාර්ලිමේන්තු සංකීර්ණ ව්‍යාපෘතියෙහි (P/C 9190100) දේපල පිරියත හා උපකරණ වලට අදාල ගිණුම් අංක **2118** යටතේ ගිණුම්ගත කර ඇත. කෙසේනමුත්, **2019** වර්ෂයේදී අධිකාරියේ උක්ත දේපල පිරියත හා උපකරණ වලට අදාල පිරිවැය වූ රු. **1, 613,133,333** ක වටිනාකම පාර්ලිමේන්තු ව්‍යාපෘති අංකය වන **1210400** හි දේපල පිරියත හා උපකරණ වලට අදාල ගිණුම් අංක **2118** යටතේ J 22548 දරණ ජර්නල් අංකය ගිණුම්ගත කිරීමට කටයුතු සිදු කර ඇත.

(ඛ) <u>නිරීක්ෂණය</u>

2019 මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 17.2.11 යටතේ ලැබිය යුතු උපදේශන සේවා හා කළමනාකරණ ගාස්තු වන රු. 10,634,268 සඳහා වන උපලේඛනය රජයේ විගණන අංශය වෙත 2022.05.02 දින ඉදිරිපත් කර ඇත. අදාළ උප ලේඛනය යාවත්කාලීන කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බැවින් එහිදී හඳුනාගනු ලබන ශේෂයන් ගිණුම් තුල නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඟ) <u>නිරීක්ෂණය</u>

මාසික කුලී මුදල් එකතු කිරීමේදී ඊට සමානුපාතිකව **20%** Fozen Arrears ද අයකර ගැනීමට කටයුතු කරන ලෙස අයකිරීමේ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇති අතර, ඒ අනුව දැනටමත් හිඟ හිටි ශේෂයන් කුලී මුදල් සමඟ අයකර ගැනීමට කටයුතු කරමින් පවතී.

තවද ක්‍රියාකාරී ගණුදෙනුකරුවන්ගේ ලැබිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු (NBT) වටිනාකම දැනට අයකර ගැනීමට කටයුතු කරන අතර, අක්‍රීය ගණුදෙනුකරුවන්ගෙන් ලැබිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු (NBT) වටිනාකමද නීතිමය කටයුතු මඟින් අයකර ගැනීමට බලාපොරොත්තු වේ.

හිඟ හිටි අක් මුදල් (Key Money) හා ඒ මත අයවිය යුතු වැට් (VAT) හා ජාතිය ගොඩනැගීමේ (NBT) බදු මුදල්ද ගෙවීමට කටයුතු කරන ලෙස දන්වා ගණුදෙනුකරුවන් වෙත දැනුවත් කිරීම් දිගින් දිගටම සිදුකරන අතර, ගෙවීම් සැලසුම් ලබාදීම මඟින් හිඟ හිටි ශේෂයක් අයකර ගැනීමටද වර්තමානයේ කටයුතු කරමිනු පවතී.

කෙසේ වෙතත් තවදුරටත් ගෙවීම් කිරීමට අපොහොසත් ගණුදෙනුකරුවන් වෙනුවෙන් නීතිමය කටයුතු මඟින් හිඟ ශේෂයන් අයකර ගැනීමට බලාපොරොත්තු වේ.

තවද හිඟ හිටි ශේෂයන් අයකර ගැනීමට වර්තමානයේද කටයුතු කරන අතර, එම කටයුතු පහත පරිදි දැක්විය හැක.

1. නිරන්තර ලිපි මඟින් කෙරෙන දැනුවත් කිරීම්.
2. ගණුදෙනුකරුවන්ගේ හිඟ ශේෂයන් සඳහා ගෙවීම සැලසුම් ඉදිරිපත් කිරීම.
3. දේපල මුද්‍රා තැබීම මඟින් හිඟ හිටි ශේෂයන් අයකර ගැනීම.
4. එන්තරවාසි යොමුකිරීම ඇතුළු නීති කටයුතු මඟින් අයකර ගැනීම් සිදුකිරීම.
5. කිසිදු ආකාරයකට අයකර ගත නොහැකි හිඟ හිටි ශේෂයක් අදාල අනුමැතින් මත පොත් වලින් ඉවත් කිරීම.

1.2.3 .

(අ) ලංකා රෙස්ට් හවුසස් සමාගම

---

i <u>නිරීක්ෂණය</u>

මේ සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් සිදුකර ගිණුම් ඉදිරිපත් කරන ලෙසට ලංකා රෙස්ට් හවුස් සමාගම වෙත දැන්වීමටත්, ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරියේ සමුහයේ ගිණුම් යටතේ මෙය නිවැරදිව පෙන්නුම් කිරීමට කටයුතු සිදු කරනු ලැබේ.

ii. <u>නිරීක්ෂණය</u>

මේ සම්බන්ධයෙන් අවශ්‍ය ගැලපීම් සිදුකර ගිණුම් ඉදිරිපත් කරන ලෙසට ලංකා රෙස්ට් හවුස් සමාගම වෙත දැන්වීමටත් කටයුතු කර ඇත.

iii. .<u>නිරීක්ෂණය</u>

පරිපාලක හා පරිපාලිත සමාගමේ ජංගම ගිණුම් අතර සැසඳීම් කටයුතු සිදු කරමින් සිටින අතර මෙම වෙනසට හේතු සොයා බලා අදාල ගැලපීම් 2020 මුල්‍ය ප්‍රකාශන වල සිදු කිරීමට කටයුතු සිදු කරනු ඇත.

iv. <u>නිරීක්ෂණය</u>

අදාල නිවැරදි කිරීම් සිදු කිරීමට ලංකා රෙස්ට් හවුසස් ආයතනය දැනුවත් කිරීමට කටයුතු කර ඇත.

v. <u>නිරීක්ෂණය</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම්කරණ ගැලපීම් හා අනාවරණය කිරීම් නියමිත පරිදි සිදු කරන ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබාදී ඇත.

vi. <u>නිරීක්ෂණය</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම්කරණ ගැලපීම් හා අනාවරණය කිරීම් නියමිත පරිදි සිදු කරන ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබාදී ඇත.

vii. <u>නිරීක්ෂණය</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම්කරණ ගැලපීම් හා අනාවරණය කිරීම් නියමිත පරිදි සිදු කරන ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබාදී ඇත.

viii. <u>නිරීක්ෂණය</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම්කරණ ගැලපීම් හා අනාවරණය කිරීම් නියමිත පරිදි සිදු කරන ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබාදී ඇත.

ix. <u>නිරීක්ෂණය</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම්කරණ ගැලපීම් හා අනාවරණය කිරීම් නියමිත පරිදි සිදු කරන ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබාදී ඇත.

x. <u>නිරීක්ෂණය</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම්කරණ ගැලපීම් හා අනාවරණය කිරීම් නියමිත පරිදි සිදු කරන ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබාදී ඇත.

xi. <u>නිරීක්ෂණය</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම්කරණ ගැලපීම් හා අනාවරණය කිරීම් නියමිත පරිදි සිදු කරන ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබාදී ඇත.

xii. <u>නිරීක්ෂණය</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම්කරණ ගැලපීම් හා අනාවරණය කිරීම් නියමිත පරිදි සිදු කරන ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබාදී ඇත.

(ආ) වෝටර්ස් එජ් සමාගම

i. <u>නිරීක්ෂණය</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම්කරණ ගැලපීම් හා අනාවරණය කිරීම් නියමිත පරිදි සිදු කරන ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබාදී ඇත.

ii. <u>නිරීක්ෂණය</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම්කරණ ගැලපීම් හා අනාවරණය කිරීම් නියමිත පරිදි සිදු කරන ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබාදී ඇත.

iii. <u>නිරීක්ෂණය</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම්කරණ ගැලපීම් හා අනාවරණය කිරීම් නියමිත පරිදි සිදු කරන ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබාදී ඇත.

iv. <u>නිරීක්ෂණය</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම්කරණ ගැලපීම් හා අනාවරණය කිරීම් නියමිත පරිදි සිදු කරන ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබාදී ඇත.

v. <u>නිරීක්ෂණය</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම්කරණ ගැලපීම් හා අනාවරණය කිරීම් නියමිත පරිදි සිදු කරන ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබාදී ඇත.

vi. <u>නිරීක්ෂණය</u>

වෝටර්ස් එජ් සමාගම විසින්, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව විසින් රු.125,442,300 ක් වැය කර ඉදිකර තිබූ දුම්රිය ආපන ශාලාවේ මෙහෙයුම් කටයුතු 2018 පෙබරවාරි 28 දින වෝටර්ස් එජ් සමාගම වෙත පවරාගැනීම හේතුවෙන් SLRDCC සමාගම වෙත ගෙවිය යුතු ප්‍රමාද වීමේ පොලියද සමග රු 130,881,116 ක වටිනාකම සඳහා මූල්‍ය ප්‍රකාශන වල වෙන් කිරීමක් සිදු නොකර තිබූ අතර, එම විගණිත මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත ශේෂයන් ඒකාබද්ධ ගිණුම් සැකසීමේදී භාවිත කරන ලදී.

කෙසේනමුත්, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මෙම ගනුදෙනුව හා සම්බන්ධ ගිණුම්කරණ ගැලපීම් හා අනාවරණය කිරීම් නියමිත පරිදි සිදු කරන ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබාදී ඇති අතර පරිපාලිත සමාගමේ ගිණුම් වල අදාල නිවැරදි කිරීම් සිදුකළ පසු 2020 වර්ෂයේ ඒකාබද්ධ ගිණුම් පිළියෙළ කිරීමේදී මේ සම්බන්ධව අදාල අනාවරණය කිරීම් ඒකාබද්ධ ගිණුම් තුල සිදු කරනු ලබන බව දන්වා සිටිමි.

vii. <u>නිරීක්ෂණය</u>

වෝටර්ස් එජ් ආයතනය මෙම අධිකාරියට පවරා දීමේදී ගණනය කර තිබූ සම්පූර්ණ වටිනාකම (ඉදිකිරීම්ද ඇතුලත්ව) ලෙස අධිකරණය විසින් නියෝග කරන ලද ගෙවිය යුතු වූ වන්දි මුදල රු.මි. **406** ක් වූ අතර එම වටිනාකම ආයෝජන වත්කමක් ලෙස ගිණුම්ගත වී ඇත.

මේ සම්බන්ධව වෝටර්ස් එජ් සමාගම දැනුවත් කර පවරා ගත් ඉහත උපකරණ හා අනෙකුත් වත්කම් ඉන්වෙන්ට්‍රිගත කිරීමට හා තක්සේරු කර ගිණුම්ගත කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබා දී අපගේ උපදෙස් මත මෙකී ක්‍රියාවලිය වෝටර්ස් එජ් සමාගම විසින් 2018 වර්ෂයේදී ආරම්භ කර 2021 වන විට දී අවසන් කර ඇත. ඒ අනුව අදාළ ගැලපිලි 2021 මූල්‍ය ප්‍රකාශන වල සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

viii. <u>නිරීක්ෂණය</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම්කරණ ගැලපීම් හා අනාවරණය කිරීම් නියමිත පරිදි සිදු කරන ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබාදී ඇත.

ix. <u>නිරීක්ෂණය</u>

මේ සම්බන්ධව සන්කෙන් කන්ස්ට්‍රක්ෂන් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය විසින් නාගරික සංවර්ධන අධිකාරියට එරෙහිව රු. **180,600,000/-** ක මුදලක් අය කරවා ගැනීම සඳහා **CHC/CIVIL/MR/565/17** දරණ නඩුව පවරා ඇත.

මෙහිදී නා.ස. අ විසින් වෝටර්ස් එජ් හොටෙල් සමාගම සැලසුම් කර ඉදි කිරීම පැමිණිලිකරු වෙත භාර දුන් අතර පසුව එයට අමතරව පර්යේෂණ බද්ධ ආකෘති නිවාසයක්, හෝටල් කාමරයක් සහ විකුණුම් කාර්යාලයක් ඉදි කිරීම සඳහාද කොන්ත්‍රාත් ලබා දෙන ලදී.

වර්ෂ **2015** දී රජයේ වෙනස්වීමත් සමග මෙකී ව්‍යාපෘතීන්හි නව විශ්ලේෂණයන් සිදු කරන තුරු තාවකාලිකව ව්‍යාපෘතීන්හි කටයුතු නවතා ඇති අතර ඉන් පසුව නැවත ආරම්භ කිරීමක් සිදු නොවුණු හෙයින් පැමිණිලිකරු එය වෙත සිදු කළ ඉදිකිරීම් සඳහා ගෙවිය යුතු වූ රු.**179,937,010.92** ක මුදල නා.ස.අ වෙතින් ඉල්ලා සිටියද ගෙවීම් සිදු කර නොමැති බැවින් මෙම නඩුව පවරා ඇත.

එහිදී ගරු අධිකරණය විසින් වෝටර්ස් එජ් සමාගමද මෙම නඩුවේ පාර්ශ්වයක් කරන ලෙසට පැමිණිලිකරුට **2020.05.20** වන දින දන්වා ඇති අතර පැමිණිලිකරු විසින් මේ වන තෙක් අදාල පියවර ගෙන නොමැති බැවින් නඩුව බහා තබා ඇති අතර විභාග නොවේ.

x. <u>නිරීක්ෂණය</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ගිණුම්කරණ ගැලපීම් හා අනාවරණය කිරීම් නියමිත පරිදි සිදු කරන ලෙසට පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබාදී ඇත.

(ඇ) නාගරික ආයෝජන හා සංවර්ධන සමාගම

---

i. <u>නිරීක්ෂණය</u>

අදාල නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබා දී ඇත.

ii. <u>නිරීක්ෂණය</u>

අදාල නිවැරදි කිරීම් සිදු කිරීම සඳහා පරිපාලිත සමාගම වෙත උපදෙස් ලබා දී ඇත.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.2.2

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ ----------

(අ)	**1978** අංක **41** දරන නාගරික සංවර්ධන අධිකාරි පනත **II** වන කොටසේ **8** ඡේදයේ (එ) වගන්තිය	<u>නිරීක්ෂණය</u> **1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතට අනුකූලව ප්‍රකාශයට පත් කරන ලද නාගරික ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් පිළියෙල කිරීම සහ ආණ්ඩුවේ අනුමැතිය සඳහා අමාත්‍යවරයා වෙත ඒවා ඉදිරිපත් කිරීම ප්‍රධාන කර්තව්‍යයක් වන අතර ඉහත කී සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී අදාල පළාත් පාලන ආයතන තුල ඉඩම් පරිහරණ රටාව කෙසේ විය යුතුද යන්න ඇතුලත් වන අතර එය ගැසට් පත්‍රයක් මඟින්ද ප්‍රකාශයට පත් කරනු ලැබේ. ඒ අනුව නාගරික සංවර්ධන අධිකාරිය විසින් මහ නගර සභා 24 ක්, නගර සභා 41 ක් සහ ප්‍රාදේශීය සභා 207 ක් ඇතුළුව සමස්ථ නාගරික සංවර්ධන ප්‍රදේශ ගණන 272 ක් නාගරික ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත්කොට ඇත. එහිදි වර්ෂ 1978 සිට 2017 දක්වා සංවර්ධන සැලසුම් 40 ක් සකස් කොට ඇති අතර, එමඟින් ප්‍රකාශිත පළාත් පාලන ආයතන 56 ක් ආවරණය වේ.** වර්ෂ **2017** සිට **2022**.05.04 දක්වා සංවර්ධන සැලසුම් 26 ක් පළාත් පාලන ආයතන 38 ක් (මහනගර සභා 12, නගර සභා **4** සහ ප්‍රාදේශීය සභා 22) ආවරණය කර මේ වන විටත් සකස් කොට ඇත. තවදුරටත් **2022** දී, මහ නගර සභා 08 ක්, නගර සභා **24** ක් සහ ප්‍රාදේශීය සභා 63 ක් ඇතුළත් පළාත් පාලන ආයතන 95 ක් ආවරණය කරමින් සංවර්ධන සැලසුම් 57 ක් මේ මොහොත වන විටද සකස් කෙරෙමින් පවතින අතර, එය **2022.12.31** දිනට පෙර නිම කිරීමට හා ගැසට් මඟින් ප්‍රකාශයට පත් කිරීමට ඉලක්ක ගත කොට ඇත. තවද, **2021.07.08** දින අංක **2235/54** දරණ ඇති විශේෂ ගැසට් පත්‍රය මඟින් නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සැලසුම් හා සංවර්ධන රෙගුලාසි ප්‍රකාශය පත් කර ඇති අතර මෙම රෙගුලාසි සෑම නාගරික සංවර්ධන ප්‍රදේශයක් සඳහාම අදාළ වේ. මෙම නියෝග, **1986.03.10** දිනැති අංක **392/9**, **1994.06.01** දිනැති අංක **821/19**, **1996.08.06** දිනැති අංක **935/6**, **1999.02.24** දිනැති අංක **1068/13**, **2006.08.23** දිනැති අංක **1459/20**, **2008.02.27** දිනැති අංක **1538/24**, **2008.06.27** දිනැති අංක **1555/32**, **2009.04.17** දිනැති අංක **1597/8**, **2009.05.30** දිනැති අංක **1603/53**, **2011.04.12** දිනැති අංක **1701/13** යන අතිවිශේෂ ගැසට් නිවේදන අවලංගු කර ප්‍රතිස්ථාපනය කර ඇත.
(ආ)	**භාණ්ඩාගාර චක්‍රලේඛ**	
(i)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	<u>නිරීක්ෂණය</u> **අධිකාරිය සතු ඉඩම් හා ගොඩනැගිලි හැර අනෙකුත් ස්ථාවර වත්කම් සඳහා වත්කම් ලේඛණයක් පවත්වාගෙන යයි.** තවද පරිගණක පද්ධතියේ ස්ථාවර වත්කම් මෘදුකාංගය **1978** දෙසැම්බර් **19** දිනැති අංක **842** දරණ භාණ්ඩාගාර චක්‍රලේඛයේ පොදු **287** ආකෘතිය ප්‍රකාරව හැකි ඉක්මනින් යාවත්කාලීන කිරීමට හා මුදල් රෙගුලාසි **454** හි පොදු **44** ආකෘති පත්‍රයට අදාළව ස්ථාවර වත්කම් මෘදුකාංගයට පහසුකම් අන්තර්ගත කිරීමටද, මෘදුකාංග නිර්මාණය කළ සමාගමට දන්වා ඇත.

		ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් වත්කම් ලේඛනය මගින් ඉදිරිපත් කලයුතු නමුත් ඉදිරිපත් නොකල තොරතුරු යටතේ පෙන්වා ඇති බොහොමයක් තොරතුරු නව ඉඩම් තක්සේරු වාර්තාවෙහි ඇතුලත් වේ. එම වාර්තාවේ සඳහන් දේපල හා ඉඩම් එක් එක් උප ව්‍යාපෘති කාණ්ඩ යටතේ හඳුනාගෙන, **2022** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට මෙම ප්‍රත්‍යාගණන අගයන් ගැලපීම ඉඩම් සංවර්ධන හා කළමනාකරණ අංශයේ හා මුදල් අංශයේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් මේ දින වල සිදුකර ගෙන යනු ලබන අතර එම නව ඉඩම් තක්සේරු වාර්තාවෙන් ඉදිරිපත් නොවන තොරතුරු, එනම් ගොඩනැගිලි වලට අදාල ග්‍රාම නිලධාරී කොට්ඨාශය, ඉදිකල වසර, භාවිතයට ගෙන ඇති හා නොමැති මහල් සංඛ්‍යාව හා කුලී පදනම මත ලබාදී ඇති ගොඩනැගිලි වලට අදාල තොරතුරු අධිකාරියේ දේපල සංවර්ධන අංශය මගින් පරිගණක ගත කරමින් පවතින නාගරික සංවර්ධන අධිකාරියේ ඉඩම් පරිගණක පද්ධතිය මගින් ලබාදිය හැක. මෙම ඉඩම් පරිගණක පද්ධතියේ අධිකාරිය සතු සියළුම ඉඩම් ලිපි ගොනු පරිගණක ගත කිරීම සිදු කරනු ලබන අතර, එම ඉඩම් වලට උප ව්‍යාපෘති අංක යටතේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අගයන් ගැලපීම තුලින් ස්ථාවර වත්කම් යටතේ ඉඩම් හා ගොඩනැගිලි වලට අදාල සියළුම තොරතුරු හෙලිදරව් කිරීමක් සිදුවේ.
(ii)	2011 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය	<u>නිරීක්ෂණය</u> නාගරික සංවර්ධන අධිකාරිය සතු පරිගණක යන්ත්‍ර හා පරිගණක මෘදුකාංග පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් මූල්‍ය කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි **(FMIS)** හරහා පවත්වාගෙන යනු ලබයි. ඉදිරියේදී **2011** නොවැම්බර් **28** දිනැති අංක **IAI/2002/02** දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව පද්ධතිය සංවර්ධනය කිරීම අදාළ මෘදුකාංගය නිම වූ සමාගම හරහා සිදු කරනු ලැබේ.
(ඇ)	2014 පෙබරවාරි 11 දිනැති අංක 01/2014 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5(2) ඡේදය	<u>නිරීක්ෂණය</u> **(2022-2025)** සංයුක්ත සැලැස්මට අදාලව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත.
(ඇ)	2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ	
(I)	**8.2.3** වගන්තිය	<u>නිරීක්ෂණය</u> නාගරික සංවර්ධන අධිකාරියේ සංවර්ධන අරමුණු වලට අනුකූලව හා එවකට පැවති සංවර්ධන නිර්නායකයන් අනුව පරිපාලිත සමාගම් කළමණාකරණ මණ්ඩල තීරණයන්ට අනුකූලව පිහිටුවන ලදී. පසුව දේශපාලන අධිකාරියේ සිදුවූ වෙනස් වීම හේතුවෙන් අදාළ අමාත්‍ය මණ්ඩල අනුමැතීන් ලබාගැනීම තාවකාලිකව නැවතී තිබුණි. කෙසේ වෙතත් ඉහතින් සඳහන් කල පරිපාලිත සමාගම් වල ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් නව කළමණාකරණ මණ්ඩලය සමග සාකච්ඡා කර ඒ පිළිබඳ අවසන් තීරණයක් ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ.
(II)	**8.3.9** වගන්තිය	<u>නිරීක්ෂණය</u> අධිකාරිය සතු රු. 2,313,550.00 ක් වටිනා ඉහත කැමරා උපකරණ අධිකාරියේ ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයෙහි සේවය කරනු ලබන සේවක මහතෙකු නමින් මාධ්‍ය ඒකකයේ භාවිතය සඳහා නිකුත් කර ඇති අතර එම සේවක මහතා තාවකාලික පදනම මත අග්‍රාමාත්‍ය

		කාර්යාලය වෙත අනුයුක්ත කර තිබූ නමුත් 2022.05.17 වන දින සිට නැවත මෙම අධිකාරිය වෙත වාර්තා කිරීම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ තාවකාලික සේවයෙන් නිදහස් කර ඇත.
(III)**ii)**	9.4 වගන්තිය	<u>නිරීක්ෂණය</u> අධිකාරියේ **2017.02.28** දින කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත **(කළමනාකරණ මණ්ඩල පත්‍රිකා අංක 72/2017)** අධිකාරියේ පරිපාලිත සමාගමක් වන නාගරික ආයෝජන හා සංවර්ධන සමාගමේ හා අධිකාරිය සමඟ එළැඹී සේවා ගිවිසුම ප්‍රකාරව අධිකාරියේ ප්‍රකාශිත ප්‍රදේශ **44** ක සංවර්ධන සැලසුම් සකස් කිරීමේ කාර්ය ඉටුකර ගැනීම සඳහා මෙම නිලධාරීන් බඳවාගෙන අධිකාරියේ සේවය සඳහා යොමු කර ඇත.
(ඇ)	2009 අප්‍රේල් 17 දිනැති අංක 597/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රය උපලේඛනයේ 7 ඡේදය	<u>නිරීක්ෂණය</u> නාගරික සංවර්ධන අධිකාරිය විසින් කොළඹ මහා නගර සභා බල ප්‍රදේශ බල සීමාව තුල සිදු කරන ලද සමීක්ෂණ වලට අනුව, ඇළ මාර්ග රක්ෂිත, මාර්ග රක්ෂිත, දුම්රිය මාර්ග රක්ෂිත, තෙල් නළ පද්ධති රක්ෂිත හා රජයේ ඉඩම් තුල සිටින අනවසර පදිංචි නිවාස ඒකක (මුඩුක්කු හා පැල්පත් වාසින්) **68,000** ක් පමණ හඳුනාගෙන තිබේ. ඔවුන්ගේ ජීවන තත්ත්වය පහත් මට්ටමක පවතින අතර මූලික අවශ්‍යතාවයක් වන නිවසක් නොමැතිව අනවසරව පදිංචිව සිටියත් නීත්‍යානුකූල පියවර ගෙන ඉවත් කිරීමට නොහැකි තත්ත්වයක පවතින්නේ ඔවුනට නිවසක් සාදා ගැනීමට ඉඩමක් හා ආදායමක් නොමැති බැවිනි. එම නිසා මෙම රක්ෂිත තුළ පදිංචි ඉහත පවුල් ඒකක ඉන් ඉවත් කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ආරම්භ කර ඇත. ඒ අනුව **2021.12.31** වන විට පවුල් ඒකක **9958** ක් රජයේ මැදිහත්වීම මත ඉදිකරන ලද මහල් නිවාසවල පදිංචිකර ඉහත රක්ෂිතයන් තුළ පැවති අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට පියවර ගෙන ඇත. ප්‍රමුඛතා පදනම මත ඉතිරි අනවසර පදිංචිකරුවන් (අඩු ආදායම්ලාභී) නව නිවාසවල පදිංචි කරවීමට හා ඒ අනුව අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට සැලසුම් කර ඇත. අනවසර ඉදිකිරීම් හා අනවසර වෙනස් කිරීම් සම්බන්ධයෙන් විෂය භාර අමාත්‍යවරයාට ලබාදී ඇති බලතල අනුව කටයුතු කිරීම සඳහා උපදේශක කමිටුවක් **2019** වර්ෂයේ අංක **2105/19** දරණ **2019.01.09** දිනැති ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇත. එම උපදේශක කමිටුව මඟින් **2019** වර්ෂයේදී ඉදිකිරීම් **35** ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත. **2020** හා **2021** යන වර්ෂවල එම කමිටුව ක්‍රියාත්මක වී නොමැති අතර, **2022** වර්ෂයේදී නැවත සංශෝධිත උපදේශක කමිටුවක් පිහිටුවීමට කටයුතු කරමින් පවතී.
(ඊ)	2010 පෙබරවාරි 03 දිනැති අංක SP/RD/02/10 දරන ජනාධිපති කාර්යාල චක්‍රලේඛය 3.4 ඡේදය	<u>නිරීක්ෂණය</u> නාගරික සංවර්ධන බල ප්‍රදේශයන්හි ආර්ථික, සාමාජීය හා භෞතික වශයෙන් සංවර්ධනය සඳහා වූ ඒකාබද්ධ සැලසුම් සකස් කිරීම නාගරික සංවර්ධන අධිකාරිය පිහිටු වීමේ මූලික අරමුණ වන අතර නේවාසික, වාණිජ, කර්මාන්ත, විවේක හා විනෝද කටයුතු හා ඒකාබද්ධ වූ සංවර්ධනයක් ලඟා කර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ බලතල අනුව රජයේ ඉඩම් පවරා ගැනීම හා පෞද්ගලික ඉඩම් අත්කර ගැනීමේ කටයුතු කරනු ලැබේ.

		එසේ අත්කර ගනු ලබන ඉඩම්, අධිකාරිය විසින් අනුගමනය කරනු ලබන ඉඩම් බැහැර කිරීමේ ප්‍රතිපත්තියට අනුකූලව ටෙන්ඩර් මඟින් රජයේ හෝ පුද්ගලික ආයතන වෙත ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරු වටිනාකම ලබා ගැනීමෙන් පසු දීර්ඝකාලීන බදු පදනම මත බැහැර කිරීම සිදු කරනු ලබන අතර ඒ සඳහා අදාළ සියළු අනුමැතීන් (කළමනාකරණ මණ්ඩල අනුමැතිය, අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා අදාළ අනෙකුත් අනුමැතීන්) ලබා ගනු ලැබේ. එසේම අත්කර ගනු ලබන ඉඩම්, එකී සංවර්ධන කාර්යය සඳහාම යොදවනු ලබන අතර එසේ නොවන අවස්ථාවල දී අවස්ථානුකූලව අදාළ අනුමැතීන්ට යටත්ව ඉඩම් අත්කර ගැනීමේ අරමුණ සංශෝධනය කර සංවර්ධන කාර්යයන් සඳහා ඉඩම් බැහැර කරනු ලැබේ.
(එ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 113(3)	<u>නිරීක්ෂණය</u> විගණන විමසුමේ සඳහන් මුදල් රෙගුලාසිවලට පටහැනිව මුදල් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව හා අවම වශයෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව සිදුකර ඇති ලියාහැරීම් නැවත ගිණුම්හි ඇතුලත් කිරීමට දැනටමත් පියවර ගෙන ඇති අතර, මෙවැනි අඩුපාඩු ඉදිරියේදී ඇති නොවීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමවේද ශක්තිමත් කර ඇත.

(අ) <u>නිරීක්ෂණය</u>

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව **2019** වර්ෂය සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කල අතර ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයේ අනුමැතියද ලැබී තිබිණි.

(ආ)

- <u>නිරීක්ෂණය</u>
  ප්‍රසම්පාදන ඒකකය වෙත ප්‍රසම්පාදන කටයුතු සඳහා ලැබෙන ඉල්ලීම් සඳහා මූලික වශයෙන්ම සිදු කරනු ලබන්නේ තාක්ෂණික ඇගයුම් කමිටුව හා මිල ගණන් විවෘත කිරීමේ කමිටුව පත්කර අධ්‍යක්ෂ ජනරාල් අනුමැතිය ලබා ගැනීමයි. එම ලිපි අදාළ ලිපි ගොනුවල ඇතුලත් කරන අතර එසේ අදාල ලිපිගොනු වලට ඇතුලත් වීමේ අඩුපාඩු ඇති නොවීමට තවදුරටත් කටයුතු කරන බව කාරුණිකව දන්වමි.
- <u>නිරීක්ෂණය</u>
  මෙම අඩුපාඩු නිවැරදි කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇති බව කාරුණිකව දන්වමි.
- <u>නිරීක්ෂණය</u>
  කාර්ය සාධන බැඳුම්කර ලබා ගැනීමේදී සිදු වී ඇති අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කර ඇත.
- <u>නිරීක්ෂණය</u>

  ඉදිරියේදී එම කාර්යයන් නියමිත වේලාවට සිදු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වමි.
- <u>නිරීක්ෂණය</u>

  ඉදිරියේදී තාක්ෂණික ඇගයීම් කමිටු දැනුවත් කර මිල ගැලපුම් පිළිබඳ සවිස්තරාත්මක ලේඛන තාක්ෂණික ඇගයීම් වාර්තාවල ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වමි.
- <u>නිරීක්ෂණය</u>
  ඇගයුම් ක්‍රියාවලිය සිදුකරනු ලබන්නේ තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් වන අතර අදාල තාක්ෂණික ඇගයීම් වාර්තා ටෙන්ඩර් මණ්ඩලය මගින් අනුමත කරනු ලබයි. ඒ අනුව ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සැලකිය යුතු ප්‍රතිශතයකින් යුතු මිල ලංසු ප්‍රතික්ෂේප කිරීම පිළිබඳ තීරණය ටෙන්ඩර් මණ්ඩලය විසින් ගනු ලබයි.

- <u>නිරීක්ෂණය</u>
  තාක්ෂණික ඇගයුම් වාර්තාවෙහි ඇගයුම් ක්‍රමවේද සහ තීරණ පිළිබඳ සටහන් ඇතුලත් කරන ලෙස ඉදිරියේදී අදාල තාක්ෂණික ඇගයීම් කමිටු දැනුවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

- <u>නිරීක්ෂණය</u>
  ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා **10%** ක ප්‍රතිශත ප්‍රමාණයකට කොන්ත්‍රාත් ප්‍රදානය කලහැකි වන අතර අදාල කොන්ත්‍රාත් ප්‍රධානය කරනු ලබන්නේ ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ඇතිව වේ.

- <u>නිරීක්ෂණය</u>
  වර්තමානයේදී ප්‍රසිද්ධ මිල කැඳවීම් තුලින් ඉඩම් දීර්ඝකාලීනව බැහැර කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) <u>නිරීක්ෂණය</u>

2015 දී දේශපාලන පරිසරයෙහි සිදු වූ වෙනස්වීම් මත, **ERP** පද්ධතිය අත්හිටුවීමට එහි තාක්ෂණික ඇගයීම් කමිටුව නාගරික සංවර්ධන අධිකාරියට නිර්දේශ කෙරුණු අතර, අධිකාරියේ ගිණුම් කටයුතු පවත්වාගෙන යාමට පරිගණක පද්ධතියක අවශ්‍යතාවය බරපතලව දැනුන හෙයින් නව ගිණුම්කරණ පද්ධතියක් මිලදී ගැනීමට කටයුතු කරන ලදී. මේ හෙයින් **ERP** පද්ධතිය ස්ථාපිත නොකෙරුණි.

(ඈ) <u>නිරීක්ෂණය</u>

කාර්යයන්	වාර්තා ලබා ගැනීම
2019.12.31 දිනට වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය හා මූල්‍ය තත්ව ප්‍රකාශය	විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සැකසීමේ කාර්යයේ 95% ක පමණ වැඩ නිමකර ඇති අතර ඉතිරි 5%ක ප්‍රමාණය කඩිනමින් ඉටුකරවා ගැනීමට කටයුතු සිදුකරනු ලැබේ. මූල්‍ය තත්ව ප්‍රකාශනයේ 85%ක පමණ වැඩ නිමකර ඇති අතර පැවති කොවිඩ් වසංගත තත්වය හමුවේ ඉතිරි ප්‍රමාණය නිමකර ගැනීමේ කාර්යය දීර්ඝ වූ අතර ඉතා කඩිනමින් එයද නිමකර ගැනීමට අවශ්‍ය පියවර ගනු ලබන බව දැන්වීමට කැමැත්තෙමු.
ණයගැති/ණයහිමි කාල විශ්ලේෂණය ණයගැති/ණයහිමි සැසඳුම	දැනට කුලී ණයගැතියන්ට අදාල කාල විශ්ලේෂණ ලබා ගැනීමේ හැකියාව ඇති අතර 2022 වර්ෂයේ සිට අනෙකුත් ණයගැති හා ණයහිමි කාල විශ්ලේෂණ වාර්තා සහ ණයගැති හා ණයහිමි සැසඳුම් වාර්තා ලබා ගැනීමේ පහසුකම් පද්ධති සැකසුම්කරු ලවා සිදු කරලීමට අවශ්ය කටයුතු සිදු කරනු ලබන බව දන්වා සිටිමි.
වාර්ෂික ක්ෂය ගණනය කිරීම	2020 වර්ෂයේ සිට දේපල පිරියත හා උපකරණ වල අඩංගු එකිනෙක වත්කම් සඳහා ක්ෂය වෙන් කිරීම් ගිණුම් අංක ලබා දී ඇති අතර පද්ධති සැකසුම්කරුවන් සමඟ සාකච්ඡා කර මේ සම්බන්ධයෙන් අදාල ගණනය කිරීම් ලේඛනය සකසා ගැනීමට කටයුතු සිදු කරනු ඇත.
ආයෝජිත දේපල ලේඛනය	පද්ධතිය ආරම්භයේදී අධිකාරිය විසින් ලබාදුන් තොරතුරු මත පදනම්ව පද්ධතිය තුළින් ආයෝජිත දේපල පිළිබඳ ලේඛනයක් ලබා ගැනීමේ හැකියාව ඇත. එහෙත් ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි එම ලේඛනයේ පැවති තොරතුරු වල සීමිතභාවය හේතුවෙන් මේ වන විට ඔබ වෙත දැනටමත් දන්වා ඇති පරිදි අධිකාරියේ 2019 වර්ෂයට අදාල ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු වාර්තාව පදනම් කරගෙන අධිකාරියේ ඉඩම් අංශය විසින් ඉඩම් හා ගොඩනැගිලි ලේඛනය (Land Register) යාවත්කාලීන කිරීමේ කටයුතු සිදුකරමින් පවති. ඒ අනුව එම කාර්යය අවසන් වීමෙන් පසු එම දත්තද උපයෝගී කරගනිමින් පද්ධති සැකසුම්කරු සමඟ ආයෝජිත දේපල ලේඛනය ගිණුම්කරණ පද්ධතිය තුලින් ලබා ගැනීමට අවශ්ය කාර්යයන් කඩිනමින් සිදුකරනු ලබන බව දැනුම්දීමට කැමැත්තෙමු.

VAT Schedules (උප කාර්යාල ඇතුළුව)	නව ගිණුම්කරන පද්ධතිය තුළින් VAT Schedules ලබා ගැනීමේ හැකියාව පවති.
දෙන ලද කාල පරිච්ඡේදයකට ස්ථාවර තැන්පතු ලේඛනය	ගිණුම්කරන පද්ධතිය සැපයුම්කරන ලද සමාගම සමඟ සාකච්ඡා කර අදාල වාර්තාව ලබා ගැනීමට හැකිවන පරිදි පද්ධතියේ සිදුකල යුතු වැඩිදියුණු කිරීම් සිදුකිරීමට කඩිනමින් කටයුතු කරනු ලැබේ
අහරු වෙක්පත් උපලේඛනය	ගිණුම්කරන පද්ධතිය තුළින් අහරු වෙක්පත් උපලේඛනයක් ලබා ගැනීමේ පහසුකම පවතින අතර එලෙස ලබා ගන්නා උපලේඛනය තුළ වෙක්පත් අහරු කිරීම් සම්බන්ධ සියළුම විස්තර (වෙක්පත් අංක, ගණුදෙනුකරු අංකය හා දිනය යනාදී) ඇතුලත් වුවද වෙක්පත් අහරු කිරීමට අදාල හේතුව එම උපලේඛනය තුළ සඳහන් නොවේ. පද්ධති සැපයුම්කරු ලවා මේ සම්බන්ධයෙන් පවතින අඩුපාඩු මහහරවා ගැනීමට අවශ්‍ය කාර්යයන් කඩිනමින් සිදුකරනු ලබන බව දැනුම්දීමට කැමැත්තෙමු.
බැංකු සැසඳුම	අධිකාරියේ ප්‍රධාන බැංකු ගිණුම ලංකා බැංකුවේ අංකය වන 1534 සඳහා බැංකු සැසඳුම් වාර්තාව ගිණුම්කරණ පද්ධතිය තුලින් ලබාගත හැකිය.

(ඉ) <u>නිරීක්ෂණය</u>

1987 වර්ෂයේ සිට අධිකාරියේ මුදල් අංශය, සැපයුම් අංශය හා වත්කම් කළමනාකරණ අංශයේ සියළුම මූල්‍යමය ගනුදෙනු සම්බන්ධ දත්ත ගබඩා කිරීම **Wang Vs** පද්ධතිය තුල සිදුකල අතර **DMS** ආයතනය විසින් එම පද්දතියට අදාල නඩත්තු කටයුතු සිදු කරන ලදි.

කෙසේ නමුදු, පසුකාලීනව අධිකාරියේ මූල්‍ය ගනුදෙනු වල සිදු වූ ධාරිතාමය වශයෙන් ඉහළ යාම හා පවත්නා පද්ධතියේ ධාරිතාව වැඩි කිරීමට නොහැකිවීම හා නව තාක්ෂණයේ ප්‍රවේශය හේතුවෙන් පද්දතියේ උපාංගවල පැවති භිහතාවය හා භාවිත කරන ලද ගිණුම් පද්ධතියේ පැවති දුර්වලතා අදී හේතූන් රාශියක් පාදක කොට ගෙන නව ගිණුම්කරන පද්ධතියක් කරා ප්‍රවේශ වීමේ අවශ්‍යතාවය පැන නැගුනි. ඒ අනුව මුදල් අංශය, සැපයුම් අංශය හා වත්කම් කළමනාකරණ අංශයේ ගිණුම්කරන අවශ්‍යතා හඳුනාගෙන අධිකාරියේ ප්‍රසම්පාදන අංශය විසින් ගිණුම්කරණ තොරතුරු පද්ධති ක්ෂේත්‍රයේ නියැලි සිටින ආයතන වලින් මිල කැඳවුම් ලබා ගැනීමට කටයතු සිදු කරන ලදි.

නමුත්, ගිණුම්කරන පද්ධතිය ක්‍රියාත්මක කරන අවස්ථාවේදී මෙම අධිකාරිය විසින් හඳුනාගත් නව විශේෂාංග **(new features)** ඔවුන් ලවා ඉටුකරවා ගන්නා ලදි. එහිදී උක්ත විෂය පථයට අදාලව මුල් ලංසු කැඳවීමේ දී හඳුනාගත් පිරිවිතරයකට අනුව මිල කැඳවුම් ලේඛනය සමඟ ඉදිරිපත් කරන ලද අතර එකී පිරිවිතරය තුල සඳහන්ව ඇත්තේ ගිණුම්කරණ පද්ධතියේ මූලිකවම අවශ්‍ය වන අයිතමයන් පමණි.

ඒ අනුව, විමසුමේ සඳහන් **New features** ලෙස නම්කර ඇති සියළුම අයිතමයන් අප විසින් මුල් ලංසුව කැඳවීමේ පිරිවිතරයේ සඳහන් වූ අයිතමයන් නොවන බව දැනුම්දීමට කැමැත්තෙමු. එනම්, ගනුදෙනු වල ධාරිතාවය වැඩිවීමත් සමඟ ගිණුම්කරන පද්ධතිය ආරම්භකර කර පවත්වාගෙන යාමේදී අප විසින් උක්ත ආයතනය හරහා මුල් ලංසුවෙහි අන්තර් ගත නොවූ කාර්යයන් රැසක් අලුතින් ඉටුකරගන්නා ලද අතර එලෙස ඉටුකරගන්නා ලද කාර්යයන්ගේ කොටසක් පහත සඳහන් පරිදි වේ.

- ගනුදෙනු විශ්ලේෂණය කිරීම සඳහා විවිධ ආකාරයෙන් වාර්තා ලබා ගැනීම
- ගනුදෙනු ගිණුම්ගත කිරීමේ දී ඇති වන වැරදි නැවත නිවැරදි කිරීමේ පහසුකම් ලබා ගැනීම **(උදා: Voucher approval edit / Journal entry approve edit)**
- ගෙවීම් වවුචර් පත් ගිණුම් පද්ධතිය තුලින්ම නිර්මාණය කිරීම **(උදා: Vehicle hiring payment voucher creation / Membership fee voucher creation)**
- උප කාර්යාල මගින් සිදු කරනු ලබන ගෙවීම් වවුචර් පත් ප්‍රතිපූර්ණය කිරීමේ ක්‍රියාවලිය ගිණුම් පද්ධතිය මගින් සිදු කිරීම යනාදී ලෙස කාර්යයන් රාශියක් ඉටු කරගැනීම.

එලෙසම **upgrade** ලෙස නම් කර ඇති අයිතම **45** ද ඉහත දැක්වූ පරිදි ගිණුම් පද්ධතියේ වැඩ ආරම්භකර කර සිදුකරගෙන යෑමේ දී එකී අයිතම හා සම්බන්ධව වැඩ කටයුතු සිදුකරනු ලබන නිලධාරීන් විසින් පරිගණක පද්දතිය සැකසීම සිදුවන අවස්ථාවේදී පරිගණක පද්දති සැකසුම්කරු හා මුදල් අංශයේ හා වත්කම් කළමණාකරන අංශයේ නිලධාරීන් සමග පවත්වන ලද සාකච්චාවන්හිදී පෙන්වා දුන් පරිදි හා යෝජනා කරන ලද පරිදි එම කාර්යයන් පහසුවෙන් හා කාර්යක්ෂමව සිදුකර ගැනීම සඳහා ඉහළ නිලධාරීන්ගේ අනුමැතිය සහිතව පද්ධති සැකසුම්කරු ලවා සිදුකරගන්නා ලද කාර්යයන් වේ. මෙලෙස මෙම අයිතම් **upgrade** කිරීම තුළින් අධිකාරිය විසින් බලාපොරොත්තු වූ ආකාරයට අදාල නිලධාරීන් විසින් තම කාර්යය පහසුවෙන් ඉටුකර ගැනීම තුලින් එම කාර්යන්ගේ නිවරදිතාව පැවති පද්ධතිය තුළ හඳුනාගත් දුර්වලතාවයන් අවම කර ගැනීම සඳහා මෙමඟින් සිදුකර ගත හැකි වී ඇත.

ඒ අනුව උක්ත අතිරේක කාර්යයන් පද්ධති සැපයුම් සමාගම විසින් ලබාදීමෙන් අනතුරුව අතිරේක ගෙවීම් ලෙස රු.**5,000,000/-** ක් ගෙවන ලෙසට අධිකාරියෙන් ඉල්ලීමක් සිදුකරන ලදි. එහිදි ඒ සම්න්ධයෙන් පත්කරන ලද තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඔවුන් විසින් මෙම කාර්යයන් සම්බන්ධයෙන් අතිරේකව දරණ ලද කාලය සලකා බලා එම කාර්යන් ඉටුකර ගන්නා ලද අධිකාරියේ නිලධාරීන්ගෙන් ඒ පිළිබඳව වැඩ අයිතම් ප්‍රමාණය, වැඩ නිම කිරීමේ ප්‍රතිශතයන් හා එක් එක් අංශ වල අතිරේක වැඩ සඳහා සේවා සැපයුම් සමාගම විසින් නියම කරන ලද පිරිවැය යනාදී කරුණු සැලකිල්ලට ගෙන රු.**4,839,188.17**ක් අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට මත ගෙවීම් කරන ලදි.

(ඊ) <u>නිරීක්ෂණය</u>

අධිකාරිය විසින් ගිණුම්කරන වැඩ සටහන නිම කර භාරදීම නියමිත කාලසීමාව තුළදී සිදුකිරීම ප්‍රමාද වීම හේතුවෙන් එම ක්‍රියාවලිය කඩිනමින් නිම කර දෙන ලෙසට ඔවුන් වෙත වරින් වර දැන්වීම් සිදු කර ඇත. ඒ අනුව එවකට අධිකාරියේ සේවයේ නියුතු ක්‍රියාකාරී අධ්‍යක්ෂතුමන්ගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවේදී කරන ලද නිර්දේශයන් මත ඔවුන් 2018.05.16 දින අදාල වැඩසටහන අධිකාරිය වෙත භාරදීම ට කටයුතු සිදු කර ඇත. ඒ අනුව, එදින සිට අවුරුද්දක ඔවුන්ගේ නඩත්තු කාලය අවසන් වීමෙන් පසු 2020 වර්ෂය සිට එම සමාගම සමඟ නඩත්තු ගිවිසුමට එළඹී ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) <u>නිරීක්ෂණය</u>

2018 වසරේදී පිටකොටුව චාර්මස් ධාන්‍යාගාර ඉඩමේ රථගාල පවත්වාගෙන යාමට රු.**3,400,000/-** වූ පදනම් මිල මත මිල ගණන් කැඳවීමේදී ලැබී තිබූ රු.**5,014,600/-** වූ ඉහළම මිල ගණන මත රථ ගාල ලබා ගැනීමට මිල ගණන් ඉදිරිපත් කල ආයතනය ඉදිරිපත් නොවූ බැවින් හතරවන ස්ථානයට මිල ගණන් ඉදිරිපත් කර තිබූ වර්ල්ඩ් කැපිටල් සෙන්ටර් ලිමිටඩ් ආයතනය මඟින් රථගාල ඉහළම ඉල්ලුම්කරුගේ මුදල මත ලබා ගැනීමට ඉදිරිපත් වූ අතර, **2018.11.28** දිනැති ලිපියේ සඳහන් කොන්දේසි යටතේ අදාළ ආයතනය වෙත ඉඩම රථගාල පවත්වා ගෙන යාම සඳහා ලබා දෙන ලදී.

2018.12.05 දිනැති ලිපිය මඟින් තාවකාලික ආහාර කුටි, වාහන සේදුම් ස්ථාන හා විනෝදාස්වාද පහසුකම් සැපයීම සඳහා අවසර ලබා දී තිබූ අතර එකී අවසරය **2019.02.13** දිනැති ලිපිය මඟින් අවලංගු කර ඇත. ඒ අනුව තාවකාලිකව ඉදිකරන ලද කුටි ඉවත් කිරීමට කටයුතු කරන ලදී.

කෙසේ වුවද, එකී ක්‍රියාකරු වෙත රථගාල පවත්වා ගෙන යාමට බදු ලබා දී තිබූ අවසරය මෙම අධිකාරිය **2019.07.03** දිනැති ලිපිය මඟින් අවලංගු කර ඇත.

එම අවලංගු කිරීමෙන් පසුව නැවත මිල ගණන් කැඳවීමෙන් පසුව වර්තමානයේදී අදාළ චාර්මස් ධාන්‍යාගාර ඉඩමේ රථගාල රු. **4,955,500/-** (බදු රහිත) මාසික කුලී මුදලකට වෙනත් ටෙන්ඩර්කරුවෙකු වෙත අවුරුදු **2** ක බදු කාලයකට ලබා දී ඇත.

(ආ) <u>නිරීක්ෂණය</u>

මෙම ගනුදෙණුවට අදාළව,

- ❖ රජයේ තක්සේරුකරුගේ තක්සේරු වටිනාකම (2011 වර්ෂයේදී - 99 අවුරුදු) රු.2,785,000,000.00
- ❖ බදුකරු ගෙවූ මුදල රු. 577,000,000.00.
- ❖ ඉඩම් අත්පත්කර ගැනීම් / වන්දි ගෙවීම් මෙන්ම බදු මුදල් ලබාදීම 2016 වර්ෂය දක්වා ප්‍රමාද වී ඇත.
- ❖ ඒ අනුව 2016 වර්ෂයේදී රජයේ තක්සේරුකරුගේ 99 අවුරුදු බදු වටිනාකම නැවත ලබාගන්නා ලදී. එය රු.3,620,000,000.00 කි.
- ❖ බදුකරු වෙත 2011 වර්ෂයේ බදු වටිනාකම නොව 2016 බදු වටිනාකම ගෙවන ලෙස දැන්වුවද ඔහු විසින් ගෙවා තිබූ රු.මිලියන 577 සඳහා පොළියක් අඩුකරන ලෙස අභියාචනය කර තිබූ අතර ඒ අනුව ගණනය කර අඩුකල පොළිය රු.330,249,000.00 කි.

සම්පූර්ණ බදු මුදලේ වටිනාකමින් මීට පෙර ගෙවූ රු.මිලියන 577 සහ අඩුකරන ලද පොළිය හැර ඉතිරි මුදල බදුකරු ගෙවා තිබූ නමුත් පොළිය අඩු කිරීම සම්බන්ධව විධිමත් අනුමැතීන් ලබාගෙන නොතිබූ නිසා අමාත්‍යාංශ ලේකම්තුමා විසින් මෙම මුදල අයකර ගන්නා ලෙස උපදෙස් ලබාදී තිබුණි.

<u>නිවැරදි කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග හා වර්තමාන තත්වය</u>

නමුත් බදුකරු ඒ සඳහා එකඟ නොවී පසුගිය කාලය තුල සිටියද ඉඩමේ සංවර්ධන බලපත්‍රය දීර්ඝ කිරීමේ අවශ්‍යතාවය මත අධිකාරියේ පූර්ව අවසරය ඉල්ලා සිටින ලදී. මෙහිදී මේ සම්බන්ධව අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය වෙත වාර්තා කර සංවර්ධන බලපත්‍රය මෙන්ම සංවර්ධන කාලය 2025 දක්වා දීර්ඝ කිරීම සඳහා පහත පරිදි කොන්දේසි වලට යටත්ව අනුමැතිය ලබාදෙන ලදී.

1. බදුකරු විසින් අධිකාරිය වෙත ගෙවිය යුතු ර.මිලියන 330,249,000.00 ක මුදල (රජයේ බදු මුදල් සමඟ රු.356,668,920.00) වහාම අධිකාරිය වෙත ගෙවිය යුතුවේ.
2. ඉහත (1) කොන්දේසිය සම්පූර්ණ කල පසුව පමණක් සංවර්ධන කාලසීමාව 2025.01.31 දින දක්වා දීර්ඝ කිරීමට කටයුතු කරනු ලැබේ.

ඉහත කළමනාකරණ මණ්ඩල තීරණය දැනටමත් බදුකරු වෙත (2022 මාර්තු මස) දන්වා යවා තිබූ අතර, 2022 අප්‍රේල් 22 දින එම ලිපිය සඳහා පිළිතුරු ලිපියක් යොමුකරමින් නැවත තීරණය සලකා බලන ලෙස අභියාචනය කර ඇත. මේ සම්බන්ධව නීති උපදෙස් ලබා ගැනීමෙන් කළමනාකරණ මණ්ඩලය වෙත යොමුකර අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.

(ඇ) <u>නිරීක්ෂණය</u>

2015 වර්ෂයේ මුල් මාසය වන විට නව රජයක් බලයට පත්වීමත් සමඟ පත්වූ නව කළමණාකාරිත්වය මඟින් ව්‍යාපෘතිය සඳහා මුදල් යෙදවීම නවතා දමනු ලැබූ අතර 2020 වර්ෂය තෙක් එහි වැඩ කටයුතු තාවකාලිකව නවතා දමා ඇත.

වර්තමාන කළමනාකාරිත්වය මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කර වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන ඇති අතර පෞද්ගලික අංශයේ මූල්‍ය දායකත්වයද සහිතව හා රජයේ පෞද්ගලික ආයෝජනයක් ලෙස (PPP Model) ඉදිරි කටයුතු සිදුකිරීමට අවශ්‍ය පියවර මේ වන විට ගනිමින් පවතී.

(ඇ) <u>නිරීක්ෂණය</u>

1. නාගරික සංවර්ධන අධිකාරිය විසින් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ (NBRO) තාක්ෂණික විද්‍යාත්මක උපදෙස් හා අධීක්ෂණය යටතේ කසල කන්ද ස්ථායී කිරීම එහි අප ජලය (Leachate) ක්‍රමවත් පරිදි රැස්කිරීම සඳහා නල පද්ධති ඉදිකිරීමේ අදියර I සම්පූර්ණ කිරීම හා අභ්‍යන්තරයේ උත්පාදනය වන අහිතකර වායුන් පරිසරයට මුදාහැරීම සඳහා යෝජනා කරන ලද නල (Gas Well) 31 න් 08 ක් ස්ථාපිත කිරීම හා කසල කන්දේ 5%ක පමණ කොටසක් නියමු ව්‍යාපෘතියක් ලෙස පස් තට්ටුවකින් ආවරණය කිරීම සිදුකර ඇත.

ඒ යටතේ නාගරික සංවර්ධන අධිකාරිය දැනට රු.මි. 455 ක පමණ පිරිවැයක් අධිකාරිය යටතේ දරා ඇත.

2. එම ව්‍යාපෘතිය අසල පිහිටි 101 වත්තේ අනවසර පදිංචි පවුල් 138 ක් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් කොලොන්නාවේ ඉදිකර ඇති මහල් නිවාස ව්‍යාපෘතියෙන් රු.මි. 700 ක පමණ වටිනා නිවාස ලබාදී ඇත.

3. මෙම ව්‍යාපෘතියේ ඉතිරි වැඩ කොටස් සම්පූර්ණ කිරීම රාජ්‍ය හා පුද්ගලික අංශ සහයෝගීතාවයෙන් (Public Private Partnership/PPP) සිදුකිරීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇත. ඒ අනුව, මෙවැනි ව්‍යාපෘති ඉදිකිරීම් පිළිබඳ පළපුරුද්ද හා මූල්‍ය හැකියාව සහිත ආයෝජකයන් මාර්ගයෙන් ව්‍යාපෘති ඉදිරි සංවර්ධන කටයුතු සිදුකිරීම සඳහා දීර්ඝකාලීන බදු පදනම මත ඉඩම් බැහැර කිරීමට අදහස් කෙරේ. ඒ අනුව, 2022 වසර අවසන්වීමට ප්‍රථම මෙම නාගරික උද්‍යානයේ ඉදිකිරීම් අවසන් කිරීමට සැලසුම් කළද, ඉඩම් අත්පත් කරගැනීමේදී ඇති වූ ප්‍රමාදයන් හේතුවෙන් සැලසුම් කළ පරිදි ආයෝජකයෙකු තෝරාගැනීමට නොහැකි විය.

4. කොලොන්නාව ප්‍රදේශයට අඩුපාඩුව පවතින හා මෙම ව්‍යාපෘතිය ආශ්‍රිතව ඉදිකිරීමට සැලසුම් කර ඇති පොදු ක්‍රීඩාංගණයක්, ප්‍රජාශාලාවක්, ජලවහන හා මාර්ග පද්ධති වැඩිදියුණු කිරීම, ඇවිදින මංතීරු හා අනෙකුත් පොදු පහසුකම් ඉදිකිරීමට සැලසුම් කර ඇත.

5. මෙම කසල කන්ද සම්පූර්ණයෙන්ම ප්‍රතිචක්‍රීකරණය කර ඉහත පරිදි පොදු පහසුකම් සහිත සැපයුම් (Logistic) මධ්‍යස්ථානයක් ලෙස මෙම සම්පූර්ණ භූමිය සංවර්ධනය කිරීම සඳහා ආයෝජන මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති ආයෝජන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව අධ්‍යයනය කරමින් පවතී.

(ඉ) <u>නිරීක්ෂණය</u>

නාගරික සංවර්ධන අධිකාරියේ උපදේශන සේවා මත හම්බන්තොට සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මාගම් රුහුණුපුර ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව ඉදිකිරීම සඳහා 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා රජයේ අරමුදල් වලින් රු.3,830,874,596 ක් හා විදේශ ණය යටතේ ඇ.ඩො. මිලියන 6.4 ක් ලෙස වියදම් කර ඇත. මෙම මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා 2017 – 2019 වර්ෂය දක්වා රු.75,889,769.97 ක් වැයකරන ලද අතර එම කාලය සඳහා ආදායම ලෙස රු.15,896,360 උපයා ඇත.

2013 වර්ෂයේදී ව්‍යාපෘතිය නිම කිරීමෙන් පසු අදාල ආයතනයක් වෙත පවරා දීමට යෝජිතව තිබූ අතර, අදාල පවරාදීම් සිදු කරනා තෙක් කළමණාකරන කටයුතු පවත්වාගෙන යාමට නාගරික සංවර්ධන අධිකාරියට සිදු ව ඇත.

(ඊ) <u>නිරීක්ෂණය</u>

නාගරික සංවර්ධන අධිකාරියේ ප්‍රධාන පරමාර්ථ වනුයේ ප්‍රකාශිත නාගරික ප්‍රදේශ සඳහා ආර්ථික, සමාජීය, භෞතික හා පාරිසරික යන අංශ ඒකාබද්ධ වූ නාගරික සංවර්ධන සැලසුම් සකස් කිරීම හා එම ප්‍රදේශ භෞතික වශයෙන් සංවර්ධනය කිරීම වේ. ඒ අනුව, කොළඹ නාගරික ප්‍රදේශ සැලසුම් සහගත ලෙස දියුණු කිරීමේ අරමුණින් නාගරික අඩු පහසුකම් සහිත ජනාවාස සඳහා සියලු පහසුකම් සහිත මහල් නිවාස ලබා දීමේ වැඩසටහන නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය ලෙස මෙම අධිකාරිය යටතේ ආරම්භ වී ක්‍රියාත්මක කරන ලදි. මෙම ව්‍යාපෘතියේ මූලික ආරම්භය වූයේ කොළඹ නගරයේ ජනගහනයෙන් 50% ක් පමණ ජීවත්වන අඩු පහසුකම් ජනාවාස වෙනුවට අංග සම්පූර්ණ නිවාස ලබා දීම වේ.

ඒ යටතේ නිවාස ව්‍යාපෘති ඉදිකිරීම කඩිනම් කොට හඳුනාගත් ජනාවාස පුනස්ථාපනය සඳහා නිවාස ලබා දීම සීඝ්‍රයෙන් සිදු කෙරිණි.

එහිදී නිවාස ව්‍යාපෘති සඳහා යොදා ගන්නා ලද ඉඩම් බොහොමයක් මෙම අධිකාරිය සතු ඒවා නොවූ අතර එම ඉඩම් මෙම අධිකාරිය වෙත අත්පත් කර ගැනීම දීර්ඝ ක්‍රියාවලියක් වූ අතර එම ක්‍රියාවලිය සිදු කරන අතරතුර නිවාස සංකීර්ණ ඉදිකර පුනස්ථාපන කටයුතු කඩිනම් කරන ලදි. එම කාලය අතරතුර සහාධිපත්‍ය සහතික ලබා ගැනීමට කටයුතු කරන ලද අතර, සහාධිපත්‍ය සහතික ලබා ගැනීමේදී පහත ක්‍රියාවලිය අනුගමනය කළ යුතු වේ.

- ඉඩමේ සැලස්ම අනුමත කර ගැනීම
- ගොඩනැගිලි සැලසුම අනුමත කර ගැනීම.

- ගොඩනැගිල්ල ඉදිකිරීමෙන් අනතුරුව අනුකූලතා සහතිකය ලබා ගැනීම
- අනතුරුව සභාධිපත්‍ය පිඹුර සකස් කිරීම.
- සභාධිපත්‍ය පිඹුර පිටපත් සමඟ අදාළ සියලු ලියකියවිලි සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වෙත භාර දීම.
- ඔවුන්ගේ උපදෙස් මත අවශ්‍ය වෙනස්කම් ඇතොත් සිදු කිරීම හා නැවත භාර දීම.

එහිදී අවශ්‍ය අනුමැති සහතික ඒ ඒ අදාළ අංශ හා ආයතන වෙතින් ලබා ගැනීමට කටයුතු කිරීමේදී ප්‍රමාදයන් ඇති විය. එමෙන්ම, ඇතැම් නිවාස ව්‍යාපෘතිවල යෝජිත ගොඩනැගිලි අතුරින් ගොඩනැගිලි එකක් හෝ කිහිපයක් වැඩ නිම කළ ද අනෙකුත් ගොඩනැගිලි නිම නොකිරීම නිසා අනුකූලතා සහතිකය ලබා ගැනීමේදී ද ප්‍රමාදයන් සිදුව ඇත.

තවද, මේ වන විට නිවාස ව්‍යාපෘති 22 ක් ඉදිකොට ජනතා අයිතියට පත්කර ඇති අතර, එම ව්‍යාපෘති අතරින් දෙමටගොඩ පිහිටි "මිහිඳුසෙන්පුර" නිවාස ව්‍යාපෘතියට සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සහතිකය ලබාගෙන ඇති අතර, මේ වන විට නිවාස ව්‍යාපෘති 06 ක් සඳහා සභාධිපත්‍ය සහතිකය ලබා ගැනීම සඳහා එම අධිකාරිය වෙත යොමු කොට ඇති අතර, අනෙකුත් නිවාස ව්‍යාපෘති සඳහා ද අවශ්‍ය අනුමැතීන් හා අදාළ ලියකියවිලි සම්පාදනය කරමින් පවතී. ඒ පිළිබඳ සවිස්තර වාර්තාව පහත සඳහන් වගුවෙහි පරිදි වේ.

වර්තමාන ප්‍රගතිය	නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව	නිවාස ව්‍යාපෘතියේ නම	වෙනත් කරුණු
අනුමැතිය ලබාගෙන ඇති නිවාස ව්‍යාපෘති	01	මිහිඳුසෙන්පුර	නිවාස හිමියන්ට ඔප්පු සැකසීම සඳහා අවශ්‍ය නීතීඥ සමාගමක් තෝරා ගැනීම සඳහා මූලික ප්‍රසම්පාදන කටයුතු කරමින් පවතියි.
අනුමැතිය ලබා ගැනීම සඳහා අයදුම්පත් භාර දී ඇති ව්‍යාපෘති	06	රන්දිය උයන හෙළමුතු සෙවණ සිරිසර උයන මෙත්සර උයන සිරිමුතු උයන මිහිජය සෙවණ	මේ අතරින් ව්‍යාපෘති 05 සඳහා අඩුපාඩු හා අවශ්‍ය සංශෝධන සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය විසින් දන්වා ඇත. ඉතිරි නිවාස ව්‍යාපෘතිය සඳහා සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය මඟින් ක්ෂේත්‍ර සමීක්ෂණ කළ යුතුව පවති.
අනුමැතිය සඳහා යොමු කිරීමට අවශ්‍ය ලිපි ලේඛන සම්පාදනය කරමින් පවතින ව්‍යාපෘති	07	ලක්සෙත සෙවණ සියපත් සෙවණ රන්මිතු සෙවණ සත්හිරු සෙවණ සියසෙත සෙවණ මෙත්සඳ සෙවණ ලක්මුතු සෙවණ	ගොඩනැගිලි සැලසුමෙහි සංශෝධනයන් සඳහා අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇත.
ක්ෂේත්‍ර නිරීක්ෂණ සිදු කරමින් පවතින නිවාස ව්‍යාපෘති	03	මුවදොර උයන ලක්සඳ සෙවණ සිරිසඳ සෙවණ	සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියට යොමු කිරීමට ප්‍රථම අවශ්‍යතා සපුරා ඇත්දැයි පරීක්ෂා කිරීම සඳහා යොමු කොට ඇත.
සභාධිපත්‍ය පිඹුරුපත් සකස් කළ යුතු නිවාස ව්‍යාපෘති	05	පුරදොර සෙවණ ජයමහ සෙවණ ලක්හිරු සෙවණ සංහිඳ සෙවණ කොළොම්තොට	පිඹුරුපත් සකස් කිරීම සඳහා ලංසු කැඳවා ඇත.

		සරසවි උයන	

මෙයට අමතරව සභාධිපත්‍ය සහතික ලබා ගැනීමෙන් පසු අවසන් අරමුණ විය යුත්තේ සභාධිපත්‍ය නීතිය අනුව කළමනාකරණ සංස්ථා පිහිටුවීම වේ. කෙසේ වුවද ඒ සඳහා පදිංචිකරුවන්ගෙන් අවම වශයෙන් **50%** කට වත් නීත්‍යානුකූල අයිතිය ඔප්පුවක් මඟින් පැවරී තිබිය යුතුය. එක් නිවාස ඒකකයක් සඳහා නාමික අගයක් නියමකොට එය සමාන මාසික වාරික වලින් අවුරුදු **30** ක් පුරාවට නිවාසලාභීන්ගෙන් අයකිරීමෙන් අනතුරුව එහි අයිතිය ඔප්පුවක් මඟින් පැවරීම දැනට පවත්නා ක්‍රමවේදය වේ. නමුත් නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහාය දැක්වීමේ ව්‍යාපෘතිය මඟින් මේ වන විට නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ නිවාස ලබාදීමේ ප්‍රතිපත්තිය නැවත පසුවිපරම් කරනු ලබන අතර, ඔවුන්ගේ යෝජනා ඉදිරිපත් කිරීමෙන් පසු එම යෝජනා ක්‍රියාත්මක කිරීම පිළිබඳව සළකා බැලීමට නියමිත අතර දැනට පවතින ක්‍රමය අනුව සභාධිපත්‍ය පිඹුර සඳහා අනුමැතිය ලබා ගත්ත ද නිවාස ව්‍යාපෘතිවල කළමනාකරණ කටයුතුවලින් නාගරික සංවර්ධන අධිකාරියට නිදහස් වීමට නොහැක.

(උ) <u>නිරීක්ෂණය</u>

ටාටා හවුසින් ඩිවලොප්මන්ට් පුද්ගලික සමාගම (Tata Housing Development Pvt. Ltd.), එස්.ජී. **18** රියලිටි පුද්ගලික සමාගම සහ නාගරික සංවර්ධන අධිකාරිය අතර **2012** මාර්තු **15** වන දින එළැඹ ඇති අවබෝධතා ගිවිසුමේ අංක **07** කොටසේ සඳහන් කර ඇති පරිදි ටාටා හවුසින් ඩිවලොප්මන්ට් සහ එස්.ජී. **18** යන ආයතන වසර දෙකක කාලයක් සඳහා තාවකාලික පදිංචිය සඳහා කුලී මුදල් ගෙවීමට හෝ ඉදිකිරීම් අවසන් වන තෙක් හෝ යන දෙකෙන් අවසන් අවස්ථාව තෙක් වන්දි මුදල් ගෙවීම, තාවකාලික කුලී මුදල් ගෙවීම සහ ඉවත් කිරීම් වලට අදාල වියදම් ගෙවීම යන සියල්ල, සියලු ඉවත් කිරීම් සිදුකර මාසයක කාලයක් ඇතුලත ප්‍රතිපූර්ණය කරන බවත්, ඉහත වියදම් සියල්ල ඇ.ඩො. මිලියන 3 කට නොවැඩි විය යුතු බවත් සඳහන් කර ඇත. ටාටා සමාගම විසින් අවබෝධතා ගිවිසුමේ සඳහන් ඇ.ඩො. මිලියන **3** ක ප්‍රමාණය **(රු. මිලියන 472)** ගෙවා අවසන්ව ඇති බව සඳහන් කරමින් ඉතිරි කාලය සඳහා කුලී මුදල් ගෙවීම ප්‍රතික්ෂේප කර ඇති බැවින් නාගරික සංවර්ධන අධිකාරිය විසින් අමතරව දරණ ලද අමතර උපදේශන ගාස්තු හා තාවකාලික කුලී මුදල් සංවර්ධක සමාගම වෙතින් ප්‍රතිපූර්ණය කර ගැනීමේ ගැටළුවක් පවතී.

(ඌ) <u>නිරීක්ෂණය</u>

ඕවල් වීවී නිවාස ව්‍යාපෘතියේ සභාධිපත්‍ය ප්‍රකාශන ඔප්පු ලබා දීමට පෙර සභාධිපත්‍ය කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු නිකුත් කරනු ලබන සහතිකය ලබා ගැනීමට කොරෝනා වසංගතය හේතුවෙන් ප්‍රමාද විය. එමෙන්ම සභාධිපත්‍ය සැලැස්මේ යම් යම් ගැටළුසහගත තත්ත්වයන් නිරාකරණය කර ගනිමින් පැවරුම්කර ඔප්පු **(Transfer Deed)** අදාළ නිවාසලාභීන්ට ලබා දීමට පෙර සභාධිපත්‍ය ප්‍රකාශන ඔප්පුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කළ යුතුව ඇත.

එමෙන්ම සියලු නිවාසලාභීන්ගේ තොරතුරු සනාථ කර ගැනීම සිදුකළ යුතු සංකීර්ණ ක්‍රියාවලියක් හෙයින් එය සැලකිය යුතු කාලයක් ගතවන කාර්යයකි. දැනට සභාධිපත්‍ය ප්‍රකාශන ඔප්පු ලියාපදිංචි කිරීමට අදාළ සියලු වැඩකටයුතු අවසන් වී පවතින අතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම ඔප්පු ලියාපදිංචි කළ යුතුව ඇත. ඉන් පසුව අදාල පැවරුම්කරයෙන් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කිරීම සිදු කරනු ලැබේ.

(එ) <u>නිරීක්ෂණය</u>

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ පරිපාලන අගනගරය ලෙස සංවර්ධනය කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව එකී ප්‍රදේශය තුල පිහිටි රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය සතු ඌණ උපයෝජිත ඉඩම් ප්‍රශස්ථ ලෙස යොදා ගැනීමේ අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු කර පොදු මහජනතාව වෙත සේවා සපයනු ලබන මූල්‍ය හා පරිපාලන ආයතන සංකීර්ණයක් ඉදිකිරීම සඳහා සුදුසු ස්ථානයක් වශයෙන් **2013** වර්ෂයේ දී අවභාවිතයේ පැවති රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ වරිපනම් අංක **294, 300** සහ **953/1** දරන ඉඩම් නාගරික සංවර්ධන අධිකාරිය විසින් හඳුනාගෙන ඇත.

ඒ අනුව, ඉඩම් අත්කර ගැනීමේ පනතේ **38 (අ)** අනුරු විධානය යටතේ **2013.10.09** දින පහත සඳහන් ඉඩම් කොටස් **03** නාගරික සංවර්ධන අධිකාරිය වෙත අත්කරගෙන ඇත.

අනු අංකය	වරිපනම් අංකය	ඉඩම් ප්‍රමාණය			මුල් හිමිකරු
		අක්.	රූඩ්.	පර්.	
1	294	0	1	2	ජී.ඩී.කුලරත්න මහතා
2	300	2	1	29	ඉලෙක්ට්‍රෝ ප්ලාස්ටික් සමූහ ව්‍යාපාරය
3	953/1	0	1	12	සී/ස ලංකා විදුලි (පුද්.) සමාගම

ඉහත ආකාරයෙන් අත්කර ගන්නා ලද ඉඩමෙන් අනු අංක **02** යටතේ දක්වා ඇති විශාලම ඉඩම් කොටස අවසතු කරන මෙන් **2015** වර්ෂයේ දී ඉඩමේ මුල් හිමිකරුවන් විසින් එවකට නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යතුමා වෙත කරන ලද ඉල්ලීමක් පරිදි අමාත්‍යතුමාගේ උපදෙස් අනුව කළමනාකරණ මණ්ඩල තීරණයකින් අනතුරුව **2015.07.02** දින මුල් හිමිකරුවන් වෙත අවසතු කර ඇත.

ඉන් අනතුරුව එයට යාබදව පිහිටි වරිපනම් අංක **953/1** දරන සී/ස ලංකා විදුලි (පුද්.) සමාගම හිමිකම් දක්වන ලද ඉඩම ද එම ආයතනය විසින් කරන ලද ඉල්ලීමක් සලකා බලා කළමනාකරණ මණ්ඩල තීරණයකින් අනතුරුව අවසතු කර ඇත.
කෙසේ වෙතත්, ඉහත දෙවන ඡේදයේ අනු අංක **02** හා **03** මඟින් දක්වා ඇති **2015** වර්ෂයේ දී අවසතු කරන ලද ඉඩම් කොටස් වත්මන් රජයේ ප්‍රතිපත්ති සහ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත ඉඩම් අත්කර ගැනීමේ පනතේ **38 (අ)** අතුරු විධානය යටතේ යළි අත්කර ගැනීමට **2021.02.17** දින කටයුතු කර ඇත.

ඒ සඳහා නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් කොළඹ නගරය කේන්ද්‍ර කරගත් යෝජිත නාගරික සංවර්ධන ව්‍යාපෘති සඳහා රජයේ හා පෞද්ගලික අංශයේ ඉඩම් නාගරික සංවර්ධන අධිකාරිය වෙත පවරා / අත්කර ගැනීම සඳහා අංක **20/1607/306/035** සහ **2020.10.12** දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අතර, ඒ සඳහා **2020.10.19** වන දින රැස්වන ලද අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. එකී අමාත්‍ය මණ්ඩල අනුමැතියෙහි (ඇමුණුම **20**) හි අනු අංක **42** යටතේ එම ඉඩම් අත්කර ගැනීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වී තිබේ.

ඒ අනුව, වන්දි හා පොලී වශයෙන් රු.මි.**213** ක් පමණ ගෙවා අවසන් කර ඇති ඉඩම් කොටස සහ **2021.02.17** දින අත්කරගත් ඉඩම් කොටස් **02** ඇතුලත් අක්කර **03** ක් පමණ වන සම්පූර්ණ ඉඩම ඉදිරියේදී සංවර්ධනය කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් කටයුතු කරනු ලැබේ.

(ඒ) <u>නිරීක්ෂණය</u>

නාගරික සංවර්ධන කටයුතු සඳහා අධිකාරියේ බලතල අනුව ඉඩම් අත්කර ගැනීම සිදු කරනු ලබන අතර අත්කර ගත් අරමුණු සඳහා පමණක්ම එකී ඉඩම් සංවර්ධනය කිරීම සඳහා බැහැර කිරීම කරනු ලැබේ. එසේ නොවන අවස්ථා වලදී අවස්ථානුකූලව, අදාල අනුමැතීන්ට යටත්ව, ඉඩම් අත්කර ගැනීමේ අරමුණ සංශෝධනය කර සංවර්ධනය කර සංවර්ධන කාර්යයන් සඳහා ඉඩම බැහැර කරනු ලැබේ.

නාගරික සංවර්ධන කටයුතු සඳහා අත්කර ගනු ලැබුවද ඉඩම් හිමිකරුවන්ගේ විරෝධතා හේතුවෙන් ඉඩම් අවසතු කිරීමට සිදු වන අවස්ථාද ඇත.

(I) මිල්ලෑව අක්කර දහසක වත්ත -

අත්කර ගැනීමේ අරමුණ කර්මාන්ත සංවර්ධන කටයුතු සඳහා වූවද කාලීන අවශ්‍යතාවය මත අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ අත්කර ගැනීමේ අරමුණ නාගරික සංවර්ධන කටයුතු ලෙස සංශෝධනය කර ඒ අනුව මිල්ලෑව වත්ත ඉඩම නාගරික සංවර්ධන කටයුතු සඳහා යොදා ගෙන ඇත.

(II) පිටකොටුව ඕල්කට් මාවතේ ස්වදේශීය ප්‍රින්ටර්ස් ආයතනය සතු පර්චස් **125**ක ඉඩම ගෙන අවසතු කිරීම. - සර්වේ ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක **CO/COL/2014/471** හා 2014.08.06 දිනැති ප්‍රගමණ අනුරේඛණයෙන් දැක්වෙන රූඩ් 03 - පර්. 7.28 ක් ප්‍රමාණයැති කොළඹ, ඕල්කට් මාවතේ පිහිටි සී/ස ස්වදේශී මුද්‍රණාලය සහ සමාගම හිමිකම් කියූ ඉඩම් කොටස නාගරික සංවර්ධන කටයුතු සඳහා අත්කර ගැනීමේ ඉල්ලුම් පත්‍රය මෙම අධිකාරිය විසින් 2013.11.05 දින මෙම අමාත්‍යාංශය වෙත යොමුකර ඇත.

පසුව, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 2 වන වගන්තිය යටතේ විෂයගත ඉඩම රජයට අත්කර ගැනීමට වුවමනා බවට අදාල දැන්වීම් 2014.06.27 දින ප්‍රසිද්ධ කර ඇත. තවද අංක 1980 අංක 2 දරණ නාගරික සංවර්ධන ව්‍යාපෘති (විශේෂ විධිවිධාන) පනත යටතේ ඉහත ඉඩම නාගරික සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බවට එකී පනතේ 2 වැනි වගන්තිය යටතේ නියමය අංක 1853/46 හා 2014.03.14 දරණ රජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකර ඇත.

නමුත්, එකී ඉඩම අත්කර ගැනීම සම්බන්ධයෙන් සී/ස ස්වදේශී මුද්‍රණාලය විසින් විරෝධතාවය දැක්වීම හා එම ආයතනය විසින් විෂයගත ඉඩම තුල සිදු කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතිය යන කරුණු සළකා බලා, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 50 වැනි වගන්තිය යටතේ එම ඉඩම අත්කර ගැනීමෙන් නිදහස් කිරීමට 2016.07.07 දින රැස්වූ මෙම අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය විසින් අනුමැතිය ලබාදී ඇත.

ඒ අනුව, එකී ඉඩම රජයට අත්කර ගැනීමට අවශ්‍ය බවට දැන්වීම් ප්‍රසිද්ධ කර ඇති නමුත් එය මෙම අධිකාරිය වෙත අත්කර ගැනීමක් සිදුවී නොමැත. තවද ඉඩම් අවසතු කිරීම අදාල වනුයේ රජයට අත්කරගත් ඉඩම් සම්බන්ධයෙන් පමණක් බවද දන්වනු කැමැත්තෙමි.

(III) ගාල්ල දඩල්ල ඉඩම -

ගාල්ල දඩල්ල පිහිටි ඉඩම අන්තර් ජාතික ක්‍රිකට් ක්‍රීඩාංගනයක් සංවර්ධනය කිරීමේ අරමුණින් මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන මත අත්කර ගැනීමට කටයුතු කර ඇත. මේ අතර අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවකදී ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනය එවතට පිහිටි ස්ථානයේම පවත්වාගෙන යෑමටත් දඩල්ල ඉඩමෙහි ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීමටත් තීරණය කරන ලද බැවින් ඒ අනුව කටයුතු කරන ලදි.

ඒ අනුව, අත්කර ගැනීමේ අරමුණ ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම වුවද ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පැවරීමට යෝජිත විෂයගත ඉඩමේ ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකරන ලද බැවින් අත්කර ගැනීමේ අරමුණ ක්‍රීඩා සංකීර්ණයක් ඉදිකිරීම යනුවෙන් සංශෝධනය කල යුතු අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීටම ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(iv) රාජගිරිය ශ්‍රී ජයවර්ධනපුර පාරේ පිහිටි අක්කර 03 රූඩ් 02 පර්චස් 03 ක ඉඩම -

ඉලෙක්ට්‍රෝ ප්ලාස්ටික් සමූහ ව්‍යාපාරයට අයත් රාජගිරිය, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ වරිපනම් අංක 294 දරණ ඉඩම 2013 වර්ෂයේදී ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ අත්කර ගැනීමෙන් අනතුරුව එහි භුක්තිය මහේස්ත්‍රාත් අධිකරණ තීන්දුවක් මගින් භාරගැනීමට කටයුතු කරන ලදී. ඉන් අනතුරුව ඉඩම අත්කර ගැනීමේ ක්‍රියාවලිය ඉදිරියට ක්‍රියාත්මක කරමින් පවතින අතරතුර මුල් හිමිකරුවන් විසින් එම අත්කර ගැනීමට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරීමට කටයුතු කරන ලදී. එම කාලය තුලදීම සවුදි අරාබියානු තානාපති කාර්යාලය ඉදිකිරීම සඳහා සවුදි රජය වෙත මෙම ඉඩම ලබාදීමට හැකියාවක් පවතින බැවින් ඒ සඳහා මුල් හිමිකරුවන් වෙත ඉඩම අවසතු කරන මෙන් ඉල්ලා එවකට නාගරික සංවර්ධන විෂයභාර අමාත්‍යතුමා වෙත මුල් හිමිකරුවන් විසින් කරන ලද ඉල්ලීමක් සළකා බැලීමෙන් අනතුරුව යෝජිත කාර්යය සඳහා ඉඩම අවසතු කරන මෙන් විෂයභාර අමාත්‍යතුමා විසින් උපදෙස් ලබාදී ඇත.

ඒ අනුව සවුදි රජය වෙත විෂයගත ඉඩම විකිණීම පිණිස මුල් හිමිකරුවන්ට අවසතු කිරීමට නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩල අනුමැතිය හිමි වී ඇත. තවද ඒ සඳහා ඇතිකර ගන්නා ලද එකඟතාවය පරිදි ශ්‍රේෂ්ඨාධිකරණ නඩු සමථයකට පත්කර ඇත. ඒ අනුව විෂයගත ඉඩම පනතේ 39(අ) වගන්තිය යටතේ 2015 වර්ෂයේදී මුල් හිමිකරුවන් වෙත අවසතු කිරීමට නාගරික සංවර්ධන අධිකාරිය විසින් කටයුතු කර ඇත.

2020 වර්ෂය අවසානයේදී කොළඹ නගරය සහ අවට පිහිටි නගරයන්හි සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා එම නගර තුල පිහිටි රජයේ සහ පෞද්ගලික අංශය සතු ඌන උපයෝජිත සුදුසු ඉඩම් පවරා ගැනීමට සහ අත්කර ගැනීමට නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි වන ලද අතර,

රාජගිරිය නගරය තුල හිස් තත්වයෙන් ඌන උපයෝජිතව පැවති ඉලෙක්ට්‍රෝ ප්ලාස්ටික් සමූහ ව්‍යාපාරයට අයත් 2015 වර්ෂයේදී අවසතු කරන ලද ඉඩමද ඒ සඳහා තෝරාගෙන තිබුණි. විශේෂයෙන්ම මෙම ඉඩම 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කිසිදු සංවර්ධන කාර්යයක් සඳහා යොදාගෙන නොතිබුණ අතර, අවසතු කරන ලද අවස්ථාවේදී නාගරික සංවර්ධන අධිකාරිය සමග ඇති කර ගන්නා ලද එකඟත්වය පරිදි සවුදි තානාපති කාර්යාලය ඉදිකිරීම සඳහාද ලබාදී නොතිබිණි.

ඒ අනුව, නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩල තීරණයකින් අනතුරුව අවසතු කරන ලද ඉඩම මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අතුරු විධානය යටතේ යලි අත්කර ගැනීමට 2021 වර්ෂයේ මුල් කාලය තුල නාගරික සංවර්ධන අධිකාරිය විසින් කටයුතු කර ඇත.

(ඔ) <u>නිරීක්ෂණය</u>

2019 වර්ෂයේදී අත්කර ගෙන ඇති කාර්ය සාධනය පිළිබඳ විස්තර විගණනය සඳහා ඉදිරිපත් කර ඇත.

(ඕ) <u>නිරීක්ෂණය</u>

කොළඹ නගරයේ පැල්පත් වාසීන්ට ස්ථීර නිවාස 50,000 ඉදිකිරීමේ ජාතික වැඩපිළිවෙල යටතේ මේ වන විට හෙක්ටයාර් 23.4036 ක භූමි ප්‍රමාණයක නිවාස ඒකක 14,607 කින් (නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ ව්‍යාපෘති 22 ක්, මෙට්‍රෝ හෝම්ස් සහ ලේක්සයිඩ් නිවාස ව්‍යාපෘතිය ඇතුළුව) සමන්විත නිවාස ව්‍යාපෘති 24 ක් ඉදිකර ඇති අතර, පහත වගුව අනුව ඉන් නිවාස ඒකක 5577 ක් ඉදිකිරීම සඳහා නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ නිදහස් කර ගන්නා ලද ඉඩම් යොදාගෙන ඇති බව පැහැදිලි වේ.

ඉඩමේ නම	නිවාස ව්‍යාපෘති ඉදිකිරීම සඳහා යොදා ගෙන ඇති ඉඩම් ප්‍රමාණය (හෙක්ටයාර්)	නිවාස ඒකක ගණන
මයුර පෙදෙස, වැල්ලවත්ත.	0.1973	120
133, 157, 155 වත්ත, ෆර්ගියුසන් පාර.	1.4168	872
ආරාමය පෙදෙස	1.1213	712
ඇපල්වත්ත	0.6538	479
එදිරිසිංහ වත්ත	0.7856	546
54 වත්ත	0.9368	720
66 වත්ත	0.515	432
CGR ඉඩම, මාළිගාවත්ත.	1.1627	768
කාලිංග මාවත	0.7923	528
31 වත්ත	0.2555	34
581 වත්ත සහ උපාලි ඉඩම	0.5504	366
එකතුව	8.3875	5577

ඊට අමතරව මේ වන විට නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිවාස ඒකක 7334 ක් කොළඹ නගරයේ පැල්පත් වාසීන් සඳහා ලබාදීම වෙනුවෙන් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.

එමෙන්ම ජනතා අයිතියට පත්කර ඇති නිවාස ඒකක 14,607 අතරින් 2021.12.31 දින වන විට නිවාස ඒකක 4294 ක් රජයේ විවිධ ව්‍යාපෘති සඳහා ලබාදීම තුළින් රජයේ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය ඉඩම් නිදහස් කර ගැනීමට සෘජු ලෙස දායකත්වය සපයා ඇත.

තවද වර්තමානයේ ණයකර නිකුත් කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලබාගෙන ඇත්තේ දැරිය හැකි මිලක් යටතේ ඉදිකිරීමට යෝජිත නිවාස ව්‍යාපෘති සඳහා වන අතර එම ණයකර නිකුතුව සිදු නොවිණි.

(ක) <u>නිරීක්ෂණය</u>

කොටස් ආයෝජනයන් සඳහා ලාභාංශ ප්‍රකාශයට පත් කිරීම, එම අදාල සමාගම් විසින් වර්ෂයේ ලාභ ඉපයීම හා 1.2.අනෙකුත් කාරණා පදනම් කර තීරණය කරනු ලබන බව දැක්වීමට කැමැත්තෙමු. කෙසේනමුත්, 2014 වර්ෂයේදී රු. 1,213,003 ක මුදලක් හා 2020 වර්ෂයේදී රු.444,075 ක මුදලක් ලාභාංශ වශයෙන් අධිකාරිය වෙත ලබා දී ඇත. තවද,මෙම සමාගමේ කළමනාකරණ මණ්ඩල නියෝජනය කරනු ලබන අධිකාරියේ නිලධාරීන්ද එකී සමාගමේ කළමනාකරණ මණ්ඩල රැස්වීම් කිහිපයකදීම මේ සම්බන්ධයෙන් කරුණු විමසීම් සිදුකර ඇත. කෙසේවෙතත්, ලාභාංශ නොලබන ආයතන සම්බන්ධයෙන් අධිකාරියේ කළමනාකරණය විසින් ඉදිරියේ දී සලකා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

(එ) <u>නිරීක්ෂණය</u>

මෙම ව්‍යාපෘතීන් සම්බන්ධයෙන් අදාල අනුමැතියන් ලබාගෙන පොත් වලින් ඉවත් කිරීමට කටයුතු සිදු කරනු ඇත.

(ඒ) <u>නිරීක්ෂණය</u>

නාගරික සංවර්ධනය අරමුණු කර ගෙන රේඛීය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වූ සුබිත පුරවර ව්‍යාපෘතිය සඳහා මෙම අධිකාරිය විසින්එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දුන් උපදේශන කටයුතු වෙනුවෙන් උපදේශන ගාස්තු වශයෙන් 6% ආදායමක් මෙම අධිකාරිය වෙත ලබා දීමට අනුමැතිය ලැබී තිබූ බැවින් එවකට සිටි අධ්‍යක්ෂ ජනරාල් අනුමැතිය මත එකී ව්‍යාපෘති ජනතා අයිතියට පත්කිරීම සඳහා දරණ ලද වියදම් මෙම ගාස්තු උපයෝගී කරගෙන නාගරික සංවර්ධන අධිකාරිය මඟින් ගෙවීම් සිදුකර ඇත.

(ඔ) <u>නිරීක්ෂණය</u>

<u>මරදාන ඉඩම</u>

අදාල සංවර්ධන කාර්ය සඳහා මේ වන විටත්, බදු දේපල යොදාගෙන ඇති අතර, සංවර්ධන කටයුතු ආරම්භ කර ව්‍යාපෘතියේ මහල් කිහිපයක සැකිල්ල ඉදිකිරීම් අවසන් කර ඇත.

දැනට රට තුල පවතින ආර්ථික තත්ත්වය මත ඉදි කිරීම් ක්ෂේත්‍රයද ක්‍රියාත්මක නොවන හෙයින් ව්‍යාපෘතියේ ඉදි කිරීම් මේ වනවිට නවතා දමා ඇති අතර, ඉදිරි ඉදි කිරීම් කටයුතු සිදු කරන ආකාරය හා අවසන් කරන ආකාරය දින වකවානු සහිතව ව්‍යාපෘති වාර්තාවක් වශයෙන් ලබාදෙන ලෙස සංවර්ධනකරුට දැනුම් දීමට කටයුතු කරනු ලැබේ.

<u>රාජගිරිය ඉඩම</u>

අංක 64, බුද්ගමුව පාර, රාජගිරිය ලිපිනයේ පිහිටි Bail Investment (Pvt) Ltd. වෙත බදු දී ඇති මෙම ඉඩමේ සංවර්ධන කටයුතු ඇන හිට ඇති අතර, නුදුරේදී රටේ ආර්ථික තත්ත්වය ස්ථාවර වූ වහාම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන බව සමාගම දැනුම් දී ඇති අතර, බදු ගිවිසුම් ප්‍රකාරව 2027.07.31 දින දක්වා සංවර්ධන කටයුතු සඳහා කාලය පවතී.

(ඕ) <u>නිරීක්ෂණය</u>

අධිකාරිය සඳහා කාර්යසාධනය පදනම් කරගත් උස්සවීම් ක්‍රමයක්ද ඇතුලත්ව බඳවාගැනීමේ හා උසස්වීම් පටිපාටියක් මේ වන විට සකස් කර, ඒ සඳහා අධිකාරිය කළමනාකරණ මණ්ඩල අනුමැතියද රේඛීය අමාත්‍යාංශ අනුමැතියද ලබාගැනීමෙන් අනතුරුව අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

(ක) <u>නිරීක්ෂණය</u>

2019.06.25 දිනැති අධිකාරියේ කළමනාකරණ මණ්ඩල තීරණය මත අධිකාරියේ 2018-2022 උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවා අවශ්‍යතාවය සපුරාලීම සඳහා මෙම අධ්‍යක්ෂ තනතුරු වලට නිලධාරීන් 10 දෙනෙකු උසස් කර ඇත.

(12/2019) කළමනාකරණ මණ්ඩල අනුමැතිය පත්‍රිකා අංක : 270/2019)

(ඛ) <u>නිරීක්ෂණය</u>

මෙම අධිකාරියේ මේ වන විට නිලවාහන ලබාදී නොමැති නිලධාරීන් වෙත කුලී පදනම මත වාහන ලබා ගැනීම සඳහා අධිකාරියේ වෙබ් අඩවියේ හා සිළුමිණ පුවත්පතෙහි දැන්වීම් පළ කර, මිලගණන් කැඳවා ඇත. (එම මිල කැඳවුම්වල පිටපත් අමුණා ඇත.) ඇමුණුම 30 කුලී පදනම මත වාහන ලබාගැනිමෙන් අනතුරුව මෙම පෞද්ගලික වාහන ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ග) <u>නිරීක්ෂණය</u>

මෙම නිලධාරීන් දෙදෙනා නැවත සේවයේ පිහිටු වන ලෙස අභියාචනා ඉදිරිපත් කරන ලද අතර, එම විනය නියෝග ප්‍රතිශෝධනය සඳහා ස්වාධීන අභියාචන පරීක්ෂණයන් පැවැත්වීමට තීරණය කරන ලදී. පසුව අධිකාරියේ විනය බලධරයා වශයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා ලෙසට ලද රේඛීය අමාත්‍යාංශ උපදෙස් මත අදාල විනය පරීක්ෂණ විධිමත්ව පවත්වා තිබේද යන්න විනිවිද භාවයකින් යුක්තව පරීක්ෂා කිරීමට එම පරීක්ෂණ වාර්තාවේ සඳහන් විශ්ලේෂණයන් නැවත සලකාබැලීමට කමිටුවක් පත් කරන ලදී. එම කමටු නිර්දේශය අධිකාරියේ කළමනාකරණ මණ්ඩල අනුමැතිය සඳහා (මාණ්ඩලික පත්‍රිකා 73/2020, 100/2020) 2020.04.23 දින හා 2020.05.27 දින ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව, එම චෝදනා වලින් එකී නිලධාරීන් දෙදෙනා නිදහස් කරන ලදී.

(ච) <u>නිරීක්ෂණය</u>

අධිකාරියේ කළමනාකරණ මණ්ඩල අනුමැතිය මත 2019.08.08 දින අධිකාරියේ වෙබ් පිටුවේ නගර නිර්මාණ ශිල්පී හා බලාත්මක සැලසුම්කරු තනතුරු පුරප්පාඩු සඳහා දැන්වීම් පළකර අයදුම්පත් කැඳවන ලදී. ඒ සඳහා අයදුම්පත් යොමු කළ අයදුම්කරුවන් මොරටුව විශ්ව විද්‍යාලය මඟින් සිදුකළ ලිඛිත පරීක්ෂණයකට සහභාගී කරවූ අතර 2019.09.09 හා 2019.09.17 දිනයන්හි සම්මුඛ පරීක්ෂණද පවත්වා එම තනතුරු සඳහා නිලධාරීන් තෝරා ගෙන ඇත.

(ඡ) <u>නිරීක්ෂණය</u>

මේ වන විට මෙම අධිකාරියේ සේවයෙන් මුදාහරින ලද සියළුම නිලධාරීන් වහාම ක්‍රියාත්මක වන පරිදි අධිකාරියේ සේවයට කැඳවීමට කටයුතු කර ඇත.

(ජ) <u>නිරීක්ෂණය</u>

මෙම දීමනා නැවත අයකර ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි පියවර ගන්නා බව දන්වා සිටිමි.

නිමේෂ් හේරත්
සභාපති
නාගරික සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන අධිකාරිය,
6,7 සහ 9 මහල්,
සෙත්සිරිපාය අදියර 01,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා

+94112873637

https://www.uda.gov.lk

info@uda.gov.lk